
# ක්‍රිස්තුස් උදෙසා විඳි වද වේදනා



රිචඩ් වර්ම්බ්‍රෑන්ඩ්

# ක්‍රිස්තුස් උදෙසා විඳි වද වේදනා

ගරු රිචඩ් වර්ම්බ්‍රෑන්ඩ්
විසිනි.

# TORTURED FOR CHRIST

*by*

**RICHARD WURMBRAND**

*SINHALA*

**ඇදහිල්ලෙන් සහනය**
**තැ: පෙ; 25**
**නුගේගොඩ.**

පළමුවන මුද්‍රණය : 1973 ජනවාරි

සියලු හිමිකම් කර්තෘ සතු ය.

# කර්තෘ ගැන වචනයක්

දේවගැති ගෞරවනීය රිචඩ් වර්ම්බ්‍රෑන්ඩ් පූජක තුමෝ දේවධර්මාචාරී කටයුතුවල නියැලි සිටියෙන් එතුමාගේ ජන්ම භූමිය වූ රුමේනියාවේ පුරා අවුරුදු 14 ක් තිස්සේ කොමියුනිස්ට් වාදීන් යටතේ සිර දඬුවමකට ලක්ව දුක්වින්දහ. රුමේනියාව පුරා ජනප්‍රසාදයට පත්ව සිටි එතුමා ක්‍රිස්තියානි නායකයෙකි. ග්‍රන්ථකර්තෘවරයෙකි. අධ්‍යාපනඥයෙකි. එතුමා හා සමතත්වයේ ලා සැලකෙන වෙනත් කෙනෙකු නොවූතරම් ය.

1945 දී රුමේනියාව කොමියුනිස්ට් ග්‍රහණයට ලක්වූ වේලෙහි ආක්‍රමණික රුසියන් සේනාවට විරුද්ධව තම මවු බිමේ වහල්භාවයට පත්ව සිටි ජනතාව වෙනුවෙන් එතුමෝ රහසිගත ව්‍යාපාරයක් ආරම්භ කළහ. ඒ අනුව 1948දි එතුමා සිර අඩස්සියට පත්විය. එතුමාගේ බිරිඳවූ සැබින්ද ඒ සමගම සිරභාරයට පත්වූවා ය. සැබින් අවුරුදු 3 ක් ම වහල් සේවිකා වක ලෙස කටයුතු කළාය. ඒ කාලය තුළදී රිචඩ් වර්ම් බ්‍රෑන්ඩ් හුදකලාවම කොමියුනිස්ට් සිරකුටියක සිර දුක්වින්දේය. ඉන් පසුව, විශාල යුද සිරකඳවුරක සිර කරුවකු ලෙස යවනු ලැබූ එතුමෝ එහිදීද දැඩි හිරිහැරවලට ලක්වූහ.

දේශාන්තරයන්හි පතළ කීර්තියක් ඇතිව සිටි ක්‍රිස්තියානි නායකයෙකු වූ එතුමාගේ ආරක්ෂාව ගැන විදේශීය තානාපති වරු විමසිලිමත් වූහ. එතුමා ගැන කොමිනිස්ට් ආණ්ඩුවෙන් ප්‍රශ්න කලහ. එතුමා රුමේනියාවෙන් පැන ගොස් ඇතැයි ඊට පිළිතුරු වශයෙන් කොමියුනිස්ට්වරු ප්‍රකාශ කළහ.

සිරෙන් මිදී ආ සිරකරුවන් ලෙස වෙස්වලාගත් කොමියුනිස්ට් රහස් පොලිස් නිලධාරීහු, එතුමාගේ බිරිඳ හමුවී රිචඩ් මිය ගිය බවත්, සිරකඳවුරේ සුසාන භූමියේදී සිරුර වළ දමන විට තමන්ද ඊට සහභාගී වූ බවත් පැවසූහ. රුමේනියාවේ සිටි පවුලේ උදවියටත්, එතුමාගේ විදේශීය හිතමිතුරන්ටත් එතුමා මියගිය බවත් එහෙයින්ම ඒ ගැන අමතක කරන්නටත් ඔවුහු කියා සිටියහ.

අවුරුදු අටකට පසුව නිදහස ලද එතුමා යළිත් වරක් සිය රහසිගත ආගමික කටයුතු ආරම්භ කෙළේය. 1959 දී යළිත් වරක් සිරභාරයට ගනු ලැබූ එතුමාට අවුරුදු 25 ක සිර දඬුවමක් නියමවිය.

1964 දී සමාව ලැබූ එතුමා සිරගෙයින් එළියට පැමිණ යළිත් වරක් සිය ආගමික කටයුතු ආරම්භකළේය. තුන්වන වරටත් සිරගෙට පත්වීමේ තර්ජනය දුටු නෝර්වේ රටේ ක්‍රිස්තු භක්තිකයෝ එතුමා රුමේනියාවෙන් මුදහරින මෙන් කොමියුනිස්ට් පාලකයන්ගෙන් ඉල්ලීමක් කළහ. මේ වන විට කොමියුනිස්ට්වරු සිය දේශපාලන සිරකරුවන් විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කළහ. සිරකරුවකුගේ වෙන්දේසි මිල ඩොලර් 1900 ක් විය. එහෙත් වර්ම් බ්‍රැන්ඩ් සඳහා වූ මිල ඩොලර් 6000 ක් වූයේ ය.

1966 දී වොෂින්ටන්හි අභ්‍යන්තර ආරක්ෂාකළ උප කමිටුව ඉදිරියේ පෙනී සිටි එතුමා සිය සිරුරේ උඩුකය වසා තිබුණු ඇඳුම් ඉවත් කොට කොමියුනිස්ට් වධබන්ධනයේ තරම පෙන්වූයේ ය. ශරීරයේ ඉහටිය තෙක්වූ ගැඹුරු තුවාල 18 ක කැලැල් එහිදී දැකගත හැකිය. ඔහුගේ මේ පුවත ඇමෙරිකාව පුරාත්, යුරෝපයේ සහ ආසියාවේත් පැතිර ගියේ ය. රුමේනියාවේ කොමියුනිස්ට් පාලකයින්ගේ තීරණයක් අනුව එතුමා ජීවිතක්ෂයට පත්කරවීමේ වැඩ පිළිවෙලක් ගැන 1966 සැප්තැම්බර් මාසයේදී වර්ම බ්‍රැන්ඩ් අනතුරු හැඟවීමේ සංඥාවක් ලැබුයේ ය. මරාදැමීමේ තර්ජනය ලදුවද, එතුමා නිහඬ නොවිය. ''රහස් සභාවේ හඬ''යනුවෙන් දත් එතුමාගේ නාමය ප්‍රකටවී ඇත. ක්‍රිස්තුභක්තික නායකයෝ එතුමා ''ජීවමාන ගැලවුම්කරු'' ලෙසත් එසේම ''අයෝමය තිරයේ පෝල්'' ලෙසත් හඳුන්වති.

# සංඥාපනය

## මේ පොත මම ලියන්නේ කුමක් නිසා ද?

සියළුම ස්වාදීන ක්‍රිස්තු බැතිමතුන්ට යකඩ තිරය පිටුපසින් පවතින රහස් සභාවෙන් ගෙනෙන පනිවුඩයකි.

මේ රහස් ක්‍රිස්තු සභාවේ මම බොහෝ අවුරුදු ගණනක් මූලිකත්වයෙන් ක්‍රියා කලේය. ඒ රහස් සභාවෙන් මම නිදහස් ලොවට පැමිනෙන්නට වීරිය කර හදිස්සි පනිවිඩයක් ඔබට ප්‍රචාරය කල යුතු යයි තිරණය කලාය. ඔබට දූත් කියවන්නට ලැබෙන අතිදෘෂ්ට ප්‍රතිහාරයක් නිසා මම ජීවත් වී නිදහස් ලොවට පැමිණුනෙමි, මේ පොතෙහි, කොමියුනිස්ට් දේශවල අභ්‍යන්තරව සිටින ශ්‍රද්ධාවන්ත දුක්විදින දේවභක්තිකයන් විසින් මට බාර දී තිබෙන පනිවිඩය ප්‍රකාශ කරමි.

ඒ නිසා අභ්‍යන්තර බැතිමතුන්ගේ පනිවිඩය ඔබතුමන්ලාගේ අත්කෘෂ්ට හදිසි කල්පනාව මේ පනිවිඩයෙන් යොමුකල හැකිය. මම පළමුව මාගේ සාක්ෂිය ඉදිරිපත් කර අභ්‍යන්තර බැතිමතුන්ගේ සිද්දස්ථානයේ කෙරෙන වැඩ ගැන ප්‍රකාශ කරමි.

# පටුන

1. රුසියානුවන් තුල ක්‍රිතුමන් වෙනුවෙන් ඇති
ඉමහත් ආශාව 9

2. මිනිසා තුල නොවූ විරූ මහා ප්‍රේමය 38

3. වන්දි ගෙවීම හා බටහිර දී සේවය කිරීමට
නිදහස් කිරීම 59

4. ක්‍රිතු තුමන්ගේ ප්‍රේමයේ ආත්මයෙන්
කොමියුනිස්ටවාදය පැරදීයයි 65

5. පරාජය කලනොහැකි, පැතිරගිය, රහස් සභාව 106

6. ක්‍රිතු දහම කොමියුනිස්ට වාදය පරදවන්නේ
කෙසේ ද? 129

7. ලංකාවේ නිදහස් ක්‍රිස්තු භක්තිකයින්ට ආධාර
කල හැක්කේ කෙසේ ද? 155

පළමුවන අදියර

# රුසියානුවන් තුළ කිතුනුමත් වෙනුවෙන් ඇති ඉමහත් ආශාව

## අදෙවදෘෂ්ටිකයෙකුට කිතුනුමත් හමුවෙයි.

මා හැදුනේත් වැඩුනේත් කිසිම ආගමක් පිළිනොගන්නා පවුලකය. ආගමික අධ්‍යාපනයක් මම නොලදිමි. දහහතර වියෙහිදීම මම සහේතුකව ම, තදින්ම අදෙවදෘෂ්ටිය වැලඳ ගත්තෙක් වූයෙමි. එය අම්හිරි ළමා කාලයක ප්‍රතිඵලය වූයේය. ජීවිතයේ ලාබාල වියෙහිදී අනාථයෙකු වූ මම ප්‍රථම ලෝක සංග්‍රාමය සමයේ වූ දිළිඳුකම දැන සිටියෙමි. අදෙවදෘෂ්ටි පොත් පත් කියවා ඇති නමුදු මගේ දෙවි කෙනෙකු හෝ කිතුනුමත් විශ්වාශ නොකිරීමට එය හේතු නොවිය. මනුෂ්‍ය වර්ගයාගේ මනසට වින කරන්නාක්සේ සලකා මේ මතයන්ට වෛර කළෙමි. එබැවින් ආගමට විරුද්ධව පිළිකුලක් මා තුළ වැඩෙන්නට වූයේය.

මට පසුව වැටහී ගිය පරිදි දෙවියන්වහන්සේගේ තෝරාගත්තෙකු වීමට තරම් මම උන්වහන්සේගේ අනුකම්පාව ලද්දේවී නමුදු ඊට හේතුන් මේයයි මට අවබෝධ කරගත නොහැකිවිය. මා මෙසේ තෝරාගැනීමකට තරම් සුදුසු චරිතයක් ඇත්තෙකු නොවීමි, ඒ තරමම ම මගේ චරිතය දූෂිත වී තිබිනි.

අදෙවදෘෂ්ටිකයෙකු වුවද දෙවස්ථානය වෙත මා ඇදගන්නා ගුප්ත දෙයක් වූයේය. දෙවස්ථානයකට ඇතුළු නොවී එය පසුකර යාම මට අපහසු එකක් බව පෙනී ගියේය. කෙසේ වුවද මේ දෙවස්ථානයන්හි සිදුවන දෑ මා

කිසි දිනෙක තේරුම් නොගතිමි. දේශනාවලට සවන් දුන්නද ඒවා මගේ හදවතට කථා කරන සුළු ඒවා නොවීය. දෙවිකෙනෙකු නොමැත, යන්න මට සහතිකය. මා විසින් අවනත වීමට සිටි එකම ස්වමියා වූ දෙවියන් හට මම වෛර කළෙමි. මගේ සිත තුල වූ දෙවියන් පිළිබඳ වැරදි මත වලට මම වෛර කළෙමි. එහෙත් මේ විශ්වය මධ්‍යයේ කිසියම් තැනෙක පවතින ප්‍රේමයේ හදවතක් දැන ගැනීමේ අභිලාෂයක් මට තිබුනා විය හැක. ළමා වියේදීත්, තුරුණු වියේදීත් විඳිනු ලබන ප්‍රීතියෙන් බිඳක් මම දැන සිටියෙමි.

දෙවිකෙනෙකු නැති බව මම දැන සිටි නමුදු එවන් ප්‍රේමයේ දෙවිකෙනෙකු නොසිටීම ගැන මම සංවේගයට පත් වූයෙමි. කතෝලික දෙව් මැදුරකට ඇතුල් වූ විට මිනිසුන් දණින් වැටී කිසිවක් පවසනු මම දැක ඇත්තෙමි. ඔවුන් ළඟින්ම දණින් වැටී ඔවුන් කියන්නක්ම අනුකරණය කොට සිදුවන්නේ කුමක්ද'යි බැලීමට මම අදහස් කලෙමි. ''කරුණා පිනිත මරිය තුමියනි! ඔබ දිනේවා!'' යි ඔවුහු ශුද්ධ වූ කන්‍යාව වෙත යාච්ඤා කළහ. මම එයම යලි යලිත් පැවසුවෙමි. කන්‍ය මරිය තුමියගේ පිළිරුව දෙස නෙත් දල්වා බලා සිටියෙමි. එහෙත් කිසිත් සිදුවූයේ නැත. මම මේ ගැන මහත්සේ සංවේගයට පත්වීමි.

තදින්ම අදෙව දෘෂ්ටිකයෙක්වූ මම දිනක් දෙවියන් වෙත මෙසේ යාච්ඤා කළෙමි. ''දෙවියනි! ඔබ නැති බව ස්ථිරවම දනිමි. මම අභියොගකරන ලෙස යම් හෙයකින් ඔබ සිටින්නේනම්, මගේ කාර්යය වනුයේ ඔබ විශ්වාශ කිරීම නොවේ. එහෙත් ඔබේ කාර්යය නම් මට ඔබ ම එළිදරව් වීමය.'' අදෙවදෘෂ්ටිකයෙක් වූ මගේ හදවත අදෙව-දෘෂ්ටි සමයෙන් සැනසුමක් නොලැබුනේය.

මේ අයුරින්ම මට අභ්‍යන්තරව කටුක ලෙස වේදනා විඳිද්දී, පසුව දැනගත් පරිදි රුමේනියාවේ කඳුකර ගම්මානයක එක් මහළු වඩුවෙක් මෙසේ යාච්ඤා කළේය. ''මගේ දෙවියනි! මම ඔබ තුමන්ට පොළොවෙහි සේවය කළෙමි. ඊට ලැබෙන තිළිණය ස්වර්ගයෙහි මෙන්ම

මෙහිදී ද ලබනු රිසියෙමි. මගේ තිළිණය විය යුත්තේ, ඔබ තුමා යුදෙව්වන් කෙරෙන් පැමිණියකු නිසා යුදෙව්වෙකු ඔබ තුමන් වෙත ගෙන එනතුරු මගේ මරණය සිදු නොවීම ය. මම දිළින්දෙක්මි. රෝගියෙක්මි, මට යුදෙව්වෙකු සොයා ඈත මෑත ඇවිදිය නොහැක්කෙමි, මගේ ගමෙහි එවන්නකු නොමැත. ඔබ තුමාම මගේ ගමට යුදෙව්වකු කැඳවුව මැනව. මම, මට කළ හැකි උසස්ම අයුරින්ම ක්‍රියා කොට, ඔහු කිතු තුමන් වෙතට ගෙන එන්නෙමි.

මට වැලැක්විය නුහුණු කිසිවක් විසින් ඒ ගමවෙත මා ඇදගනු ලැබීය, එහි කිරීමට කිසිවක් මට නොවීය. රුමේනියාව දෙලොස්දහසක් ගම්වලින් සමන් විත වුවද,මා ගියේ පෙර කී ගම වෙතටමය. මා යුදෙව්වකු බව දැනගත්විට රුමත් තරුණියක් කිසිවකු සිය ග්‍රහණයට හසුකරගන්නාක්සේ පෙර කී වඩුවා සිය ග්‍රහණයට මා හසුකරගත්තේය. ඔහුගේ යාච්ඤාවට පිළිතුරු මා තුලින් දිස්වූ හෙයින් ඔහු මට කියවීමට බයිබලක් සැපයීය. මීට පෙර මම සංස්කෘතික දේ දැනගනු රිසියෙන් බයිබලය කියවා ඇත්තෙමි. එහෙත් ඔහු දුන් බයිබලය අනෙක් ඒවාට වඩා වෙනස් වූ එකක් විය. මමත් මගේ බිරිඳත් දෙවියන් වහන්සේ වෙත හැරෙනු පිණිස ඔහු සිය බිරිය සමගින් පැය ගණන් යාච්ඤාවෙන් පසුවූ බව පසුව මට පැවසීය. ඔහු මට දෙනු ලැබූ බයිබලය ලියා තිබුනේ බොහෝ විට වචනයෙන් නොව, ඔහුගේ යාච්ඤාව මගින් දල්වාලනු ලැබූ ප්‍රේමයේ ගිණි සිළු වලින් වූයේය.

මට එහි කියවිය හැකි වූයේ ස්වල්පයකි. මට කළහැකි වූයේ මගේ දූෂිත ජීවිතයත් කිතුතුමන්ගේ ජීවිතයත් මගේ අපවිත්‍ර භාවයත්, එතුමන්ගේ නිර්මලභාවයත් මගේ අප්‍රසන්නකමත් උන්වහන්සේගේ ප්‍රේමයත් සසඳමින් වැලපීම පමණි. අනතුරුව මාද එතුමන්ගේම අයෙකු ලෙස පිලිගනු ලැබීය.

ඊට පසු ඉතා ඉක්මනින්ම මගේ බිරිය ද උන්වහන්සේ පිලිගත් අතර ඇය තවත් බොහෝ දෙනෙකුද ද එතුමන් වෙතට කැඳවූවාය. මෙසේ රුමේනියාවේ නව ලුදරන් ආගමික යන්ගේ නැඟිටීම සිදුවිය.

අනතුරුව නාසින්ගේ සමය එළඹියේය. අපට විඳින්නට සිදුවූ ගැහැට අනන්තය. නාසිපදය ප්‍රොතෙස්තන් වාදීන් හා යුදෙව්වන් ද පීඩාවට ලක්කර අන්තවාදී ඒකාධිපති ඔතොඩොක්ස්, සිද්ධාන්තයන්ගේ ස්වරූපය ගත්තේය.

මේ සභාවේ නායකයත්, ආරම්භකයාත් වූ මම දේව ගැතියෙකු වීමට ප්‍රථමයෙන් පවා දේව සේවය සඳහා සූදනම් වී සිටියෙමි. කිහිපවාරයක්ම මාත් බිරියත් සිරකරනු ලැබීය. පහර කෑවෙමු. නාසින්ගේ අධිකරණය වෙත ද පමුණුවනු ලැබීමු. නාසිවාදයේ භීෂණත්වය විශාල වුවද, පැමිණීමට තිබුණු කොමියුනිස්ට් පාලනය හා සසඳා බලන කල්හි එය තොල ගා රස බැලීමක් බඳු විය. මගේ පුත්‍රයා වූ මිහායි හට මරණයෙන් ගැලවීම සඳහා යුදෙව් නොවූ නමක් දිය යුතුවිය.

එහෙත් මේ නාසිසමයේ දී මහත් ප්‍රයොජනවත් එකක් සිදුවිය. ශාරීරික වධයන් තුළින් යහපත් ගති ගුණ ගෙනදිය හැකි බවද, දෙවියන්ගේ ආධාරයෙන් මනුෂ්‍ය ආත්මයට සිත් සසලකරවන වද බන්ධන තුල ද ජීවත් විය හැකි බවද නාසින් විසින් අපට උගන්වන ලදි. එළඹීමට ඉතා ආසන්නව තිබුනු අතිශයින්ම බිහිසුනු කාලපරිච්ඡෙදයක් ගැන සූදනම් වීමක් බඳු, රහසිගත කිතුනු ජීවිතයක ක්‍රියා පිළිවෙල ඔවුන් විසින් අපට උගන්වනු ලැබීය.

## මා රුසියානුවන්ට කළ සේවය:-

අදෙවදෘෂ්ටිකයෙකු වී සිටීම ගැන පසුතැවිලි වූ අතර, මම දෙවියන් වහන්සේ වෙත කැප වූ ප්‍රථම දිනයේදීම රුසියානුවන්ට ඒ ගැන සාක්ෂි දැරීමට මට හැකිවූයේය. ලාබාලවියේ සිටම රුසියානුවෝ අදෙවදෘෂ්ටියට අනුකූලව හැදුනු වැඩුනු පුද්ගලයෝය. රුසියානුවන් වෙතට ඒමට මා තුල වූ අභිලාෂය මුදුන්පත් විය. රුමේනියාවේ සිර කඳවුරුවල සිටී දහස් ගණන් යුද සිරකරුවන් අතර කිතුනු ධර්ම ප්‍රචාරක කටයුතු කිරීමට හැකිවීම එහි ආරම්භය විය.

එය සිත් කළඹවන සුළු සේවය කිරීමක් වූයේය. රුසියානු සිරකරුවකු සමග කල ප්‍රථම සාකච්ඡාව කිසිදිනෙක මගේ මතකයෙන් බැහැර නොයයි. තමා ඉංජිනේරුවකු බව ඔහු මට පැවසුවේය. "තමා දෙවියන් විශ්වාශ කරන්නේදැයි මම ප්‍රශ්න කලවිට, ඔහු 'නැතැ' යි කීවේනම් මම එය එතරම් තැකීමක් නොකරමි. විශ්වාශ කිරීම හෝ නොකිරීම හැම මිනිසෙකුට ම පොදුය. එහෙත් මම ඔහු දෙවිකෙනෙකු විශ්වාශ කරන්නේදැයි ඇසූවිට විස්මයෙන් නෙත් අයා බලා සිට නොතේරුන ලෙසින් මෙසේ කීවේය. "මට එසේ විශ්වාශ කිරීමට හමුද අණක් නැහැ. එසේ අණකිරීමක් ඇත්නම් මම විශ්වාශ කරමි."

මගේ දෙකපොල රූරා කඳුළු පහළට ගලා ගියේය. හදවත කැබලිවලට බිඳීගියාක් මෙන් මට දැනුනි. මියගිය මනසින් යුතු – සකල මනුෂ්‍ය වර්ගයා වෙත පෞද්ගලිකව ම ප්‍රදනය කල උත්තරීතර තිළිණය නැති කරගත්තෙකු – මෙහි මා අබියස සිටියි. අණට කීකරු වී විශ්වාශ කිරීමට හෝ නොකිරීමට සූදනම් වූ ඔහු කොමියුනිස්ට් වරුන් විසින් 'මනස විකෘති' කළ අයෙකි. තවදුරටත් තමන් විසින්ම සිතීමට ඔහුට නොහැකිවූයේය. මෙය වසර ගණනාවක කොමියුනිස්ට් පාලනයෙන් පසු රුසියානුවෙකුගේ ආකාරය පෙන්වන්නෙකි, කොමියුනිස්ට් වාදය විසින් මනුෂ්‍යයාට සිදුකර ඇතිදේ මේ දර්ෂණයෙන්, දැක තැතිගත් මම, මගේ මුළු ජීවිතයම මේ මිනිසුන් වෙනුවෙන් කැපකොට, පෙරලා ඔවුන්ට ඔවුන්ගේ පුද්ගලිකත්වය ලබාදෙන බවටද ඔවුන්තුල දෙවියන් හා කිතුතුමන් කෙරෙහි විශ්වාශය වගා කරන බවටද, දෙවියන් ඉදිරියේ ශාපළ කළෙමි

රුසියානුවන් හමුවීමට රුසියාවට යාමට මට අවකාශ නොවිය. ආරම්භකවම 944 අගෝස්තු මස විසි තුන්වන ද රුසියානු යුද හමුදවේ ලක්ෂයක සේනාංකයක් රුමේනියාවට ඇතුළු වූයේ නොබෝ කලකින්ම එය කොමියුනිස්ට් පාලනයට යටත් විය. එවක් පටන් නාසි සමය තුලදී වූ දුක් ගැහැට සුළු ඒවා බව පෙන්වමින් බියකරු සිහිනය ආරම්භවිය.

එසමයේ රුමේනියාවේ ජනගහනය දශ ලක්ෂ දහ නවයක් වුවද කොමිනියුස්ට් පක්ෂයට වූයේ දස දහසක සාමාජික පිරිසක් පමණි. එහෙත් සෝවියට් සංගමයේ හිටපු ලේකම්-වර විෂින්ස්කි අපගේ ප්‍රියාදර පළමුවන මයිකල් රජුගේ කාර්යාලයට කඩාවැදී මේසයට මිට මොලවා ගසා "ඔබ කොමියුනිස්ට් වරුන් රජයට පත් කල යුතුය" යි කියා සිටියේය. අපගේ යුද හමුදව හා පොලිස් බළ ඇණි බලයෙන් නිරායුධ කොට කොමියුනිස්ට්වරුන් බලයට පත් වූයේය. එහෙත් එකල සිටි අමෙරිකානු හා බ්‍රිතාන්‍ය පාලකයන්ගේ සහයෝගය ඔවුන්ට නොලැබුනේය.

ස්වකීය පුද්ගලික පාපයන් ගැනම පමණක් නොව ස්වකීය ජාතියේ පාපයන් ගැනද මනුෂ්‍යයන් දෙවියන් ඉදිරියේ වගකිවයුත්තාහ. වහල් භාවයට යටත්ව සියලු ජාතීන්ගේ ශෝකාන්තයට වගකිවයුත්තෝ බ්‍රිතාන්‍ය හා හා අමෙරිකානු කිතු බැතිමතුන්ය. රුසියානුවන්ගේ සිත්බිය කරවන ආණ්ඩුවකට නොදනම උදව්දෙන කාලයක තමන් සිටින බව අමෙරිකානුවන් දැනගත යුත්තාහ. කිතු තුමන්ගේ ආලෝකයට වහල් භාවයේ සිටින ජනතාව කැඳවීමට උදව් දීමෙන් අමෙරිකානුවන් මේ දෝෂය මකා ගත යුතුය.

## ප්‍රේමයේත්, නොමග හැරීමේත් කථා ලීලාව ඒකාකාරීය

කොමියුනිස්ට්වරු බලයට පත්වූ පසු ඔවුන් අති දක්ෂ ලෙස සභාව නොමග හැරීමේ කටයුතුවල යෙදුනෝය. ප්‍රේම යේත්, මංමුලාකරවීමේත් කථාලීලාව ඒකාකාරීය. තරුණියක් සිය බිරිය කර ගැනීමට අදහස් කරන්නෙකුද, රැයේදී පමණක් ඇය සමග සිට පසුව එලවා දමන්නෙකුද යන දෙදෙනාම පවසන්නේ "මම ඔයාට ආදරෙයි" යනුවෙනි. ප්‍රේමයේත්, මංමුලාකරවීමේත් කථා ලීලයද බැටළු හම් පොරවා ගත් වෘකයන්ගෙන් නියම බැටළුවන්ද වෙන් කරගත යුතු බව කිතු තුමන් අපට කී සේක.

කොමියුනිස්ට්වරුන් බලයට පත්වූ පසු දහස් ගණන් පූජකවරුන්, දේවගැතිවරුන් හා පාස්ටර්වරුන් ඒ කට හඬ වල් දෙක වෙන් කර හඳුනා ගන්නේ කෙසේදැයි නොදන සිටියාහ. කොමියුනිස්ට්වරුන් විසින් සියලුම කිතු බැතිමතුන් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට රැස් කරවන ලදී. සියලුම සභාවලට අයත් හා දහසක පමණ සංඛ්‍යාවක පූජක, දේවගැති හා පාස්ටර්වරු එහි සිටියෝය. මේ හාර දහසක පූජක පිරිස විසින් ජෝශප් ස්ටාලින් සභාවේ ගරු සභාපති ධුරයට පත්කර ගත්හ. එසේම ඔහු ලෝක අදෙව දෘෂ්ටි ව්‍යාපාරයේ සභාපතිද ක්‍රිස්තියානි සමූහ ඝාතකයාද වූයේය. පිළිවෙලින් නැගී සිටි පූජකවරුන්, දේවගැතිවරුන් කොමියුනිස්ටවාදය හා කිතු දහම පූලිකවම ඒකාකාරී බවද, සාමූහිකව නැගී සිටිය හැකි බවද ප්‍රකාශකර සිටියේය. එකා පසුපස එකා බැගින් නැටී සිටි ඇමතිවරුන් කොමියුනිස්ට් වාදයට ප්‍රශංශා මුඛයෙන් කථා කොට, නව රජය දෙවසථානවලට දක්වන යටහත් භාවය සහතික කර සිටියෝය.

මගේ බිරියද මීට සහභාගි වූවාය. මා අසලින් අසුන් ගෙන සිටි ඇය "රිචඩ්! නැගිටින්න. කිතු තුමන්ගේ මුහුණෙන් මේ ලජ්ජාව සෝද හරින්න! ඔවුන් එතුමන්ගේ මුහුණට කෙළගසනවා"යි කීවයාය. "මම එසේ කලහොත් ඔබට ඔබේ සැමියා නැති වනු ඇතැ"යි මම කීවෙමි. "බයගුලෙක් සැමියා ලෙසින් තබා ගන්න මට ඕන නැහැ"යි ඇය කිවාය.

මම නැගීසිට, මේ කිතුනු ඝාතකයන්ට නොව දෙවියන් වහන්සේ හා කිතුතුමන්ට ප්‍රසංසා කරමින්, අපේ යටහත් භාවය ප්‍රථමයෙන්ම එතුමන්ට විය යුතු බව ප්‍රකාශ කලෙමි. කොමියුනිස්ට් පාර්ලිමේන්තුව වූ "රොස්ට්‍රම" සිට විසුරුවා හැරි මේ කිතු තුමන්ගේ පණිවුඩය ගුවන් විදුලිය මගින් මුළු රටටම සවන් දිය හැකි විය. පසුව ඊට ගෙවිය මිලය මට ගෙවීමට සිදුවුවද එය වටිනා කමට සරිලන එකක් වූයේය.

ඔතොඩොක්ස් හා ප්‍රොතෙස්තන් සභා නායකයෝ කොමියුනිස්ට් වාදයට අවනත වීමට තරඟයට මෙන් නැගී සිටියෝය. සිය පූජක ලෝගුවේ දැකැත්ත හා මිටියේ සලකුන

තබා ගත් ඕතොඩොක්ස් පූජක වරයෙක් තව දුරටත් ඔහුට ස්වාමිනි නොව, ඒ වෙනුවට ''සහොදර බිෂොප්''(Comrade) යනුවෙන් අමතන ලෙසද ඔහුගේ පූජකයන්ට කීවේය. රොසිටා නගරයේ පැවැත්වූ බැප්ටිස් සභිකයන්ගේ සභාවකට මම සහභාගි වූයෙමි. මේ රැස්වීම පැවැත්වූයේ රතු ධජයක් යටතේය. සෝවියට් ජාතික ගීය ගයන කල්හි එහි සිටියෝ නැගිට සිටියාහ. ''ස්ටාලින් දෙවියන් වහන්සේ ගේ පණත් සම්පූර්ණ කලා මිස ඊට එදිරිවූයේ නැතැ''යි බැප්ටිස් සභාවේ නායකයා ප්‍රකාශ කළේය. ඔහු ස්ටාලින් මහා බයිබල් ආචාරයයකු ලෙස ප්‍රශංසා කල අතර, පූජකයන් වූ පැට්රුස්කොව් හා රොසියානු වඩාමත් මෙය කියා සිටියේය. ඔවුන් රහස් පොලිසියේ නිලධරයන් බවට පත්වූහ. රුමේනියාවේ ලුදරන් සභාවේ නියෝජ්‍ය බිෂොප් වරයා වූ රාජ්, දෙවියන් වහන්සේ විසින් එලිදරව් කිරීම් තුනක් දුන්බව දෙවධර්මාශ්‍රමයන්හි උගැන්වීමට පටන්ගත්තේය. එකක් මොසෙස් තුලින්ද, දෙවැන්න යේසුස් වහන්සේ තුලින් ද, තෙවැන්න අප ඉදිරියේ ක්‍රියාකරන ස්ටාලින් තුලින් ද ඒවා දුන් බව පැවසුවේය. අවසාන එක ඉන් පෙරට ගිය ඉගැන්වීම් යටපත් කෙරුවේය.

මා ප්‍රිය කල අවංක බැප්ටිස්ට් සභිකයන් කිහිපදෙනෙකු ඊට අවනත නොවී බොහෝ දුක් වින්ද බව අවබොධ කර ගත යුතුය. කෙසේ වුවද කොමියුනිස්ට්වරුන් සිය නායකයන් තෝරා ගත් අතර බැප්ටිස්ට් සභිකයන්ට වූයේ තමන්ගේ කැමැත්ත කිරීමට නොව ඔවුන් පිළිගැනීමටය. අද දිනයේද මේ ආගමික නායකත්වය මේ තත්වයේම තිබෙන බැව් සැබෑවකි.

කිතු තුමන්ගේ වෙනුවට කොමියුනිස්ට් වරුන්ගේ සේවක යන්වූ ඔවුන් තමන්ට එක් නොවූ සිය සහෝදරයන්ට දෝෂා රෝපණය කළහ.

රුසියානු විප්ලවයට පසු රුසියාවේ කිතු බැතිමතුන් විසින් ම රහස් සභාවක් නිර්මාණය කළේ යම් සේ ද, එසේම ශුභාරංචිය දෙශනා කිරීමෙන් ජනතාව කිතු තුමන් වෙත

කැඳවීම සඳහා සිටින විශ්වාශදායී ධර්ම ප්‍රචාරය සඳහා රහස් සභාවක් රුමේනියාවේද නිර්මාණය කිරීමට අප පොළඹවනු ලැබුවේ. එහි කොමියුනිස්ට් වාදය බලයට පත්වීම හා රජයේ දෙවස්ථානවල නායකයන්ගේ පාවාදීමය. මේ හැම එකක්ම තහනම් කල කොමියුනිස්ට්වරු රජයේ දෙවස්ථාන පිළිගත්හ.

අනෙක් අයගේද සහාය ඇතිව මම රහස් සේවයක කටයුතු ඇරඹුවෙමි. පිටතින් මට තිබුනු වැදගත් සමාජයීය තත්වය මගේ රහස් සේවය කටයුතු මුවා කරන්නක් වූයේය. මම නෝර්වීජියානු ලුදරන් සභාවේ පාස්ටර්වරයෙකු වූ අතර ලෝක දෙවස්ථාන සංගමයේ රුමේනියානු නියෝජිතයාද වූයේය. (රුමේනියාවේ සිටි අප හට මේ සංවිධානය කොමියුනිස්ට්වරුන් සමග එක්වෙතැයි අල්පමාත්‍රයකුදු අදහසක් අපට නොවීය. මේ සමයේදී එය අප රටෙහි ක්‍රියා කලේ සුළු වශයෙනි) මගේ රහස් වැඩ කටයුතු දැන නොසිටි නිලධාරීන් ඉදිරියේ සිටීමට මේ තත්වයන් දෙක මට හොඳ රැකුලක් වූයේය. මේ කටයුත්ත පිළිබඳ ශාඛා දෙකක් විය.

දශ ලක්ෂයක රුසියානු සෙබළුන් අතර රහසිගත දේව සේවයක් කිරීම එහි පළමුවැන්න විය.

දෙවැන්න නම් රුමේනියාවේ වහල් භාවයේ සිටින මිනිසුන් අතර දේව සේවය කිරීමය.

## රුසියානුවෝ–පිපාසයෙන් පීඩිත ආත්ම ඇති ජනතාවක්

රුසියානුවන් අතර ශුභාරංචිය දෙශනා කිරීම මට මිහි පිට ස්වර්ගයක් බඳු විය. මා බොහෝ ජාතීන් අතර ශුභාරංචිය දෙශනාකර ඇති නමුදු මෙතරම් ආශාවෙන් එය පානය කරන මිනිසුන් කොටසක් කිසිදිනෙක දුක නැත. ඔවුන්ගේ ආත්ම එතරම්ම ම පිපාසයකින් පෙලෙති. මගේ මිත්‍රයෙක්වූ ඔතොඩොක්ස් පූජකවරයෙක් රුසියානු නිලධාරියෙකු පාපොච්චාරණයකට පැමිණි ඇති බැව් මට ටැලිපෝන් මගින් දැනුම් දුන්නේය. මගේ මිත්‍රයා රුසියානු බස දැන සිටියේ

නැත. මම රුසියානු බස දත් බව ඔහු දැනගත් හෙයින් ඔහු මගේ ලිපිනය නිලධාරියාට දුන්නේය. පසුදින ඔහු මා සොයා ආවේය. මේ පුද්ගලයා දෙවියන් වහන්සේට ප්‍රේම කළේය. උන්වහන්සේ කෙරෙහි බලා සිටි සේක. එහෙත් කිසිදිනෙක බයිබලයක් දැක සිටියේ නැත. දේව මෙහෙයකට කිසිදිනෙක සහභාගී නොවීය. (රුසියාවේ දෙවස්ථාන ඉතා විරලය) ඔහු ආගමික අධ්‍යාපනයක් ලබා නොතිබුනේය. දෙවියන් කෙරෙහි අල්ප මාත්‍රවූ දැනුමක්වත් නොමැති ඔහු එතුමන්ට ප්‍රේම කළේය.

කිතුතුමන්ගේ කඳු උඩ දේශනාවද එතුමන්ගේ උපමා-වන්ද, මම ඔහුට කියවූයෙමි. ඒ ඇසූ ඔහු කාමරය පුරා නටමින් "කොපමණ පුදුමද?!! ලස්සණද?!! මේ කිතුතුමන් නොදැක මම ජීවත්වන්නේ කොහොද? ඉහවහා ගිය ප්‍රීතිය කියා පාන්නට විය. කිතුතුමන් කෙරෙහි මෙපමණ ඉපිලී ගිය ප්‍රීතියෙන් කිසිවකු සිටිනු මම දුටු ප්‍රථම වතාව මෙය වූයේය. අනතුරුව මට වැරදීමක් සිදුවිය. කිතුමතුන්ගේ දුක්ඛ ප්‍රාප්තියත් කුරුසියේ ඇණ ගැසීමත් කියවූයේ ඔහු ඊට සූදනම් නොවී සිටි විටය. එය ඔහු බලාපොරොත්තු වූවක් නොවීය. කිතුතුමන් පහර කනු ලැබූ අයුරුද, කුරුසියේ ඇණ ගැසූ අයුරුද, අවසානයේ මියගිය අයුරුද ඇසූවිට පුටුවේ අත් ඇදි මත වැටී සාතිශය සංවේගයෙන් වැළපෙන්නට වූයේය. ඔහු ගැලවුම් කාරයා කෙරෙහි විශ්වාශ කළේය. එහෙත් ඔහුගේ ගැළවුම්කාරයා මියගොස්ය.

මම ඔහු දෙස් නෙත් යැවීමි. කිතුනුවකු, පාස්ටර්වරයෙකු, බයිබල් ගුරුවරයෙකු යනුවෙන් මා හැඳින්වීම ගැන මම ලජ්ජා වූයෙමි. කිතුතුමන් විඳි පීඩාවන් මේ නිලධරයා පරිදි මම ද උසුලා නොගත් බැවිනි. කුරුසිය පාමුලදී ද, සොහොන් ගැබ තුල කිතු තුමන්ගේ මෘත ශරීරය ඇති විට ද මග්දලාහි මරියා හඬා වළපුනු අයුරින් මට එය දිස්වූයේය.

අනතුරුව මම උන්වහන්සේගේ මළවුන්ගෙන් නැඟිටීම ගැන කියවූයෙමි. තම ගැලවුම්කාරයානෝ මලවුන් කෙරෙන් නැඟිටි බැව් හෙතෙම නොදත්තේය. මේ විස්මකුරු පුවත

සවන්හි වැකුණු කල්හි ශේ සිය දෙදණට අතින් තට්ටු කරමින් ඉතා රළු ස්වරයකින් දිව්රා සිටියේය. එහෙත් එය අතිශයින්ම සුපරිශුද්ධ වූ දිව්රියක් බව මම හැඟිමි. මේ ඔහුගේ රළු කථා විලාශය විය. යලිත් ශේ ප්‍රීතිවන්නට වූයේය. ඔයු ප්‍රීතියෙන් මුර ගැසීය. ''එයා ජීවත් වෙනව! එයා ජීවත් වෙනවා!!'' කියමින් යලිත් කාමරය පුරා නටන්නට වූයේ ප්‍රීති ප්‍රමෝද-යෙන් උතුරා යමිනි.

''අපි යාච්ඤා කරමු'' මම ඔහු ඇමතීමි. යච්ඤා කිරීමට ඔහු දන සිටියේ නැත. අප යාච්ඤා කිරීමට උපයෝගී කර ගන්නා ශුද්ධ වූ වචන මාලාවන් ඔහු නොදත්තේය. මා සමග එකට දණින් වැටුනු ඔහුගේ යාච්ඤාව වූයේ මෙසේය. ''අහෝ! දෙවියනෝ! ඔබ කොච්චර හොඳ හාදයෙක්ද? මම ඔබ වුනා නම්, ඔබ මම වුනා නම් මම කිසිදකා ඔබේ පව් සමා කරන්නෙ නැහැ. ඒත් ඔබනම් ඇත්තටම හරිම හොඳ හාදයෙක්. මගේ මුළු හෘදයෙන්ම ඔබට ප්‍රේම කරනවා!''

ස්වර්ගයේ සිටි සියලු සුරදූතයන්ට තමන් නියැලී සිටි කාර්යයන් නතර කර දමා මේ රුසියානු නිලධරයාගේ මනස්-කාන්ත යාච්ඤාවට සවන් යොමා සිටියේ යැ'යි මම සිතමි. ඔහු කිතුනුමන් වෙත දිනාගනු ලැබීය.

එක් සාප්පුවකදී රුසියානු කැප්ටන් වරයෙකු හා කාන්තා නිලධාරිනියක් මට හමුවිය. ඔවුන් බඩු මිලදී ගනිමින් සිටියද රුසියානු බස නොදන සිටි වෙළඳ සේවකයා හා කථා කල නොහැකිව අපහසු තත්‍වයකට මුහුන පා සිටියෝය. ඔවුන්ගේ පරිවර්තකයා ලෙස මම ඉදිරිපත් වූයෙමි. අපි කුළුපගයන් වූයෙමි. දිවා ආහාර ගැනීමට මම ඔවුන් මගේ නිවසට ඇරයුම් කළෙමි. අහර ගන්නට ප්‍රථම මම ඔවුකට මෙසේ කීවෙමි. ''දන් ඔබ දෙදෙනා ඉන්නේ කිතුනුවකුගේ නිවසකයි. කෑම ගැනීමට පෙර යාච්ඤා කිරීමේ පුරුද්දක් අප අතර තිබෙනවා'' මම යාච්ඤාව රුසියානු භාෂාවෙන් කීවෙමි. ඔවුන් ගෑරප්පු හා පිහියා පිඟන් මත තබා අහර ගැනීමට රසි නොවූ ලෙසින් දෙවියන්, කිතුනුමන් බයිබලය ගැන ප්‍රශ්න පිට ප්‍රශ්න අසන් නට වූවෝය. ඔවුන් කිසිවක් දන සිටියේ නැත.

ඔවුන් හා කථා කිරීම එතරම් පහසු එකක් නොවිය. බැටළුවන් සියයක් සිට එකෙක් නැතිවූ මිනිසාගේ උපමාව ඔවුන්ට කිවෙමි. එය ඔවුන්ට තේරුනේ නැත. ''ඔහුට බැටළුවන් සියයක් සිටියේ කොහොමද? ඇයි? කොමියුනිස්ට් සාමූහික ගොවිපොළට ඔවුන් ගෙන ගියේ නැද්ද?'' ඔවුන් ප්‍රශ්න කළේය. අනතුරුව යේසුස් වහන්සේ රජෙක් යයි කීවෙමි. රජවරු හැම දෙනාම මිනිසුන්ට කෲර ලෙස සැලකූ නරක මිනිස්සු. යේසුස් වහන්සේද එසේ විය යුතුයි' ඔවුහු පිළිතුරු දුන්හ. මිදි වත්තේ උපමාව ඔවුන්ට කී විට ''හරි හොඳයි මිදි වත්ත අයිතිකරුවාට විරුද්ධව කැරළි ගසා තිබෙනවා. ඒක හොඳයි. මිදි වත්ත අයත්වෙන්න තිබුනෙ සාමූහික ගොවිපොලකටයි'' ඔවුන් පැවසූහ. හැම දෙයක්ම ඔවුන්ට නවතාවයෙකින් යුක්ත වූහ. මම ඔවුන්ට ක්‍රිස්තුතුමන්ගේ උත්පත්තිය ගැන පැවසුවෙමි. මරියා දෙවියන්ගේ බිරිඳද? මගෙන් ඇසූහ. ලාංකිකයෙකුට එය ඇසුනේ නම් ආගමට අපහාස කිරීමක් ලෙස සලකනු ඇත. ඔවුන් හා වෙනත් අය සමග කෙරුනු කතාබහෙන් මම තේරුම් ගත්තේ වර්ෂ ගණනාවක කොමියුනිස්ට් පාලනයෙන් පසු රුසියාවට ශුභාරංචිය දේශනා කිරීමට නම් සම්පූර්ණයෙන්ම අළුත් කථා ලීලාවක් අනුගමනය කළ යුතු බවය.

මධ්‍යම අප්‍රිකාවේ ධර්ම දූත කටයුතු වලට ගිය මිෂනාරිවරු අනාගත වක්තෘ යෙසයියාගේ වචන පරිවර්තනය කිරීමේදී අපහසුකම් වලට මුහුණ පෑවෝය. ''ඔබේ පව් ලාක්ෂා මෙන් රතු වුවද හිම මෙන් සුදු වන්නේ ය''යි එහි ලියා තිබේ. මධ්‍යම අප්‍රිකානුවෝ කිසි දිනෙක හිම දැක නොතිබුනේය. හිම යනුවෙන් වචනයක් ඔවුන්ට නොවිය. එය පරිවර්තනය කලේ මෙසේය. එනම් ''ඔබේ පාපයන් පොල් මද මෙන් සුදු වන්නේය'' යනුවෙනි.

ඔවුන්ට තේරුම් යන පරිදි ශුභාරංචිය මාක්ස්වාදී භාෂාවට පරිවර්තනය කිරීමට අපට සිදු විය. එය අපට කළ නොහැක්කක් වූ අතර ශුද්ධාත්මය තුලින්ම පමණක් ඉටු කරගත

හැකි වූයේය. එදිනම රුසියානු කැප්ටන්වරයාද කාන්තා නිලධාරිනියද කිතු තුමන් වෙත කැප වූවෝය. පසුව ඔවුන් මහත් ලෙස රහස් සභාවේ කටයුතු වලට සහාය දුන්නෝය.

ශුභාරංචි පිටපත් හා වෙනත් ක්‍රිස්තියානි පත්‍රිකාවන් අපි රහසේ මුද්‍රණය කොට රුසියානුවන් අතර බෙද හැරියෙමු. කිතු තුමන් වෙත හැරුනු රුසියානු සෙබළුන්ගේ ආධාරයෙන් බයිබල් පිටපත් සහ බයිබලීය කථා පොත් රුසියාවට ගෙන ඒමට හැකි වූයේය.

දේව වචනය රුසියානුවන්ගෙ අතට ලැබීමට සැලැස් වීමට අපි තවත් උපක්‍රමයක් උපයෝගී කර ගතිමු. වසර ගණනාවක් තිස්සේ සටන් උදෙසාම කාලය ගත කර ඇති හෙයින් ඔවුන්ගෙන් සමහරක් සිය දරුවන් පවා මේ කාලය මුළුල්ලේම දැක නැත. රුසියානුවෝ දරුවන් කෙරෙහි මහත් ප්‍රිය බවක් දක්වති. මගේ පුත්‍රයා වූ මිහායි හා අවුරුදු 11 න් පහළ ළමයින් සාක්කුවල බයිබල් පිටපත්, ශුභාරංචි හා වෙනත් පත්‍රිකා පුරවාගෙන වීදි වලදීත් උද්‍යානවලදීත් රුසියානු සෙබළුන් හමුවෙති. සෙබළුන් එවුන්ගේ හිස් පිරිමදිමින් වසර ගණනාවකින් නුදුටු සිය දරුවන් සිහිකරමින් ආදරයෙන් කථා කරති. සෙබළුන් ළමයින්ට සූකිරි, චොකලට් දුන් විට ඔවුහු පෙරලා බයිබල් හා පත්‍රිකා දෙති. සෙබළුන් ඒවා පිළිගත්තේ මහත් ආශාවෙකිනි. එළිමහනේ බොහෝ විට අන්තරායකාරී වූ දේ ළමයින් සම්පූර්ණ ආරක්‍ෂාව සහිතව කරන ලදී. ඔවුන් රුසියානුවන්හට ධර්ම දූතයන්ය. ප්‍රතිඵලය අතිශයින්ම යහපත් විය. බයිබල් ලබා ගැනීමට වෙනත් මඟක් නොමැති වූ විට සෙබළුන් මේ මගින් ඒවා ලබා ගත්හ.

## රුසියානු හමුද කඳවුරුවල දේශනා කිරීම

අප දේව සේවය කලේ පෞද්ගලිකවම පමණක් නොවේ. කුඩා කංඩායම් වශයෙන් අපට සේවය කල හැකි විය. රුසියානුවන් අත් ඔරලෝසු වලට දක්වන්නේ ඉමහත්

ආශාවකි. ඔවුන් හැම දෙනාගෙන්ම අත් ඔරලෝසු සොරකම් කරති. මාවතේදී ඔවුන් මා නැවතූ විට හැමදෙනාටම බැලීමට මගේ ඔරලෝසුව දීමට සිදුවිය. එක අතක අත් ඔරලෝසු කීපයක් බැඳගත් රුසියානුවන් ඔබට දැකිය හැකිය. කරේ එල්ලාගත් එලාම් ඔරලෝසුවක් ඇති කාන්තා නිලධාරිනියක්ද වෙයි. මීට පෙර ඔවුන්ට අත් ඔරලෝසු නොවූ අතර ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයද ලබාගත නොහැකිය. සොරකම්කල ඔරලෝසුවක් අවශ්‍යවූ විට යායුත්තේ හමුද කඳවුරු වලටය. බොහෝවිට ඔවුන්ගේම අත් ඔරලෝසුව යළිත් මිළදී ගනී. එබැවින් රුමේනියානුවන් රුසියානු කඳවුරු තුළට ඇතුළුවීම සුලභ සිද්ධියකි. ඔරලෝසු ගැනීමේ නියායෙන් හමුද කඳවුරුවලට ඇතුල්වීම අපට වූ හොඳම ව්‍යාජ හේතුවකි.

රුසියානු කඳවුරුවල දේශනා කිරීමට මම ප්‍රථමයෙන්ම තෝරාගත්තේ ශාන්ත පාවුල්තුමන්ගේ හා ශාන්ත පේත්‍රුස් තුමන්ගේ දිනය වෙනුවෙන් ඔතොඩොක්ස් සභාව මගින් පවත්වනු ලබන භෝජන සංග්‍රහය පැවැත්වූ දිනයයි. මම ඔරලෝසු ගැනීමේ නියායෙන් යුද හමුද මූලස්ථානයට ගියෙමි. එහිවූ එක් ඔරලෝසුවක් මිල අධික බවද එකක් ලොකු වැඩි බවද, අනෙක ඉතා කුඩා බවද ව්‍යාජ හේතුන් දක්වමින් පැවසුවෙමි. සෙබළුන් මාවෙත රොක් වී යම්යම්දේ ඉදිරිපත් කරමින් ඒවා අලෙවි කිරීමට තැත් කළහ, ''පෝල් කියා හෝ පීටර් කියා කෙනෙක් මෙහි ඉන්නවාදැ''යි මම විහිළුවට මෙන් ඇසුවෙමි. සමහරෙක් එනමින් වූහ. ඔබේ ඔතො-ඩොක්ස් දෙවස්ථානයේ අද ශාන්ත පාවුල්තුමන්ට හා ශාන්ත පේත්‍රුස්තුමන්ට ගෞරව කරන බව දන්නෙහිද?යි අනතුරුව මම ඇසුවෙමි. සමහර රුසියානුවෝ එය දැන සිටියහ. ඊට පසු මම මෙසේ කීවෙමි. ''තමුන්නාන්සේලා ශාන්තපාවුල් ගැන හෝ ශාන්ත පේත්‍රුස්තුමන් ගැන දන්නවාද? කිසිවෙකු දැන නොසිටියහ. මම ඔවුන්ට පාවුල්තුමා හා පේත්‍රුස්තුමා ගැන කීවෙමි.

''ඔබ මෙහි ආවේ ඔරලෝසු ගන්න නොවෙයි, විශ්වාශය ගැන කියන්න. මෙතන වාඩිවී අපට ඒක කියන්න. ඒ වුනත් ප්‍රවේසමෙන්. කාගෙන් ප්‍රවේසම් විය යුතු දැ? යි අපි දනිමු''යි එත් මහලු සෙබලෙක් මා නවතමින් කීවේය. ''මේ අප වටා ඉන්න හැම දෙනාම හොඳ මිනිස්සු. මම ඔබේ දණ මත අත තැබූ විට කතා කලයුත්තේ ඔරලෝසු ගැන පමණයි. අත ආපසු ගත් විට ඔබේ දේශනාව පටන් ගන්න.'' සෑහෙන පිරිසක් මා වටා රොක්වී සිටියහ. ඔවුන් ඇමතූ මා පාවුල් තුමා, පේත්‍රුස් තුමා හා කිතු තුමන් ගැනද පාවුල් හා පේත්‍රුස් මිය ගියේ කා උදෙසාදැයි පැවසුවෙමි. අවිශ්වාශ යමෙක් අප අසලට පැමිණිකල සෙබලා මා දණ හිස මත අත තබයි. එවිට මම ඔරලෝසු ගැන පමණක් කථා කරමි. ඔහු ඉ[illegible]ව ගිය කල මම යලිත් කිතුතුමන් ගැන කථාව අරඹමි. රුසියානු සෙබළුන්ගේ ආධාරයෙන් මම මෙසේ කීපවාරයකදීම එහි ගියෙමි. එහිවූ ඔවුන්ගේ සහෝදර සෙබළුන් බොහෝ ගණනක් කිතු තුමන් වෙත ඇත. දහස් ගණන් ශුභාරංචි පිටපත් රහසේ බෙදා දෙන ලදී. මේ නිසා රහස් සභාවේ අයත් අපේ සොයුරු සොයුරියෝ දැඩිලෙස පහරදීම්වලට මුහුණ පෑ නමුදු අප සංවිධානය පාවාදීමට තරම් පෙළඹුනේ නැත.

මෙසේ කටයුතු කරන අතරතුර රහස් සභාවේ අප සහෝදරයන් එක්වී එකිනෙකාගේ අත් දැකීම් ගැන ඇසීමට දැක්වූයේ මහත් ආශාවකි. ප්‍රථමයෙන්ම අප දුටුවේ ඔවුන් මහා ශුද්ධවන්තයන්ගේ තත්වයට එළඹ ඇති බවය. කොමියුනිස්ට් දැඩි ක්‍රියාමාර්ගයන් ඔස්සේ වසර ගණනාවක් ඔවුන් ගමන් කර තිබුනේය. සමහරෙක් කොමියුනිස්ට් විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලැබූ අය වූහ. එහෙත් ලවන ජලයේ වසන මසුන් සිය ඇඟ මස්වල රසවත් භාවය රැකගන්නාක් මෙන් කොමියුනිස්ට් විද්‍යායතනවල අධ්‍යයනය කළ ඔවුන් කිතු තුමන් වෙනුවෙන් සිය ආත්මයත්

නිර්මලව, පවිත්‍රව තබාගත්හ. මේ රුසියානු කිතු බැතිමතුන් සතුව එවැනි ශොභන ආත්මයන් වූයේය. "අපේ හිස් වැසුම්වල ඇති දෑකැත්ත සහ මිටිය සහිත තරු සළකුන අන්ත ක්‍රිස්තුගේ සලකුණ බව අපි දනිමු"යි ඔවුන් පැවසුවේ මහත් සංවේගයකිනි. රුසියානු සෙබලුන් අතර ශුභාරංචිය බෙද හැරිමට ඔවුන්ගෙන් ලැබුනු රුකුල මහත්ය.

මට මෙය කිව හැක. එනම් ඔවුන් සතුව ප්‍රීතිමත් බවේ ලක්ෂණයන් හැර සියලුම කිතුනු ගුණාංගයන් තිබුනු බවය. මේ ප්‍රීතිමත් බව වූයේ කැපවීමේදී පමණි. අනතුරුව එය නොපෙනී ගියේය. එයින් මම මහත් සේ මවිතයට පත් වුනෙමි. "ඔබ ප්‍රීතිය නොදන්නේ යයි කියන්නේ කෙසේද?"යි මම වරක් බැප්ටිස්ට් සභිකයෙකුගෙන් ප්‍රශ්න කලෙමි. "අවංක කිතුනුවෙක්ව යාච්ඤාවෙන් යුක්තව ජීවිතය ගත කරමින් ආත්ම කිතු තුමන් වෙත දිනාගන්නා බව මගේ දෙවස්ථානයේ පූජකයාගෙන් වසන් කර ගැනිමට සිදුවී තිබෙන විට මම කෙසේ ප්‍රීතිවෙම්දැ"යි ඔහු පිළිතුරු දුන්නේය. දේවස්ථානය භාර පූජකයා රහස් පොලිසියේ ඔත්තුකරුවෙක් විය. සිය බැටළු රැල පාවා දෙන එඬේරුන් කවුරුන්දැයි අපි දනිමු. ඔබ රස විඳින පාපයෙන් ගැලවීමේ ප්‍රීතිමත් භාවය අප හදවත් තුළ ඈත ඈත තැනෙක සිට පැන නැංගද, තව දුරටත් කය උසුලා සිටිය නොහැකි විය.

කිතු දහම අපට දෘෂ්‍ය කාව්‍යයක් බඳු විය. නිදහස් කිතුනු වන්වූ ඔබ කිතු තුමන් වෙතට ආත්මයක් දිනාගන්නා කල ජීවමාන සභාවකට සාමාජිකයෙක්ද දිනා ගන්නේය. එහෙත් අප විසින් යමෙකු දිනා ගත් කල අපට සිපිරිගෙට යාමට ද, අපගේ දරු කැල අනාථයන් වන බවද හොඳින් දැන සිටියෙමු. කිතු තුමන් වෙතට ගෙන ඒමේ සොම්නස ඒ වෙනුවෙන් අපට ගෙවිය යුතුව ඇති මිලය ගැන හැඟීමක් හා එකට කැලතී පැවතුනි.

අපට හමුවීමට සිදු වූයේ සම්පූර්ණයෙන්ම නව ආකාර යක වූ රහස් සභාවේ කිතුනුවන්ය. එහි අප විස්මයට පත් කල සිද්ධීන් බොහෝ වූයේය.

තමන් කිතුනුවන් බව විශ්වාශ කලද එහි අර්ථයෙන් ශූන්‍යවූ අය සිටින්නේ යම්සේද, එසේම තමන් අදේව දෘෂ්ටික යන් බව විශ්වාශ කලද එහි අර්ථයෙන් ශූන්‍යවූ අයද සිටිති.

දිනක් කැටයම් ශිල්පී යුවලක් මා ඉදිරියේ සිටියහ. මා ඔවුන්ට දෙවියන් ගැන කීවිට දෙවියන් ජීවමානව නොමැති බව ඔවුහු "අපි බෙෂ්බොෂ්නිකි හෙවත් අදෙව දෘෂ්ටිකයෝ යයි පිලිතුරු දුන්හ. එහෙත්, අපට වූ හාස්‍යජනක සිද්ධියක් ඔබට කියමු" යයි ඔවුන් කීවෝය.

"වරක් අපි ස්ටාලින්ගේ ප්‍රතිමාව නෙලීමේ නිරත වී සිටියෙමු. වැඩ කෙරී ගෙන යද්දී මගේ බිරිඳ "ප්‍රතිමාවේ මාපටැඟිල්ල කෙසේ සාදමුද? අනෙක් ඇඟිලිවලින් මාපටැ-ඟිල්ල වෙන්ව නොතැබුවහොත් අතේ ඇඟිලි හරියට කෙලි බඩු වගේ වෙවී. එවිට අපට එහි මිටියක්, අතකොළුවක් හෝ පොතක් හෝ පාන් ස්වල්පයක් රැඳවිය නොහැක. මේ කුඩා මාපටැඟිල්ල නොමැති නම් මනුෂ්‍ය ජීවිතය ඉතාමත් කරදර කාරී එකක් විය හැකියි. කව්ද මේ මාපටැඟිල්ල හැදුවේ? අපි දෙන්නා පාසැලේදී මාක්ස්වාදය උගත් නිසා ස්වර්ගයත් පොලවත් ඉබේම පහලවුනු බව අපි දන්නවා. ඒවා දෙවියන් විසින් මවනු ලැබූ ඒවා නොවේ. මම ඉගෙන ගෙන තිබෙන නිසා විශ්වාශ කරනවා. ඒත් දෙවියන් වහන්සේ ස්වර්ගයත් පොලවත් නොමැව්වේ වී නමුත් මේ කුඩා මාපටැඟිල්ල මැවීම කරණකොට ගෙන උන්වහන්සේට ප්‍රශංසා කටයුතුව තිබෙනවා."

"විදුලි බුබුල ටෙලිපෝනය හා දුම්රිය හා වෙනත් දේ ලෝකයට හඳුන්වා දුන් එඩිසන් හට ද, බෙල් හා ස්ටීවන්සන් හටද අපි ප්‍රශංසා කරමු. එහෙත් මේ මාපටැඟිල්ල හඳුන්වා දුන් තැනැත්තාහට අපි ප්‍රශංසා නොකරන්නේ ඇයි? එඩිසන් හට මාපටැඟිල්ලක් නොතිබුනා නම් ඔහු සමහර විට කිසිවක් සොයා නොගනීවි. ඒක නිසා මාපටැඟිල්ල සෑදූ දෙවියන්ට නැමදීම නිවැරදියි" කීවාය. බිරිඳක් ඥණාන්විතව යමක් කී විට සැමියන් කෝප වන්නා සේම මෙහිදී ද සැමියා කෝපයට පත් විය. "මෝඩියක් වගේ කථා කරන්න එපා" දෙවියෙක් නැතැයි ඔබ ඉගෙන ගෙන තිබෙනවා.

දෙවිකෙනෙක් නැතැයිද සවර්ගය ද ජනශූන්‍ය බවත් නැවතත් සිතන්න. ඇය මෙසේ පිළිතුරු දුන්නාය. "ඒක ඊට වඩා පුදුමයක්නෙ. අපේ මුතුන් මිත්තන් අඥානව විශ්වාස කළ සර්වබලධාරී දෙවියන් වහන්සේ සවර්ගයේ සිටියේ නම් අපට මාපටැඟිල්ලක් තිබීම ස්වාභාවික සිද්ධියක්. සියලු බල ඇති දෙවියන් වහන්සේට හැමදේම කළ හැකිවාක් මෙන්ම මාපටැඟිල්ලක්ද සෑදිය හැකියි. එහෙත් සවර්ගයේ කිසිවකු නොමැති නම් ඒ මාපටැඟිල්ල සෑදූ "කිසිවෙක් නොමැති තැනැත්තා" හට නමස්කාර කිරීමට මම මගේ මුළු හදවතින්ම සනිටුහන් කර සිටිමි" ඇය කීවාය.

මෙසේ ඔවුහු 'කිසිවෙකු නොමැති' නැමැත්තා අදහන්නට වූහ. කාලයාගේ ඇවෑමත් සමගම ඔවුන්ගේ මේ කිසිවෙකු නොමැති තැනැත්තා කෙරෙහි වූ විශ්වාසය වර්ධනය වූයේය. ඔහු මාපටඟිල්ල පමණක් නොව තාරකාවන් පුෂ්පයන් බිළිඳුන් හා ජීවිතයේ හොභනවත් වූ සෑම දෙයකම නිර්මාතෘවරයා වශයෙන් විශයෙන් විශ්වාස කරමිනි.

එය හරියටම ශාන්ත පාවුල් තුමාහට ඇතැන්ස් නුවරදී "නොදන්නා දෙවියෙකු" හට නමදින්නන් හමුවූවාක් වැන්න.

තමන් නිවැරදිව විශ්වාශ කළා වුවද, ප්‍රේමයේත්, ප්‍රඥාවේත්, බලයේත් ආත්මය වූ දෙවියන් වහන්සේ හැර ඇත්ත වශයෙන්ම ස්වර්ගයේ වෙන කිසිවෙකු නොමැති බවද

උන්වහන්සේ සිය එකම පුත්‍රයාණෝ ලෝකයා උදෙසා කුරුසිය මත පූජාවක් වීමට එවූ බවද දැන මේ යුවල වචන විෂයාතික්‍රාන්ත ප්‍රීති ප්‍රමෝදයට පත්වූ වෝය.

ඔවුන්ට නොදැනීම ඔවුන් දෙවියන් විශ්වාශ කරන්නන් වූහ. ගැලවීම ලබාගැනිමත්, පාපයෙන් මිදීමත් සම්බන්ධව ඔවුන් හා කථා කිරීමේ මහඟු තම මොහොත මට උදාවූයේය.

වරක් එක් රුසියානු නිලධාරිනියක් මට මාවතේදී මුණ ගැසුනේය. මම ඇය වෙත පැමිණ කමාව ඉල්ලමින් "නොහඳුන කාන්තාවක් හා මාවතේදී කථාකිරම ශිෂ්ට සම්මත නොවන බව මම දන්නවා" ඒත් මම දෙවගැතිවරයෙක්. දිරිගැන්වීම මගේ පරමාර්ථයයි, මම ඔබට කිතුනුමන් ගැන කීමට අදහස් කරමි යි කීවෙමි.

"ඔබ කිතුනුමන්ට ප්‍රේම කරනවාද?" ඇය ඇසීය. "ඔව් මගේ මුළු හෘදයෙන්ම" මම කීවෙ ඇය මගේ දෙ අත් වැළඳගනිමින් යළි යලිත් මා සිපගත්තාය. පය ඉතාමත් උද්වේගකාරී මොහොතක් වූයෙන් මිනිසුන් අපි ඥතීන් යයි සිතන පරිදි පෙරලා මම ඇය සිපගතිමි. "මමත් කිතුනුමන්ට ප්‍රේමකරනවා" ඇය මුර ගැසුවාය. ඇය මගේ නිවසට කැඳවූයෙමි. කිතුනුමන් ගැන කිසිවක් ඇය නොදන්නා බව ඇසූ මම විශ්මයට පත්වූයෙමි. එතුමාගේ නම හැර මුළුමනින්ම කිසිවක් නොදැන සිටියාය. එසේ වුවද ඇය එතුමන්ට ප්‍රේම කළාය. එතුමා ගැලවුම්කාරයා හෝ බවද, ගැලවීම යන්නෙන් කුමක් අදහස් කරන්නේද කියාවත් ඇය නොදන්නිය. එතුමා කොහේ සිටියේද? කෙසේ දිවිගෙවුවේද? 'කෙසේ මියගියේ ද' යි ඇය දැන සිටියේ නැත. කිතුනුමාගේ ජීවිතයවත් ඉගැන්වීම්වත්, සේවයවත් ඇය නොදත්තාය. ඇය මට මනොවිද්‍යාත්මක ගැටළුවක් බඳුවිය. කිසිවෙකුගේ නම පමණක් ම දැන ඔහුට ප්‍රේම කරන්නේ කෙසේද?

මම ප්‍රශ්න කළවිට ඇය මෙසේ පැහැදිලි කළාය. 'දැරියක් වශයෙන් මම පින්තූර උපයෝගී කර ගනිමින් කියවීමට ඉගෙන ගතිමි. 'ඇ' අකුරින් ඇපල්ද 'සී' අකුරින් සීනුවද, 'බ' අකුරෙන් බළලා යනුවෙන් ද මම උගතිමි. මම උසස් විද්‍යාලයට ඇතුළු වූ විට මගේ ශුද්ධ වූ කාර්යයව ඇත්තේ කොමියුනිස්ට් පීතෘ භූමිය ආරක්ෂා කිරීම යයි දැන ගතිමි. කොමියුනිස්ට් සදචාර ධර්මයන් මම ඉගෙන ගතිමි. එහෙත් මේ ශුද්ධ වූ කාර්යය හෝ සදචාර ධර්මයන් කුමක් වැනිදැයි මම නොදනිමි. ඊට මට ජීවායේ පින්තූර අවශ්‍යවිය. ජීවිතයේ හැම ප්‍රසන්න දේවලට ද ප්‍රශංසා කටයුතු දේවලටද, සත්‍යවූ දේවලටද පින්තූර අපගේ මුතුන් මිත්තන්ට තිබුනු බව මම දැන් දනිමි. මගේ මිත්තනිය 'ක්‍රිස්ටෝස්' නැමැත්තකුගේ පින්තූරය ඉදිරිපිට වැඳවැටෙනු මම දැක ඇත්තෙමි. මේ නමටම මම ප්‍රේම කළෙමි. මා එක්තරා අන්දමක ප්‍රීති ප්‍රමොදයට පත්කල මේ නාමය මට ඉතා සමීප වුවක් විය 'යි ඇය කීවාය. 'එතුමාගේ නාමය ඉදිරියේ හැම දෙනාම දණ නැමිය යුතු' බව පිලිප්පි පොතේ දක්වා ඇති අයුරු ඇයට සවන් යොමා සිටින කල මට සිහි වූයේය. සමහරවිට අන්ත ක්‍රිස්තු විසින් මුළු පොලෝතලයෙන්ම දේව විශ්වාශය මකා දැමිය හැකිය. එහෙත් මේ ඉතාමත් සුළුවූ 'ක්‍රිස්තුස්' යන වචනයේ ගැබ්වී ඇත්තේ බලපාන ක්‍රමයකි. එය ආලොකය කරා මහ පෙන්වනු ඇත. ඇය ප්‍රීති ප්‍රමොදයෙන් යුක්තව කිතුතුමන් හමුවූවාය, නාමිකව ඇය ප්‍රේම කල තැනැත්තා දැන් හදවත තුල පුද්ගලයෙකුසේ සිටියි. රුසියානුවන් හා මා පසු කල හැම දර්ශනයක්ම කාව්‍යයක් බඳු වූයේය. ගැඹුරු අර්ථයක් බඳු විය. දුම්රිය පොලවලදී ශුභාරංචිය දේශනා කල සොහොයුරියක් විසින් මගේ ලිපිනය ලබා ගැනීමට රිසිවූ නිලධාරියෙකු හට එය දුන්නේය.

එක් සැන්දෑ සමයකදී,උස්වූ, ශොබන පෙනීමක් ඇති මේ රුසියානු ලයිතන්වරයා මගේ නිවසට ඇතුළු විය. ''ඔබ වෙනුවෙන් මට කුමක් කල හැකිද?'' මම ඇසුවෙමි. ඔහු ''මම ආලෝකය සොයා පැමිණ සිටිමි'' යයි පිලිතුරු දුන්නේය. ශුද්ධ ලියවිල්ලේ අත්‍යාවශ්‍ය කොටසක් ගැන

කියවූයෙමි. සිය දෙඅත් මාපිට තැබූ හේ "මම මේ අහන්නෙ මුළු හෘදයෙන්මයි. මම මංමුලා කරන්න එපා! කරුණාකර කියන්න. මෙක ඇත්තටම දේව වචනය ද කියා" මම එය සත්‍ය බව සහතික කලෙමි. පැය ගණනාවක් තිස්සේ සවන් දුන් ඔහු පසුව කිතු තුමන් පිලිගත්තේය.

ආගමික කරුණු විෂයෙහි රුසියානුවන් සිතින් නොගැඹුරුය. අදහස් වලින් නොපටුය. ඔවුන් ආගමට විරුද්ධව සටන් කරන්නේ නම් හෝ කිතු තුමන් සෙවීමට කටයුතු කරන්නේ නම් ඒ සඳහා මුළු හෘදයම කැප කරති. රුසියාවේ හැම කිතුනුවෙක්ම ආත්ම දිනීමේ යෙදී සිටින්නේ ඒ නිසාය. ශුභාරංචි කටයුතු එහි තරම් සඵලවත්ව ඇති රටක් පොලෝ-තලයේ තවත් නොවන්නේ එබැවිනි. මිහිතලය මත වසන ඉතාමසවාභාවික ආගමික මනුෂ්‍ය කොට්ඨාශයකි.රුසියානුවන් ශුභාරංචිය අපි ඒ ආකාරයෙන්ම අප ඔවුන්ට දෙන්නේ නම් ලෝකයේ මුහුණුවර වෙනස් කළ හැකිව තිබේ. රුසියාවෙන් දේව වචනය අතුගා දමා තිබෙනු පෙනෙද්දීත් රුසියානු ජනතාව දේව වචනය දැන ගැනීමේ සාගින්නෙන් පෙලෙමින් සිටීම එතරම ම ශෝකාන්තයකි.

වරක් දුම්රියේදී එක් රුසියානු නිලධාරියෙක් මා ඉදිරිපිට අසුන්ගෙන සිටියේය. ජල පහරක් බඳු සිය අදෙවදෘෂ්ටි තර්කයන් ගෙන හැර පාමින් මගේ මතය බිඳීමට ඔහු පටන්-ගන්නා විට මම කිතුතුමන් ගැන කථාකර තිබුනේ මිනිත්තු කිහිපයක් පමණි. කාල්මාක්ස්, ස්ටාලින්, වොල්වෙයාර්, ඩාවින් වැන්නවුන්ගේ උපුටාගත් මතයන් ඔහුගේ මුවින් පිටවූයේ නිරායාසයෙනි. ඔහුගේ සදෙස් බව දැක්වීමට මට අවස්ථාවක් දුන්නේ නැත. දෙවි කෙනෙකු නොමැති බව පහදා දීමට ඔහු පැය භාගයකට ආසන්න කාලයක් ගත කලේය. ඔහු කථාව නිමකළ කල්හි "දෙවිකෙනෙක් නොමැතිනම් ඔබ කරදරයකට මුහුණ පැවිට යාච්ඤා කරන්නේ ඇයි?" දැයි මම ඇසුවෙමි. සොරෙකු සොරකම් කරන මොහොතේදී මෙන් විශ්මයට පත් වෙමින් "මම යාච්ඤා කරන බව ඔබ දන්නේ කෙසේද?" යි ඇසීය. මම ඔහුට ගැලවී-යාමට ඉඩ නොහලෙමි. "මම අහන්නේ මුලින් කී ප්‍රශ්නයමයි.

ඇයි ඔබ යාච්ඤා කරන්නේ?'' කරුණාකර කියන්න.'' ඔහු හිස නමා වරද පිළිගත්තේය. අප වටා සිටියේ ජර්මන් ජාතිකයෝය. අපි හැමදෙනාම යාච්ඤා කලෙමු. එය කෙසේ කරමුදැයි අප දැන සිටියේ නැත. එබැවින් අප කීවේ මෙසේය. ''ආත්මයේ මාතෘවරිය වූ දෙවියනි!'' යනුවෙනි. හදගැබට එබිකම්කර බලන කල්හි එය ඉතා යහපත් යාච්ඤාවක් වූයේය.

රුසියානුවන්ට අප කල සේවය මහත්සේ එල ගෙන දුන්නේය.

පීටර් ගැන මට හොඳට මතක ඇත. කුමන හිරගෙදරකදී ඔහු මියගියේ දැයි කිසිවෙකු දැන නොසිටියේය. විසි වයස් තරුණයෙක් වූ ඔහු රුමේනියාවට පැමිණියේ රුසියානු හමුදාව සමගය. රහස් සභාවේ රැස්වීමකදී කිතුතුමන් පිළිගත් හෙතෙම තමා බෞත්තීස්ම කරන ලෙස මගෙන් ඉල්ලා සිටියේය. බෞතීස්මයෙන් අනතුරුව ඔහු කිතුතුමන් වෙත ඒමට පොළඹවනු ලැබුවේ බයිබලයේ කුමන පදය දැයි මම ප්‍රශ්න කළෙමි. රහස් සභාවේ රැස්වීමකදී මා කියවූ ශුද්ධවූ ලූක් ශුභාරංචියයේ 24 පරිච්ඡේදයේ වූ ඒ පදයට තමා සාවධානව සවන් යොමුකල බව ඔහු පැවසීය. එහිවූයේ එමාවුස් බලා ගිය ශ්‍රාවකයන් දෙදෙනා හට කිතුතුමන් මුන ගැසීම ගැනය, ඔවුහු ගම්මානය ගැම්පවුකල උන්වහන්සේ වඩා දුරයන ආකාර දැක්වූ සේක. ''මම පුදුම වන්නේ ක්‍රිස්තුස්වහන්සේ මෙසේ කීවේ ඇයිද කියායි'' පීටර් පැවසීය. ඇත්ත වශයෙන්ම කිතුතුමන්ට ශ්‍රාවකයන් සමග නතරවිය යුතුව තිබුනි. එසේ තිබියදීත් තව දුරටත් යාමට අදහස් කරන බව කීවේ ඇයි? ''උන් වහන්සේ ''ආචාරශීලීය'' යි මම පැහැදිලි කළෙමි. ඔහු ආශාකල දේ සහතිකවිය යුතු බව ඔහු බලාපොරොත්තු විය. යමෙකුට නිවසකට ඇරයුම්කලවිට ඔහු ඔවුන් හා එහි යන්නේ ඉතාමත් ප්‍රීතියකිනි. කොමියුනිස්ට් වරු ආචාරශීලීත්වයෙන් තොරය. ඔවුන් අපේ හදවත් වලටත්, සිත් වලටත් ඇතුළුවන්නේ බලාත් කාරයෙනි. හිම්දිරියේ සිට මැදියම් රැය දක්වා ඔවුන්ට සවන්දෙන ලෙස බලකර සිටිති, ඔවුන් එසේ කරන්නේ

පාසැල්, ගුවන් විදුලිය, ප්‍රවෘත්ති පත්‍ර, දැන්වීම් චිත්‍රපට හා අදේවදෘෂ්ටි රැස්වීම් මගින්ය. ඔබ හැරෙන හැම දිහාවකම ඒවා ඇත. ඔබ කැමති හෝ වේවා අකමැති හෝ වේවා අදේව දෘෂ්ටි ප්‍රචාරක කටයුතු වලට නිරන්තරයෙන්ම සවන් දිය යුතුමය. කිතු තුමන් අපගේ නිදහස ගරුකරන සේක, ඔහු දොරට තට්ටු කරන්නේ මෘදු ස්වරයෙකිනි. "යේසුස්වහන්සේ මා දිනාගත්තේ එතුමන්ගේ ආචාරශීලි බව තුලිනි." පීටර් පැවසීය. කොමියුනිස්ට් වාදයත් කිතු තුමාත් අතර වූ මේ සම්පූර්ණ වෙනස සනාථ වීමෙන් ඔහු එතුමා පිළිගෙන ඇත. කිතුතුමන්ගේ චරිතය තුලවූ මේ ගුණාංගයන් නිසා පොළඹවනු ලැබූ රුසියානුවා ඔහු පමණක් නොවේ.

ඔහුගේ කැප වීමෙන් පසු රහස් සභාවේ ආධාර පිණිස රුමේනියාවේ සිට රුසියාවට ක්‍රිස්තියානි පත්‍රිකා, ආදිය වරින් වර රහසින් ගෙන ඒමට පීටර් සිය නිදහස, - ජීවිතය,- අන්තරායයේ තබමින් ක්‍රියා කලේය. අවසානයේ දී ඔහු අල්ලා ගන්නා ලදි. 1959 වනතුරු ද ඔහු සිපිරිගෙයි සිටි බව මම දනිමි. ඔහු මිය ගියේද? ඔහු මුළුමනින්ම ස්වර්ගයේ ද? නැතහොත් සිය සගයන් සමග මිහිතලය මත තවදුරටත් කරන්නේ කෙසේදැයි දන්නේ දෙවියන් පමණකි.

ඔහු මෙන්ම අනිකුත් අයද කැපවීමෙන් පමණක් නොනැවතුනි කිතුතුමන් වෙත ආත්ම ගෙන ඒමෙන් පමණක් අප නොනැවතෙමු. ඉන් අප කරන්නේ කාර්යයෙන් අර්ධයක් පමණි. කිතු තුමන් වෙත එන හැම දෙනෙක්ම තවත් අය එතුමන් හට දිනා ගන්නා අයවළුන් කළ යුතුය. රුසියානුවෝ කැපවීමෙන් පමණක් නොනැවතුනාහු රහස් සභාවේ ධර්ම දූතයන් බවට පත් වූහ. ඔවුහු අප්‍රවේසම් කාරීහුය. නිර්භය කිතු තුමන් උදෙසා මලහොත් එය ඔවුන්ට කල හැකි ඉතාමත්ම අල්ප වූ දෙයකි.

## වහල් ජනතාවවෙත අපි සේවය කලෙමු

අපේ රහස් සභාවේ දෙවැනි ශාඛාව වන්නේ රුමේනියානු ජනතාව අතර කරන දේව සේවයයි. කොමියුනිස්ට් වරුන් ඉතා ඉක්මනින් ඔවුන්ගේ වෙස් මුහුණු

දමනු ඇත. ආරම්භයේ දී ඔවුන් සභාව නොමග හැරීමේ ප්‍රයත්නයක යෙදුනෙන් භයානකත්වයක් උදවිය. දහස් ගණනක් සිරකරන ලදි. කිතු තුමන් වෙත කෙනෙකුගෙන් ඒම සිත් සසල කරවන සිද්ධියක් විය.

පසුකාලයකදී දේව අනුග්‍රහයෙන් කිතු තුමන් වෙතට ගෙන ආ පිරිසක් සමග එකම සිරමැදිරියක මම සිටියෙමි. කිතුනු විශ්වාශය උදෙසා සිය දරුවන් සය දෙනා හැර පියා සිපිරිගෙට ආ අයෙකු අප සමග සිටියේය. ඔහුගේ බිරියද දරුවන්ද සාගින්නෙන් පෙලුනෝය. යළි ඔහුට ඔවුන් කිසිදක දකීමට හැකිවූයේ නැත. "මම ඔබ කිතු තුමන් වෙතට ගෙන ආ නිසාත් බිරිය හා දරුවන් එතරම් සාගින්නකින් පෙලෙන නිසාත් ඔබ මා කෙරෙහි කෝප වන්නෙහි ද?" මම ඇසුවෙමි. "මේ ආශ්වර්යමත් ගැලවුම්කාරයාණන් වෙතට ගෙන ආ ඔබට ස්තුතිය ප්‍රකාශ කිරීමට මට වචන නොමැත." "මම කිසිදක අන් අයුරකින් එය තේරුම් නොගනිමි."යි ඔහු කීවේය.

නව වාතාවරණය යටතේ සේවය කිරීම අපහසු එකක් විය. කුඩා ක්‍රිස්තියානි පොත් මුද්‍රණය කරවා දැඩි කොමියුනිස්ට් ප්‍රවෘත්ති පරීක්ෂණයක් තුලින් සම්මත කරවා ගැනීමට අපට හැකි විය. ප්‍රවෘත්ති පරීක්ෂක මංඩලයට ඉදිරිපත්කල පොතේ පිට කවරයේ වූයේ කොමියුනිස්ට් වාදයේ නිර්මාතෘවර කාල්මාක්ස්ගේ ඡායාරූපයකි. "ජනතාවට ආගම අබිංබදුය"යි ඊට සරිලන නමකින් පොත හැඳින්වූවෙමි. කල්පනා කොට බැලූ හෙතෙම පොත මත මුද්‍රාව තැබුවේ ඒවා කොමියුනිස්ට් පොත් යැයි අදහස් කොටය ප්‍රවෘත්ති පරීක්ෂක මංඩලය තුටුපහටුවන අන්දමින් කාල්-මාක්ස්, ස්ටාලින්, ලෙනින්, වැනි අයගෙන් උපුටා ගත් අදහස් වලින් මුල් පිටු කිහිපය පුරවා පසුව අපි කිතු තුමන් ගැනවූ අපේ පණිවුඩය දුන්නෙමු.

රහස් සභාවේ රහස් වන්නේ කොටසක් පමණි. එය හරියටම පාවෙන හිම කඳු බඳුය. එළිමහනේ ක්‍රියා කරන්නේ ඉත් කුඩා කොටසකි. කොමියුනිස්ටවරු වෙතට

ගොස් කරුණු පහද දී මේ කුඩා පොත් බෙද හැරියෙමු. පිට කවරයේ කාල් මාක්ස් ගේ ඡායාරූපය වූ මේ පොත් මිලදී ගැනීමට ඔවුන් පොරකෑහ. පසුව දහවැනි පිටුව තෙක් කියවූ කල්හි යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ ගැන වූ සියල්ල ඔවුනට හමුවෙයි. ඒ වනවිට අප බොහෝ ඈතට ගොසිනි.

මේ තත්වය යටතේද දේශනා කිරීම අපහසු විය. අපේ ජනතාව බොහෝ පීඩාවන්ට ලක්වූහ. කොමියුනිස්ට්වරු හැම දෙනෙකුගෙන්ම හැම දෙයක්ම පැහැර ගත්හ. ගොවියා ගේ කුඹුරුද, බැටළුවන්ද, කරණ්වෑමියාගෙන් හා සන්නාලියන්ගෙන් ඔවුන් සතු කුඩා කඩයද ගත්හ. ඉඩම් අත්පත් කරගත්තේ ධනවාදීන් පමණක් නොවේ. ඉතා දුගියන්ද දැඩි ලෙස පීඩා විඳිති. හැම පවුලකින් කෙනෙකු බැගින් සිරගෙවල සිරකරුවෝ වූහ. දරිද්‍රතාවය මහත් විය.

ප්‍රේමයේ දෙවියන් නපුරුකමේ ජයග්‍රහනයට ඉඩ දෙන්නේ කෙසේද?'' මිනිසුන් ප්‍රශ්න කලහ.

''මාගේ දෙවියනි! මාගේ දෙවියනි!! ඔබ මා අත් හැරියේ මන්ද?'' යි කියමින් කිතුතුමන් මියගිය මහ සිකුරාද දිනවල දේශනා කිරීමට එකල සිටි අපොස්තළුවරුනට පහසු එකක් වූවා විය හැක. සත්‍යය නම්, ඒ සිදුවූ කටයුත්ත එය දෙවියන් කෙරෙන් වූවා මිස මිනිසා වෙතින් නොවන බව සනාථවීමය. කිතුනු විශ්වාශය තුල එබඳු පැන වලට පිළිතුර ඇත.

දැන් අප දැඩිලෙස පීඩා විඳින අයුරින් දිළිඳු ලාසරස්ද පීඩා විඳි බව කිතුතුමන් අපට කී සේක. ඔහු සාගින්නෙන් මිය යමින් සිටියේය. ඔහුගේ තුවාල බල්ලන් විසින් ලෙව කෑවෝය. එහෙත් අවසානයේ සුරදූතයෝ ඔහු ආබ්‍රහම්ගේ ළපැත්ත කරා ගෙන ගියහ.

**රහස් සභාව සුළු වශයෙන් එළිමහනේ කටයුතු කලේ කෙසේද?**

රහස් සභාව පුද්ගලික නිවෙස් වලදීද, කැලයෙහිදීද, රහස් කාමරවල දීත් හැකි සෑම තැනකදීම රැස්වෙති එළිමහනේ රහසින් සේවය කිරීමට නිතරම සූදානම්ය. කොමියුනිස්ට්වරුන් යටතේ වීදිවල දේශනා කිරීමට අපි රහසින් උපා යෙදුවෙමු. කාලය ඉතා අන්තරාය කාරිවිය. මේ අන්දමින් මිස වෙනත් අයුරකින් හමුවිය නොහැකි බොහෝ පුද්ගලයන් අපට හමුවිය හැකිවිය. මගේ බිරිඳ මේ ගැන අසා අතිශයින්ම කාර්ය ශූර වූවාය. කිතුනුවෝ කිහිපදෙනෙකු වීදි කොනකට රැස්ව සෙමින් ගිතිකාවක් අරඹති. මේ කන්කළු ගී ඇසීමට සෙනඟ රොක් වූ විට මගේ බිරිය දේශනාව ඇරඹුවාය, අනතුරුව රහස් පොලිසිය පැමිනිමට මත්තෙන් අපි එතැනින් පලායමු. බුකාරස්ට් නගරයේ ඇති 'මලස්කා' කර්මාන්ත ශාලාව ඉදිරිපිට මගේ බිරිඳ දහස්ගණනක් කම්කරුවන් අමතා දෙවියන් වහන්සේ හා පාපයෙන් ගැලවීම ගැන දේශනා කලාය. පසුවද කොමියුනිස්ට් පාලකයන්ගේ අයුක්ති සහගත ක්‍රියා කලාපයන් නිසා කැරලි ගැසූ කම්කරුවන්ට වෙඩි තබන ලදී. එවකට ඔවුන් ගැලවීමේ පණිවුඩය අසා තිබුනා පමණි, අපි රහස් සභාවට අයත් වුවද යොහන් බෞතීස්ත බඳුවිය. අපි එළිමහනේ දී පාලකයන්ටත් පාලිකයන්ටත් කිතුනුමන් ගැන කියා සිටියෙමු.

වරක් රජයේ ගොඩනැගිල්ලක ඉණි පෙලේ ගමන් කරමින් සිටි අප සොහොයුර දෙදෙදෙනෙක් ඉදිරියට පැමිණි අගමැති ජෝර්ජියු ඩෙජ් මහතා හට මහ හැරීමට දෙපසට වූහ. ඒ සුළු මොහොතේදී ඔහුගේ පාපයෙන් හා වධක ක්‍රියාවලින් හැරී කිතුනුමන් වෙතට එන ලෙස ඔහු පොළඹවමින් ඉල්ලා සිටියාය. ඔවුන්ගේ මේ නිර්භීත ඉල්ලීම නිසා ඔවුන් සිපිරිගෙට යවන ලදී වසර කිහිපයකට පසු මේ අගමැතිවරයා තදබල ලෙස රෝගාතුරවිය. ඊට වසර ගණවාකට පෙර පැලකරන ලද ඔවුන් පිඩාවට පැමිණවූ ශුභාරංචි බීජයේ එල හටගෙන තිබුනි. අධාර අවශ්‍යාව සිටි මේ මොහොතේ තමාට

කියා තිබුණු වචන ඔහු සිහි කළේය. බයිබලයේ කියන පරිදි මේ වචන "දෙමුවහත් කඩුවකට වඩා තියුණුයි. ඔහුගේ හදවතේ වූ තියුණු බව ඔවුන් කපා දමූ කල්හි හේ කිතුතුමන්ට අවනත විය. සිය ප්‍රාණපාච්චරණය කල හෙතෙම රෝගාතුරවම කිතුතුමන්ට සේවය කළේය. මඳ කලක් ඇවෑමෙන් ඔහු අළුතින් හමුවුනු ගැලවුම් කාරයානන් සොයා ගියේය. මේ සියල්ලම සිදුවූයේ මිලය ගෙවීමට ඉදිරිපත්වුනු ඒ කිතුනුවන් දෙදෙනා නිසාය. ඔවුන් අදදින කොමියුනිස්ට් දේශයන්හි සිටින ධෛර්යම කිතුනුවන්ගේ ආකාරය පෙන්වයි.

රහස් සභාව මෙසේ රහසිගතව රැස්වීම් පැවැත්වුවා පමණක් නොව නිර්භීතව එළිමහනේදී ද, මාවත්වලදී ද හා කොමියුනිස්ට් නායකයන් හට ද දේශනා කළෝය. ඒ සඳහා ගෙවිය යුතු මිලක් වූයේය. අපි ඊට සූදනම්ය. අද දින වුවද එය ගෙවීමට රහස් සභාව සූදනම්ය. රහස් පොලිසිය රහස් සභාවට මහත්සේ පීඩා කරයි. රහස් සභාවට එසේ විරුද්ධවීමෙන් පමණක් ප්‍රතිඵලයක් ලද හැකි බව ඔවුන් තේරුම්ගෙන ඇත. එබඳු ආත්මික විරෝධයකට එදිරිව නොසිටිය හොත් එය ඔවුන්ගේ අදේවදෘෂ්ටි බලයට වින කරනු ඇත. ඔවුන් පිළිඅරගෙන ඇත්තේ යක්ෂයාට පමණක් ඔවුන්ට විරුද්ධ විය හැකි බවය කිතුතුමන් තුල විශ්වාශ කරන කිසිවකු කිසි දිනක සිහිකල්පනාවෙන් තොර නොවන බව ද උන්වහන්සේට කීකරුවූ කෙනෙකු වන බවද ඔව්හු දන සිටියෝය. පුද්ගලයකු සිරකරලිය හැකි වුවද ඔහු තුල ඇති දේවවිශ්වාශය සිරකරලිය නොහෙන බව ඔවුන් දත්හ. මේ හේතුවෙන් ඔව්හු තවත් තදින්ම සටන් කලහ.

එහෙත් රහස් සභාවට අනුකම්පාව දක්වූ සාමාජිකයෝ රජයේ දෙපාර්තමේන්තුවලද රහස් පොලිසියේ ද සිටියෝය. කිතුනුවනට රහස් පොලිසියට බැඳෙන ලෙස ද, අපේ වෛරයට මෙන්ම පිළිකුලට ද ලක්වූ

නිල ඇඳුම ඇඟලාගන්නා ලෙසට ද අපි උපදෙස් දුන්නෙමු. එවිට ඔවුන්ට රහස් සභාව වෙත රහස් පොලිසියේ කටයුතු දක්විය හැකිවිය. අපේ සොහොයුරන් කීප දෙනෙකු සිය ඇඳිහිල්ල මුවා කර ගනිමින් එය ඉටු කලේය. සිය පවුලේ සාමාජිකයන් පිලිකුල් කරද්දීත් කොමියුනිස්ට් නිල ඇඳුමක් ඇඳ, ඉටුකරන තමාගේ නියම දූත මෙහෙවර කිමෙක්දැයි හෙලි නොකර සිටිම එතරම් පහසු කාර්යයක් නොවේ. එහෙත් ඔවුන් එය ඉටු කලහ. ඔවුන්තුල වූ කිතුතුමන් වෙත පිදු ප්‍රේමය එපමණම මහත්වූයේය.

මාවතේ මා සිටින විටදී පැහැරගෙන ගොස් වසර ගණනාවක්ම හිර කරගෙන සිටියෝය. ඒ බව හෙලිවී කිතිනු වෛද්‍යවරයෙක් මා සෙවීමේ අටියෙන්ම රහස් පොලිසියේ වෛද්‍යවරයෙක් වූයේය. සියලුම සිරමැදිරිවල වෛද්‍යවරයා ලෙස පත්වී මා කොහිදැයි සෙවීමට අදහස් කලේය. ඔහු කොමියුනිස්ට් වාදියෙකු වී යයි සිතා මිතුරෝ ඔහු කෙරෙන් බැහැරව ගියහ. සිරකරුවෙකුගේ ඇඳුම අදිනු වෙනුවට වධකයෙකුගේ ඇඳුම ඇඟලා ගැනීම කිතුතුමන්ට කරන පූජාවක් සේ ඔවුහු සැලකුවෝය.

ගැඹුරුවූ සිර මැදිරියක සහ අඳුරේ සිටි මා හමුවුනු වෛද්‍යවරයා මම ජීවත්ව සිටින බව පිටතට දන්වා හැරියේය. මගේ අවුරුදු අටහමාරක පළමු සිපිරි ජීවිතයේ දී හමුවූ ප්‍රථම මිතුරා ඔහු වූයේය. ඔහුට නය ගැතිවන්නට මම ජීවත්වන බව ප්‍රචාරය කර හරින ලදී. 1956 දී වූ අයිසන්හවර් – කෘෂෙව් සම්මුතියේදි සිර කරුවන් මුදා හරින කල මමද මුදා හරින ලෙස කිතුනුවෝ ආයාචනා කළහ. මම කෙටි කලකට පමණක් නිදහස රස වින්දෙමි.

විශේෂයෙන්ම මා සෙවීමේ අටියෙන්, මේ කිතුනු වෛද්‍යවරයා රහස් පොලිසියට නොබැඳුනේ නම් මම මේ වනතුරුද නිදහස් නොකරනු ඇත. සමහරවිට මම අද දින සිපිරිගෙයි හෝ සොහොන් ගැබක් තුල විය හැක.

රහස් පොලිසියේ තමන් දරන තිලය උපයෝගී කර ගනිමින් රහස් සභාවේ සාමාජිකයෝ අපට බොහෝ විට අනතුරු හැඟවූ අතර ඒවා මහත් අනුබලයක් වූයේය. කිතුනුවන් කරා එළඹීමට ඇති අන්තරායන්ගෙන් ඔවුන් ආරක්ෂා කිරීමට රහස් සභාවට අයත් සාමාජිකයෝ රහස් පොලිසිය තුල සිටිති. පාලක පක්ෂයේ කටයුතු වල වැදගත් තනතුරු උසුලන අය කිතුනුවන් කෙරෙහි වූ සිය ඇදහිල්ල රහසිගතව තබාගෙන අපට මහත් ආධාරෝපකාර ලබා දෙති. දැනට කිතුනුවන්ට රහසින් සේවය කලද කිසියම් දිනක ඔවුන්ට ස්වර්ගයේදී එතුමාට ප්‍රසිද්ධියේම සේවය කල හැකිය.

කෙසේ වුවද රහස් සභාවේ බොහෝ සමාජිකයෝ සොයා ගනු ලැබ සිරගෙවල දමන ලදී. අප ගැන රහස් පොලිසියට කරුණු සැපයූ යුදස් වැනියවුන් ද අප සමඟ සිටියහ. ස්වකීයයන් ගැන කරුණු හෙලි කරන ලෙස දේවගැතියන්ට හා දේව සේවයට කැපවූ කිතුනුවන්ට කොමියුනිස්ට්වරු පහර දුන්හ. ඔවුන්ට මත් ද්‍රව්‍ය පෙවූ අතර, ව්‍යාජ ලියකියවිලිද උපයෝගී කර ගත්හ.

දෙවැනි අදියර

# මිනිසා තුල නොවූ විරූ මහා ප්‍රේමය

1948 පෙබරවාරි මස 29 ද වනතුරු මම රහසින් මෙන්ම ප්‍රසිද්ධියේ ද දේව සේවය කළෙමි. එක් පියකරු ඉරු දිනයක මාවත දිගේ දෙවස්ථානය කරා පිය නගමින් සිටින විට රහස් පොලිසිය විසින් මා පැහැරගෙන ගියෝය.

බයිබලයේ කිහිප අවස්ථාවකම සඳහන්ව ඇති මිනිසුන් පැහැරගෙන යාම කෙබඳුදැයි පුදුමයට පත්වූයෙමි. එය කොමියුනිස්ට් වාදය මගින් උගන්වනු ලැබීය.

මේ කාලය තුල බොහෝ අය ඒ අයුරින්ම පැහැරගෙන යනු ලැබීය. මා ඉදිරිපිට නතර කල රහස් පොලිස් වෑන්රිය තුලින් එලියට පැනගත් සිව්දෙනෙකු මා රථය තුලට ඇද දැමූහ, මා සඟවාගෙන ගොස් වර්ෂ ගණනාවක් ගත වූයේය. අටවසරක කාලයක් තිස්සේ මා ජීවත්ව සිටී ද නැතහොත් මිය ගොස්දැයි කිසිවෙක් නොදත්හ. මගේ බිරිය සිරිගෙට පැමිණි විටක මා හා සිට නිදහස් කල සිරකරුවන් බව හඟවමින් ඉදිරිපත් වූ රහස් පොලිස් භටයෝ, ඔවුන් මගේ අවමඟුල් උළෙලට සහභාගි වූ බව කීවෝය. ඇයගේ හදවත සිදී බිදී ගියේය.

මේ දිනවලදී සියලුම නිකායනට අයත්වූ කිතුනුවෝ දහස් ගණනක් සිරගෙට යවන ලදහ. පූජකයන්ද, සාමාන්‍ය වැසි-යන්ද, තරුණයන් පමණක් නොව ගැහැණු ළමුන්ද ඔවුන්ගේ ආගමික විශ්වාශය නිසා සිරගෙට ගියහ. රුමේනියාවේ

පමණක් නොව සියළුම කොමියුනිස්ට් රටවල සිපිරිගෙවල් පිරි ඉතිරීගොස් ඇත. එහි සිරගෙට යාම යනුවෙන් අදහස් කරන්නේ වධ වේධනා වලට ලක්වීමය.

සමහර විටෙක එහි වධ වේධනා සිත් සසලකරවන සුළු විය. මට පසුකරන්නට සිදුවූ දේවල් ගැන බොහෝ කථා කිරීම මම ප්‍රිය නොකරමි. රාත්‍රියේ නින්ද පවා නොය යි. ඒවා එතරම්ම ම පීඩා කාරීවූයේය. "කොමියුනිස්ට් සිපිරිගෙයිදී කිතු තුමන් හමුවෙයි" නමැති ග්‍රන්ථයේ දෙවියන් සමග අප ලැබූ අත්දැකීම් බොහෝ විස්තර සහිතව දක්වා ඇත.

## වධ බන්ධන කිව නොහැකි තරම්ය.

ජ්ලොරිස් කිච් නමැති දෙව්ගැති වරයාට ගිණියම්කල යකඩ කූරු වලින් හා පිහිවලින් පීඩා කරනු ලැබීය. ඔහුට දරුණු ලෙස පහර දී තිබුනේ ය. විශාල පයිප්පයක් දිගේ සාගින්නේ පෙලෙන මීයන් රැසක් ඔහුගේ සිර කුටිය තුලට යවන ලදී. ඔහුට නිදි නැතිවූවා පමණක් නොව මුළු කාලය තුලම මීයන්ගෙන් ආරක්ෂාවීමට සිදුවිය. එක මොහොතක් හෝ ඔහු පමා වුවහොත් මීයන් හපාකනු ඇත.

පුරා දෙසතියක්ම දිවා රෑ මුළුල්ලේම සිටගෙන සිටීමට ඔහුට බල කරන ලදී. ස්වකීයයන් පාවාදෙන ලෙස කොමියුනිස්ට්වරු බල කර සිටියහ. එහෙත් ඔහු ඊට දැඩි ලෙස විරෝධය පල කලේය. අවසානයේ ඔහුගේ දහතර හැවිරිදි පුත්‍රයා ඔහු ඉදිරියට ගෙනැවිත් කසපහර දෙන්නට විය. ඔවුන් විසින් බලකරන දේ හෙලි කරන තුරු එසේ නොකඩවා පහරදෙන බව කීවෝය. මේ දිලිඳු මනුෂ්‍යයා උම්මත්තකයෙක් බඳු වූයේය. ඉවසා ගෙන සිටිය හැකි තරම් ඔහු සිට අන්තිමේදී එය දරාගත නොහී මෙසේ මුර ගෑවේය. "ඇලෙක්සැන්ඩර්! ඔවුන්ට ඕන දේ මම දූත් කියන්න ඕන. තම දූරටත් ඔබට පහරදෙනවා මට බලා ඉන්න බැහැ!" "ද්‍රෝහී පියෙක් වීමෙන් මට අසාධාරණයක් කරන්න එපා. විරුද්ධවම සිටින්න." ඔවුන් මා මරාදැම්මත් මම මැරෙන්නේ

යේසුනි! මාගේ පිතෘ භූමිය!! යනුවෙන් කියමිනි!! යි පුත්‍රයා පිළිතුරු දුන්නේය. කෝපයෙන් දැවීගිය ඔව්හු ළමයා බිම ඇද දමා මැරෙන තෙක්ම පහර දුන්නෝය. සිර කුටියේ බිත්ති පුරා ලේ විසිරී ගියේය. ඔහු දෙවියන් වහන්සේට ස්තුති කරමින් දෙනෙත් පියා ගත්තේය. මෙය දුටු අපේ ප්‍රිය සොහොයුරු ජලොරිස්කිව් ඉන්පසු කිසිදිනෙක ප්‍රකෘති මානසික තත්වයෙක් නොවිය.

ඇතුල් පැත්තෙන් තියුණු ඇණ තිබුනු මාංචු අපේ අත් වලට දමනු ලැබීය. අප නිසලව සිටියහොත් ඉන් හානියක් නොවෙයි. එහෙත් සිරකුටි තුල ඇති දරාගත නොහැකි ශීතලෙන් වෙව්ලා ගියහොත් ඒ තියුණු ඇණ වලින් අත් ඉරියයි.

සිරකරුවෝ දෙපා උඩට සිටින සේ එල්ලා දමන ලදී. අනතුරුව සිරුර දෙපසට පැද්දී යන විට දරුණු ලෙස පහර එල්ල කරන ලදී. අතිශයින්ම දරුණුවූ ශීතකරණ තුලට සිරකරුවන් දමන ලදී. ඔවුන්ගේ සිරුරේ වූයේ යන්තම් වැර හැල්ලක් පමණි. පරීක්ෂාවෙන් බලා සිටින වෛද්‍යවරයා ඔහු දරුණු ශීතලෙන් මියයන ලකුණු පෙන්වූ වහාම ඉන් ඉවතට ගෙන උණුසුම් කාරන ලෙස රැකවල් කරුවනට අනදෙයි. ඇඟේ මිදුනු හිම දියවී උණුසුම්වූ වහාම යළිත් ශීතකරණය තුලට දමයි. එහිතුල මිනිත්තුවක් හෝ දෙකක් සිටීමෙන් මරණය පවා එළඹෙයි. මෙය නිමක් නැතිව කරන ලදී. මේ නිසා අද දින පවා මට ශීතකරනයක් විවෘත කල නො හැකි තරම්ය.

සිරකරුවන් ඔවුන්ට වඩා යන්තම් ලොකු වූ පෙට්ටියක් තුලට දමනු ලබත් ඊට පසු ඔවුන්ට එහි හැරෙන්නට වුවද ඉඩක් නැත. පසුව තියුණු උල් ඇණ වලින් ලැල්ල සිදුරු කරති. නොසෙල්වී සිටිනතාක් කල් ඒ තුල සිටිය හැක. පැය ගණනාවක්ම ඒ තුල සිට ගෙන නොසෙල්වී සිටීමට වධකයෝ

බල කරති. එහෙත් වෙහෙස මහන්සිය නිසා පසෙකට ඇලව ගිය හොත් තියුණු උල් සිරුරතුලට කාවදියි. අතක් පයක් හෝ එහා මෙහා කල හොත් බියකරු ඇණ තුඩු එහි ඇනෙයි.

මනුෂ්‍යයාට තේරුම්ගත හැකි ආකාරයට වඩා හොඳින් කොමියුනිස්ට් වරුන් මේවා සිදුකර ඇත. කිතුනුවනම වධ වේධනා පමුණුවන විට වධකයන්ගේ මුහුණුවල ප්‍රීතිය ඉපිලී යනු මම දුටුවෙමි. ඒ අතරතුර වධකයෝ "අපි යකායෝ"යි මුර දුන්නෝය.

"මක්නිසාද අපේ පොරබැදීම ලේ හා මාංසයට විරුද්ධව නොව අධිපතිකම් වලටත් ස්වර්ගීය සේනාවල, දුෂ්ට කමෙහි ආත්මික සේනාවලටත් විරුද්ධවය," කොමියුනිස්ට් වාදය මනුෂ්‍යයාගෙන් නොව යක්ෂයාගෙන් ආවක් බව අපි දනිමු. එය ආත්මික බලවේගයකි. දුෂ්ටකමේ බලවේගයකි. ඊට විරුද්ධ විය හැකි එකම බලය නම් ඊට වඩා බලගතු බලවේග යක් වූ දෙවියන් වහන්සේය.

මම නිතරම වධකයන්ගෙන් "ඔබගේ හදවතේ දයානු-කම්පාවක් ඇත්තේම නැද්ද? කියා ඇසුවෙමි. එවිට ඔවුන් සාමාන්‍යයෙන් කීවේ ලෙනින්ගේ උද්ධෘත පාඨයකි. එනම් "බිත්තර කවුව බිඳින්නේ නැතිව ඔම්ලට් එකක් හදන්න බැහැ, තවත් විටෙක කෑලි විසිනොවෙන්න ගහක් කප්පන්න බැහැ" යනුවෙනි. එවිට මම මෙසේ කීවෙමි. ලෙනින්ගේ කීම මම දන්නවා. එහෙත් එතන වෙනසක් තිබෙනවා. ගහක් කපනකොට ඊට වේදනාව නොදැනෙයි. එහෙත් මේක කරන්නේ මිනිසුන්ට ගසන හැම පහරක්ම වේදනා උපදවනවා මච්වරුන් ඒ නිසා වැලපෙනවා. මගේ ප්‍රයත්නය නිෂ්ඵල විය. ඔවුහු ද්‍රව්‍යවාදීහු ය. ඔව්හු බිත්තරයක, ලී කැබැල්ලක හෝ මිනිසෙකුගේ වෙනස නොහඳුනති. මේ ආකාරවූ විශ්වාශයන් කරණ කොටගෙන ඔවුහු කෲරත්වයේ පතුලේ ගිලී සිටියි.

අද්වෛ දෘෂ්ටියේ කෲරත්වය දෙසවන් ඇදහිය නොහැකි තරමය. මිනිසකු තුල යහපත් ක්‍රියාවක හෝ දෙන ත්‍යාගයක් ගැන හෝ ඔහුගේ නපුරුකමට දෙනදඬුවමක් ගැන විශ්වාශයක් නොමැති කල්හි ඒ පුද්ගලයාගේ මිනිස් බව ලැබීම අර්ථ විරහිත එකකි. එවිට 'මිනිසා හා නපුරුකමේ පාතාලයෙන් වැලැක්වීමක් එහි නොමැත. වධකයන් නිතරම කියන්නක් නම් "දෙවිකෙනෙක් නැත. මින්පසු කිසිවක් නැත. නපුරට දඬුවමක් නැත. අපට සිතුවක් කල හැක." යනුවෙනි. වධකයෙක් මෙසේ කියනු ඇසුවෙමි." මගේ හදවත තුල තිබෙන සියලුම දුෂ්ටකම් ඉෂ්ටකර ගැනීමට පුළුවන්වූ විට මම විශ්වාශ නොකරන දෙවියන්හට ස්තුති කරමි" යන්නය. ඔවුන් ඒවා ප්‍රකාශ කරන ලද්දේ සිරකරුවනට පැමිණවූ දරුණු වධවේධනා වලිනි. විශ්වාශකල නොහෙන තරම් කෲරක්‍රියා වලිනි.

කිඹුලෙකු මිනිසෙකු ගොදුරු කරගත් කල මම අතිශයින්ම තැවෙන්නෙමි. එහෙත් ඌට අවවාද කළ නොහැක. ඌ ශිෂ්ට සත්වයෙක් නොවන බැවිනි. එහෙත් කොමියුනිස්ට් වරුන්ටද අවවාද කළ නොහැකිය. කොමියුනිස්ට්වාදය ඔවුන් තුලවූ ශිලාචාර හැඟීම් නසා දමා ඇත. ඔවුන්, සිය හදවත්වල දයානුකම්පාවක් නොමැතිබව කියන්නේ ආඩම්බර යෙනි.

මම ඔවුන්ගෙන් උගතිමි. "ඔවුන්ගේ හදවත් කුටිය තුල කිතු තුමන්ට ඉඩක් වෙන් නොකලාක් මෙන්ම මගේ හදවත තුලද යක්ෂයාහට සියුම් තැනක් හෝ ඉඩ නොහරින්නෙමැයි" මම ඉටාගතිමි.

එක්සත් ජනපද සෙනේට් සභාවේ අභ්‍යන්තර ආරක්‍ෂක උපකමිටුව ඉදිරියේ මම සාක්ෂි දුන්නෙමි. කිතුනුවන් පුරා දින හතරක් දිවා රෑ තිස්සේ කුරුසියකට බැඳ දැමූ හැටි මම විස්තර කළෙමි. කුරුසියට බැඳදමා ඇති තැනැත්තාගේ සිරුරමත සියගනනක් සිරකරුවන් සිය සිරුරු කිස කිරීම් ආදිය කිරීමට සිදුවිය. අනතුරුව කුරුසිය කෙලින් සිටුවා

විහිළු කරමින් අපහසකල වධකයෝ "උඹලාගේ ක්‍රිස්තුස් දිහා බලාපල්ලා! මිනිහා කොච්චර ලස්සනද? ආහ්! ස්වර්ග යෙන් එන සුවඳ කොච්චර මිහිරිද? යනුවෙන් කීවෝය. එවැනි වධ පැමිණවීමෙන් අනතුරුව එක් පූජක වරයෙකුට අශූචි හා මුත්‍ර ශුද්ධවූ රාත්‍රී භෝජනය ලෙස බෙදදෙන ලෙස බල කරන ලදී. මෙය සිදුවූයේ රුමේනියාවේ පිටෙස්ටි සිර ගෙදර දීය. "මේ විහිළුවලට ලක්වනවාට වඩා මැරෙන එක හොඳ නේද? මම ඔහු ගෙන් ඇසුවෙමි. "කරුණාකර මම විනිශ්චය කරන්න හදන්න එපා මම කිතු තුමන්ට වඩා දුක්වින්ද." ඔහු පැවසිය, බයිබලයේ සඳහන් වන අපායේ සියලු ආකාරයේම විස්තරද ඩාන්ටෙ වෙදනා ගැන ලියූ හැම විස්තරයක්ම කොමිනියුස්ට් සිරකඳවුරුවල වධ බන්ධන හා සමාන කර බලන කල්හි කිසිවක් නොමැති තරම්ය.

මෙය පිටෙස්ටි සිපිරිගෙය තුල ඒ ඉරුදිනයේ දී ද අනෙක් ඉරුදිනයන්හිදීද සිදුවූ දේ වලින් බිඳක් පමණි. අනෙකුත් දේ සාමාන්‍යයෙන් කිව නොහැකි තරම්ය. මේ සිද්ධීන් යලි යලිත් පැවසුවහොත් මගේ හදවත අඩපණවී යනු සිකුරුය. අසහ්‍යය. මේවා ඔබේ කිතුනු සොයුරු සොයුරියන් පසු කලාවූද පසු කරමින් සිටින්නාවූ ද දේවල්ය. පූජක මිලාන් හැයිමොවිසි ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේට විශ්වාසව සිටීමේ වීර වරයෙකි.

සිරගෙවල් පිරී ඉතිරී ගොසින් තිබුනු හෙයින් රැකවල්-කරුවෝ අප නම් වලින් නොදන සිටියහ. සිර කඳවුරු නීති උල්ලංඝනය කිරීමේ චෝදනාවට විසිපස්වරක් කසපහර ගැසීමට නියම කල සිරකරුවන්ට ඊට ඉදිරිපත්වන ලෙස කී විට ගණන්කල නොහැකි තරම් වාරගණනක් එම සිරකරුවන් වෙනුවෙන් මේ පූජකවරයා ඉදිරිපත් විය. මේ ක්‍රියාව නිසා මේ පූජකතුමා පමණක් නොව එතුමා විසින් නියෝජනය කරනු ලැබූ කිතු තුමන් ද සිරකරුවන් ගේ ගෞරවයට පාත්‍රවිය.

තවදුරටත් කොමියුනිස්ට්වරුන්ගේ භීෂණයන්ද කිතුනුවන්ගේ ජීවිත පූජාවන්ද, පමණක් නොව වීර ක්‍රියාවන් හා වධ බන්ධනයන් පැවසීමට ගියහොත් මට එහි නිම දැකිය නොහැකිය. මේ සිරකරුවන්ගේ ධීර වීර ක්‍රියාවන් නිදහසේ රස විඳිමින් සිටින සහෝදරයන් දිරිමත් කිරීමට සමත්විය.

රහස් සභාවට අයත් සේවකයන් අතර එක් තරුණියක් වූවාය. ඇය රහසිගතව ශුභාරංචිය පතල කරන බවත් ළමුනට ද කිතුනුමන් ගැන කියා දෙන බවත් රහස් පොලිසිය විසින් හෙළිකරගන්නා ලදුව ඇය සිර කිරීමට ඔවුහු තීරණය කලෝය. සිරගෙයි ලීම වඩාත් පීඩා දෙන අයුරින් සිදුකිරීමට අදහස්කල ඔවුහු ඇයගේ විවාහය සිදුකරන දින එලඹෙන තෙක් එය කල් තැබූහ. මේ තරුණ ළඳගේ ජීවිතයේ අතිශයින්ම විශ්මයජනක මෙන්ම සොම්නසින් පිරි ඉතිරීගිය මේ දිනයේ දී හදිසියේම දොර තල්ලුකර දමමින් රහස් පොලිසිය නිවස තුලට කඩාවැදුනහ.

රහස් පොලිස් භටයන් ඇගේ දෙනෙතට ලක්වූ කල්හි ඇය සිය දෙඅත මාංචු දමනු පිණිස ඔවුන් වෙත දිගු කලාය. දයා විරහිතව ඔවුහු ඇගේ දෙඅතට මාංචු දැම්මෝය. ස්වකීය ප්‍රියයා දෙස නෙත් යොමු කල ඇය අනතුරුව මාංචුව සිපගනිමින් මෙසේ පැවසුවාය. "මගේ විවා මඟුල් දිනයේ දී ස්වර්ගීය මනාලයා විසින් මේ මැණික ප්‍රදනය කල හෙයින් ස්තුති කරමි. ඔහු වෙනුවෙන් පීඩා ඉසිලීමට තරම් මම වටිනා හෙයින් ඔහුට ස්තුති කරමි." කිතුනුවන් ද මනාලයා ද සොවින් වැළපෙමින් සිටි අතර ඔවුන් ඇය ඇදගෙන ගියහ. කොමියුනිස්ට් රැකවල්කරුවන් අතට පත්වූ කිතුනු තරුණියකට අත්වන ඉරණම ඔවුන් සියල්ලෝම දැන සිටියහ. පස්වසරක් ඇවෑමෙන් පසු මුදා හරින ලද්දේ ජරාජීර්ණවූ, සිදී බිදී ගිය, තිස්වසරක තරම වයස් ගිය වැනි ගැහැනියකි. ඇය එනතුරු මනාලයා බලා සිටියේය. එය කිතුනුමන් වෙනුවෙන් ඇයට කරන්නට හැකිවූ ඉතා සුළුකාරියකැයි ඇය පැවසුවාය. මෙවැනි පියකරු කිතුනුවෝ රහස් සභාවේ සිටිති.

## මනස විකෘති කිරීම කෙබඳුද?

කොරියානු යුද සමයේදීද, අද වියට්නාමයේද කෙරෙනු ලබන මනස විකෘති කිරීම ගැන සමහරවිට ලාංකිකයන් අසා සිටිනු විය හැක. මට ද මනස විකෘති කිරීම තුලින් යාමට සිදුවිය. එය අතිශයින්ම බියකරු වධයකි. දිනකට පැය දහහතක්ම බැගින් පුරා සිව්වසරක් තිස්සේ අපිට සවන් දීමට සිදුවූයේ මෙයටය.

කොමියුනිස්ට්වාදය හොඳය!
කොමියුනිස්ට්වාදය හොඳය!
කොමියුනිස්ට්වාදය හොඳය!
කොමියුනිස්ට්වාදය හොඳය!

ක්‍රිස්තියානි ආගම මෝඩකමකි!
ක්‍රිස්තියානි ආගම මෝඩකමකි!
ක්‍රිස්තියානි ආගම මෝඩකමකි!

අත්හැරපන්!
අත්හැරපන්!!
අත්හැරපන්!!!
අත්හැරපන්!!!!

දිනකට පුරා දහහත් පැයක්ම, දින ගණන්, සති ගණන් මාස ගණන් මීට කන්දීමට අපට සිදුවිය.

බොහෝ කිතුනුවන් මගෙන් ප්‍රශ්න කලේ 'අපි කෙසේ මනස විකෘති කිරීම මැඩ පැවැත්වූවෝද?'' යන්නය. මනස විකෘති කිරීමට ඇත්තේ එකම එක දෙයකි. එනම් හදවත සෝද නිර්මලව තබා ගැනීමය. කිතු තුමන්ගේ ප්‍රේමයෙන් හදවත සෝද ඇත්තේ නම්, ඔබේ හදවත තුල එතුමන් කෙරෙහි ප්‍රේමයක් ඇත්තේ නම්, පැමිණෙන හැම වධබන්ධනයක්ම මැඩලිය හැකිවනු ඇත. පෙම්වත් මනාලියක් සිය ප්‍රේමණීය මනාලයා වෙනුවෙන් කුමක් නොකරන්නේද? ප්‍රේමණීය මවක්

සිය බිළිඳා වෙනුවෙන් කුමක් කිරීමට මැලිවන්නේද? මරියා බිළිඳු කිතුතුමන්ට ප්‍රේම කලේ යම්සේද? එසේම ඔබද කිතුතුමන් කෙරෙහි ප්‍රේමය දක්වන්නේ නම් එවැනි වධ වේධනාවන් මැඩ පැවැත්වීමට හැකිවනවා ඇත.

දෙවියන් වහන්සේ අප විනිශ්චය කරන්නේ අප කෙතරම් දුරට ඉවසීමේ පසුවූ අන්දමින් නොව අපි කොපමණ දුරට උන්වහන්සේට ප්‍රේම කළේද්ද'යි යන්න අනුවය. කොමියුනිස්ට් සිර ගෙවල සිටින සිරකරුවන්ට ද අන් අය කෙරේ ප්‍රේමය දැක්විය හැකි බවට මා සාක්ෂියකි. ඔවුන්ට දෙවියන් වහන්සේට මෙන්ම මිනිසාට ද ප්‍රේම කළ හැකිය.

වධවේධනා පැමිණවීම කිසිම බාධකයකින් තොරව කරගෙන යන ලදී. ඒ අතර මගේ ප්‍රකෘති සිහිය නැතිව ගියේ නම් හෝ තවදුරටත් යමක් මගෙන් දැනගැනීමට අපහසු තරම් මානසික පෙරළියකට ගොදුරුව ඇතැයි හැඟීගියේ නම් මා යලිත් සිරමැදිරිය කරා ගෙනයනු ලැබීය. මම එහි බාගෙට මැරි එකම ඉරියව්වකින් බිම වැතිරී සිටින්නේ යලිත් වධ බන්ධන වලට ලක්කිරීමට තරම් බිඳක් ශක්තිය එනතුරු පමණි. මේ අවස්ථාව බොහෝ දෙනෙකුට මරු කැඳවන සුළුවිය. එහෙත් කිසියම් අයුරකින් යලි ආපසු යන අන්දමට මගේ සවිය රැකී තිබුනි. ගෙවී ගිය වසර කිහිපය තුලදී සිර කඳවුරු ගණනකදී ඔවුන් මගේ පිටකොන්දේ ඇට හතරක් ද, තවත් ඇට බොහෝ ගණනක් ද කඩා බිඳ දමන ලදී. මගේ සිරුර පිලිස්සූහ. සිරුරේ සිදුරු දහඅටක්ම කපා දැමූහ.

මේ සියල්ලටම පසු ක්ෂය රෝගයෙන් පෙනහැල්ලේ ඇතිවී තිබුනු සිදුරු පරීක්ෂාකර බැලූ ඔස්ලෝහි වෛද්‍යවරු මම තවදුරටත් ජීවත්වීම ඔවුන්ගේ වෛද්‍ය ග්‍රන්ථවලට අනුකූලව බලන කල්හි මහා නාස්තියක් හැටියට ප්‍රකාශ කළහ. මීට සිව් වසරකට පෙර මම මිය යා යුතු විය. මම එය හාස්කමක් බව දනිමි. දෙවියන් වහන්සේ හාස්කම්වල දෙවි කෙනෙකි.

යකඩ තිරයෙන් ඔබ්බෙහි වූ රහස් සභාව උදෙසා හඬ දෙන මගේ හඬට සවන්දීමට ඔබට හැකි වන සේ මේ විශ්මය ජනක දේ දෙවියන් වහන්සේ සිදු කළ බැව් මම අදහම්. දුක් පීඩාවන් තුල වේදනාවෙන් පීඩිතව සිටින විශ්වාසවන්තවූ සහෝදරයන් කෙරෙන් මේ හස්න ඔබ වෙත කියා පෑමට දෙවියන් වහන්සේ මම මිය යා නොදී ඉන් පිටතට ඒමට ඉඩ හල සේක.

## කෙටි නිදහසකින් පසු යලි සිපිරිගෙට

1956 වසර එළඹුනි. අවුරුදු අටහමාරක් පමණ මම සිරබත්වල රස විඳ තිබුනි. මගේ සිරුරේ බර අඩුවී ගියේය. ඉතා අවලක්ෂණ ලෙස ලකුණු ඇති විය. කෲර ලෙස පහර කෑවෙමි. පා පහර වලට ලක් වූයෙමි. උවහසට ලක් වීමි. සාගින්නෙන් පීඩිත වූයෙමි. මඩිනු ලැබීමි. ප්‍රශ්න කරනු ලැබුවෙමි. කසපහර කෑවෙමි. අත්හැර දමනු ලැබීමි. මේ කිසිවකින්වත් මා තුල ඇති භක්තියට හානි කරන ප්‍රතිඵල ගෙන දුන්නේ නැත. අධෛර්යයට පත් ඔවුහු මා නිදහස් කලහ. එසේ වුවද තවමත් ඔවුහු මා සිර කිරීමට මානබලමින් පසු වූහ.

මගේ ප්‍රථම තත්වයේ සිටීමට ඉඩ හලේ එක් සතියකට පමණි. මම දේශනාවන් දෙකක් පැවැත්වූයෙමි. අනතුරුව මා කැඳවූ ඔවුහු තව දුරටත් මට ආගමික කටයුතුවල නිරත වීමට දිය නොහැකි බැව් පැවසුවෝය. මට කීමට තිබුනේ කිමෙක් ද? මම දයකයන් රැස් කරවා, ඉවසන්න! ඉවසන්න! හැකිතාක් ඉවසන්න!! යැයි කීවෙමි'යි පැවසුවෙමි.'' ''ඒකෙ තේරුම ඇමරිකන්කාරයො ඇවිත් ගලවගන්න තෙක් ඔහේ නිකම්ම ඉවසගෙන ඉන්නද?'' පොලිස් භටයෝ මුර ගෑසූහ. ''කාලය කැරකෙන රිය සක මෙන් වෙනස් වෙනවා'' මම පැවසුවෙමි. ''ඔබ ඔවුන්ට කියන්නෙ කොමියුනිස්ට් පාලනය තවදුරටත් තියෙන්නෙ නැහැ කියල ද? මේවා විප්ලවයට විරුද්ධ බෙගල්'' ඔවුන් මුර දුන්හ. එය මගේ ප්‍රසිද්ධ දේව සේවයේ අවසානය වූයේය.

යලිත් රහස් සභාව වෙත ගොස් සේවය කිරීමෙන් ඔවුන්ට විරුද්ධව ක්‍රියා කිරීමට මා බිය වෙතැයි ඔවුන් සමහර විට සිතුවා විය හැකිය. ඔවුන්ට වැරදුනේ එතැනදීය. මීට පෙර කළ කටයුතු වලම මම රහසින් නිරත වීමි. මට මගේ පවුලේ සහයෝගය ලැබුනේය. භූතයන් තරමටම අතිශයින් රහසි ගතව මා වෙතට ආ ගිය විශ්වාසය තැබිය හැකිවූ රහස් කටයුතුවල යෙදුනු කණ්ඩායම් වලට මම සාක්ෂි දරුවෙමි. නපුරු අද්වෛ දෘෂ්ටියේ පරමාර්ථය ගැන මගේ පණිවුඩය ප්‍රකාශ කිරීමටත් දෙවියන් වහන්සේ විශ්වාස කිරීමටත්, නිර්භීත වීමට හා මිනිසුන් ධෛර්යමත් කිරීමටත් මේ වර මගේ සිරුරේ තිබුනේ තුවාල කැලැල්ය. කොමියුනිස්ට් වරුන්ගේ දෙඇස් දෙවියන් වහන්සේ විසින් ආවරණය කලෙන් එකිනෙකාට ආධාර කරගත් අප සොහොයුරන් අතර මම රහසින් ශුභාරංචි කටයුතු සම්පාදනය කළෙමි. සියල් ලටම පසු ක්‍රියාකාරීව ඇති දේව හස්තය නොදකීමට තරම් මිනිසා අන්ධ වී නම් ශුභාරංචි ප්‍රචාරකයාද නොදකිනු ඇත.

පොලිසිය මගේ කටයුතු සෙවීමේ නොනවතින අභිප්‍රාය අවසානයේදී මුදුන් පමුණුවා ගත්තේය. යලිත් මම සොයා ගනු ලැබ සිපිරිගෙට යැවීය. මා ලබා තිබුනු ප්‍රසිද්ධිය නිසාම මේ වර මගේ පවුලේ සාමාජිකයෝ සිරගෙට නොදැම්මා විය හැකිය. වර්ෂ අටහමාරක් සිර බතේ රස වින්දෙමි. අනතුරුව තුන් වසරක් නිදහස්ව සිටියෙමි. දැන් තවත් වර්ෂ පහමාරක ටත් අධික කාලයක දඬුවමකට නියම වී සිටිමි.

මගේ දෙවැනි වර සිපිරි ජීවිතය ප්‍රථම වරට වඩා අතිශ යින්ම භයානක විය. පැමිනෙන්නට ඇති දේ ගැන මට හොඳ දැනීමක් තිබුනේය. මගේ ශාරීරික සෞඛ්‍යයට ඉක්මනින්ම ඉතා භයානක අන්දමින් නරක අතට හැරී ගියේය එහෙත් අපි සිරගෙය තුළ රහස් සභාවේ කටයුතු තවදුරටත් පවත්වා ගෙන ගියෙමු.

අපි වෙළඳාමක් ඇරඹිමු අපි දේශනා කළෙමු. ඔවුහු පහර දුන්හ.

තවත් සිරකරුවෙකුට දේශනා කිරීම තදින්ම තහනම් කර තිබුනේය. එසේ කොට අසුවුවහොත් ඔහු ඉතා තදබල ලෙස පහර දීම්වලට ලක්වෙයි. දේශනා කිරීමේ මා හැකි මොහොත නියා ඒ මිලය ගෙවීමට අපි එක්තරා පිරිසක් තීරණය කරගතිමු. අපි ඔවුන්ගේ නියමයන් පිලිගතිමු. එය හරියටම වෙළඳාමක් බදු විය. අපි දේශනා කරමු. එවිට ඔවුන් අපට පහර දෙති. දේශනා කිරීමෙන් අපි සොම්නස්වීමු. අපිට පහර දීමෙන් ඔවුහු සොම්නස් වූහ. ඒ අනුව දෙපසම ප්‍රීතිවූවෝය.

මම පහත යදහන් කරනදේ, මට සිහිපත්කලහැකි වාර ගණනටද වඩා වැඩියෙන් සිදුවූයේ ය. එක් සොහොයුරෙක් දේශනා කරමින් සිටින විට හදිසියේම රැකවල් කරුවන් ඉතා සීරුවෙන් පැමිණියෙන් ඔහු විස්මයට පත්ව දේශනාව අතරමඟ නතර කලේය.ඔවුහු ඔහු බිම දමා ඉස්තෝප්පුව දිගේ පහරදෙන කාමරය කරා ඇදගෙන ගිය හ. පසුව දුටුවේ කුමක් ද? නිමක් නැතිව පහර දීමෙන් පසු ලෙයින් නාගත්, ඇඟ පුරාම සීරීම් තුවාල තිබූ ඔහු සිපිරිගෙට තල්ලුකර දැම්මය. සෙමින් සෙමින් මඩිනු ලැබ, වේදනාවෙන් පීඩිත වූ සිරුර කෙලින් කරගත් හෙතෙම සිය ඇඳුම සකසා ගෙන මෙසේ පැවසුවේය. "ඉතින් සහෝදරවරුනි, මම හදිසියේම නතර කර ගියේ කොතැනද?" හේ යළිත් සිය දේශනාව ඇරඹුවේය.

මම ඉතා පියකරු දේ දැක ඇත්තෙමි.

සමහර විට දේශනාකරුවා දේව සේවයට කැපවූවෙක් පමණි. ශුද්ධාත්මය විසින් ජ්වලිත කරන ලදුව සාමාන්‍ය මිනිසුන් ඉතා චමත්කාර ජනක අන්දමින් දේශනා කළෝය. ඔවුන්ගේ හදවත් ඔවුන්ගේ වචන තුල ගැබ් වී තිබුනේය. අඩුවම් ලෙස පැමිණෙන මෙවැනි සිද්ධි අතරෙහි දේශනාකිරීම

ඔවුනට එතරම් සැලකිය යුතු නොවූ කරුණකි. එවිට රැකවල් කරුවෝ පැමිණ දේශකයා ඉවතට ඇදගෙන ගොස් බාගෙට මැරෙන තරම් පහරදෙති.

ගෙරිලා සිර කඳවුරේදී ශ්‍රෙසු නමැති කිතුනුවාට මැරෙන තෙක් පහර දීමට නියම කරන ලදී. පහර දීම සති කීපයක් තිස්සේ කෙරී ගෙන ගියේය. පහර දීම සිදු කළේ ඉතා හෙමිනි. එක වරකදී ඔහුගේ යටි පතුල් වලට රබර් පොල්ලකින් පහර දුන්නේය. අනතුරුව නතර කරන ලදී. නව මිනිත්තු කිහිප යකින් යලිත් පහර දෙන ලදී. ඔහුගේ අණ්ඩකෝෂයට පහර දෙන ලදී. අනතුරුව වෛද්‍යවරයෙක් ඔහුට ඖෂධයක් විදින ලදී. ඉතා හොඳ පෝෂ්‍යදායි ආහාර දෙනු ලදුව ඔහු සුවපත් වී නව පණක් ලබයි. යලිත් පහර දෙනු ලැබීය. මෙසේ යලි යලිත් පහර දීම හේතුවෙන් ඔහු මලවුන් අතරට ගියේය. මේ වධ දීම මෙහෙය වූයේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුවූ රෙක් නැමැත්තාය.

කොමියුනිස්ට්වරුන් කිතුනුවන්ට නිතරම මෙසේ කියන් නාක් මෙන් රෙක් ද සහෝදර ශ්‍රෙසු හට මෙසේ කියන්නට ඇත. "නුඹ දන්නවා ද? දෙවියෝ මමයි. නුඹේ ජීවිතයත් මරණයත් අතර බලය තිබෙන්නේ මා අතේ. ස්වර්ගයේ සිටින තැනැත්තාට නුඹ තුල ප්‍රාණය රඳවන්නේදැයි තීරණය කරන් නට බැහැ. හැම දෙයක්ම ඇත්තේ මා අතේ. මට හිතුනොත් නුඹ මරනවා. මම තමයි දෙවියා" එසේ ඔහු කිතුනුවන් උපහාසයට ලක් කරති.

මෙ බියකරු අවස්ථාවේදී සහෝදර ශ්‍රෙසු විසින් රසවත් පිළිතුරක් ශ්‍රෙසුට දුන්නේය. මෙය රෙක් විසින්ම මට පසුව කියන ලදී. "ඔබ කී කථාවේ ගැඹුරු තේරුම ඔබ දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම ඔබ දෙවි කෙනෙක්. නියම අයුරින් වර්ධනය වීම සිදු වූවහොත් හැම දළඹුවෙක්ම සමනල යෙක් වනු ඇත. ඔබ මවා ඇත්තේ මිනිසුන් මරා දමන වධකයෙක් වීමට නොව දෙවියෙකුගේ ආකාරයට පත් වනු පිණිසය. උන්වහන්සේ මෙලොව සිටි සමයේ යුදෙව්වන්

අමතා "නුඹලා දෙවියන්" යැයි පැවසූ සේක. දේවත්වයේ ජීවිතය ඔබේ හදවත තුලය." ශාන්ත පාවුල් වැනි වූද ඔබ වැනි වූද වධකයෝ මිනිසෙකු දුෂ්ට ලෙශ ක්‍රියාකිරීම ලජ්ජාවට කරුණකැයිද ඔවුන්ට ඊට වඩා යහපත් ක්‍රියාවන්හි නිරත විය හැකි යයිද අවබොධ කර ගත්හ. මෙසේ ඔවුහු දේව ස්වභාවයේ කොටස්කරුවෝ වූවෝය. රෙක් මහත්මයාණෙනි; මා විශ්වාස කරන්න. ඇත්ත වශයෙන්ම ඔබ කැඳවා ඇත්තේ දෙවියෙකු වීමටය. වධකයෙක් නොව දේවත්වයේ ස්වරූප යට පත් වනු පිණිසය."

තමන් අභිමුඛයේදී මරා දමනු ලැබූ ස්තෙවන්ගේ මතාහර ශාක්ෂියට ටාර්ශස් හි පාවුල් එතරම් අවධානය යොමු නො කලේ යම්සේද, එසේම රෙක් ද තමන්ගේ ගොදුර වූ මේ සිර කරුවාගේ වචන කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකරන ලදී. එහෙත් ඒ වචන ඔහුගේ හද සන්තානයේ රැව් දුන්නේය. යථා කාලයේ දී මෙය තමන්ගේ නියම කැඳවීම බව රෙක් අවබෝධ කර ගත්තේය.

කොමියුනිස්ට් වරුන්ගේ සියලු පහර දීම්, වධ බන්ධන, කෲර ක්‍රියාවන් නිසා මහත් පාඩමක් ආරම්භ වූයේය. "එනම් ශරීරයේ ස්වාමියා ආත්මය" බවය. වධ බන්ධන වලට ලක් වන කල්හි අපි වේදනාවෙන් පීඩිත වූයෙමු. බොහෝ විට එය අපට පෙනුනේ ආත්මය කෙරෙන් දිගන්තය තෙක් ගෙන යන ලදුම. කිතු තුමන්ගේ මහිමය අබියසෙහිදී නොපෙනී ගිය කිසිවක් පරිද්දෙනි.

සතියකට වරක් දෙන පාන් පෙත්තෙන්ද, දිනපතා දෙන අපිරිසිදු ගෝවා සුප්වලින්ද දෙවියන් වහන්සේගේ කොටස වෙන් කිරීමට තරම් අවංකව සිටීමට අපි තීරණය කළෙමු. හැම සති දහයකටම වරක්ම අපිට ලැබෙන පාන් පෙත්ත ඉතාම දුර්වල සහෝදරයාට දුන්නේ ස්වාමීන්වහන්සේට උන් වහන්සේගේ කොටස දෙන ලෙසිනි.

එක් කිතුනුවෙකු මරණ දඬුවමට යටත් කරන ලදී. මිය යාමට පෙර ඔහුට බිරිය බැලීමට ඉඩ දෙන ලදී. බිරිය ඇමතූ ඔහුගේ අන්තිම වචන වූයේ "මරා දමන අයට ප්‍රේම කරමින් මා මිය යන බව ඔබ දැන ගත යුතුය. ඔවුන් කුමක් කරන්නේද'යි ඔවුහු නොදනිති. ඔවුන්ට ද ප්‍රේම කරන ලෙස මම අවසාන වශයෙන් ඉල්ලමි. ඔබේ ප්‍රියයා මරා දැමූ හෙයින් ඔවුන් කෙරේ සිතේ කහටක් තබා ගන්න එපා. අප ස්වර්ග යෙහිදී හමුවෙනු ඇත." මේ යුවලගේ සාකච්ඡාවට සවන්දී සිටි රහස් පොලිස් නිලධාරියාගේ සිතු තුලට කා වැදී ගියේය. පසුව ඔහු කිතුනුවෙකු වීම නිසා සිපිරිගෙයි දමා සිටින විට මේ කථාව මට පවසන ලදී.

ටිර්හු ඔක්තා නම් සිරගෙයි මැට්විවිසි නම් තරුණ සිරකරුවෙක් විය. ඔහු සිරගත වූයේ දහඅට වැනි වියෙහිදීය. විඳින්නට වූ වධවේදනා නිසා ඔහු ක්ෂය රෝගයෙක් වූයේ ය. ඔහුගේ පවුලේ අය ඔහු මේ සිරගුහාවේ සිටින බව කෙසේ නමුදු දැන මරණයේත් ජීවිතයේත් වෙනසක් සිදු කිරීමට සමත් "ස්ට්‍රෙප්ටොමයිසින්" නැමැති ඖෂධය අඩංගු බෝතල් සියයක් යැවීය. මැට්විවිසි කැඳවූ හිරගෙදර දේශපාලන නිලධාරියා පාර්සලය පෙන්වමින් "මෙන්න නුඹේ ජීවිතය ගලවා ගත හැකි බෙහෙත"යි පැවසීය. "ඒ වුණත් ඒක නුඹට බලා ගන්න තහනම් පුද්ගලිකව මම කැමතියි නුඹට උපකාරයක් කරන්න. නුඹ තවම කොලු ගැටයෙක්! නුඹ හිරගෙදර මැරි යනවාට මගේ කැමැත්තක් නැහැ. නුඹට උපකාරයක් කරන්න නම් මට උපකාරයක් කරන්න ඕන. නුඹේ අනෙක් සිරකරුවන් ගැන තොරතුරු කියන්න ඕන එවිට මගේ උසස් නිලධාරීන්ට කියන්න පුලුවන් මේ පාර්සලය නුඹට දුන් හේතුව"යි පැවසීය. මැට්විවිසි පිලිතුරු දෙමින් "ජීවිතය රැකගෙන කැඩපත තුලින් ද්‍රෝහියකුගේ මුහුණ බැලීමට මට ලැජ්ජයි." ඒ වගේ තත්වයක් පිලිගන්න මට පුලුවන් කමක් නැහැ. මම මරණයට ඊට වඩා කැමතියි." රහස් පොලිස් නිලධාරියා ඔහුට අත දෙමින් "ඔබට බොහොම ස්තුතියි! වෙන පිලිතුරක් මම බලාපොරොත්තු වුනේ නැහැ. ඒත් මම තවත් යොජනාවක් කරන්න කැමතියි. සමහර සිරකරුවෝ

අපේ ඔත්තුකරුවෝ වී තිබෙනවා.ඔවුන් නුඹට විරුද්ධව වැරදි කියනවා. ඔවුන් දෙපිට කාට්ටුවෝ. අපට ඔවුන් කෙරේ විශ්වාශයක් තියන්න බැහැ. අපි අවංකවම දැනගන්න කැමතියි ඔවුන් මොන විධියේ පුද්ගලයෝද කියා. ඔවුන් ඔබට ද්‍රෝහී වෙලා ඔබේ ක්‍රියාවන් කථාවෙන් අපට දැන්වීමෙන් ඔබට කරන්නේ මහත් පාඩුවක්. ඔබේ සහෝදරයන් පවාදෙන්න ඔබට අනවශ්‍ය බව මම තේරුම් ගන්නවා. ඒ වුනත් ඔබේ එදිරිකාරයන්ගේ ඔත්තු අපට කියන්න. එවිට ඔබේ ජීවිතය ගලවාගන්න හැකිවේවි.''යි කීවේය.

මැට්ව්විසි වහා පිලිතුරු දෙමින් මම කිතුතුමන්ගෙ ශ්‍රාවකයෙක්! උන්වහන්සේ අපට උගන්වා ඇත්තේ අපේ සතුරන්ට පවා ප්‍රේම කරන ලෙසයි. දුෂ්ටකමට දුෂ්ටකමේ තිළිණයක් දෙන්න මට බැහැ. මට ඔවුන්ට විරුද්ධව ඔත්තුවක් කියන්න බැහැ. මම ඔවුන්ට අනුකම්පා කරමි. ඔවුන් උදෙසා යාච්ඤා කරමි. කොමියුනිස්ට් වරුන් සමග සම්බන්ධයක් තබාගන්නට මගේ බලාපොරොත්තුවක් නැහැ.'' දේශපාලන නිලධාරියා හා කල සාකච්ඡාවෙන් පසු පෙරලා පැමිණි මැට්ව්විසි මා සිටි එම සිර මැදිරියෙහි දීම මියගියේය. ඔහු දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් මලවුන් අතරට යනු මම බලා සිටියෙමි. ජීවිතයේ ස්වාභාවික පිපාසාවන් පරයා ප්‍රේමය ජයග්‍රහණය කර ඇත්තේය.

දිලින්දෙක් සංගීතය කෙරෙහි අනුපමේය ආශාවක් දක්වන්නේ නම් ඔහු සතු අන්තිම ශතයද ගෙවා ඊට සවන් දෙයි. එවිට ඔහුට මුදල් නොමැති වුවද ඉන් තමා පරාජය වී යයි නොදනෙයි. ඒ ඔහු ඉතා කන්කලු ගීතයකට සවන් දී ඇති හෙයිනි.

සිපිරිගෙයි ගතකල වර්ෂ ගණනාව මා ලද පරාජයකැ'යි මට නොදනෙයි. මම චමත්කාරජනක දේ දැක ඇත්තෙමි. සිපිරිගෙහිදී මම දුබලයන් සමඟද, නොසලකා අත් නොහැරිය යුතු වුවත් සමඟද සිටියෙමි. ප්‍රථම ශතවර්ෂයේ දී වාසය කල කිතුනුවන්ට සමකල හැකි මහා ශ්‍රද්ධාවන්තයෝ, ඇදහිල්ලේ

වීරවරයෝ සමග එකම සිරමැදිරියේ සිටීමේ මහඟුතම අවස්ථාව මම ලද්දෙමි. කිතුනුමන් උදෙසා ප්‍රීති ප්‍රමොදයෙන් යුතුව ඔවුහු මරණය කරා ගියහ. මෙවැනි ශ්‍රද්ධාවන්තයන්ගේද, ඇදහිල්ලේ වීරවරයන්ගේ ද ආත්මික ප්‍රියංකරත්වය කෙදිනක හෝ විස්තර කල නොහැක්කේමය.

මම පවසන දේ මෙහි එතරම් විශේෂ වූ දේවල් නොවේ. ස්වභාවධර්මතාවයේ විෂයය පරයන සුළු දේ රහස් සභාව කිතුනුවන්ට ස්වභාවික දේවල් බවට පත්වූයේය.

රහස් සභාව නම් ප්‍රථම ප්‍රේමය කරා එළඹ ඇති සභාවය.

සිපිරිගෙට යන්නට මත්තෙන් මම කිතුනුමන්ට දැක්වූයේ ඉමහත් ප්‍රේමයකි. සිපිරිගෙය තුලදී මම කිතුනුමන්ගේ මනාලිය - උන්වහන්සේගේ ආත්මික ශරීරය - දැක ඇති හෙයින් යම්සේ කිතුනුමන්ට ප්‍රේම කරත්නේ ද එසේම රහස් සභාවටද ප්‍රේම කරන බව පැවසිය යුතුය. ඇගේ ප්‍රියංකරත්වය ද, පූජාවීමේ ආත්මය ද මම දුටුවෙමි.

## මගේ බිරියට හා පුත්‍රයාට වූයේ කුමක්ද?

මම බිරිය කෙරෙන් ඉවත් කරනු ලැබීමි. ඇයට කුමක් සිදුවූයේදැයි මම නොදන්නෙමි. වසර ගනනාවකට පසු ඇයද සිපිරිගෙටලු බව මම ඇසුවෙමි. කිතුනු ගැහැනියක් මිනිසෙකුට වඩා සිරගෙයිදී පීඩාවිඳියි. කෲරතර රැකවල් කරුවෝ තරුණියන් දූෂණය කලෝය. එහි වූ උපහාස කිරීම හා අසභ්‍යදේ සිත් සසල කරවන සුලුය. වරක් කපා ගෙන යමින් තිබුනු ඇලක බර වැඩ කිරීමට ගැහැනුහට බල කරන ලදී. මිනිසෙකු කරන වැඩ කොටසම ගැහැනියක විසින්ද නිම කල යුතු විය. ශීත ඍතුවේ ඔහු ස්කොප්පය කිත් පස් ඉවත් කලහ. අශෝභන හැසිරීම් මුල්තැන ගත්තේය. ඇදහිල්ල නිසා කරන වධදීම් තරහයක සිරි ගත්තේය. දිවි රැක ගැනීමේ අටියෙන් මගේ බිරිය තණ කොළ කැවේය. ඇලෙහි

සේවයෙහි නිරතවූ සාගින්නෙන් පීඩිතවූ සිරකරුවෝ මීයන් හා සර්පයන් වැනිදේ අහර කොට ගත්තේය. ඉරුදින දී රැකවල්කරුවන්ට විනෝදය ගෙන දෙන කාර්යයක් විය. එනම් ගැහැනියක් ඩැනියුබ් ගඟට විසිකර යලි ඇය ගොඩට ඇද ගැනීමය. ඇගේ තෙත සිරුර දුටුවිට ඔවුන් කවටකම් කරති. යලි ඇය ගඟට විසිකර යලිත් ගොඩට ඇදගනී. මගේ බිරියද මේ අයුරින් ඩැනියුබ් ගඟට විසිකරන ලදී.

මගේ පුත්‍රයා වෙතින් ඔහුගේ දෙමාපියන් ඉවත් කල කල්හි වීදිවල මංමුලා වූවකු සේ හැසිරුනේය. මිහායි ළමා වියෙහි සිටම ආගම කෙරෙහි ලැදිවූවෙක් විය. ඔහුගේ නව හැවිරිදි වියෙහි දී දෙමාපියන් ඉවත් කරගෙන ගිය පසු ඔහුගේ කිතුනු ජීවිතයේ තීරණාත්මක මොහොත පසු කළේය. කෝපවූ හෙතෙම ආගමෙන් ප්‍රශ්නකර සිටියේය. මේ වයසේ ඔහුගේ අනෙක් ළමයින්ට සාමාන්‍ය-යෙන් නොමැති ගැටලු ඔහුට විය. ඔහුගේ ජීවිතය රැක ගැනීමට මුදල් සපයා ගැනීමේ මාර්ග ගැන සිතීමට ඔහුට සිදුවිය

කිතුනු වේද සාක්‍ෂිකයන්ගේ පවුල්වලට ආධාරදීම අපරාධයක් සේ සලකන ලදී. මිහායිට උදව්කල එක් කාන්තාවක් සිරගෙයි දමා තදබල ලෙස පහරදීම නිසා ඊට පසලොස් වසරකට පසුවද ඇය අංග විකල වී ඇත. තමාගේ ජීවිතය අන්තරායයේ හෙලමින් මිහායි සිය නිවසට කැඳවා ගත් නිසා ඇය සිරකරුවන්ගේ පවුල්වලට ආධාර කිරීමේ අපරාධය නිසා අට වසරක සිර දඬුවමකට යටත් කරන ලදී. ඇගේ සියලුම දත් උදුරා දමනු ලැබුවේය. ඇට බිඳ දමන ලදී. ඇයට යලි කිසි දිනක වැඩ කල නොහැකි විය. මුළු ජීවිතයටම ඇය අංග විකලවනු ඇත.

## මිහායි යේසුස්වහන්සේ අදහන්න!

එකොළොස් හැවිරිදි වියෙහිදී ම මිහායි කම්කරුවකු ලෙස සිය ජීවිතය උදෙසා මුදල් සැපයීම ආරම්භ කලේය. කටුක වේදනා ඔහුගේ ඇදහිල්ල සසලකරන සුලුවිය.

මගේ බිරිය සිරකොට දෙවසරකට පසු ඇය බැලීමට ඔහුට ඉඩ දෙන ලදී. සිරකඳවුරට ගිය යකඩ පොලු අතරින් සිය මැණියන් දැක්කේය. ඇය ඉතා අපිරිසිදු වී කෙට්ටු වී වැරහැල්ලක් ඇඟ ලා සිටියාය. ඔහු ඇය හඳුනාගත්තේ අපහසුවෙනි. ඇය ප්‍රථමයෙන්ම කිවේ 'මිහායි යේසුස්වහන්සේ අදහන්න' යනුවෙනි. එවිට රැකවල් කරුවෙක් මෘගයෙකු මෙන් ඇය මිහායි කෙරෙන් තල්ලු කරන ලදි. ඉවතට ඇදගෙන යන මව දෙස බලා මිහායි වැලපෙන්නට වූයේය. මේ මොහොත ඔහුගේ කැපවීමේ මොහොත වූයේය. එබඳු අවස්ථාවලදීද යේසුස් වහන්සේට ප්‍රේමකල හැකි බවද එතුමා සැබවින්ම ගැලවුම්කාරයා බවද ඔහු දැන සිටියේය. පසුව ඔහු මෙසේ කීවේය. ''මගේ මව විශ්වාශ කරන ආකාරයට කිතු දහම තුල එබී දයානුකම්පාවට වඩා සත්‍යයක් ගැන වෙනත් තර්ක නොමැති නම් මෙය මට සෑහෙයි.'' ඔහු මුළුමනින්ම කිතුනුමන් පිලිගත්තේ එදිනය.

පාසැල් ජීවිතය ගෙන යාමට ඔහුට නොනවතින සටන කට යෙදීමට සිදුවීය. ඔහු හොඳ ශිෂ්‍යයෙක් වූ හෙයින් ඊට තිලිනයක් වශයෙන් තරුණ කොමියුනිස්ට් සංගමයේ සාමාජිකත්වයේ සලකුණවූ රතු ටයි පටියක් ලැබුනේය. ''මගේ දෙමාපියන් හිරගෙයි දැමූ අයගේ ටයි පටියක් මම පළඳින්නෙ නෑ'යි'' ඔහු කීවේය. මේ නිසා ඔහු විදුහලෙන් නෙරපන ලදී. වසර කිහිපයක්ම නිකරුනේ ගෙවී ගියේය. ඔහු යලිත් විදුහලට ඇතුළු වූයේ තමා කිතුනු සිරකරුවෙකුගේ පුත්‍රයෙකු බව වසන් කරගෙනය.

පසුව ඔහුට බයිබලයට විරුද්ධව රචනයක් ලියන්නට සිදු විය. ඔහු එහි මෙසේ සඳහන් කළේය. 'බයිබලයට විරුද්ධ ඇති තර්කයන් දුර්වලය. බයිබලයට විරුද්ධව ඇති උපුටා සඳහන් කරන ලද දේ සත්‍යයෙන් තොරය. සැබවින්ම මහාචාර්ය වරයා බයිබලය කියවා නැතුවා විය හැකිය. බයිබලය විද්‍යාවට අනුකූලය.'' යලිත් වරක් ඔහු විදුහලින් නෙරපන ලදී. මේ වර ඔහුට වසර දෙකක්ම ඉගෙනීමට නොහැකි විය.

අවසානයේදී ඔහුට සෙමනේරියක ඉගෙනීමට ඉඩ ලැබුනි. මෙහිදී ඔහු ''මාක්ස්වාදි දේව ධර්මය'' අධ්‍යයනය කළේය. සැම දෙයක්ම විස්තර කළේ කාල්මාක්ස්ගේ දර්ශන යට අනුකූලවය. ඔහු පන්තියේදීම විරුද්ධ විය. අනෙක් සිසුවෝද ඔහුට එක් වූහ. මෙහි ප්‍රතිඵලය වූයේ එතැනින්ද ඔහු නෙරපා දැමීම නිසා ඉගෙනීමේ කටයුතු අවසාන කිරීමට නොහැකි වීමය.

වරක් මහාචාර්ය වරයෙක් අදේවදෘෂ්ටි දේශනයක් පවත් වන ලදී. තරුණයන් නොමඟ යැවීමේ වගකීම තමාම උසුලා ගනිමින් නැගී සිටි මගේ පුත්‍රයා ''එය මුසාවක් බව පළ කර සිටියේය. මුළු පන්තියම මිහායිගේ පක්ෂයට විය. කිසිවක් ප්‍රකාශ කර සිටීමේ ධෛර්යය කිසිවෙකුට තිබීම අවශ්‍යය. එවිට සියල්ලෝම ඔහුගේ පසට වෙති. අධ්‍යාපනය ලැබීම සඳහා ඔහු නිතරම තමා කිතුනු සිරකරුවෙකුවූ වර්ම බ්‍රැන්ඩ්ගේ පුත්‍රය බව සැඟවීමට උත්සාහ ගත්තේය. එහෙත් නිතරම ඔහු සොයා ගැනීමත් විදුහලේ අධ්‍යක්ෂක වරයා ඔහු කැඳවා නෙරපනු ලැබීමත් ඉතා සුලභ දර්ශනයක් විය.

මිහායි අතිශයින්ම සාගින්නෙන් පීඩිත වූයේය. සිපිරි ගෙට යවන ලද කිතුනුවන්ගේ පවුල් නිරන්තරයෙන්ම මිය යන තුරා සාගින්නෙන් පීඩිත වන්නේය. ඔවුන්ට ආධාර කිරීම මහා අපරාධයකි.

මම පුද්ගලිකව දන්නා පවුලක් දුක් විඳි අයුරු මම ඔබට කියමි. එක් සොහොයුරෙක් රහස් සභාවේ වැඩ කිරීම නිසා සිපිරිගෙට යවන ලදී. ඔහුට දරුවන් හය දෙනෙකුද බිරියද අත්හැර යාමට සිදු වූයේය. කොමියුනිස්ට් රාජ්‍යවල රැකියා සපයන්නේ රජය මගිනි. අපරාධයක් කරන ලද කිතුනුවන්ගේ දරුවන්ට රැකියා දෙන්නේම නැත. කරුණාකර මෙය ශිෂ්ඨ සම්මත මට්ටමෙන් තීරණය නොකරන්න. එහි සත්‍යය පමණක් උකහා ගන්න. මේ කිතුනු වේද සාක්ෂිකයාගේ දූවරුන් දෙදෙනා රෝගයන් පෙලෙන ඔවුන්ගේ මව, කුඩා සොහොයුරන්ගේ දිවි රැක ගැනීමේ අටියෙන් දූෂිත වූ ජීවන

මාර්ගයකට පෙළඹුනේය. දහහතර හැවිරිදි ඔවුන්ගේ බාල සොහොයුරා ඒ දර්ශනය දැක සිහිවිකලව මානසික රෝහලකට ඇතුල් කරන ලදී. වසර ගණනක් ඉකුත්වූ පසු පියා සිරෙන් නිදහස් විය. ඔහුගේ එකම යාච්ඤාව වූයේ "දෙවියනි! යලිත් මා සිරගෙටම ගෙන යනු මැනවි! මට මේවා බැලිය නොහැකියි!" යනුවෙනි. සිය දරුවන්ට යේසුස් වහන්සේ ගැන කියා දීම නිසා යලිත් ඔහු සිරගෙට යැවීම නිසා ඔහුගේ යාච්ඤාවට පිලිතුර ලැබුනේය. තව දුරටත් ඔහුගේ දූවරු ඒ දූෂිත ජීවිතයේ නොරැඳුනහ. රහස් පොලිසියේ බල කිරීම් වලට කැමැත්ත දීමෙන් පසු ඔවුන්ට රැකියාවක් ලැබුනේය. ඔහුන් නිරත වූයේ ඔත්තු සෙවීමේය. කිතුනු වේද සාක්ෂික යෙකුගේ දූවරු දෙදෙනෙකු වශයෙන් ඔවුහු හැම නිවසකම ගෞරවයට පාත්‍ර විය. ඔවුන් සවනත වැකුනු හැම තොරතුරක්ම රහස් පොලිසියට දැන්වූවෝය. නිදහස් කිතුනුවන් වූ ඔබ එබඳු කිතුනු පවුල් වලට ආධාර කිරීමෙන් වැලකී, ඒවා කැත දූෂිත දේ යයි සත්තකින්ම කියන්න එපා. එවන් ශෝකාන්තයන්ගේ බිහිවීම ඔබේ පාප නිසාම නොවේදැයි ඔබ ඔබගෙන්ම විමසා බලන්න.

තුන්වැනි අදියර

# වත්දී ගෙවීම හා බටහිර දී සේවය කිරීමට නිදහස් කිරීම

පුරා දහහතර වසක්ම මම සිරබතේ රස වින්දෙමි. මේ මුළු කාලය තුලම මම බයිබලයක් හෝ වෙනත් පොතක් හෝ නොදුටුවෙමි. ලිවීම කල යුතු අන්දම මගේ මතකයෙන් ඉවත් වී තිබුනේය. දරුණු ලෙස සාගින්නෙන් පෙළීම නිසාද වධ වේදනා නිසාද සිහි විකල තත්වයකවූ හෙයින්ද දේව වචනය මගේ මතකයෙන් බැහැරව ගොස් තිබුනේය. එහෙත් දහහතර වැනි වසර සපිරෙන දිනයේදී මගේ මතකය තුලින් මේ බයිබල් පදය නැගී ආවේය. "යාකොබ් රාබෙල් උදෙසා දහහතර වසක්ම මෙහෙ කළේය." ඔහු ඇයට පෙම් බැඳි නිසා එය ඉතා කෙටි එකක් මෙන් දිස් විය."

නොබෝ දිනෙකින්ම, අපේ රටෙන් දෙනු ලැබූ පොදු සමාවක් යටතේ මම නිදහස් කරනු ලැබුවෙමු. එය සිදු වූයේ අමෙරිකානු පොදු මහජන මතයේ දැඩි පෙළඹවීම නිසාය. යළිත් මම මගේ බිරිය දුටුවෙමි. පුරා දහහතර වසක් ඇය මා උදෙසා විශ්වාසවන්තව බලා සිටියාය. කිසිවෙකු සිර කරනු ලැබූ කල ඔහු සතු සකල වස්තුව රජයට ගන්නා හෙයින් මහත් දරිද්‍රතාවයක් මැද අපි නව දිවිය ඇරඹුවෙමු.

නිදහස් කරනු ලැබූ දේවගැතියන්ට කුඩා දේවස්ථානවල භාරකාරත්වය ගත හැකි විය. මටද ඔර්සෝවා නගරයේ දේවස්ථානයක් ලබා ගත හැකි විය. එම දේවස්ථානයේ සිටි දකය සංඛ්‍යාවම තිස් පහ කිසි දිනක තිස් හය දක්වා වර්ධනය නොකල යුතු ය'යි රජයේ ආගමික දෙපාර්තමේන්තුව විසින්

මට තදින්ම අවවාද කරන ලදී. හැමදයකයෙක් ගැනම ඔත්තු සපයන ලෙසත්, මට ඔත්තු සැපයීමේ නියෝජිතයෙකු වන ලෙසත්, තරුණයන් කෙරෙන් ඉවත්ව සිටින ලෙසත් මට අවවාද කරන ලදී. පාලනයේ උපකරණයක් ලෙස දේවස්ථානය උපයෝගී කරගත්තේ මේ අන්දමිනි.

මම දේශනා කලේනම් බොහෝ දෙනා ඊට සවන් දීමට එන බැව් මම දන සිටියෙමි. එබැවින් එය රජයේ දේවස්ථානයක සිට ඇරඹීමට මම උත්සුක නොවූයෙමි. එබැවින් මම යලිත් රහස් සභාවෙහි කටයුතු කලේ සියලු චමත්කාරජනක දේද, අන්තරායකාරී දේද බෙද ගනිමිනි.

මම සිරබත්වල රස විදිද්දී දෙවියන් වහන්සේ ක්‍රියාකර තිබුනේ විස්මය ගෙන දෙන අයුරිනි. රහස් සභාව තව දුරටත් ඉවත ලනු නොලැබීය. තවදුරටත් මතකයෙන් ඉවත් කරනු නොලැබීය. අමෙරිකානු හා වෙනත් කිතුනුවන් අප වෙනුවෙන් ආධාර කිරීම ද, යාච්ඤා කිරීම ද අරඹා තිබුනි.

මම ප්‍රාදේශීය නගරයක වූ මගේ සොහොයුරෙකුගේ නිවසේ දිනක් අපරභාගයේ මද විවේකයක් ලබමින් සිටියෙමි. මට කථාකල ඔහු "පිටරටින් සොහොයුරන් ඇවිල්ලා" පැවසීය. අප ඉවතට නොහෙලූ, අප මතකයෙන් බැහැර නොහැරි කිතුනුවෝ බටහිර වූහ.

උද්‍යෝගයෙක් උද්දම වූ ඔවුහු කිතුනුවේද සාක්ෂිකයන්ගේ පවුල් වලට ආධාර දීමටත්, රහසින් කිතුනු පත්‍රිකා ගෙන්-වීමටත් සංවිධානය වූහ. මේ ක්‍රියාවන්හි නිරතවීමට පැමිණි සොහොයුරන් හය දෙනෙකු යාබද කාමරයේ වූහ. දහ හතර වසක්ම සිරගෙයි ගත කල අයෙකුගේ ලිපිනය අසා ඇති බවද, ඔහු දැක ගැනීමේ රිසියෙන් පසුවනු බවද දීර්ඝ වේලාවකට පසු ඔවුහු කීවෝය. මම, "ඒ මම" යයි කීවෙමි. "අපි බලාපොරොත්තු වුනේ ශෝකයෙන් මලානිකවී ගිය කෙනෙක්" ඔබ සොම්නසින් පිරී ගොස් සිටින නිසා ඔහු ඔබ වෙන්න බෑ"යි ඔවුහු කීවෝය. සිපිරිගෙයි සිටියේ මා බවද,

පිටරටින් පැමිණි අය දුන ඇඳින ගැනීම හා තවදුරටත් අපි අමතක නොවන තත්‍වයක සිටීම මගේ ප්‍රීතියට හේතුවන බවද සහතික ලෙස කියා සිටියෙමි. රහස් සභාව වෙත ආධාර ස්ථිර ලෙසටම නොකඩවා ලැබෙන්නට විය. බොහෝ බයිබල් පිටපත් හා වෙනත් කිතුනු ධර්ම පත්‍රිකාවන් ද කිතුනුවේද සාක්ෂිකයන්ගේ පවුල්වලට සහනාධාරද රහසිගත මංවලින් අපි ලබා ගත්තෙමු. මේ ආධාරයන් යටතේ රහස් සභාවට වඩාත් සාර්ථක ලෙස කටයුතු කිරීමට හැකිවී තිබේ.

ඔවුන් අප වෙත දේව වචනය ලබා දුන්නා පමණක් නොව අපි ඔවුන්ගේ ප්‍රේමයට පාත්‍රවූ බවද දුටුවෙමු. ඔවුන් අප වෙත රැගෙන ආවේ සැනසිලි සුව දෙන වදන්ය.

මානසික විකෘති කිරීමට භාජනය කල කාලය තුලදී නුඹලාට කිසිවෙකු තවත් ප්‍රේම නොකරනු ඇත!. නුඹලාට කිසිවෙකු තවත් ප්‍රේම නොකරනු ඇත! යනුවෙන් අසා ඇත්තෙමු. අමෙරිකානු හා ඉංග්‍රීසි ජාතික කිතුනුවන් සිය ජීවිතයන් අන්තරායයේ හෙලමින් අපවෙත ප්‍රේම කරන බව පෙන්වා දී ඇති අයුරු අපි දකිමු, අප වෙතින් අවවාද ලබා-ගනිමින් ඔවුන් ක්‍රමවත් ලෙස මෙම සේවය කලහැකි රහසිගත මං දියුණු කලහ. රහස් පොලිසිය නිවෙස් වටා සිටියද ඔවුහු ඒවා තුලට බඩගැවෝය. ඔවුහු නිවෙස් තුලට ඇතුල් වූ බව රහස් පොලිසිය නොදත්හ.

බයිබල් පිටපත් ඉතා සුලභව ඇති ඇමෙරිකානු හා ඉංග්‍රීසි කිතුනුවන්ට මෙසේ රහසිගතව ලබාගන්නා ලද බයිබල් පිටපතක වටිනාකම අවබෝධ කරගත නොහැක්කේමය. යාච්ඤාව කරණ කොටගෙන පිටරටවල සිටින කිතුනුවන්ගෙන් ද්‍රව්‍යාකාර ආධාරයක් ලබානොගත්තේ නම් අපේ පවුල තවදුරටත් දිවි රැක නොගනු ඇත. රහස් සභාවේ දේව ගැතිවරුන් හා පූජකයන් ගැනද කිව හැක්කේ මෙබඳුම පුවතකි. බ්‍රිතාන්‍ය යුරෝපීය ක්‍රිස්තියානි සංගමය මගින් පරිත්‍යාග කරනු ලැබූ ද්‍රව්‍යාකාර හා මහත් ශිෂ්ට සම්පන්න

ආධාරයත් ගැන මගේම අත් දැකීම් තුලින් සාක්ෂි දිය හැක. මේ මනුෂ්‍යයෝ දෙවියන් කෙරෙන් අපවෙත එවනු ලැබූ සුරදූතයන් බඳු වූවෝය.

පූර්නජීවයක් ලත් රහස් සභාවේ සේවා කටයුතු නිසා යලිත් සිරගත කරනු ලැබීමේ මහා අන්තරාය කාරී තත්වයකට මම පත් වූනෙමි. මේ වකවානුවේදී කිතුනු සංවිධාන දෙකක්වූ නෝර්වීජියානු මිෂනාරි සංගමය හා හිබෲ ක්‍රිස්තියානි මිත්‍ර ගිවිසුම මගින් මගේ නිදහස් වීම සඳහා පවුම් හයදහසක වන්දි මුදලක් ගෙවන ලදී. දැන් මට රුමේනියාවට ආයුබෝවන් කිව හැක.

## මා රුසියාවෙන් පිටවූයේ ඇයි?

කෙසේ වී නමුදු නිදහස් ලෝකයා වෙතට රහස් සභාවේ හොරණෑව වනු පිණිස රටින් පිටව යන ලෙස රහස් සභාවේ නායකයන් මට බලකර නොසිටියේ නම් මම ඉන් පිටව නොයන්නෙමි. බටහිර ලෝකයේ වාසය කරන ජනතාවට, ඔවුන් ගේ නාමයෙන්, ඔවුන් විඳින වධ බන්ධන වල හා ඔවුන්ගේ අවශ්‍යතාවයන්ගේ නාමයෙන් කථා කරනු ඇතැයි ඔවුහු මා කෙරෙන් බලාපොරොත්තු වූහ. මම බටහිර ලෝකයට ආනමුදු මගේ හදවත රැඳුනේ ඔවුන් වෙතය. දුක් කම්කටොලු වලින් පෙලෙන අයුරු හා රහස් සභාවේ ධෛර්යමත් ක්‍රියාවන් ගැන ඔබට ඉවසීමේ ඉමහත් අවශ්‍යතාවය මම අවබෝධකර නොගත්තේවී නම් මම කිසිදිනෙක රුමේනියාවට ආයුබෝවන් නොකියනු ඇත. මේ මාගේ දූත මෙහෙවරය.

රුමේනියාවෙන් පිටවීමට ප්‍රථම දෙවරක්ම රහස් පොලිසිය වෙත මම කැඳවනු ලැබීමි. මා නිදහස් කිරිමට අවශ්‍ය මුදල් ලැබී ඇති බැව් ඔවුහු මට දන්වූහ. කොමියුනිස්ට් වාදය මගින් ගෙන එනු ලැබූ ආර්ථික අර්බුද තාවයන් නිසා රුමේනියාව එහි පුරවැසියන් විකුණයි. "බටහිරට ගොස් ඔබට කැමති තරම් කිතුතුමන් ගැන දේශනා කරන්න. එහෙත් අපට විරුද්ධව එක වචනයක් කථා කරන්න එපා. ඔබ එසේ

කලහොත් අප ඔබට කරන දේ අවංකවම කියන්නම්. පවුම් 1000 කට කුලියට මිනීමරුවෙක් ගන්න පුළුවන්. එසේ නැත්තම් ඔබ පැහැරගෙන එන්න පුළුවන්. (ඔස්ට්‍රියාවේ සිට පැහැරගෙන රුමේනියාවට ගෙන ආ වාසිලි ලිව්ල් නම් ඔතොඩොක්ස් පූජකයෙක් මා සමග එකම සිර මැදිරියක සිටියේය. ඔහුගේ නිය උදුරා දමනු ලැබීය. එසේම බර්ලිනයේ සිට ගෙනන ලදුවන් සමගද මම සිටියෙමි. මෑත දී පැරීසියෙන් හා ඉතාලියෙන් රුමේනියානුවන් පැහැරගෙන එනු ලැබීය.) කෙල්ලෙක් ගැන හෝ හොරකමක් ගැන හෝ තරුණ කාලයේ කල දූෂිත වැඩක් ගැන ප්‍රසිද්ධ කොට ඔබේ චරිතය වුනත් විනාශ කර දමන්න අපට පුළුවන්. බටහිර ජාතිකයෝ, විශේෂයෙන්ම අමෙරිකානුවන්, පහසුවෙන් නොමඟ හරින්නත්, රවටන්නත්, පුළුවන්'' යි ඔව්හු පැවසුවෝය.

එසේ සංග්‍රහ කරනු ලැබූ පසු ඔවුන් මට බටහිර බලා ඒමට ඉඩ හරින ලදී. මට පසුකරන්නට සිදුවූ මනස විකෘති කිරීම කෙරෙහි ඔවුන්ගේ විශ්වාශය මහත් වූයේය. මා මෙන්ම මනස විකෘති කිරීම තුලින් ගිය අය අද වධ බන්ධන වලට මුහුණ දුන්නද ඔවුන්ගෙන් සමහරෙක් එපරිද්දෙන්ම නිහඬ වනු ඇතැයි කොමියුනිස්ට් වරුන්ට සහතිකය.

මෙසේ 1965 දෙසැම්බරයේ අපේ පවුල රුමේනියාවට ආයුබෝවන් කීවෝය.

පිටවයාමට පෙර මගේ අවසාන ක්‍රියාව වූයේ මා සිර කිරීමට අතදුන් හා මට පමුනුවන, වධබන්ධනවල වර්ෂ ගනන නියම කල කර්නල්වරයාගේ සොහොන් ගැබ වෙත යාමය. ඔහුගේ සොහොන් ගැබ මත මම කුසුම් දමක් ද තැන්පත් කලෙමි. ආත්මික ශූන්‍යතාවයක තුල වෙසෙන කොමියුනිස්ට් වරුන් කිතුනුමන් ගේ ප්‍රීතිය වෙත ගෙන ඒම සඳහා මම කැප වූයෙමි.

මම කොමියුනිස්ට් වාදයට විරුද්ධවෙමි. එහෙත් මම ඔවුන්ට ප්‍රේම කරමි. මම පාපයට ද්වේෂ කරමි. එහෙත් පාපිනට ප්‍රේම කරමි. මගේ මුළු හදවතින්ම කොමියුනිස්ට් වරුන්ට ප්‍රේම කරන්නෙමි. කොමියුනිස්ට්වරුනට කිතුනුවන් මරා දැමිය හැකිය. එහෙත් ඔවුන්ගේ මිනීමරුවා කෙරෙහි පවා දක්වන ප්‍රේමය නැසිය නොහැකිය. කොමියුනිස්ට් වරුන් කෙරෙහි හෝ මගේ වධකයන් කෙරෙහි මා තුල සියුම් හෝ කහටක් මෙන්ම දැඩි විරෝධතාවයක් හෝ නොමැත්තේය.

## සිව්වැනි අදියර

# කිතුනුමන්ගේ ප්‍රේමයේ ආත්මයෙන් කොමියුනිස්ට්වාදය පැරදියයි

යුදෙව්වන්ගේ මුතුන්මිත්තන් මිසරයෙන් ගැලවී, මිසර ජාතිකයන් රතු මුහුදේ ගිලුණු විට යුදෙව්වන් ගැයූ ජය ගීතයන්ට සුර දූතයෝ ද එක්වූහයි ජන ප්‍රවාදයක් යුදෙව්වන් අතර ඇත. "යුදෙව්වන්ට මනුෂ්‍යයන් වශයෙන් ඔවුන්ගේ ගැලවීම ගැන ප්‍රීති විය හැකි මුත් නුඹලාගෙන් ඊට වඩා මහත් දෙයක් මම බලාපොරොත්තුවෙමි. මිසර ජාතිකයෝ මගේ මැවීමක් නොවන්නේද? මම ඔවුන්ට ද ප්‍රේම නොකරන්නේද? ඔවුන්ගේ වෙදවාවකයේ දී මම කම්පාවෙන අයුරු නුඹලාට අවබෝධ කරගත නොහැක්කේ කෙසේද? යි සුර දූතයන්ගෙන් දෙවියන්වහන්සේ විචාල සේක.

යෙරිකෝ නුවරදී යොෂුවා ඔහුගේ දෙනෙත් ඔසවා බැලීය. අසිරියකි. කොපුවෙන් ඉවතට ගත් කඩුවක් අතැ'තිව මිනිසෙක් ඔහු ඉදිරිපිට සිටියේ. යොෂුවා ඔහු ළඟට ගොස් ඔබ අපට ද? අපේ සතුරන්ටද? යි ඇසුවේය.

යොෂුවා හමුවීමට පැමිණි තැනැත්තාගේ පිළිතුර වූයේ මා ඔබ වෙනුවෙනි. "හෝ මම ඔබේ විරුද්ධ වාදියෙක් වෙමි" හෝ නැතහොත් මම මධ්‍යස්ථ අයෙක්මි" යි විය හැකිව තිබුණි. මිනිසෙකුට දිය හැකිව තිබුනු පිළිතුර මෙය පමණි. යොෂුවාට හමුවුණු පුද්ගලයා විශ්වයේ අනෙක් ස්ථානයකට අයත් වූවෙක් නිසා නුඹ ඊශ්‍රායෙල් වරුන්ට පක්ෂවද? විපක්ෂවද? යන ප්‍රශ්නයට පිළිතුරු වූයේ "නැත" යන්නයි. මෙය බලාපොරොත්තු නොවූද, තේරුම් ගැනීමට

දුෂ්කර වූද, වචනයකි. මෙහි ''නැත'' යන්නෙහි අර්ථය කුමක්ද? ඔහු පැමිණියේ විරුද්ධවාදීන් නොමැති සියළු දෙනම සියළුදේම තේරුම් ගන්නා, සකල වර්ගයා වෙත පැතිරුනු මෛත්‍රිය කරුණාවෙන් හා ප්‍රේමයෙන් ඉතිරී පැතිරී ගිය ස්ථානයක සිටය.

සාමාන්‍ය මනුෂ්‍ය ශක්තියේ අන්දමට කොමියුනිස්ට් වාදයට සම්පූර්ණයෙන්ම විරුද්ධ විය යුතුය. මෙහිදී මේ කෲරතර ක්‍රියා කරන්නාවූ කොමියුනිස්ට් වාදීන්ටත් විරුද්ධ විය යුතුව ඇත.

ක්‍රිස්තියානිහු අනෙක් සාමාන්‍ය අයට වඩා උසස් අය වෙති. ඔවුන් දෙවියන් වහන්සේගේ දරුවන්ය. දිව්‍යමය ස්වභාවයකට හිමිකම් කියන්නන්ය. එම නිසා මම කොමියුනිස්ට් සිර මැදිරිවලදී දුන් දඬුවම් නිසා කොමියුනිස්ට් වරුන් පිළිකුල් නොකලෙමි. ඔවුන්ද දෙවියන් වහන්සේගේ මැවීමකි. මා ඔවුන් පිළිකුල් කරන්නේ කෙසේද? නැතහොත් ඔවුන්ගේ මිත්‍රයෙක් වන්නේ කෙසේද? මිත්‍රත්වය යනු දෙහදක එක් සිතකි. නමුත් මම කොමියුනිස්ට් වරුන් හා එක් සිත් නොවෙමි. ඔවුන් දෙවියන් වහන්සේ කෙරෙහි කැමැත්තක් නොදක්වති. එහෙත් මම උන්වහන්සේට ප්‍රේම කරමි. යමෙක් මාගෙන් ''ඔබ කොමියුනිස්ට් වාදියෙක්ද? කොමියුනිස්ට් විරෝධියෙක්ද''යි ප්‍රශ්න කළහොත් මාගේ පිළිතුර ගැටළු සහිත එකක් වන්නේය. කොමියුනිස්ට් වාදය මනුෂ්‍යයාට ඉතාමත් අනතුරුදායකය. එමනිසා එය මුලිනුපුටා දමන තෙක් සටන් කරමි. එහෙත් මාගේ ආත්මයෙන් මම යේසුස් වහන්සේ සමග ස්වර්ගීය ස්ථානයක සිටිමි. මම ''නැත'' යන කණ්ඩායමේ වසමි. එහිදී කොමියුනිස්ට් වරුන් කෙතරම් වැරදි කලද ඔවුන් තේරුම් ගන්නේ ප්‍රේමයෙනි. මෙහි සිටින සුරදූතයෝ ජීවිතයේ ජයග්‍රහණය වෙත යාමට සියළු දෙනාටම උදව් කරති. ඒ ජයග්‍රහණය වනාහි කිතුනුමන් වැනියකු වීමය. එබැවින් මගේ ඉලක්කය වී ඇත්තේ කොමියුනිස්ට් වරු අතර ශුභාරංචිය පතලකර හැරීමත් ඔවුන්ට මේ සදකාල ජීවනය ගැන සුබඅස්න කියා දීමත්ය.

මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස් වහන්සේ කොමියුනිස්ට් වාදීන්ට ප්‍රේම කරයි. උන්වහන්සේ සකල මනුෂ්‍යයාටම ප්‍රේම කරන බව කියා ඇති අතර ධර්මිෂ්ඨයන් අනූ නව දෙනෙක් තබා ගොස් නැතිවූ එක් අධර්මිෂ්ඨයා සොයයි. උන්වහන්සේගේ අනුගාමිකයන් හා සේවකයන් මෙම විශ්වනීය ප්‍රේමය උන්වහන්සේගේ නාමයෙන් උගන්වා තිබේ.

"සියලු දෙනාටම දැඩිලෙස ප්‍රේම කරන්නෙකු එක් අයෙකුට හෝ ප්‍රේම නොකරන්නේ නම් හේ කිතුනුවෙක් නොවේ. මන්ද? ඔහුගේ ප්‍රේමය විශ්වසනීය නොවන හෙයිනි''යි ශාන්ත මැකරේ තුමා පවසා තිබේ.

ශාන්ත අගෝස්තිනු මෙසේ උගන්වයි. සියළු මනුෂ්‍යයා ධර්මිෂ්ඨව එක් මනුෂ්‍යයෙක් පමණක් පව්කාරයෙක්ව සිටිනම් උන්වහන්සේ එක් එක් අයෙකු කෙරෙහි පෞද්ගලික වශයෙන් ප්‍රේම කරන හෙයින් උන්වහන්සේ මෙලොවට පැමිණ එම අධර්මිෂ්ඨයා වෙනුවෙන් කුරුසියේ දුක විඳ දරාගනු ඇත.'' ක්‍රිස්තියානි ඉගැන්වීම පැහැදිලිය. කොමියුනිස්ට් වාදීන් මනුෂ්‍යයන් බැවින් ක්‍රිස්තුස්වහන්සේ ඔවුනට ද ප්‍රේම කරයි. ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් ද පාපයට ද්වේශ කරන නමුත් පව්කාරයාට ප්‍රේම කරයි.

රාත්තල් පණහක පමණ බරැති දම්වැලින් දෙපා බැඳුණු ගිණියම් කල යකඩ කූරුවලින් වද විඳින්නාවූ හැඳි පුරා පිරුණු ලුනු දිය මුවතුලට දමන්නාවූ වතුර නැතිව දුක් විඳින, කසයෙන් තලනු ලැබූ, සීතලෙන් වෙව්ලන, කුසගින්නෙ පෙලෙන, සිරකරුවන් ඒ වේදනා විඳින අතර,කොමියුනිස්ට්වාදීන් වෙනුවෙන්යාච්ඤා කරන අයුරු මම දුටුවෙමි. අප හදවත් තුල ජනිත කරනු ලැබූ, කිතුතුමන්ගේ ප්‍රේමය මගින් මිස මෙය මනුෂ්‍ය ශක්තියකින් ගත නොහැකිය.

ඉන්පසු අපට පීඩා කරනු ලැබූ කොමියුනිස්ට් වරුන්ද සිරකරනු ලැබිය. කොමියුනිස්ට් වාදය යටතේ කොමියුනිස්ට් වාදීන් පමණක් නොව කොමියුනිස්ට් පාලකයන්ද ඔවුන්ගේ

විරුද්ධවාදීන් මෙන්ම සිරගෙවල ලනු ලැබූහ. මෙහි පීඩාකල අයද පීඩා විඳි අයද එකම සිරමැදිරියක සිටී. අන්‍යාගමිකයන් ඔවුන් කෙරෙහි විරුද්ධකම් පැවත් ක්‍රිස්තියානි අය මොවුන් සමඟ සමගියෙන් කල් යැවූ අතර කොමියුනිස්ට් වාදීන්ගේ දුක් පීඩාද විඳ දරා ගත්හ. සතියකට වරක් ඔවුන්ට ලැබෙන පාන් කොටස ද තමාගේ ජීවිතය ගලවා ගත හැකි බෙහෙත් ස්වල්පයද, තමන් සමග කල්යවන කොමියුනිස්ට්වාදී පීඩා-කරුවෙකුට දෙන ක්‍රිස්තියානි පුද්ගලයින් මා දැක තිබේ.

සිරමැදිරියක අවසන් හුස්ම හෙලූ රුමේනියාවේ හිටපු අගමැති ලූලිව් මැනිව් මහතාගේ අවසාන වචනය වූයේ මෙයයි. "කොමියුනිස්ට්වාදීන් අප රටින් මුලිනුපුටා දැමුවහොත් එය සෑම ක්‍රිස්තු භක්තිකයෙකුට කළ හැකි සුපරිශුද්ධ සේවය වෙයි. ඔවුන් වීථියට ගොස් මහජනයාට පීඩා කල කොමියුනිස්ට්වරුන් යුක්තිසහගත කෝපයෙන් සිටින ජනතාවගෙන් රැකගත යුතුය."

ක්‍රිස්තුස් වහන්සේ පිළිගෙන වැඩිකල් යන්නට මත්තෙන් මම තවදුරටත් වැඩි කාලයක් ජීවත් නොවේ යැයි හැඟීමක් මා සිතතුල විය. මම ඇවිදින කල අතරමඟදී හමුවන සෑම ස්ත්‍රී පුරුෂයෙකුම පාපයෙන් ගැලවීම ලබාගෙනද? නැද්ද?" යන හදවත තුල ඇති පිහියක් වැනි දැවෙන ප්‍රශ්නයෙන් හටගත් වේදනාවෙන් දුක් වින්දෙමි. ඔවුන් පාපකාරී සමාජයක සාමාජිකයෙකු නම් මම පැය ගණන් වැලපෙන්නෙමි. "හැම දෙනාම පාපයෙන් ගැලවිය යුතුය" යන මා හදවත තුල තිබුනු බලාපොරොත්තුවෙන් කොමියුනිස්ට්වරුන්ද වෙන් නොකලෙමි.

තනිව සිරකර තැබීමේදී පෙර මෙන් අපට තවදුරටත් යාච්ඤා කිරීම අපහසු විය. සිතකින් සිතිය නොහෙන තරමේ දරුණු සාගින්නකින් අපි පෙළුනෙමු. මෝඩයන් වන තෙක් අපිව මත් කර තිබුණි. ඇටසැකිල්ලක් තරම් දුර්වල වීමු. ස්වාමීන්ගේ යාච්ඤාව ඉතා දීර්ඝ එකක් මෙන් දැනුනි. විටින්

විට කියන එකම යාච්ඤාව වූ ''යේසුස් වහන්ස මම ඔබට ප්‍රේම කරමි'' යන්න හැර අනෙකක් අපට සිතාගත නොහැකි විය.

එක් ආලෝකමත් දිනයකදී මම යේසුස් වහන්සේ වෙතින් පිළිතුරු ලැබුවෙමි. ''නුඹ මට ප්‍රේම කරන්නෙහිද? දැන් මම නුඹට ප්‍රේමකරන හැටි පෙන්වන්නෙමි යන්න''යි ක්ෂණයකින් උදුනක ගිනිදැල්ලක් ලෙසින් මගේ හදවත තුල ගින්නක් පැන නැගුනි. යේසුස් වහන්සේ කථාකරන කල ඔවුන්ගේ හදවත් දැවෙන්නාක් මෙන් දැනුනු බව එමාවුස්හි සිට පැමිණි ගෝලයෝ පැවසූහ. දැන් එය මා සමග විය. අප හැමදෙනා උදෙසා කුරුසියෙහි දිවිපුදකල කිතුනුමන් මම දැන සිටියෙමි. කෙතරම වැරදි කලද එවන් ප්‍රේමයකින් කොමියුනිස්ට්වරුන් වෙන්කල නොහැක.

කොමියුනිස්ට්වරු බියකුරුදේ කර ඇති අතර, තවමත් එවැනි දේ කරති. බොහෝ ජලයෙන් ප්‍රේමය නිවන්නට නොහැක. එය යටත් කිරීමට ගංගාවන්ට නොහැකිය. ප්‍රේමය මරණය තරම් බලවත්ය. ඊර්ෂ්‍යාව මිණිවල මෙන් කෘරතරය. සකල ධනවතුන්ම, දිළිඳුන්ම, බාලයන්ද, මහල්ලන්ද, සෑම වර්ගයේම මනුෂ්‍යයන්ද, සෑම ජාතීන්ද දේශපාලන මතධාරීන්ද, ශුද්ධවන්තයන් හා අපරාධ කාරයින් වෙත මිණිවල ප්‍රේමකරයි. එසේම ප්‍රේමයේ ප්‍රතිමූර්තිය වූ යේසුස්වහන්සේ කොමියුනිස්ට් වාදීන් ද තමන් වෙත දිනාගන්නා තෙක් නොනවතියි.

මගේ සිර මැදිරියට එක් පූජකයකු දමනු ලැබීය. ඔහු බාගෙට මැරී සිටි අතර ශරීරයෙන් ද මුහුණෙන්ද ලේ ගලා යමින් තිබුනි. ඔහුට දරුණු ලෙස පහරදී තිබුනේය. අපි ඔහු සේදුවෙමු. ඇතැම් සිරකරුවන් කොමියුනිස්ට් වාදීන්ට සාප කලහ වේදනාවෙන් කෙඳිරිගාමින් ඔහු මෙසේ කිවේය. ''කරුණාකර ඔවුන්ට සාප කරන්න එපා. නිශ්ශබ්ද වෙන්න මම ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමි.

## සිරමැදිරිවලදී පවා අප ප්‍රීතිමත් වූයේ කෙසේද?

සිර මැදිරියේ ගත කල වර්ෂ දහතරක කාලය ඇතැම්විට ප්‍රීතියෙන් පිරි එකක් වූ බව ආපසු හැරී බලන කල පෙනෙයි. ''අතිශයින්ම භයංකර වධ වේධනා මධ්‍යයේ වුවද ක්‍රිස්තු භක්තිකයන් ප්‍රීතියෙන් සිටින්නේ කෙසේද?'' යි ආරක්ෂාවක රැකවල් කරුවෝ පවා පුදුමයට පත් වූහ. ගීතිකා ගැයූ විට පහර කෑමුත් ගී ගැයීමෙන් වැලකී සිටීමට අපට නොහැකිවිය. කෝකිලයන් පවා ගී ගැයීමෙන් පසුව මරා දමන හැටි මම සිහින් මවා ගතිමි. ක්‍රිස්තු භක්තිකයන් සිරමැදිරිවලදී ප්‍රීතියෙන් රැඟුහ. එවැනි විපත්ති දයක තත්වයක් යටතේදී පවා ඔවුන් ප්‍රීතියෙන් සිටියේ කෙසේද?

''නුඹලා දකින දේ දකින ඇස් ආශීර්වාද ලද්දෝය''. යනුවෙන් කිතුතුමන් ගෝලයන්ට වදල වචන මම නිතරම සිරමැදිරියේදී ආවර්ජනය කළෙමි. ගෝලයෝ චාරිකාවකින් පසු, බියකරු දේ දකින්නට සිදුවූ පලස්තීනය හරහා ආපසු පැමිණියා පමණි. පලස්තීනය දරදඬු පාලනයක් පැවති රටක් විය. රෞද්‍රලෙස සලකනු ලැබූ මිනිසුන්ගේ දුඩි විපත සෑම තැනම වූයේය. ශ්‍රාවකයන්ටරෝග, වසංගත, සාගින්න, කණගාටුව එහිදී හමුවිය. සිය සැමියා සිරභාරයට ගනු ලැබ වැලපෙන බිරිඳක් හෝ දෙමහල්ලන් සිටින ජාති හිතෛෂීන්ගේ නිවෙස් වලට ඔවුන් ගියෝය. එය බැලීමට තරම් සුදුසු දර්ශනීය ලොකයක් නොවීය. නුඹලා දකින දේ දකින ඇස් ආශීර්වාද ලද්දෝ යයි කිතුතුමන් තවමත් කියන සේක.

ඔවුන් කණගාටුව පමණක් නොව මනුෂ්‍යයා ලබන ජයග්‍රහණය හෙවත් ඉහළම සතුට වැනි කිස්තුස් වහන්සේ දුක තිබේ. මුල් අවස්ථාවේ අවලක්ෂණ පනුවන් හා කොලවල බඩගා යන දළඹුවන් වැනිව සිටි සිරකරුවන්ට එම කාළකණ්ණි ජීවිතයෙන් පසු වෛවර්ණ සමනලයන් වී මලින් මලට පියාඹන කාලයක් එළඹේ. මෙවැනි ප්‍රීතියක් අපට ද තිබේ.

යෝබ්ට වඩා පීඩා විඳි යෝබ් වැන්නවුන් මා වටා සිටියහ. එහෙත් මම යෝබ්ගේ කථාව දැන සිටියෙමි. ප්‍රථමයෙන් ඔහු සිතුවාට වඩා දෙගුණයක් පසුව ඔහු සතුවූ අයුරු මම දැන සිටියෙමි. සාගින්නෙන් දැවෙමින් මුළුමනින්ම (පිළියම් නොකොට) නොසලකා හැරි ගඩු සහිත සිරුරු ඇති ලාසරස් වැන්නවුන් මා වටා සිටියහ. සුරදූතයන් ලාසරස් ආබ්‍රහම්ගේ තුරුලට ගෙන ගියාක් මෙන් මොවුන්ට ද අනාගතයේ එපරිද්දෙන්ම වන බව මම දැන සිටියෙමි. හෙට දිනයේ අභිෂේක කරනු ලබන කිලිටි වැරහැලි ඇඳි දූ්වලව ගිය ආගම වෙනුවෙන් දිවි පුදන අය මා සමීපයෙන් සිටි‍ මම දුටුවෙමි.

මේ අයුරින් මිනිසුන් දෙස බැලූව මුත් අනාගතයේ දී මොවුන්ට මෙසේ නොවන බව මට වටහා ගත හැකි වීය. අනාගතයේ ශාන්ත පාවුල් මෙන් විය හැකි ටාර්සස්හි සාවුල් වැනියවුන් ද මේ වන විට මා වටා සිටියහ. රහස් පොලිසියේ නිලධාරීන් ක්‍රිස්තුස් වහන්සේ පිලිගත් පසු සිර මැදිරිවල වධ වේදනා විඳීමට කැමති වූහ. ශාන්ත පාවුල්ට පීඩා කල පලස්තීනයේ ජේලර්වරයා මෙන් අපට වධ දෙන ජේලර්වරුන් ද ක්‍රිස්තුස් වහන්සේ පිලිගන්නා බව අපි දැන සිටියෙමු. මා ගැලවීම සඳහා කුමක් කළ යුතුද? යි ඔවුන් ඉතා ඉක්මනින් අසනු ඇතැයි අපි සිතුවෙමු. කැත කුණු තවරාගෙන කුරුසිවල බැඳ දමා සිටියවුන් දෙස බලා ඔච්චම් කරමින් ගිය අය දුටුවිට ගොල්ගොතාවේ සිටි ජනයා තමන් කල පාපයට සාප කරගත් අයුරු අපට සිහිවිය.

සිරගෙවල සිටි කොමියුනිස්ට් වාදීන් පාපයෙන් ගැලවීම ලබා ගනු ඇතැයි අපි බලාපොරොත්තු වීමු. වගකීමේ තේරුම අපි වර්ධනය කලෙමු. වධ බන්ධනයනට ගොදුරු වී සිටිය වුන්ට ප්‍රේම කිරීමට උගත්තෙමු.

මගේ පව්ලේ බොහෝ දෙනෙක් මරා දමනු ලැබීය. මගේ නිවසේදීම මිනීමරුවන් බොහෝ දෙනෙක් පාපයෙන් ගැලවීම

ලැබුහ. කොමියුනිස්ට්වරුන් සඳහා කිතුනු මිෂනාරි සේවයක් ඇති කිරීමේ අදහස පහල වූයේද ඒ ඇසුරෙනි. එය ඊටම ගැලපෙන ස්ථානයක් වූයේය.

දෙවියන් වහන්සේ යමක් ගැන බලන්නේ අප බලන අන්දමින් නොවේ. අපි යමක් ගැන බලන්නේ කුහුඹුවකු බලන අන්දමින් නොවේ. අපවිත්‍ර කැලි කසල සිරුරේ ගා කුරුසියකට බැඳ දැමීම මනුෂ්‍යයන් සිතන අන්දමට පිළිකුල් දෙයකි. කෙසේ වෙතත් යේසුස් වහන්සේ වෙනුවෙන් විඳින වේදනා සැහැල්ලු පීඩාවන් මෙම බයිබලය අපට කියාදෙයි. වර්ෂ දහතරක් සිර මැදිරිවල ගත කිරීම අපට දිගු කලක් වුවද බයිබලය කියන්නේ "එය ආලෝකය ලබාගනු සඳහා මොහොතක් සේවය කිරීමක් පමණක් බවත් දෙවියන්වහන්සේගේ ඇසින් ඉතා සුළුවූ කොමියුනිස්ට් වරුන්ගේ රෞද්‍ර මෙන්ම සමාව දිය නොහැකි අපරාධවලට විරුද්ධව ධර්මිෂ්ඨ සටන් කිරීම ගැන හරිලෙස සිතීමට මෙය අපට කියාදෙයි. දහස් වසරක් එක් දිනක් මෙන් සලකන දෙවියන් වහන්සේ ඉදිරියේ මොවුන්ගේ අර්ධ ශතකයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන මෙම වධබන්ධන වැරදී මංමුලාවූ එක මොහොතක් පමණක් විය හැක. ඔවුන්ට ගැලවීම ලැබීම සඳහා තවමත් ඉඩ ඇත.

ස්වර්ගීය වූ යෙරුසලම මවකි. ඇය මවක් මෙන් ප්‍රේම කරයි.

කොමියුනිස්ට් වාදීන්ට ස්වර්ගයේ දොරටු වසා නැත. ඔවුන් වෙතින් ආලෝකය නිවා දමා නැත. ඔවුන්ට දූන් ඇය මෙන් පසු තැවිලි විය හැකිය. අපි ඔවුන්ට පසුතැවිලි වීමට ඇරයුම් කල යුතුව ඇත.

බොහෝ ආගමික නායකයන් අභ්‍යාස කරනු ලැබූ පැහැදිලිවම උසස් මට්ටමකට පැමිණි ඇති ප්‍රේමයට පමණක් කොමියුනිස්ටවාදීන් වෙනස් කල හැකිව තිබේ. හිට්ලර්

කොමියුනිස්ට් විරෝධියෙක් විය. එම නිසා ඔවුන් යටත් කරගනු වෙනුවට ලෝකයෙන් තුනෙන් එකක් පමණ දිනා ගැනීමට උදව් කලේය.

හුදෙක් ප්‍රේමය පෙරදැරි කරගෙනම සිරගෙය තුල කොමියුනිස්ට්වාදීන් අතර ආගමික සේවයක් ආරම්භ කල අතර ප්‍රථමයෙන් කොමියුනිස්ට් පාලකයන් ගැ ා සිතුවෙමු.

සමහර ධර්මදූත මංඩලවල අධ්‍යක්ෂකවරු ආගමික ඉතිහාසය ගැන උගෙන ඇත්තේ ස්වල්පයකි. නෝර්වේ රට ක්‍රිස්තුස් වහන්සේ වෙත දිනා ගනු ලැබුවේ කෙසේ ද? ඔල්ෆ් රජතුමා දිනාගැනීමෙනි. ශාන්ත ස්ටීවන් රජතුමා දිනාගැනී-මෙන් හංගේරියාවද ක්‍රිස්තුස්වහන්සේ වෙත හරවා ගත්තේය. රුසියාවේ ප්‍රථම වරට ශුභාරංචිය දෙශනා කරනු ලැබුවේ ව්ලැඩිමීර් රජතුමා දිනාගැනීමෙනි. පෝලන්තයේදී සිදුවූයේ මෙයමය. අප්‍රිකාවේ ගෝත්‍රයක නායකයා දිනා ගනු ලැබූවිට සියලු සමාජික ගෝත්‍රිකයෝ නායකයා අනුගමනය කරති. යහපත් ක්‍රිස්තු භක්තිකයන් වූ අය ධර්මදූත සේවා කංඩායම් ආරම්භ කළමුත් සුළු බලපෑම් ඇතිව සිටියවුන් ඔවුන්ගේ තත්ත්වයෙන් වෙනස් කල නොහැකි විය.

අපි පාලකයන්, දෙශපාලනඥයන්, ආර්ථික, විද්‍යාත්මක හා සෞන්දර්යය ප්‍රියකරන්නන් ක්‍රිස්තුස් වහන්සේ වෙත දිනාගත යුතුය. ඔවුහු ආත්මික ඉංජිනේරුවරුය. ඔවුන් මිනිසුන්ගේ ආත්ම සකස් කරයි. මිනිසුන්ට මහ පෙන්විය හැකි ඔවුන් දිනා ගැනීමෙන්, ඔබ මිනිසුන් දිනා ගන්නේය.

ධර්මදූත සේවා කටයුතු අතින් බැලුවහොත් අනෙක් සමාජ ක්‍රමයන්ට වඩා දියුණුවක් කොමියුනිස්ට් වාදය ලබා ඇත. එය අතිශයින්ම මනා ලෙස පාලනය කර ඇත.

එක්සත් ජනපද රාජ්‍යයේ ජනාධිපතිවරයා මුස්ලිම් ආගම වැලඳගනු ලැබුවහොත් ඒ නිසාම හැම අමෙරිකානු පුරවැසි-යෙක්ම මුස්ලිම් ආගම වැළඳ නොගනී. එහෙත් මා ඔ සේතුං

සියොසිකුහෝ බ්‍රෙෂ්නෙව් ක්‍රිස්තියානි ධර්මය වැළඳගතහොත් මුළු රටම ඔවුන් අනුගමනය කරනු ඇත. නායකයන්ගේ බලය එපමණටම මහත්ය.

එහෙත් කොමියුනිස්ට් නායකයෙකුට ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරිය හැකිද? සත්තකින්ම පුළුවන. ඔහුගේ ගොදුර මෙන්ම ඔහුද ප්‍රී්‍රියෙන් තොරය. ආරක්ෂාවෙන් තොරය.

බොහෝ රුසියානු පාලකයන්ගේ අවසානය සිදු වූයේ සිර මැදිරි තුල හෝ ඔවුන්ගේම සහෝදරයෙකුගේ වෙඩි උණ්ඩයකිනි. චීනයේද සිදු වූයේ මෙයමය. සියලුම බලතල සිය අතෙහි තිබුන ඇමතිවරයන්වූ ලැගෝඩා, යෙෂ්නෙව්. බෙරිය වැනියවුන් විප්ලවයේ අවසාන භාගයේදී ගෙල හරහා සිදුරු කර ගෙන ගිය වෙඩි උණ්ඩයකින් සිය මෙලොව ජීවිතය අවසන් කළහ. සෝවියට් සමුහාණ්ඩුවේ ස්වදේශ ඇමති වරයාවූ ෂෙලිච්ක්ද යුගෝස්ලෝවියාවේ ස්වදේශ ඇමතිවරයාවූ රැන්කොවික්ද අන්තිමේදී වැරහැලි මෙන් වීසිකරනු ලැබුවේ මෑතකදීය.

## අපට ආත්මික අංශයෙන් කොමියුනිස්ට් වාදයට පහරදිය හැක්කේ කෙසේද?

කොමියුනිස්ට් පාලනයෙන් කිසිවකු හෝ එහි පාලකයන් හෝ ප්‍රිතිමත් නොකරයි. පක්ෂයේ වැඩ පිලිවෙල වෙනස් කරනු ලැබුවහොත් රහස් පොලීසියේ වෑන් රියක් පැමිණ ඔවුන් ගෙන යනු ඇතැයි ඔවුන් තැති ගෙන සිටිත්. සම්පූර්ණ වග කීම තමන්ම දූරු සමහර කොමියුනිස්ට් පාලකයන් [මම පුද්ගලිකවම දනිමි. ඔවුන්ට විවේකයන් දීමට හැක්කේ යේසුස් වහන්සේට පමණි.

ලෝකය න්‍යෂ්ටික විනාශයකින් ගලවා ගැනීම වාර්ෂික ආදයමෙන් විශාල කොටසක් යුද හමුද වෙනුවෙන් වැය කිරීම නිසා ඇති විය හැකි සාගින්නෙන් මනුෂ්‍යයන් ගලවා ගැනීම වැනි අර්ථ කිහිපයක්ම කොමියුනිස්ට් පාලකයන් ක්‍රිස්තුස්

වහන්සේ වෙත දිනා ගැනීමෙන් ලැබේ. ජාත්‍යන්තරව ඇති කැලඹීමක අවසානය කොමියුනිස්ට් පාලකයන් ක්‍රිස්තුස් වහන්සේ වෙත දිනා ගැනීම විය හැකිය. ක්‍රිස්තුස්වහන්සේ මෙන්ම සුර දූතයන්ද ප්‍රීති ප්‍රමෝදයෙන් පිරීම, කොමියුනිස්ට් පාලකයන් උන්වහන්සේ වෙතට හැරීම විය හැකිය. එය සභාවේ ජයග්‍රහණය විය හැකිය. කොමියුනිස්ට් පාලකයන් දිනා ගනු ලැබුවහොත් ධර්ම දූත කටයුතු ඉතා දුෂ්කර නවගිනියාව හෝ මැඩගස්කරය එය අනුමත කරනු ඇත්තේ සම්පූර්ණ ක්‍රියාකාරී බලයක් ඉන් ගෙන දෙන බැවිනි.

ක්‍රිස්තුස් වහන්සේ වෙත කැපවූ කොමියුනිස්ට්වරුන් මම පුද්ගලිකවම දනිමි. මගේ තුරුණු වියෙහිදී මම අදේවදෘෂ්ටියේ තරයේම එල්බ සිටියෙමි. යේසුස් වහන්සේ වෙතට පැමිණි අදේවදෘෂ්ටිකයන් හා කොමියුනිස්ට්වරු තමන් බොහෝ පව් කල හෙයින් උන්වහන්සේට වඩාමත් ප්‍රේම කරයි.

ධර්මදූත කටයුතු වලදී උපායඥණය අවශ්‍ය වී තිබේ. පාපයෙන් ගැලවීම අතින් බැලුවහොත් සියලු ආත්මයන් එක සමානය. ධර්මදූත කටයුතු වලදී උපායඥානයෙන් එදෙස බැලුවහොත් සියලු ආත්ම එක සමාන නොවේ. වඩා බලපෑමක් කල හැකි මනුෂ්‍යයකු දිනා ගැනීම තමන්ගේ ගැලවීම පමණක් ලබා කර ගත හැකි වනචාරියකු අමතනවාට වඩා වැදගත් වෙයි. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ආගමික සේවාව අවසන් කිරීමට තෝරා ගත්තේ කුඩා ගමක් නොව ලෝකයේ ආත්මික කේන්ද්‍රස්ථානයවූ යෙරුසලමයි. ශාන්ත පාවුල් රෝමයට කිහිප වරක්ම යාමට පෙලඹවූයේද මේ කරුණමය.

ස්ත්‍රියගේ බීජය සර්පයාගේ හිස පොඩිකර දමනු ඇතැයි බයිබලය පවසයි. අපි උගේ උදරය අල්ලා කිතිකවා උං සිනහ ගන්වයි. සර්පයාගේ හිස ඇත්තේ මොස්කව් හා පීකිං අතර මිස ටියුනිස්හා මැඩගස්කරය අතර නොවේ. සෑම

කිතුනුවෙක්ම, සෑම සභා අධිපතියෙක්ම, සෑම ප්‍රධාන ධර්මදූත අධ්‍යක්ෂක වරයෙක්ම කොමියුනිස්ට් ලෝකය ගැන ප්‍රධාන වශයෙන් සිතිය යුතුය.

ඒකාකාරී වැඩ පිළිවෙල අප ඉවත ලිය යුතුය. "ස්වාමීන් වහන්සේගේ කටයුතු වංචාවෙන් කරන්නා මකාදමනු ලැබේ" යයි ලියා තිබේ. කොමියුනිස්ට් වාදයට සභාව මගින් පෙරමුනේ සිටම පහර එල්ල කල යුතුව ඇත.

යුද්ධය ජයග්‍රහණය කල හැක්කේ උපායඥණයෙන් ආරක්ෂාවීමෙන් නොව සටන් කිරීමෙනි. කොමියුනිස්ට් වාදය කෙරෙහි බලන කල රටක් පසු පස රටක් කොමියුනිස්ට් වාදයට ප්‍රිය වීමෙන් අපට පෙනෙන්නේ සභාව තවමත් සිය ආරක්ෂාව සලසා ගනිමින් සිටින බවය. සභාව තුල ඇති මෙය මුළුමනින්ම වෙනස් කළ යුතුය. දෙවියන් වෙන්ව ඇති යකඩ පොලු කපන බව ගීතාවලිය කියයි, එබැවින් යකඩ තිරය උන්වහන්සේට සුළු කරුණකි.

නීතියට පටහැනිවද, රහසිගතව ප්‍රථම සභාව කටයුතුකර ජයග්‍රහණය කලේය. එම ක්‍රමය අනුව යලි කටයුතු කිරීමට අපි උගත යුතුය.

කොමියුනිස්ට්වරුන්ගේ කාලය වන තුරුම අළුත් ගිවිසුමේ බොහෝ දෙනෙක් කවට නම්වලින් හැඳින්වූයේ ඇයි දැයි මට සිතා ගත නොහැකි විය. සිමොන් නයිගර් යනුවෙන්ද යොහන්ට මාර්ක් යනුවෙන්ද විය. කොමියුනිස්ට්වාදී රාජ්‍ය තුල සේවය කරන කල්හි අපි රහසිගත නම් පාවිච්චි කරමු.

නගරය තුලට ගොස් එහි භාජනයක් දරණ මනුෂ්‍යයෙක් සොයන්නැයි ඔහුගේ ලිපිනය නොදී, අවසාන රාත්‍රී ආහාරය පිළියෙල කරමින් යේසුස් වහන්සේ පැවසුවේ ඇයිදැයි මම තේරුම් නොගතිමි. රහස් සභාව ඉටුකරන දේව සේවයේදී අපිද එවැනි රහසිගත හැඳුනුම් ක්‍රම දිය යුතු බව මම දැන් තේරුම් ගෙන සිටිමි.

මේ ආකාරයෙන් සේවයක් කිරීම පිළිගෙන ප්‍රථම කිතුනු සභාවේ ක්‍රම අනුගමනය කරමින් වඩාත් ප්‍රතිඵලදායී ලෙස කොමියුනිස්ට් රාජ්‍යවල යේසුස් වහන්සේ වෙනුවෙන් සේවය කළ හැක.

එහෙත් ඉතා දීර්ඝ කාලයක සිට කොමියුනිස්ට් රටවල ධර්මදූත කටයුතු කරන බටහිර සභා පාලකයන් හමුවූවිට ඔවුන් කොමියුනිස්ට්වරුන් කෙරෙහි ප්‍රේමය නොදක්වන බව මට තේරුම් ගියේය. කාල්මාක්ස්ගේ ගෘහයේ විනාශවූ ආත්ම කෙරෙහි කරුණාව දක්වන යහපත් සමාරියේ වැසියෙක් මට හමු නොවීය.

ඇත්ත වශයෙන්ම මිනිසෙක් මරණයට හේතු කරුණු මිසක ඔහුගේ ධර්මය කඩ පාඩමෙන් කීම විශ්වාස නොකරයි.

තමන්ගේ විශ්වාසය උදෙසා මරණයට වුවද කැපවීමට සූදානම් බව රහස් දේවසභාවේ කිතුනු බැතිමතුන් ඔප්පු කර ඇත්තේය. මම යළිත් සිර ගෙවල තැබිය හැකි, අළුත් වධ බන්ධනවලට ලක්විය හැකි, මෙන්ම මරණයට පවා කැපවිය හැකි මෙම සේවය තවදුරටත් පවත්වාගෙන යමි. අන්තරායය මා වෙත පවරා ගනිමින් යකඩ තිරය පිටුපස මම ධර්මදූත කටයුතු මෙහෙයවීමි. මම ලියන දේ මම විශ්වාශ කරමි.

අමෙරිකාවේ සභා නායකයන් කොමියුනිස්ට් වාදයන් සමඟ මිතුරු වී මේ ඔවුන්ගේ විශ්වාශය වෙනුවෙන් මරණයට පත්විය හැකිද? බටහිර අග්‍ර ගණයේ තනතුරු හැරදමා නැගෙනහිර සාමාන්‍ය දේව සේවකයකුවී කොමියුනිස්ට්වරුන් හා සහයෝගීව විසීමට කැමතිද?යි මම ඇසීම නිවැරදිය. මේ වන තුරුද බටහිර රටවල සභා පාලකයන් එවැනි ඇඳහිල්ලක් ඔප්පුකර නැත.

එකිනෙකා පොදු වශයෙන් තේරුම් ගැනීමට දඩයම් කිරීම, මසුන් ඇල්ලීම වැනි කටයුතු වලට ජීවිතයේ අවශ්‍යදේ නිපදවා ගැනීමට තමන්ගේ හැඟීම් එකිනෙකාට ප්‍රකාශ කිරීමට

මනුෂ්‍යයන්ගේ වචනය වැඩි ඇත. එහෙත් දේවරහස්වල ප්‍රමාණය හෝ ආත්මික ජීවිතයේ උත්තරීතර බව හෝ ප්‍රකාශ කිරීමට තරම් මනුෂ්‍ය වචන නොමැතිය.

එසේම යක්ෂයාගේ කෲරත්වයේ ගැඹුර විස්තර කිරීමට හැකි මනුෂ්‍ය වචන නොමැත. නාසීන් විසින් උණු ලෝදිය ලිපකට විසිකරනු ලැබූ මිනිසකුට හෝ තමන්ගේ ලදරුවා එම ගිනි උදුනට විසිකරනු ලැබූවිට; මිනිසකුට ඇතිවන හැඟීම් ඔබට විස්තර කල හැකිද?

කොමියුනිස්ට් වරු යටතේ වධ වින්ද හා විඳින්නාවූ කිතුනුවන් විඳින වධ වේධනා විස්තර කිරීම අර්ථ විරහිතය.

රුමේනියාවට කොමියුනිස්ට් වාදය රැගෙන ආ ලුක්‍රිට්ව් පැට්රස්කානු මා සමග සිරගෙයි සිටියේය. ඔහුගේ සහෝදර වරු ඔහුට තැගි පිරිනැමූයේ ඔහු සිරගෙයි. දැමීමෙනි. යහපත් සිහි බුද්ධියෙන් පසුවුවද පිස්සන් සමග සිටීමට මානසික රෝහලට දැම්මේ ඔහුද පිස්සකු වනතුරුය. ඔවුන්ගේ හිටපු රාජ්‍යලේකම්වර ඇනා පැව්කර්ට ද කලේ මෙයමය. නිතරම පාහේ මෙවැනි සංග්‍රහ කිතුනුවන්ට දෙනු ලැබේ. ඔවුන් විදුලි සැර ලබති. ඔවුන්ට සිරුර නැමිය නොහැකි කබායන් අන්දවති. චීනයේ වීදිවල සිදුවන දේ ඇසින් නොදකිය හැකි දේ සිතින් මවා ගැනීමට දැන් වෑයම් කරන්න. මේ සම්බන්ධව ඇති අවසාන ප්‍රවෘත්තිය මෙයයි. කීර්තිමත් වන දේව සේවක ලේඛකයන් හා අනෙක් ක්‍රිස්තු භක්තිකයන් තමන්ගේ විශ්වෘශය අත් හැරීමට මැලිවූ විට ඔවුන් සිරභාරයට ගත් අය ඔවුන්ගේ කන් කැපූහ. දිව වල් කැපූහ. පා කැපූහ.

දරුනු වධ බන්ධන වලට ලක් කිරීම මරා දැමීම කොමියුනිස්ට් වාදීන් විසින් කරනු ලබන බලවත්ම නපුරුකම් නොවේ. ඔවුන් බලාපොරොත්තු කඩවන අයුරින් වැඩුන අයගේ මෙන්ම ළමුන්ගේද සිතිවිලි දූෂ්‍යකර දමති. ඔවුන් අන්තේවාසිකයන් දේවස්ථානවල තනතුරුවලට පත්කොට කිතුනුවන්ද සභා ද විනාශයට පත්කරති. තරුණයන්ට

දෙවිකෙනෙකුන් හා යේසුස් වහන්සේ කෙනෙකු විශ්වාශ නොකරන ලෙසටද ඊට වෛර කරන ලෙසද උගන්වති.

අවුරුදු ගණනාවක් සිර ගෙවල දුක්විඳ ආපසු ගෙදර එන අයට තමන් ගෙදරින් බැහැරව ගත කල කාලය තුලදී දැඩිලෙස අදේවදෘෂ්ටිකයන් වී ඇති සිය දරුවන්ගෙන් අපහස විඳින කල ඇතිවන සංවේගය අපි කෙසේ පල කරන්නෙමුද?

මෙම ග්‍රන්ථය ලියා ඇත්තේ හුදෙක්ම තීන්තෙන් නොව හදවත් තුලින් වැගිරුනු රුධිරයෙනි.

දනියෙල් සමග තරුණයන් තිදෙන ගිණි උදුනට බහාලු කල ඉන් ඔවුන් ගැලවුවං පමණක් නොව ඔවුන් වෙතින් දුම් ගඳක් හෝ වහනය නොවූවාක් මෙන්, කොමියුනිස්ට් සිර ගෙවල දුක් විඳ එන කිතුනුවන්ගේ සිත් තුල කොමියුනිස්ට් වරුන්ට විරුද්ධව කිසි තිත්තකමක් දක්නට නොලැබේ.

මලක් පාගා පොඩිකර දමනු ලැබූ කල ඊට ඔබට ත්‍යාග යක් වශයෙන් සිය සුවඳ දෙන්නාක් මෙන් තමන්ට වධ දෙන කොමියුනිස්ට්වරුන්ට කිතුනුවන් ප්‍රේමය දක්වති. අපි බොහෝ ජේලර්වරයන් ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ආවෙමු. අපි හැම දෙනාම එකම ආශාවකින් පෙළුනෙමු. එනම් අපට පීඩා කරන කොමියුනිස්ට්වරුන් වෙත අපට ඇති උත්තරීතර දෙය එනම් ක්‍රිස්තුස්වහන්සේ වෙතින් ලැබෙන පාපයෙන් ගැලවීම ප්‍රදනය කිරීමේ ආශාවය.

සිරගෙය තුල වේද සාක්ෂිකයකු හැටියට මියයාමේ උතුම් අවස්ථාවක් මට අත් නොවීය. මම නිදහස් කරනු ලැබ රුමේනියාවෙන් පිටවී බටහිර බලා ඒමටද අවකාශ ලැබුනි.

යකඩ තිරයෙන් ඔබ්බෙහි ඇති බලවත් රහස් සභාව ගැන, තමන්ට සිතට නැගෙන විරුද්ධ අදහස් ප්‍රකාශ කරන බොහෝ සභා පාලකයන් මට හමු විය. බටහිර සිටින බොහෝ කිතුනු වන්ට කොමියුනිස්ට් වරුන් කෙරෙහි ප්‍රේමයක් නොමැත.

කොමියුනිස්ට් රටවල ජනයාගේ ගැලවීම උදෙසා ඔවුන් කිසිවක් නොකිරීමෙන් එය සනාථ වේ. ඔවුන් යුදෙව්වන් වෙත ගොස් ඇත. මහමදීකයන් හා බෞද්ධයන් වෙත ධර්මදූත සේවයේ යෙදී ඇත. ඔවුන් කරුණු පහද දෙයින් වෙනත් සභාවන් වෙත ගොස් ඇත. එහෙත් ඔවුන් කොමියුනිස්ට් වරු කරා නොගියහ. ඔවුන් කොමියුනිස්ට් වරුන්ට ප්‍රේම නොකරති. නොඑසේ නම් ඉන්දියානුන් කරා ගිය කාරි සහ චීනය බලා ගිය හඩ්සන් ටේලර් මෙන් වැදගත් ධර්මදූත මෙහෙයන් ඉටු කරන්නට තිබුනි.

ඔවුන් කොමියුනිස්ට වාදීන්ට ප්‍රේම නොකරනවා පමණක් නොව ඔවුන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට මොවුන් දිනා ගැනීම වද කිසිවක් කර නොමැත. තමන්ගේ ක්‍රියාවලියන් නිවැරදි යයි ප්‍රීතියට පැමිණ ඔවුන් නොසලකා හැර දැමීම නිසාද, සමහර විටෙක ඔවුන් අපරාධයට හවුල්කාරයන් ලෙස සැලකීම නිසාද, බටහිර සභා පාලකයෝ කොමියුනිස්ට්වරු තුල, ආගම කෙරෙහි ඇති අවිශ්වාසය තහවුරු කරති· ඇරහුමකින් තොරවම සභා පාලනය කොමියුනිස්ට්වරුන්ට දිනා ගැනීමටද, ලෝකයේ සභාවල මෙහෙයවීම ලබාගැනීමටද උදව් කරති. ඔවුන් කිතු තුමන්ට කොමියුනිස්ට් වාදයේ ඇති අන්තරායකාරී බව නොහභවති.

කොමියුනිස්ට්වරුන්ට ප්‍රේම නොකිරීමද, ඔවුන් ක්‍රිස්තුස්-වහන්සේ වෙතට දිනාගැනීමට කටයුතු නොකිරීමෙන්ද, (ව්‍යාජ කරුණු දක්වීම යටතේ එසේ කිරීමට ඔවුන්ට අවසර නැත. එනම් ප්‍රථම ක්‍රිස්තු භක්තිකයෙක් නීරෝගෙන් ශුභාරංචිය පතල කිරීමට අවසර ඉල්වා සිටියාක් මෙනි) මොවුන් සිය රැලට ප්‍රේම නොකරති. අපි ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනා නොගැනීම නිසා ඔවුන් බටහිර තම බලයට යටත් කොට කිතුනු දහමද මුලිනුපුටා දමනු ඇත.

**නොසලකා හරිනු ලැබූ ඉතිහාස පාඩම.**

ප්‍රථම ශතවර්ෂයේදී උතුරු අප්‍රිකාවේ ක්‍රිස්තියානි ධර්මය දියුණු විය. ශාන්ත අගොස්තීනු, ශාන්ත සයිප්‍රියන්, ශාන්ත ඇතනියුස් සහ වර්ටුලියන් වැනියවුන් එහි සිට පැමිණියහ. උතුරු අප්‍රිකානු කිතුනුවෝ එක් දෙයක් නොසලකා හැරියහ. එනම් මහමදගමිකයන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගැනීම නොසලකා හැරීමය. එහි ප්‍රතිඵලය වූයේ උතුරු අප්‍රිකාව ආක්‍රමණය කළ මුස්ලිම්හු ශතවර්ෂ ගණනාවකට ම එහි කිතු දහම මුලිනුපුටා දමනු ලැබූහ. වර්තමානයේ පවා උතුරු අප්‍රිකාව අයත් මුස්ලිම් වරුන්ටය. ක්‍රිස්තියානි ධර්මදූත ව්‍යාපාර ඔවුන් හඳුන් වන්නේ ''දේව ධර්මය නොපිලිගන්නා කණ්ඩායම'' යනුවෙනි. ඉතිහාසයෙන් අපි යමක් ඉගෙන ගනිමු.

සංශොධන කාලය තුලදී හුස්, ලූතර් හා කැල්වින්ගේ ආගමික ප්‍රබෝධය ද යුරෝපීය ජනතාව ඉසිලිය නොහැකිව සිටි දේශපාලනික හා ආර්ථික බලයේත් (Papacy) පල්ලියේ බලපැමෙනුත් ඉවත්වීමද එකවිටම සිදුවිය. එසේම රහස් සභාවේ බලාපොරොත්තුව වන්නේ කොමියුනිස්ට් වරුන් හා ඔවුන්ගේ ගොදුර වෙත එක්වරම ශුභාරංචිය පැතිරවීමත් සකල නිදහස් මනුෂ්‍ය වර්ගයා සැමද නිදහස් රාජධානියේ ජීවත්වීමත්ය.

කොමියුනිස්ට් වාදය හෙලා දැකිය නොහැකි දේශපාලනික බලවේගයක් නොමැත. කොමියුනිස්ට් වරුන්ට න්‍යෂ්ටික බලය ඇත. ඔවුන්ට විරුද්ධව යුද්ධකිරීමෙන් වන්නේ කෝටි සංඛ්‍යාත ජනකායක් බිල්ලට දීමය. මනස විකෘති කරනු ලැබූ බොහෝ බටහිර පාලකයෝ කොමියුනිස්ට් පාලකයන් හෙලා දැකීම වුවද අදහස් නොකරයි. එය ඔවුන් නිතරම පවසා ඇති එකකි. ඔවුන් පිලිකා රෝගය, ක්ෂය රෝගය ගෙන දෙන මත්ද්‍රව්‍යද, අපරාධකාරී රංචු ගැසීම අනුමත කරනු මිසක් මේ හැමකකටම වඩා විනාශය ගෙන දෙන බව ප්‍රකාශ කොට ඇති කොමියුනිස්ට්වාදය අනුමත නොකරති.

ස්ටාලින් සිය ජීවිත කාලය තුලදී බිල්ලට දුන් අහිංසක යන්ගේ නම් ලියුවහොත් එය අවසන් කිරීමට ඔහුගේ ජීවිත කාලයම ප්‍රමාණවත් නොවන බව ලල්යා එරෙන්බර්ග් නමැති ලේඛකයා පවසයි. කොමියුනිස්ට් පක්ෂය ඇමතූ නිකිතා කෘෂෙව් ''හත් වැනි සමුළුවේදී තෝරා ගන්නා ලද මධ්‍යම කාරක සභාවේ එකසිය තිස් නවදෙනාගෙන් අනූඅට දෙනෙකු, එනම් සියයට හැත්තෑවක් පමණ සිර කිරීමෙන් හා වෙඩි තබා මරා දැමීමෙන් බවත්, දහස් ගණන් අවංක, නිදොස් කොමියු-යුනිස්ට් වරුන්ගේ ජීවිත බිලි ගැනීමෙන් ස්ටාලින් ගෙවූ බවත් ප්‍රකාශ කලේය.

දැන් ස්ටාලින් කිතුනුවන්ට කල දේ සිතා බලන්න.

කෘෂෙව් ස්ටාලින් අනුගමනය නොකලද එවැනි කටයුතු නොකඩවාම ඉටු කලේය. 1959 සිට සෝවියට් රුසියාවේ තිබුනු දේවස්ථාන වලින් හරි අඩක්ම වසා දමා ඇත.

ස්ටාලින්ගේ කාලයට වඩා දරුනු මලෙච්ඡ ක්‍රියා රැල්ලක් චීනයේ නැගී ඇත. දේවස්ථානයක් ආරම්භ කිරීම ජීවිතය අවසන් කිරීම බඳු ක්‍රියාවකි. රුසියාවේ හා රුමේනියාවේ ලඟදී බොහෝ ගණන් සිර කර ඇති බැව් දැනගන්නට ලැබී ඇත.

කෝටි සිය ගණනක ජනකායක් භයට හා රැවටිල්ලට ලක් කරමින් බටහිර හැම දෙයකටම, විශෙෂයෙන්ම කිතු දහමට ද, ද්වේෂ කරන තත්වයකට තරුණ පරම්පරාව ගෙන විත් ඇත.

දේවස්ථාන අබියස සිට එහි එන ළමුනට පහරදී එලවා දමන නිලධාරීන් රුසියාවේ සාමාන්‍ය දර්ශනයකි. බටහිර කිතු දහමේ අනාගත විනාශකාරීන් වූ මොවුන් ඉතා ක්‍රමානු-කූලව, ඉතා සූක්ෂමව නැගී ඇත. කොමියුනිස්ට්වාදය ඉවත් ලිය හැකි එකම බලවේගයක් ඇත. එනම් කිතුනු රාජ්‍යයන් රෝමානු අධිරාජ්‍යය බවට පෙරලූ බලයයි. වනචාරී වයිකිංස්

වරු හා විශුටන්ස්වරු කිතුනුවන් කිරීමේ බලයයි - තුවණවූ අනුන්ගේ කටයුතු සෙවීම ඉවත ලෑමේ බලයයි. එනම් කොමියුනිස්ට් රාජ්‍යයන්හි රහස් සභාව නියෝජනය කරන හිභාරංචියේ බලයයි.

මෙම සභාව රඳා පැවැත්වීම හා ඇයට උදව් දීම පමණක් නොව දුක් විඳින සහෝදරයන්ද ප්‍රශ්නයක් නොවේ. එහි අර්ථය නම් ඔබේ රට උදෙසා හෝ ඔබේ දේවස්ථානය උදෙසා ජීවත්වීම හෝ මරණයයි. නිදහස් කිතුනුවන්ගේ ප්‍රීතිය මෙම සභාව නොවැටී රැඳීම පමණක් නොවිය යුතුය. එහි නිදහස් රාජ්‍යයක ක්‍රමයක් තිබිය යුතුය.

රහස් සභාව මගින් කොමියුනිස්ට පාලකයන් යේසුස්-වහන්සේ වෙත දිනාගෙන අවසානය. රුමේනියාවේ අගමැති ජෝර්ජ්හියු ඩෙජ් සිය පාපී ජීවිතය අවසන්කොට තමාගේ පාපයන් පාපොච්චාරණය කොට කැපවූ මනුෂ්‍යයකු ලෙස මිය ගියේය. කොමියුනිස්ට රටවල රහසිගතව කිතුනුවන්ව සිටින රජයේ සේවකයන්ද වෙති. මෙය පැතිරී යා හැක. ටිටෝ, ගොමුල්කා ඒකාධිපති කෲර පාලකයන්ව සිට පසුව කිතු දහමට හා නිදහස වෙත හැරීම මෙන් නොව, එවිට කොමියුනිස්ට් රාජ්‍යවල නියම අන්දමේ වෙනස්වීමක් බලාපොරොත්තුවිය හැක.

මේ සම්බන්ධයෙන් බලාපොරොත්තු සහගත අවස්ථා දනට පැන නගියි. කිතුනුවන් ඔවුන්ගේ මහත් බියකුරු අවස්ථාහිදී අවංකව සිටින්නාක් මෙන්ම, කොමියුනිස්ට් වරුන් ඔවුන්ගේ විශ්වාශයන් කෙරෙහි අවංකවෙති. කොමියුනිස්ට් වාදයෙන් ලෝකයේ ජාතීන් අතර සහෝදරත්වය පැන නඟිනු ඇතැයි ඇත්ත වශයෙන්ම ඔවුහු ඇහුවාහුය. එහෙත් ඔවුන් දූන් කොමියුනිස්ට් රටවල් එකිනෙකා බල්ලන් මෙන් කලහ කරගන්නා අයුරු දකිති.

කොමියුනිස්ට්වාදය මගින් ඇත්තටම භූමික පරාදීසියක් මවනු ඇතැයි ඔවුන් විශ්වාශ කලෙන් ස්වර්ගීය පරාදීසිය ඔවුන් මිථ්‍යාවක්සේ සලකා එපාකලාහුය. එහෙත් දූන්

ඔවුන්ගේ ජනතාව සාගින්නෙන් පෙලෙන හෙයින් ධනවාදී රටවලින් තිරිඟු ආනයනය කිරීමට සිදුවී ඇත.

කොමියුනිස්ට්වරු තම නායකයන් කෙරෙහි විශ්වාසය තැබූහ. ස්ටාලින් මනුෂ්‍ය ඝාතකයෙක් බවද, ඔවුන්ගේම පත්‍රවල ඔවුන් කියවති. ජාතික වීරවරයන් වූ රකෝසි, ඇනා පව්කාර්, ජීරෝ රූන් කොව්සි ගැනද ඇත්තේ මෙයමය. තව දුරටත් කොමියුනිස්ට්වරුන් තම නායකයන්ට නොවරදින බව විශ්වාස නොකරති. ඔවුන් හරියටම පාප්තුමෙකු නොමැති කතෝලිකයන් වැනිය.

කොමියුනිස්ට්වරුන්ගේ හදවත්වල කුහර වෙති. ඒ කුහරයන් පුරවාලිය හැක්කේ යේසුස් වහන්සේ තුලින් පමණි. ස්වභාවයෙන්ම මනුෂ්‍ය හදවත් දෙවිකෙනෙකු සොයයි. යේසුස්වහන්සේ පුරවාලන තෙක්ම හැම මනුෂ්‍යයකු තුලම ආත්මික ශූන්‍ය බවක් පවතී. මෙය කොමියුනිස්ට්වරුන් විෂයෙහිද සත්‍යයකි. ඔවුන්ටත් අභියෝග කළහැකි ප්‍රේමයේ බලයක් ශුභාරංචිය තුල පවතී. එය සිදුවනු මම දිටිමි. එය කල හැකි බව මම දනිමි.

තමන්ගේ පවුල්වලට ද පුද්ගලිකවම තමන් හට කරනලද ගැරහිලි, වධබන්ධනද, අමතක කළ කිතුනුවෝ ඊට කොමිනියුස්ට්වරුන්ට සමාව දුන්නෝය. කොමියුනිස්ට්වරුන්ට උද්ගතවන අර්බුදකාරී තත්වයන්හිදී ඉන්මිදී ක්‍රිස්තුස් වහන්සේ වෙතට යාමට කිතුණුවෝ ඔවුන්ට හැකි උසස්ම අයුරින් ක්‍රියා කරති. මේ කටයුත්තට ඔවුන්ට අපේ උදව්ව අවශ්‍යවෙයි. මෙපණක් නොව ක්‍රිස්තුභක්තියෙන් විශ්ව ප්‍රෙමයකින් වෙලී ඇති අතර එහි විශේෂතාවයක් නැත. සියලු යහපත සහ නපුර මත්තෙහි හිරුදෙවි නගින බව යේසු සමිඳුන් වදලහ. කිතුනු ප්‍රෙමය ගැනද කීමට ඇත්තේ මෙයමය. අපි අපගේ සතුරනට ප්‍රෙම කළ යුතුයයි ඇති යේසු සමිඳුන්ගේ උගැන්වීම අනුගමනය කරමින් බටහිර ක්‍රිස්තියානි නායකයෝ කොමියුනිස්ට් වරුන්ට මිත්‍රත්වය

දක්වති. එහෙත් අපි අපේ සොහොයුරන් අමතක කරමින් සතුරනට පමණක් ප්‍රේම කලයුතුයයි යේසුස්වහන්සේ උගැන්වූයේ නැත.

යේසුස් වහන්සේ පිළිබඳ ශුභාරංචිය නොදෙමින් කිතුනුවන්ගේ රුධිරයෙන් දූන් නහවාගෙන, ජයගනිමින්, සෝෂා නගමින් තමන්ගේ ප්‍රේමය ඔවුන් පෙන්වති. කොමියුනිස්ට් වරුන්ගේ මේ පීඩා අමතක කර දමා ඇත. ඔව්හු ප්‍රේමකරනු නොලැබුවා හුය.

බටහිර ජර්මන් කතෝලික සභාව හා අනෙක් ශුභාරංචි ආයතන මගින් පසුගිය හත්වර්ෂය මුළුල්ලේ ඩොලර් දශලක්ෂ 125 සාගින්න නිවීමේ කටයුත්තට කැපකර ඇත. අමෙරිකානු කිතුනුවෝ ඊටත් වඩා දෙනු ලැබ ඇත.

සාගින්නෙන් පෙලෙන බොහෝජනයා ඇත. එහෙත්, නිදහස් කිතුනුවන් විසින් ආධාර කලයුතු තත්වයක සිටින වේදසාක්ෂිකයන් තරම් සාගින්නෙන් පෙලෙන අනෙකෙක් වේද'මට සිතිය නොහැක. ජර්මන් බ්‍රිතාන්‍ය අමෙරිකා හා ස්කැන්ඩිනේවියානු සභා මගින් ආධාර වශයෙන් මුදල් ලැබුන හොත් ඒවා අවශ්‍ය හැමදෙනා වෙතටම ලැබිය යුතුය. එහෙත් ප්‍රථමයෙන්ම ලැබිය යුත්තේ වේද සාෂිකයන් හා ඔවුන්ගේ පවුල්වලටය.

දූන් එය සිදුවන්නෙහිද? ක්‍රිස්තියානි සංවිධාන මගින් කිතුනුවන් ත්‍යාගශීලිබව පෙන්වමින් මට සිරගෙයින් නිදහස් වීමට මුදල් ලැබුනි. කෙසේ වුවද අපේ රටේ කිතුනුවන් විසින් සිරකරුවෙකුට නිදහස් වීමට මුදල් ගෙවීත. ඒ මට පමණි. මගේ නිදහස්වීමට මුදල් දීමෙන් හෙළිවන සත්‍ය නම් බටහිර ක්‍රිස්තියානි සංවිධාන තමන්ගේ කටයුතු නොසලකා හරිනු ලැබීම ගැන චෝදනා කිරීමට සුදුසු බවය.

නව සභාව යුදෙව්වන්ටමද. නැතහොත් අන්‍ය ජාතීන්ටත් සමව දැයි ප්‍රථම ක්‍රිස්තියානින් ඔවුන්ගෙන්ම ප්‍රශ්න කලාහුය. ප්‍රශ්නය ඊට නියම පිළිතුර ලැබුවේය. විසි වන සියවසේදී මෙම ප්‍රශ්නය යලිත් මතු විය. ක්‍රිස්තියානි ආගම බටහිරට පමණක් නොවේ. ක්‍රිස්තුස් වහන්සේ අයත් වන්නේ අමෙරිකාවට හෝ එංගලන්තයට හෝ අනෙක් ප්‍රජාතන්ත්‍රවාදී රට වලට පමණක් නොවේ. ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබූවිට උන්වහන්සේගේ එක් හස්තයක් නැගෙනහිරටද අනෙක බටහිරටද විහිදති. යුදෙව්වන්ට පමණක් නොව අන්‍ය ජාතීන්ට මෙන්ම කොමියුනිස්ට්වාදීන්ටද රජවීම උන්වහන්සේ අපේක්ෂා කරයි. බටහිර ලෝකයාට පමණක් නොව මුළු ලෝකයේම ගොස් හැම මැවිල්ලකටම ශුභාරංචිය දේශනා කරන්නැයි උන්වහන්සේ කී සේක. උන්වහන්සේ සිය රුධිරය පූජා කරනු ලැබුවේ සියල්ලන් උදෙසාය. සියල්ලන්ම ශුභාරංචිය අසනු පිණිසය. විශ්වාස කරනු පිණිසය.

කොමියුනිස්ට් රටවල ශුභාරංචිය දේශනා කිරීමට අප පොලඹවන්නේ කුමක් ද? ඒ රටවලින් ක්‍රිස්තුස් වහන්සේ වෙතට එන අය තුල ඇති ප්‍රේමය හා උනන්දුවයි. එකම ඇල්මැරුණු රුසියානු කිතුනුවෙක්වත් මට හමු නොවීය. කොමියුනිස්ට් තරුණයන්ට ක්‍රිස්තුස් වහන්සේගේ විශේෂ ශ්‍රාවකයන් විය හැකිය. පාපයේ ජීවත්වන සකල මනුෂ්‍යයාම ඉන් මිදී නිදහස් වීම ක්‍රිස්තුස් වහන්සේගේ ආශාව මෙන්ම කොමියුනිස්ට් වරුන්ටද ප්‍රේම කරයි. ඔවුන් කොමියුනිස්ට් වාදයෙන් මිදී එනු ඇතැයි උන්වහන්සේ අපේක්ෂා කරයි. සමහර සභා පාලකයන් මේ වෙනුවට කොමියුනිස්ට්වාදයේ නිවැරදි බව පමණක් කියමින් එය කෙරෙහි ප්‍රසන්න භාවයක් පෙන්වයි. ඔවුන් පාපී සභාවයට උදව් කරයි. කොමියුනිස්ට් වාදයට ජයග්‍රහණය කිරීමට ඔවුන් උදව් දෙමින් කොමියුනිස්ට් වරුන්ගේ බිල්ල වැනිවූ ගැලවීම ඔවුන් කෙරෙන් සඟවති.

## නිදහස් කරනු ලැබූවිට මට හමු වූයේ කුමක්ද?

මම සිර ගෙදරින් නිදහස් කරනු ලැබූ විට අනාගත සැලැස්ම ගැන විමසූ බිරිඳට මම මෙසේ කීවෙමි. "මා ඉදිරි

යෙන් ඇති විශිෂ්ටම දෙය නම් ආත්මික තවුස් ජීවිතයයි'' ඇයටද එවැනි අදහසක් වූ බව ඇය කීවාය. මගේ යෞවන ජීවිතයේදී ක්‍රියාශීලී ස්වභාවයක් මා තුල තිබුනි. එහෙත් සිර ගෙයිදී තනිවම වර්ෂ ගනනාවක් සිර කර තැබීම නිසා එය භාවනානුයෝගී කල්පනාවෙන් යුක්ත මනුෂ්‍යයකු බවට මාරු කරනු ලැබිය. හදවත තුල වූ සියළුම කුණාටු නිශ්චල වීය. කොමියුනිස්ට්වාදය මම ගණන් නොගනිමි. ඒ ගැන තැකීමක් පවා නොකෙලෙමි. මම ස්වර්ගීය මනාලියා වැළඳගෙන සිටියෙමි. මා වධ වේදනා වලට ලක් කල අය කෙරෙහි යාච්ඤා කල අතර ඔවුන්ට මුළු හදින්ම ප්‍රේම කිරීමට හැකි විය.

කෙදිනකදී හෝ මම නිදහස් කරනු ඇතැයි මා තුල බලාපොරොත්තුවේ සේයාවක් විය. එසේ නිදහස් කල විට මම කුමක් කල යුතු දැයි වරින් වට සිතට වධ දුනි. මම නිරන්තර යෙන්ම මෙනෙහි කලේ ජීවිතයේ අවසාන භාගයේ දී ජීවන කතරෙහි කිසියම් තැනකදී මිහිරිතම එක්වීමකින් ස්වර්ගීය මනාලියා හා ගත කිරීමයි.

දෙවියන් වහන්සේ සත්‍යයි.බයිබලය සත්‍යය ගැන සත්‍යයයි. දේව ධර්ම ශාස්ත්‍රය පිළිබඳව ඇති සත්‍යයේ සත්‍යයමූලික ධර්මය පිළිබඳව ඇති සත්‍යයේ සත්‍යයේත් සත්‍යයයි.ක්‍රිස්තියානි ජනතාව සත්‍යය ගැන ඇති බොහෝ සත්‍යයන් තුල ජීවත්වන හෙයින් සත්‍යය නැත. සාගින්නෙන් පෙලෙන, පහරදෙනු ලැබූ, මත්වී ගිය අප විසින් දේව ධර්ම ශාස්ත්‍රය හා බයිබලය අමතක කර දමා ඇත. සත්‍යය පිලිබඳ වූ අපි අමතක කර දමා ඇත. එබැවින් අප ජීවත් වූයේ සත්‍යය තුලය. ''ඔබ නොසිතන පැයේදී ඔබ නොසිතන දිනක දී මනුෂ්‍ය පුත්‍රයා එනු ඇතැ''යි ලියා තිබේ. අපිට තව දුරටත් සිතිය නොහැක. වධ බන්ධන විදින අපේ අඳුරුතම පැයේදී මනුෂ්‍ය පුත්‍රයා සිර මැදිරිවල බිත්ති රතු කැට මෙන් දිලිසවමින් සිර මැදිරි ආලෝකයෙන් පුරවාලමින් අප වෙත පැමිණි සේක. ඈත ඈතක වූ කිසියම් තැනෙක අපි ශරීරාකාරයෙන් වධ විදිමින් සිටියෙමු.

එහෙත් ආත්මය ස්වාමීන් වහන්සේ තුල ප්‍රීති ප්‍රමෝදයට පත් විය. රාජකීය මාලිගා උදෙසා අපි මෙම ප්‍රීතිය අත්හලේ නැත.

යමකට හෝ යමෙකුට විරුද්ධව සටන් කිරීම! නැත. මගේ සිත් තුල ඊට වඩා යමක් නැත. මම යුද්ධයන්හිදී ද, දැනට පවතින යුද්ධයන්හිදී ද සටන් කිරීම අපේක්ෂා නොකලෙමි. මම කැමැත්තෙන්ම අපේක්ෂා කලේ ක්‍රිස්තුස් වහන්සේ වෙතට ජීවමාන ආරාමයක් ගොඩ නැංවීමටය. එය සිර මැදිරියේදී නිසංසල කල්පනාවෙන් ගත කල වර්ෂයන්හිදී වූ බලාපොරොත්තුවයි.

මම නිදහස්වූ කල මුල් දින වලදීම හිර ගෙදර දී වින්ද වධ වේදනාවලට වඩා පිළිකුල් කොමියුනිස්ට්වාදී දෘෂ්ටියකට මුහුණ දුනිමි. මට හමුවූ මහා දේශකයින්, විවිධ සභාවල දේවගැතිවරු හා බිෂොප්වරු ඔවුන් තමන්ගේ රැලට විරුද්ධව රහස් පොලිසියට ඔත්තු සපයන බව කීවේ දැඩි ශෝකයකිනි. ''ඔවුන්ගේ ඔතුත් සපයන ජීවිතය අත්හැරදමා සිරගෙට යාමට සූදනම් දැයි'' මම ඔවුන්ගෙන් ඇසුවෙමි. සියල්ලෝම ''නැහැ' යනුවෙන් පිළිතුරු දි ඔවුන් වලක්වන අයට බිය නොවන බව පැහැදිලි කරමින් පැවසූහ. ඔත්තුකාරයකු නොවීම දේවස්ථානය වසා දැමීමට හේතුවක් වන බවද, මම සිර අඩස්සියට ගැනීමට පෙර නොවූ සභාවල අළුත් 'සංවර්ධනයක්' ගැන මට පැවසූහ.

හැම නගරයකටම මිනිසුන්ගේ ඇදහීම පාලනය කරනු සඳහා රජයේ නියෝජිතයෙක් වූ රහස් පොලිසියේ නිලධාරියෙක් පත්කර ඇත. ඔහුට අවශ්‍ය ඕනෑම වෙලාවක ඕනෑම පූජකයෙකුගෙන් දේවස්ථානයේ සිටින්නේ කවුරුන්ද? නොකඩවාම ශුද්ධවූ රාත්‍රී භෝජනය ගන්නේ කවුරුන්ද? ආගම ගැන ජ්වලිත කවුරුන්ද? ආත්ම දිනන්නවුන් කවුරුන්ද? මිනිසුන් පාපොච්චාරණයේදී කුමක් කියන්නේද? ආදී වශයෙන් ප්‍රශ්න කළ හැක. ඊට උත්තර දීගත නුහුණ හොත් ඔහු

අස්කර දමා ඒ සම්බන්ධයෙන් ඔහුට වඩා කිවහැකි පූජකයෙක් පත්කර ගනී. එවැනි අයෙකු නැතිවූ විට එම දේවස්ථානය හෙමින් සීරුවේ වසා දමනු ඇත.

බොහෝ පූජකවරු රහස් පොලිසියට වෙනස්, වෙනස් තොරතුරු දුන්හ. සමහරු යම් යම් දේ සඟවමින් අසතුටෙන් කීකරු වූහ. සමහරු හෘදය සාක්ෂිය දැඩිකර ගනිමින් පුරුද්දක් වශයෙන් කීහ. සමහරු ඒ ගැන තදින්ම සිතට ගනිමින් ඔවුන්ට අණ කළාටත් වඩා කිවූහ.

වේද සාක්ෂික කිතුනු ළමුන් පිරිසකගේ පාපොච්චාරණයක් මම ඇසුවෙමි. වරක් ඔවුන්ට කාරුණිකව සැළකූ අය ගැන පවසන ලෙසට බල කරනු ලැබූහ. නැතහොත් තව දුරටත් ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවන තැනට කටයුතු සැලසීය. බැප්ටිස්ට් සභාවේ රැස්වීමකට මම ගියෙමි. එම රැස්වීම පැවැත්වූයේ රතු ධජය යටතේය. තෝරාගත් නායකයන් කවුරුන් විය යුතුදැයි කොමියුනිස්ට්වරු මෙහිදී තීරණය කළහ. සෑම රහස් දේවස්ථාන වල පූජකයන් තෝරාගනු ලැබුවේ කොමියුනිස්ට් පක්ෂය මගිනි. එවිටම යේසුස්වහන්සේ වදාළ එපාකරනු ලැබූ පිළිකුළ මහාපරිශුද්ධස්ථානයේ තිබීම අවබෝධ කරගතිමි.

හැමවිටම යපහත් මෙන්ම නරක දේවගැතිවරු සිටියහ. එහෙත් දැන් සහා ඉතිහාසයේ ප්‍රථම වරට මධ්‍යම කමිටුව හෙවත් අදේව දෘෂ්ටික පක්ෂය මගින් ක්‍රිස්තියානි ආගම මුලිනුපුටා දැමීම සඳහා සහා පාලනය කිරීමට තීරණය කළහ. එවැනි පාලනයක අදහස කමක් ද? ඇත්ත වශයෙන්ම කිතු දහම මුලිනුපුටා දැමීමය.

ලෙනින් මෙසේ ලීවේය. සෑම ආගමික මතයක්ම, දෙවියන් පිළිබඳ සෑම අදහසක්ම, දේව මතයන්ට ආශා කිරීම කිව නොහැකි ඉතා අන්තරායදායී පහත් ස්පර්ෂයෙන් බෝවන පිළිකුල් දෙයකැයි, දශලක්ෂගනන් පාප, කැත රෞද්‍ර ක්‍රියා සහ ස්පර්ෂයෙන් බෝවන රෝග දෙවියන් වහන්සේ පිළිබඳ ආත්මික අදහස් වලට වඩා සියුම් දෙයකි.''

සෝවියට් දේශයේ හැම කොමියුනිස්ට් පක්ෂයක්ම ලෙනින්වාදිය. ඔවුන්ට ආගම පිළිකාවකට, ක්ෂයරෝගයට, වඩා පිළිකුල්ය. ආගමික නායකයන් විය යුත්තේ කවුරුන් දැයි තීරණය කළහ. රජයේ දෙවස්ථානවල නායකයෝ එක්වී ඔවුන් සමග ඒවා තෝරා බේරා ගත්හ.

දෙවිකෙනෙක් නැතැයි යන මතයෙන් තරුණ හා ළමයින්ගේ සිත් දූෂණය කිරීම මම දැක ඇත්තෙමි. රජයේ දේවස්ථානවලට එය ඉතා සියුම්ලෙස හෝ බාධා කිරීමට නොහැකිවිය. අපේ අගනුවර වූ බුකාරෙස්ට් නගරයේ දේවස්ථානයක් හෝ තරුණ රැස්වීමක් හෝ ළමයින්ගේ ඉරුදින දහම් පාසලක් නොමැත. කිතුනු ළමයින්ට පාසැල්-වලදී සලකනු ලැබුවේ ඉතා කුරිරු අන්දමිනි.

මා වධබන්ධන වලට මුහුණදේද්දී හටගත් වේදනාවට වඩා මහත් වේදනාවකින් මේවා දැකීමෙන් මම පෙළුනෙමි. මම කොමියුනිස්ට් වාදයට වෛර කළෙමි.

මම කොමියුනිස්ට් වාදයට වෛර කරනු ලැබුවේ මට කල කරදර නිසා නොව දෙවියන් වහන්සේගේ මහිමයටද ක්‍රිස්තුස් වහන්සේගේ නාමයටද එදිරිව කල දේ හා ඔවුන්ගේ පාලනය යටතේ සිටින කෝටිගණන් ආත්ම නිසාය. රටේ හැම තැනකින්ම ගැමියෝ මා හමුවී සමූහ ගොවිපොලවල පාලනය කරනු ලබන අන්දම පැවසූහ. පෙර ඔවුන්ගේම ගොවිබිම්-වලදී ද, මිදිවතුවලදී ද, අද ඔවුන් සාගින්නෙන් පෙලෙන වහලුන්ය. ඔවුන්ට පාන් නොවීය. ළදරුවන්ට කිරි හෝ පලතුරු නොවීය. පෙර කානාන් දේශය මෙන් ස්වාභාවික සම්පතින් පොහොසත් වූ මේ රටේ අද මෙසේය.

කොමියුනිස්ට් පාලනය නිසා ඔවුන් හැම දෙනාම බොරුකාරයන් හා සොරුන් වී ඇති අයුරු සහෝදරයෝ මට පැවසූහ. ප්‍රථමයෙන් ඔවුන් සතුවූ එහෙත් දැන් සමූහ

ගොවිපලවලට අයත් තැන්වලින් සාගින්න නිසාම සොරකම් කළහ. අනතුරුව ඔවුන්ගේ සොරකම් වසාදැමීමට බොරු කීමට සිදුවිය.

කම්කරුවෝ කම්හල්වල ඇති භයංකර තත්වය පවසමින්, ඔවුන්ගේ ශ්‍රමශක්තිය ධනවාදීන් සිහිනෙකුදු නොසිතන අයුරින් රජයේ ලාභය තකා ගන්නා අයුරු පැවසුවෝය. එහි කම්කරුවනට වැඩ වර්ජන කිරීමට ඉඩ නොලැබේ. තම හෘදය සාක්ෂියට විරුද්ධව දෙවිකෙනෙක් නැතැයි උගැන්වීමට බුද්ධිමතුන්ට සිදුවී තිබේ. ලෝකයෙන් තුනෙන් එකක් පමණ ජීවිත හා සිතුවිලි මිථ්‍යාමතවලින් විනාශ කර දමා ඇත.

කොමියුනිස්ට් තරුණ සංවිධානයක් මගින් කිතු බැති-මතෙකු වූ තරුණයෙක් තරුණියක සිප ගැනීම නිසා තරවටු කරනු ලැබීයයි පැමිණිලි කරනු ලැබීය. අනතුරුව ඇය සිප ගත යුතු අයෙකු නම් කරනු ලැබීය. සියල්ලම බලාපො-රොත්තු නොවූ අයුරින් මිථ්‍යා විය. පිළිකුල් විය.

බොහෝ කලකට ප්‍රථමයෙන් මගේ සහෝදරයෙකුවූ රහස් සභාවේ සටන්කාමියෙකු මට හමුවිය. ඔවුන්ගෙන් සමහරෙකු හිරෙන් නිදහස් වූ පසු යලිත් සටන අරඹා තිබුනි. ඔවුහු සමගින් සටන ගෙන යාමට මට ආරාධනය කළහ. මම රහසේ පැවැත්වූ රැස්වීම්වලට සහභාගි වූයෙමි. එහිදී ගැයූ ගීතිකා පොත්වල ගී ලියා තිබුනේ අතිනි.

තිස් වසරක් මුළුල්ලේම කාන්තාරයේ දිවි ගෙවූ ශාන්ත අන්තෝනිතුමා මට මතකය. ඔහු සමාජයෙන් වෙන්වී මුළු ජීවිතයම නිරාහාරව යාච්ඤා කරමින් කල් යැවීය. එහෙත් යේසුස් වහන්සේගේ දේවත්වය ගැන ශාන්ත ඇතනියුස්තුමා හා ඇරියුස් අතර පැවැති සටන ඇසූකල සිය භාවනානුයෝගී ජීවිතය හැරපියා සත්‍යයේ ජයග්‍රහනය උදෙසා ඇලෙක්සැන්ඩරි-යාවට ලඟාවූයේය. ඈත කඳුකරයේ තවුස් දිවියක් ගතකල ශාන්ත බර්නාඩ් ඩික්ලෙරිව්ක්ස් ගැන මම අසා ඇත්තෙමි.

හිස්වූ සොහොන්ගෙයක් දිනාගැනීමේ නිශ්ඵල සටනක යෙදෙමින් අරාබි හා යුදෙව් ජාතිකයන් මරා දමමින් මෝඩ ලෙස හැසිරෙද්දී, ඔහු සිය තවුස් අරම හැරදමා මේ ක්‍රියාවට විරුද්ධව දේශනා කරනු පිණිස පැමිණියේය.

සකල ක්‍රිස්තු භක්තිකයන්ට කලයුතුව ඇති දේ කිරීමට මම තීරණය කලෙමි. කිතුතුමන්ගේ, ශාන්ත පාවුළුතුමන්ගේ හා මහා ශුද්ධවන්තයන්ගේ ආදර්ශ අනුගමනය කොට පසුබහින සුළු අදහස් ඇති සිත අත්හැර සටන් කිරීමට සිතා ගතිමි.

එය කෙබඳු සටනක් විය හැකිද? කිතුනුවන්ගේ සතුරන් වෙනුවෙන් යාච්ඤා කරමින් ඔවුන් මනහර ආදර්ශයක් දී තිබේ. අපේ හදවත්වල ආශාව ඔවුන්ගේ පාපයෙන් ගැලවීමය. එය සාර්ථක වූ විට අපි නිතරම ප්‍රීති ප්‍රමෝදයට පත්වූයෙමු.

නපුරු කොමියුනිස්ට් ක්‍රමයට වෛර කරමින් රහස් සභාව ශක්තිමත් කිරීමට මම අධිෂ්ඨාන කලෙමි. මේ බියකරු, රුදුරු, බලපැවැත්වීම අවසන්කිරීමට ඇති එකම බලවේගය ශුභාරංචියේ බලයයි.

සකල කොමියුනිස්ට් ලෝකය මිස හුදෙක් රුමේනියාව ගැන පමණක් නොසිතුවෙමි. එහෙත් බටහිරදී බලාපොරොත්තු නොවුනු දේ බොහෝ හමුවිය.

කොමියුනිස්ට් ලේඛකයන් දෙදෙනෙකු වූ සියොව්ස්කි හා ඩැනියෙල් ඔවුන්ගේ සහෝදරයෙක් විසින් සිරගෙට නියම කල විට ලෝකයේ හැම දෙසකම ලේඛකයන් ඊට විරුද්ධත්වය පළකලහ. එහෙත් තමන් විශ්වාශය නිසාම කිතුනුවන් සිරගෙවල දැමීම ගැන දේවස්ථානවලින් විරෝධයක් නොනැගෙයි.

පීඩා ලබන්නවුන්ගේ නමස්කාරය නම් කුඩා පොත් පිංච හා කුඩා බයිබල් පොත් බෙදා හැරීමෙන් කල වරදට සිරකල කුෂ්යැක් සහෝදරයා ගැන කවුරුන් සලකත්ද? මුද්‍රිත දේශනා

බෙදහැර සිරගෙට නියම වූ සහෝදර පොකොෂ්ච් ගැන කවුරු දනිත්ද? එවැනිම වරදක් කොට සිරගෙයිහි ලෑ යුදෙව් ජාතික ගෘන්වෙල්ඩ් ගැනද ජීවිතාන්තය දක්වාම සිරකල ඔහුගේ පුත්‍රයා ගැන කවුරු දනිත්ද? මගේ පුත්‍රයාවූ මිහායි වෙතින් මම ඉවතට ගෙනයනු ලැබූවිට මම වැලපුනේ කෙසේදැයි මම දනිමි. සහෝදර ගෘන්වෙල්ඩ්, අයිවන්කෝ, ග්‍රෑනි, ෂිච්චක් ටයිස්යා ටිකැවෙන්කෝ, එකැටරිනා, විකැසිතා, ජෝර්ජි, විකැසින්, ලැට්වියාවේ පිලාන් යුවලක්ද සමග මම වධ බන්ධනවලට ගොදුරුවීමි. මොවුන් විසිවන සියවසේ විශ්වාශය උදෙසා වීරවරයන් වූහ. ප්‍රථම කිතු බැතිමතුන් වන සතුන්ට ගොදුරු කරදීමට පෙර තම සහෝදරයන්ගේ බැඳි යදම් සිපගත්තේ යම්සේද එසේම මොවුන් බැඳි දම්වැල් සිප ගැනීමට මම ගෞරවයෙන් හිසනමමි.

ඇතැම් බටහිර ආගමික නායකයන් මොවුන් ගැන නොසලකති. ඔවුන්ගේ යාච්ඤා ලැයිස්තුවේ මේ වධවිඳින්න වුන්ගේ නම් සඳහන් නොකරති. මොවුන් මෙසේ වධ විඳිද්දී ඔවුන් පීඩාවලට නියම කරනු ලැබූ රුසියාවේ බැප්ටිස්ට්, ඔතොඩොක්ස් ආගමික නායකයන් නවදිල්ලියේදී, ජිනීවාහිදී පැවැත්වුනු සාකච්චාවලදී මහත් හරසර ලැබූහ. රුසියාවේ රුසියාවේ සම්පූර්ණ ආගමික නිදහස ඇති බවට මොවුන් සහතික කලාහුය,

මේ සහතිකය දෙනු ලැබූ කල ලෝක ක්‍රිස්තියානි සභා සම්මේලනයේ සභානායකයා රුසියානු බොලෂෙවික් ආච් බිෂෙප්වර නිකොඩිම් සිපගත්තේය. අනතුරුව ඔවුන් ලෝක ක්‍රිස්තියානි සම්මේලනයේ නාමය රවටාලමින් භෝජන සංග්‍රහයකට සහභාගිවෙද්දී මම සමග සිරමැදිරිවල සිටි ශුද්ධවන්තයන් යේසුස්වහන්සේගේ නාමයෙන් ලැබූ පිරිසිදූ නොකොට පිඝු, බඩවැල් සමග ගෝවා කෑවෙමු.

කරුනු මින් නතර නොවීය. රහස් සභාව මට අවසථාවක් දෙනු ලැබූවිට රටින් පිටවී යා යුතු බව තීරණය කළාහුය. ඒ මෙහි සිදුවන දේ ලෝකයාට පැවසීමටය. කොමියුනිස්ට්

වාදය වරදට පත් කරන අතර කොමියුනිස්ට් වරුන්ට ප්‍රේම කිරීමට මම තීරණය කළෙමි. කොමියුනිස්ට් වාදය වරදට පත් නොකරමින් ශුභාරංචිය දේශනා කිරීම හරියයි මම නොසිතමි.

පිරිසිදු ශුභාරංචිය පමණක් දේශනා කරන ලෙස සමහරූ මට කීවෝය. කොමියුනිස්ට්වාදය ගැන සඳහන් නොකරමින් යේසුස්වහන්සේ ගැන පමණක් සඳහන් කර දේශනා කරන ලෙස රුසියානු රහස් පොලිසිය කී අයුරු මට සිහිවෙයි. පිරිසිදු ශුභාරංචිය දේශනා කිරීමට ශුද්ධාත්මය පොළඹවනු ලබන්නා සේම මොවුන්ගේ මේ ක්‍රියා කිරීමට ද එම ආත්මය උදව් කරන්නේද? මේ කියන පිරිසිදු ශුභාරංචිය මම නොදනිමි. යොහන් බෞතිස්ත දේශනාකල පිරිසිදු ධර්මයද? පසුතැවිලි-වන්න ස්වර්ග රාජ්‍යය සමීපයයි පමණක් ඔහු කීවේ නැත. හෙරොද් නුඹ නරක අයෙකියි ද ඔහු කීවේය. ඔහු දැනගත් ඉගැන්වීම් සභවා නොතැබීම නිසා ඔහු හිස ගැසුම් කැවේය. කන්ද උඩ දේශනාවේදී යේසුස්වහන්සේ පිරිසිදු ශුභාරංචිය පමණක් දේශනාකලේ නැත. ඔහු එකල සිටි පූජකයන්ට විරුද්ධවෙමින් ලියන්නෙනි, වංචාකාරවූ පරිසියෙනි, පොළොං වංශය තෝපිට දුක් වන්නේය. මේ උන්වහන්සේ කුරුසියෙහි ඇණ ගැසූ පිරිසිදු ශුභාරංචියයි. පරිසිවරින් කන්දඋඩ දේශනාව ගැන කරදර නොවූවා විය හැක.

පාපය එහි නාමයෙන්ම හැඳින්විය යුතුය. කොමියුනිස්ට් වාදය අද ලෝකයේ අන්තරායකාරී පාපයක් වී ඇත. ඊට දෙස් නොතබන හැම සුභාරංචියක්ම පිරිසිදු ශුභාරංචි නොවේ. රහස් සභාව ජීවිත හා නිදහස අන්තරායයේ තබමින් මීට දෙස් පවරයි. එහෙත් මේ රටෙහිදී අප නිශ්ශබ්දව සිටිමු. කොමි-යුනිස්ට්වාදය දෝෂාරෝපනයට ලක්කිරීමට මම තීරණය කළෙමි. එහෙත් කොමියුනිස්ට් විරෝධීන් එය කරන්නාක් මෙන් නොවේ. හිට්ලර් කොමියුනිස්ට් විරෝධියකු වුවද කෲරතර පාලකයෙක් විය. අපි පාපයට පහර දුන්නේය. නමුත් පව්කරුවනට ප්‍රේම කළේය.

## මම බටහිරදී දුක් වින්දේ මන්ද?

කොමියුනිස්ට් දේශයන්හිදීට වඩා බටහිරදී මම දුක් වින්දෙමි. "නග්නවූවන්, නග්න යේසුස්වහන්සේ අනුගමනය කරති" යන ලතින් උවම ස්පුට කරන රහස් දේවසභාවල වචන විෂයාතික්‍රාන්ත පියකරුබව මෙහි නොමැත්වීම මගේ දුක්විඳීමට හේතුවිය. කොමියුනිස්ට් කඳවුරුවල මනුෂ්‍ය පුත්‍රයාටත් ඔහුගේ අයටත් හිස තැබීමට තැනක් නැත. එහි කිතුනුවෝ තමන් උදෙසා නිවෙස් ගොඩනොනගති. කුමන යහපතකටද? ඔවුන්ගේ ප්‍රථම සිරකිරීමේදීම ඒවාද බලයෙන් රජයට අත්පත් කර ගනී. කොමියුනිස්ට්වරුන් අදහස් කරන හැටියට අළුත් නිවසක් තිබීම සිරකිරීමට හේතුවන කරුණකි. එහි ඔබට ඔබේ පියා මිහිදන් කරන්නට ඉඩ නොලැබෙන අතර යේසුස්වහන්සේ අනුගමනය කිරීමට ප්‍රථම ඔබේ පවුලේ සියල්ලන්ටම ආයුබෝවන් කිව යුතුය. ඔබේ මව කවුද? ඔබේ සොයුරා, සොයුරී කවුද? මේ අන්දමින් බලනවිට ඔබ යේසුස් වහන්සේ වැනිය. දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකරන අයට පමණකි. දෙමව්පියන්, සොයුරන්, සොයුරියන් හා නිරතුරුවම මනාලයා මනාලියද, දරුවන් දෙමාපියන්ද, බිරින්දන් ස්වාමිපුරුෂයන්ද,වරදට පත් කරනු ලබන්නේ නම්, එය ස්වාභාවික බැඳීමක් වශයෙන් සැලකිය හැකිද? එය ඉතිරිව ඇති ආත්මික සම්බන්ධතාවයට වඩා විශාලය. රහස් සභාව දිළිඳුය. පීඩා විඳින්නේය. එහි ඇල්මැරුණු සාමාජිකයන් නැත.

රහස් සභාවේ ආගමික මෙහෙයයන් වර්ෂ 1900 කට පෙර ස්වරූපය ගනී. දේශකයා දේවධර්ම ශාස්ත්‍රය පැහැදිලි කිරීමට නොදනී. ජේතෘස් තරමටවත් දේශනා කරන අයුරු නොදනියි. පෙන්තකොස්ත දිනයේ පැවැත්වූ දේශනය නිසා හැමදේවධර්ම මහාචාර්යවරයෙකුම ජේතෘස් හට නරක නාමයක් තබා ඇත. වර්ෂ ගණනාවක් දේශකයා බයිබලය නොමැතිව සිරගෙයි ගතකල හෙයින්ද කොමියුනිස්ට් රටවල බයිබලය දුර්ලභ හෙයින්ද බයිබල් පද හරිහැටි නොදනී. ඔවුන් තම පියාණන් වහන්සේට යාච්ඤා කරන කල්හි එහි ප්‍රකාශවන

තරමට වඩා ගැඹුරු අර්ථයක් ඒ තුල ගැබ්වී ඇත. දිනපතා සිරගෙවල දී ඔවුන් මේ සර්වබලධාරි දෙව්පියාණන්ගෙන් රොටී ඉල්වා සිටියද, ඒ වෙනුවට සිතිය නොහෙන තරම් අපිරිසිදු ගෝවා පමණක් ලබති. කෙසේ වෙතත් ඔවුන් පියාණන් වහන්සේ ප්‍රේමණීය දෙවිකෙනෙක් බව අදහති. තමා මරා දමුවද දෙවියන් විශ්වාස කරන බව පැවසූ යෝබ්මෙනි. ඔවුන්ට තමන් කුරිසියෙහිදී අත් හැර දමුවාක් මෙන් පෙනෙන්නට තිබියදීත් පියාණන් යයි දෙවියන් වහන්සේට කී යේසුස්වහන්සේ මෙනි.

රහස් සභාවේ පවතින ආත්මික පියකරුබව දුක ඇති අයෙකුට හිස් කමෙන් පිරී ඇති බටහිර දේවස්ථාන බලා තෘප්තිමත් විය නොහැක. කොමියුනිස්ට් හිරගෙයිදීට වඩා මම බටහිර දී දුක් වින්දෙමි. මගේ දෙඇසින්ම මම බටහිර ශිෂ්ටාචාරය නැසෙනු දකිමි.

පිරිහෙන බටහිර යන මැයෙන් ඔස්වල්ඩ් ස්පෙන්ග්ලර් මෙසේ ලිවිය. "නුඹලා මැරෙමින් සිටියි. උසස්වූ සකල ගුණ සමුදයයන් නින්දසහගතව විනාශවනු මම දකිමි. නුඹලාගේ මහා ධන සම්භාරය හා නුඹලාගේ දිළිඳුකමද, නුඹලාගේ ධනවාදය හා සමාජවාදයද, යුද්ධ සහ විප්ලවද, අදේවදෘෂ්ටිවාදයද, හැමකම දෙස් දකීමද අශුභවාදයද, නුඹලාගේ දුසිරිත්ද, විවාහ බැමි කඩාදමීම්, උත්පත්ති පාලනය, පතුලේ සිට ලේ ගලමින් මොලයේදී නුඹලා මරා දමන බව ඔප්පු කල හැකිය. ඉපැරණි ඇලෙක්සැන්ඩ්‍රියාවේ, ග්‍රීසියේ හා දුර්වල වූ රෝම අධිරාජ්‍යවල අන්තිම කාල පරිච්-ඡේදයේ දක්නට ලැබුනු ලක්ෂණ ඔප්පුකරලිය හැක. මෙය 1920 දී ලියන ලද්දකි. එතැන් පටන් යුරෝපයෙන් අධකද, කියුබාව තෙක් ද, ප්‍රජාතන්ත්‍රවාදය හා ශිෂ්ටාචාරය මිය ගොස් ඇත. තවමත් බටහිර නින්දේ පසුවෙති.

එහෙත් නොනිදන බලවේගයක් ඇත. එනම් කොමියුනිස්ට්වාදයයි. නැගෙනහිර කොමියුනිස්ට්වරුන් බලාපොරොත්තු කඩවී විශ්වාශය නැතිවූ කල්හි බටහිර

කොමියුනිස්ට්වාදය ස්ථිරව පවතී. කොමියුනිස්ට් රටවල දෙනුලබන කාලකණ්නි, කෲරපීඩා ලංකා කොමියුනිස්ට් වාදීන් සාමාන්‍යයෙන් විශ්වාශ නොකරයි. ඔවුන් ඔවුන්ගේ විශ්වාශය උසස් පන්තියේ විවේකාගාරයන්හිදීද, බුද්ධිමතුන්ගේ සමාජ ශාලාවන්හිදී, විද්‍යාලවලදීද, මුඩුක්කුවලදී ද, වෙහෙස නොවන ජවලිතයකින් යුතුව පතුරුවයි. කිතුනුවන් වූ අප හදවතේ අර්ධයකින් සකල සත්‍යය පැත්තේද, කොමියුනිස්ට්වරුන් මුළු හෘදයෙන් බොරුව පැත්තේද සිටියි. ලංකා දේවධර්මවාදීන් මේ අතර නොවටිනා දේ සාකච්ඡා කරමින් සිටියි. ඉන් මට සිහිවන්නේ මෙයයි. දෙවැනි මහමත්ගේ යුදහමුදාවෝ 1493 දී කොන්ස්තන්තිනෝපල් නගරය වටලා සිටින අවස්ථාවේදී බෝල්කන් ජාතීන් ක්‍රිස්තියානිත්ට යටත්විය යුතුද, නැතහොත් මොහමත් පාලනය ශතවර්ෂ ගණනකට තිබිය යුතුද? යන්න තීරණය කල යුතුව තිබුනි. එහෙත් වටකල නුවර තිබුන දේවස්ථාන සාකච්ඡා කරනු ලැබුවේ මේ ප්‍රශ්න ගැනය. එනම් ශුද්ධ කන්‍යාවගේ ඇස්වල පාට කුමක්ද? සුර දූතයන් අයත් වන්නේ කුමන ලිංගකයකටද? ශුද්ධ ජලයට මැස්සෙක් වැටුනහොත් සිදුවන්නේ කුමක් ද? මැස්සා ශුද්ධ වන්නේද? ජලය අපිරිසිඳු වන්නේද? යනුවෙනි. ඒ කාලය ගැන සලකන කල මෙය නිකම්ම ඓතිහාසික නොවන පුරාණ කථාවක් විය හැක. එහෙත් ආගමික සභාවල පලවන දේ සලකන කල්හී ඉහත කී අන්දමේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන බව පෙනෙයි. කොමියුනිට්වාදයේ තේරුම ද රහස් සභාව විඳින දුක් පීඩාද බියෙන් මෙන් යන්තම් සඳහන් කරඇත. ඔවුන් දේවධර්මය ගැන සම්බන්ධ කරුණු ගැනද අවශ්‍ය නොවන දේවල් චාරිත්‍රයක්මෙන් පත්වන නිමාවක් නැති සාකච්ඡා පවත්වති.

එක් විවේකාගාරයක දී පැවැත් වූ සම්භාෂණයක දී එක් අයෙක් මෙසේ ඇසීය. ''ගිලෙමින් තිබෙන නැවක ඔබ සිටින විට නැවේ පුස්තකාලයෙන් එක් පොතක් පමණක් රැගෙන දූපතකට ගැලවීයාමට සිදුවුවහොත් ඔබ තෝරාගනු ලබන්නේ මොන පොතද? 'බයිබලය' යි අයෙක් උත්තර

දුනි. තවෙකෙක් ෂේක්ෂ්පියර් යනුවෙන් පිළිතුරු දුනි. එහෙත් ගත් තරුවෙක් හරි උත්තරය දුන්නේය. "ගොඩබිමකට ලඟාවිය හැකි බෝට්ටුවක් තනන අයුරු උගන්වනු ලබන පොතක් තෝරාගනිමියි" එවිට ඕනෑම පොතක් කියවීමට මම නිදහස්වෙමියි කීය.

සියලු ආගමික නිකායයන්හි හා හැම දේවධර්ම ශාස්ත්‍රඥයන්ගේ ද නිදහස ආරක්‍ෂා කිරීමටද කොමියුනිස්ට් පීඩාවන් නිසා එය නැතිවූයේ කොහිදැයි කණගාටුවට පත්වීම සඳහා කටයුතු කිරීම එක් දේවධර්ම මතයකම ඇලී සිටිනවාට වඩා වැදගත් වෙයි.

සත්‍යය ඔබ නිදහස් කෙරේයයි යේසුස් වහන්සේ කී සේක. එසේම සත්‍යය දිය හැකි එකම රාජධානියයි. අනවශ්‍ය දේ ගැන කෝලාහල කිරීමට වඩා කොමියුනිස්ට් වාදයේ රෞද්‍ර බලපෑමට විරුද්ධව නිදහස සඳහා සටන් කිරීමට එක්සත්විය යුතුය. යකඩ තිරය පිටුපස ඇති රහස් සභාව වැඩිවන පීඩාවන් නිසාද මම පීඩා වින්දෙමි. මේ පීඩා මම විඳි හෙයින් එහි අන්දම සිතේ මවාගත හැක. 1968 ජුනි මස ඉස්වෙස්ටියා හා ඩවෙන්කායිස් ජීසන් බැප්ටිස්ට් සභිකයන්ට විරුද්ධව ඔවුන්ගේ දරුවන් පච්චලින් ගැලවීම සඳහා මරාදමන ලෙස උගන්වනු ලැබීයයි චෝදනා කරනු ලැබිය. එය යුදෙව්වරුන්ට විරුද්ධව චාරිත්‍රයක් මෙන් පුරාණයේ සිටම ඉදිරපත් කරනු ලබන චෝදනාවකි.

එහෙත් මෙහි අර්ථය මම දනිමි. 1956 දී මම රුමේනියාවේ ක්ලුජ් සිර කඳවුරේ ගැහැනු දරුවකු මරා දමනු ලැබීයයි චෝදිත ලැසරොව්සි නමැත්තා සමග සිරෙහි සිටියෙමි. ඔහු වයස තිහක් පමණ විය. පෙර දින රැයෙහිදී දෙනු ලැබූ පීඩා නිසා ඔහුගේ හිසකේ සුදුපාට විය. ඔහු මහල්ලෙක් මෙන් පෙනුනේය. ඔහු නොකරන ලද අපරාධය, කල බවට පාපොච්චාරණය කරන ලෙස පවසා ඔහුගේ නියපොතු ගලවා දමා තිබුනි. වර්ෂ ගනනාවක් දුක් විඳීමෙන් පසු ඔහු අහිංසක යැයි පිලිගෙන නිදහස් කරනු ලැබීය. එහෙත් නිදහස තව දුරටත් ඔහු සමග නොවීය. සදකාලයටම ඔහු කැඩුනු බිඳුණු මනුෂ්‍යයෙකු විය.

සමහරෙකුට පත්‍රයේ පලකොට ඇති බැප්ටිස්ට් සභික-යෙකුට විරුද්ධව නගා ඇති මෝල් චෝදනාවක් කියවා සිනහසිය හැක. එහෙත් ඒ චෝදනාවට හේතුව මම දනිමි.

ලංකාවේ සිටිමින් ඒ සමාන දේ ඔබේ ඇස් ඉදිරිපිට නිතරම තිබීම අශොභනය.

කොමියුනිස්ට් වරුන්ගේ අතකොළුවක් වී ඇති සෝවියට් රුසියාවේ ආච් බිෂොප් කලුගා හි යමොජින් හා රජය සමග ඉතා සහයෝගයෙන් කටයුතු කල අනෙක් බිෂොප් වරයාද අද කොහිද? මේ අයුරින් විරුද්ධව ක්‍රියා කල ආච් බිෂොප්වරුන් රුමේනියාවේ සිර කඳවුරක් තුල මා අසල මියයමින් සිටිනු මම නොදිටිනම මම මෙ දේව බිෂොප්වරු කෙරෙහි එතරම්ම ම තැකීමක් නොකරමි.

සභාවේ ආගමක නිදහස ඉල්ලා සිටීම නිසා ඇමතිවරයකු වූ නිකොලොයි එෂ්ලිමාන්ද ග්ලෙබ් යකුනින්ද ආගමික නායකයන් විසින් කීකරු ලෙස හැසිරීමට පුහුණු කරනු ලැබීය. බටහිර දන්නේ මෙපමණකි. මෙවැන්නක් සිදුවූ රුමේනියාවේ ව්ලැඩිමීර්ස්ති පියතුමා සමග සිරගෙයි සිටියෙමි. මතුපිටින් එය සමයානුකූල කීකරු කීමක් පමණි. රජයේ දේවස්ථාන මෙන් මොවුහුද රහස් පොලීසිය සමග සබඳකම් පවත්වති. ඔවුන් විසින් විනය ගරුක බව පුහුණු කරන අයට ස්ථිර ලෙස පීඩා දීම ඉතා සැලකිල්ලෙන් කරති.

කොමියුනිස්ට් කඳවුරුවල පීඩා විඳීම ගැන මම වෙව්ලා යමි. පීඩා කරන්නන් සදකාලිකවම සිදුවන දේ ගැන මම තැතිගතිමි. තමන්ගේ පීඩා විඳින සහෝදරයන්ට උදව් නොකරන ලාංකික කිතුනුවන් ගැන මම තැති ගතිමි.

මෙවැනි ගැටුම්වලින් තොරව මගේ මිදි උයනේ ශොභන කම රැක ගැනීමට මම කැමැත්තෙමි. කොතැනක හෝ නිසලතාවය හා විවේකයට මම ප්‍රිය කරමි. එහෙත් එය තුඩුළුවන. කොමියුනිස්ට් වාදය එලිපත්තටම පැමිණ ඇත.

කොමියුනිස්ට්වරු ටිබැට් රට ආක්‍රමණය කරද්දී ආත්මික කටයුතු ප්‍රිය කල අය නිමාවට පත් කලහ. අපරටේ සත්‍ය තාවයෙන් මුදහල හැමදෙනාම අවසාන කලහ. විදේශිකයන් පහසුවෙන් රවටාගත හැකි දේ පමණක් තබා ගනිමින් දේව-ස්ථාන තාපසාරාම විසුරුවා හලහ. මා අපේක්ෂා කල මේ නිහඬ තාවය හා විවේකී බව මගේ ආත්මය සත්‍ය උදෙසා අන්තරායයෙන් ද ගලවා ගනු ඇත,

පුද්ගලිකව ම අන්තරාය කාරී වුවද මෙම සටන මම මෙහෙයවිය යුතුය. මා නොපෙනී ගිය හොත් කොමියුනිස්ට් වරුන් විසින් මා පැහැර ගත් බව ඔබට ස්ථිරවම සිතිය හැක. 1948 දී මම මහමඟදී පැහැර ගෙන සිර කරනු ලැබුවේ ව්‍යාජ නමකින් ආරුඪ කිරීමෙනි. එවකට රාජ්‍ය ලේකම්වර ඇනා පව්කාර්, ස්වීඩන් තානාපති ශ්‍රීමත් පැට්රික් වොන්රියුස්වෝඩ් හට මෙසේ කිවේය. ආ වම්බ්‍රැන්ඩ්ද? එයා දැන් කෝපන්-හේගන් නුවර ඇවිදිමින් ඉන්නවා.'' සිර කඳවුරේ සිට රහසින් යවාගත හැකිවූ මගේ ලිපියක් තානාපතිවරයාගේ පසුම්බියෙහි විය. ඔහුට බොරු කී බව ඔහු දැන සිටියේය. එවැනි දේ යලිත් සිදුවිය හැක. මා මරාදමනු ලැබුවහොත් මාගේ මිනී මරුවා ඉදිරිපත් කරන්නේ කොමියුනිස්ට් වරුන් විසිනි. වෙන අයකුට මම මරා දැමීමට හේතුවක් නැත. අනුමාන වශයෙන් ප්‍රසිද්ධ කරනු ලබන මගේ සදචාර අසංවර බව, සොරකම, ඒ කීය ලිංගික සේවනය වෛශ්‍යාකම, දේශපාලනික විශ්වාස-යෙන් තොරබව, බොරුකීම රහස් පොලිසියේ සංග්‍රහයන් සම්පූර්ණ කරනු ඇත. ''අපි නුඹ සදචාරයට අනුව විනාශ කරමු.''

එක්සත් ජනපදයේ සෙනේට් සභාවට මගේ සාක්ෂිය දුන් පසු මම මරා දැමීමට රුමේනියානු කොමියුනිස්ට් වරු තීරණය කලබව විශ්වාශ කටයුතු මාර්ගයකින් මම ආරංචිවිය. මම ශාරීරිකව හෝ මගේ යහපත් කම හෝ මරා දැමීමට ඔවුන් උත්සාහගනු ඇත. ඔවුන්ට ඉට බලවත් මාර්ග ඇත.

මට නිහඬවිය නොහැක. මම කියන්න ගැන නිහඬව පරීක්ෂාකිරීම ඔබේ කාර්යයයි. එහි වැසියන් අමාරුකම්වලින්

පීඩාවට පත් කරනු ලබන මා පසුකල මේ දුෂ්කර පීඩාව නමැති මේ මරණීය කොමියුනිස්ට් වාදය කුමක්දැයි ඔබ ම ඔබගෙන්ම ප්‍රශ්න කල යුතුව ඇත.

ලංකාව තවමත් නින්දේය. ඔවුන් නැගිටිය යුතුව ඇත.

වේදනා විඳින්නන් තමාගේ වරද අනුන්ට පැවරීමට මාන බලයි. එවැනි වේදනා අඩු කිරීමකදී දැරිය යුතු බර අධිකය. කොමියුනිස්ට් වරුන් සමග සුහද එක්වීමකින් සිටින ලංකා සභා නායකයන්ට මම වරද නොතබමි. නපුර පැමිණෙන්නේ ඔවුන් කෙරෙන් නොව එය ඉපැරණි එකකි. මේ නායකයන් මේ ඉපැරණි නපුරක බිල්ලය. මේ කලබලය ඔවුන් මැවුවක් නොවේ. එය ඔවුන්ට හමුවිය.

බටහිර සිටින කාලය තුලදී බොහෝ දේවධර්ම ආශ්‍රම යන් වෙත ගොස් ඇත්තෙමි. සීනුවල ඉතිහාසය ද සාහිත්‍ය ගී වල ඉතිහාසය ද සභාවේ විනය ගැන කොහෙත්ම අවශ්‍ය නොවන නීතිද පිළිබඳ දේශන මම අසා ඇත්තෙමි. මැවීමේ කථාව, ආදම්, ගංවතුර, මෝසෙස්ගේ පුදුම ක්‍රියා, ස්ථිරවූ පසු ලියන ලද අනාවැකි ආදිය බොරුයයි උගන්නා දේව ධර්මය ආයතනවල සිසුන් මම දැක ඇත්තෙමි. කන්‍යාවට බිළිඳෙකු ලැබීම මිථ්‍යාවක් බවත් එසේම යේසුස් වහන්සේගේ මළවුන් ගෙන් නැගිටීම මුසාවක් බවත්, යම් තැනක උන්වහන්සේ ගේ ඇට සැකිල්ල ඇති බවත්, ශුද්ධ ලියවිලිවල මුල් පිටපත් නොවන බවද එළිදරව් පොත පිස්සකුගේ වැඩක් බවද ඔවුන් කියයි.

වර්තමාන ආගමික නායකයන් ධර්ම දූත ආශ්‍රමයන්හිදී උගත්තේ ඒවාය. ඔවුන් ජීවත්වන වාතාවරණය එයයි. එවැනි අමුතු දේ පැවසූ ස්වාමියාට කීකරු වන්නේ ඇයි? දෙවියන් මලේ යැයි නිදහස්ව උගැන්විය හැකි සභාවට සභා නායකයන් විශ්වාශ වන්න මන්ද?

ඔවුන් යේසුස් වහන්සේගේ මනාලිය නොව රජයේ දේවස්ථානයන්හි නායකයන්ය. ඈත අතීතයේ සිටම සිය ස්වාමියා පාවා දුන් දේවස්ථාන වල නායකයන්ය. රහසිගතව දේව සේවය කරත්ම සේවකයකු, ආගම වෙනුවෙන් දිවි පුදන්නෙකු, වධ බන්ධනයන්ට ලක්වුවකු හමුවූ විට ඔවුන් ඔහු දෙස බලන්නේ අමුතු සතකු දෙස බලන්නාක්මෙනි.

මිනිසුන්ගේ බාහිර පෙනුමෙන් ඔවුන් විනිශ්චය කිරීම සඥස්ය. අපි එසේ කරන්නෝ වේනම් තමන්ගේ සබත් ගැන වූ නීති රීති ගරු නොකල යේසුස්වහන්සේ නරක කෙනෙකැයි කී පරිසිවරුන් මෙන් වන්නෙමු. යේසුස් වහන්සේගේ ප්‍රියංකරත්වය දූක දූකත්ම ඔවුන්ගේ දෙනෙත් මුළුමනින්ම වසාගනිති. කොමියුනිස්ටවාදය කෙරෙහි සදෙස් දර්ශනයක් දකින එම සභා පාලකයන් වෙනත් අන්දමින් නිදෙස් විය හැක. පුද්ගලිකව අවංක විය හැක. එසේම ඔවුන් වැරදි වන්නේ කුමකින්ද? එය මාරුවිය හැකිය.

වරක් මම රුමේනියාවේ පාරම්පරික ආගමික නායක–යෙක් සමග සිටියෙමි. ඔහු තමන්ගේම අයට වැරදි තබන සුළු කොමියුනිස්ට් වාදියෙකි. මම ඔහු අතින් අල්වාගෙන අකීකරු පුත්‍රයාගේ උපමාව පැවසුවෙමි. ඒ එක් සන්ධ්‍යාවකදීය. ඔහුගේ ගෙවත්තේදීය. බලන්න... පෙරළා තමන් වෙත පව්කාරයෙකු දෙවියන් වහන්සේ පිළිගත්තේ කෙතරම් ප්‍රේමයකින්ද? බිෂොප් වරයෙක් වුවද ඔහු පසුතැවිලි වන්නේනම් ඔහු පිළිගනියි. මම කිතුනු ගීයක් ගැයුවෙමි, මේ මනුෂ්‍යයා ක්‍රිස්තුස්වහන්සේ වෙත භාරවිය.

තමන් නිදහස් කරනු ඇතැයි අපේක්ෂාවෙන් සිටි, අදේවදෘෂ්ටි ලිපි ලිවූ ඕතොඩොක්ස් පූජකවරයෙක් සමග සිර මැදිරියක සිටියෙමි. මම ඔහු හා කථා කල පසු ඔහුගේ ලිපි කැබලිවලට ඉරා දැමීය. එසේ නිදහස් විය නොහැකි වූ එම අන්තරායදායී ක්‍රියාව කලේය. මට තවකෙකු පිට වරද පැවරිය නොහැක. මා හදවත තුල ඇති බර මේ අන්දමට තවකෙකු මත පැවරිය නොහැකි විය.

මට තවත් වේදනාවක් විය. ඉතා කිට්ටු මිතුරන් පවා මා වැරදි ලෙස තේරුම් ගත්හ. කොමියුනිස්ට් වරුන් කෙරේ තද තිත්තකමෙන් එදිරිවූ අයෙකැයි මට චෝදනා කලේය. එය අසත්‍ය බව මම දැන සිටියෙමි.

මුස්ලිම් ලේඛකයකු වූ ක්ගලාඩ් මොන්ටිෂිරෝ ''සතුරනට ප්‍රේම කරන්න. සාපකරන්නන්ට ආසිරි පතන්න'' යනුවෙන් වදරා පරිසිවරුන් හා ලියන්නන්ට ප්‍රසිද්ධියේ ගර්හා කිරීම වැරදි බව කීය. ලංඩනයේ ශාන්ත පාවුළු දේවස්ථානයේ ඩීන් වරයෙකු වූ ආචාර්ය ඩබ්ලිව්. ආර්. මැතිව්ස් මෙය යේසුස් වහන්සේ තුල වූ නොගැලපෙන ප්‍රතිවිරුද්ධතාවයක් බව තීරණය කරයි. ඊට සමාවක් ලෙස යේසුස් වහන්සේ බුද්ධිමතෙක් නොවන බව කියයි.

මොන්ටිෂ්රෝගේ, යේසුස්වහන්සේ ගැන ඇති මෙම ආකල්පය වැරදිය. ප්‍රසිද්ධියේ වරදට පත් කල ද යේසුස්-වහන්සේ පරිසිවරුනට ප්‍රේම කළේය. මම කොමියුනිස්ට් වරු වරදට පත් කලද ඔවුන්ට මෙන්ම දේවස්ථානය තුල ඇති උපකරණයන්ට ප්‍රේම කරමි.

කොමියුනිස්ට් වරු අමතක කරන්න. ආත්මික දේ ගැන පමණක් වැඩ කරන්න මම නිතරම පැවසුවෙමි.

නාසීන්ගේ වධයට ගොදුරු වූ කිතුනුවකු මට හමුවිය. මා ''යේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරන තාක්කල් ඔහු මා සමග සිටින බවත් එහෙත් කොමියුනිස්ට් ධර්මයට විරුද්ධව වචනයක්වත් නොකිය යුතු බව පැවසීය. නාසිවදයට විරුද්ධව සටන් කල කිතුනුවෙක්, බයිබලයේ කියා ඇති ආකාරයෙන් පමණක් කථාකරමින් එම වධබන්ධනයන්ට විරුද්ධ නොවීම වැරදිද? යි මම ඇසුවෙමි. ''නමුත් හිට්ලර් හැට ලක්ෂයක් යුදෙව්වන් මරා දැම්මා එකෙකුට හෝ ඊට විරුද්ධව කථා කරන්න තිබුනා'' යි පිලිතුර විය, ''කොමියු-නිස්ට් ධර්මය තිස් ලක්ෂයක් රුසියානුවෝද ලක්ෂගණනක්

චීන ජාතිකයන් හා වෙනත් ජාතීන්ද මරා දමා ඇත. ඔවුන් යුදෙව්වන් මරා දමා ඇත. අපි විරුද්ධ විය යුත්තේ යුදෙව්වන් මරා ඇමු විටද? නැතහොත් රුසියැනුවන් මරා දැමූවිටද? යි මම ඇසුවෙමි. පිලිතුර වූයේ මෙය හරියටම වෙනස් දෙයක්'' ඔහු වෙන යමක් කීවේ නැත.

හිට්ලර් සමයේදීද කොමියුනිස්ට් සමයේදී ද පොලිස් පහරදීම්වලට මම ලක් වුනෙමි. දෙකෙහිම වෙනසක් නොවීය දෙකම වේදනා ගෙන දෙන්නක් විය.

නොයෙක් අයුරින් ඇති පාපයන්ට විරුද්ධව අපට සටන් කිරීමට සිදුව ඇත. එකම ගැටලුවකින්ම පමණක් අපේ සිත් වෙලාගෙන නැත. නමුත් වර්තමානයේ කිතු දහමට ඇති ඉතාම අන්තරායය නම් කොමියුනිස්ට ධර්මයයි. ඊට විරුද්ධව එක්සත්විය යුතුය.

එය යලිත් මම කියන්නද? මිනිසෙකු ගේ ඉලක්කය යේසුස් වහන්සේ මෙන් වීමයි. කොමියුනිස්ට් ධර්මයේ ඉලක්කය මිනිසා එසේවීම වැලැක්වීමයි. කොමියුනිස්ට්වරු බාල කාලයේ සිටම ආගම් විරෝධීහුය. මරණින් පසු මිනිසා ලුනු සහ ඛනිජ ද්‍රව්‍ය වන බව ඔවුන් ගේ විශ්වාශයයි. වෙනත් යමක් නොමැත. මුළු දිවියම එක්තරා අන්දමකට ගෙවිය යුතු බව ඔවුන්ගේ මතයයි.

ජනතාව! ඔවුන් දන්නේ එපමණකි. එය හරියටම අළුත් තෙස්තමේන්තුවේ සඳහන් යේසුස් වහන්සේ එක් යක්ෂයකු ගෙන් නම ඇසු කල ඔහු ''අපි ලෙගියොන් (අසංඛ්‍ය) යයි කීවාක් මෙනි. දෙවියන් වහන්සේගේ මෙම පුද්ගලිකත්වය සුනු කර දැමිය යුතුය. ඇල්පඩ් ඇඩ්ලර්ගේ 'පෞද්ගලික මානසික ශාස්ත්‍රය' නමැති ග්‍රන්ථය ළග තබා ගැනීමේ වරදට එක් අයෙකු සිරගෙට යවන ලදී. පුද්ගලික පුද්ගලික හැම තිස්සේම පුද්ගලික ඇයි? සාමූහිකත්වය බැරි රහස් පොලිසියේ නිලධරයෙක් බෙරිහන් දුන්නේය.

යේසුස් වහන්සේ අප කෙරෙන් පුද්ගලිකත්වය බලාපොරොත්තුවේ. එබැවින් කොමියුනිස්ට්වරුන් හා අපට එකඟ වීමට අපහසුය. කොමියුනිස්ට්වරුන් එය දනී. ''ආගම හා විද්‍යාව'' නමැති සඟරාවේ මෙසේ කියයි. කොමියුනිස්ම වාදයට ආගම් හා එකඟ විය නොහැක. එය ආගමට විරුද්ධය. කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රීතිමත් වැඩ පිළිවෙළ ආගමට මරු පහරකි. එය ආගමික වහල් බැම්මෙන් මිනිසා සදාකාලයටම මුදවා අදේවදෘෂ්ටි සමාජයක් ගොඩනැංවීමේ වැඩ පිළිවෙළකි.

කිතුනුවනට කොමියුනිස්ට්වාදය හා එක්ව ජීවත්විය නොහැක. කොමියුනිස්ට්වරුන් ඊට මෙසේ කියයි. ''කොමියුනිස්ටවාදය ආගමට මරු පහරකි.

පස්වන අදියර

# පරාජය කල නොහැකි, පැතිරගිය, රහස් සභාව

ඊ ළිත් මම රහස් සභාව ගැන කියමි. එය වැඩ කටයුතු කරගෙන යනුයේ බලවත් දුෂ්කරතා මධ්‍යයේය. අදේව දෘෂ්ටිය කොමියුනිස්ට් රටවල රාජ්‍ය ආගමය. පැරැන්නන්ගේ ඇදහීමට දෙනු ලබන්නේ සුළු නිදහසකි. එහෙත් ලමයින් හා තරුණයන් පැරණි ඇදහිම් විශ්වාශ නොකළ යුතුය. මේ රටවල ගුවන් විදුලිය රූපවාහිනි, චිත්‍රපට, නාට්‍ය, පුවත්පත්, ප්‍රකාශන මාර්ග යන හැම එකකම ඉලක්කය දේව විශ්වාශය ඉවත් කර ලීමයි.

අති විශාල විරුද්ධ පක්ෂයකට මුහුණ දීමට රහස් සභාවට ඇත්තේ ඉතා ස්වල්ප වූ හැකියාවකි. රහස් සභාවේ පූජකයනට දේව ධර්මය ගැන පුහුණුවක් නොමැත. එසේම බයිබලයෙන් බිඳක් හෝ නොකියවූ පූජකයන්ද එහි සිටිති.

කොපමණ දෙනෙක් දේව සේවය සඳහා බඳවා ගන්නේද'යි මම ඔබට කියමි. රහසිගත පූජකයෙකු වූ තරුණයෙක් අපට හමුවිය. ඔහු දේව සේවයට බඳවා ගත්තේ කවුදැයි මම ඇසුවෙමි. කොමියුනිස්ට් ප[illegible]යෙන් පිළිනොගත් කිසිවකු රජයේ දේවස්ථානයේ බිෂොප් විසින් බඳවා ගන්නේ නැත. වේද සාක්ෂිකයෙකු ලෙස මරා දමනු ලැබූ බිෂොප් වරයෙකුගේ සොහොන බැලීමට අපි තරුණ කිතුනුවන් දහදෙනෙකු සමග ගියෙමු. සොහොන් ගල මතුයෙහි අපි දෙදෙනෙක් අත් තැබුවෙමු. අනිකුත් අය ඒ වටා සිටගෙන අපි දේව සේවය වෙනුවෙන් කැපකර ගන්නා ලෙස ශුද්ධාත්මයාණන් ගෙන් ඉල්ලා සිටියෙමු. උන්වහන්සේගේ සිදුරුවූ හස්තයෙන් අප කැපකර ගත් බව අපට සහතිකය. තරුණයන්ගේ මේ කැපවීම දෙවියන් ඉදිරියේ මට යහපත්ය.

එවැනි කැපවීමකින් යුතු මිනිසුන්, කිසිම දේවධර්ම පුහුණුවක් නැති, බොහෝ විට බයිබලයෙන් ඉතා ස්වල්පයක් පමණක් දැනගෙන ද ක්‍රිස්තුස් වහන්සේගේ සේවය පවත්වා-ගෙන යති.

එය ප්‍රථම ශතවර්ෂයේ සභාව මෙනි. යේසුස් වහන්සේ වෙනුවෙන් ලෝකය අනික් අතට හැරවූයේ කුමන ධර්මදූත ආශ්‍රමයක්ද? ඔවුන් හැමෝම කියවීම දැන සිටියේද? ඔවුන්ට බයිබල් ලැබුනේ කොහෙන්ද? දෙවියන් ඔවුන්ට කථාකල සේක.

රහස් සභාවට අයත් වූ අපට දේවස්ථාන නොවීය. එහෙත් අපි වනයේ රහසින් රැස්වූකල අහස්කුස නමැති දෙව්ලොවට වඩා කුමන දේවස්ථානයක් පියකරු වන්නේද? ගී ගයන විහඟුන්ගේ ගී රාවය ඕගන් එකක තැන ගත්තේය. වන මල්වල ඉමිහිරි සුවඳ, සුවඳ දුම්මල වල තැන ගත්තේය. මෑතදී සිරගෙයින් නිදහස් වූ වධයට කැපවූ අයගේ පිළිකුල් අපිරිසිදු වස්ත්‍ර පූජකයන්ගේ ලෝගුවට වඩා සිත් අලවන සුලු විය. ඉටිපන්දම් වෙනුවට අපට සඳ හා තාරකා තිබුනි, ඒවා දැල්වූ සුරදූතයන් අපේ උවටැන් කරුවන් විය.

මේ දේවස්ථානයන්හි ප්‍රියංකරත්වය විස්තර කිරීමට මට නොහැකිය. බොහෝවිට මෙවැනි දේව මෙහෙයන් අවසානයේ කිතුනුවන් අල්ලාගනු ලැබ සිරගෙදරට යවනු ලැබේ. එහිදී යදම් වලින් බැඳීම මනාලියක් සිය ප්‍රියයාගෙන් ලබන අනර්ඝ මැණිකක් මෙන් ඉවසා සිටිත්. සිරගෙදර ජලය ඉතා දුර්ලභය. මාලිගයන්හි දී රජුන්ගෙන් ලැබෙන චුම්බනයන්, ප්‍රිය වැළඳ-ගැන්මත් මෙහිදී ඔබ නොඅඩුව ලබයි. බයිබලයේ පමණක් සඳහන් සත්‍ය ජයග්‍රාහී කිතුනුවන් මට මෙහි සිරගෙවලදී ද, රහස් සභාවලදී ද හමුවී ඇත. රහස් සභාව අනුකම්පා විරහිතව පීඩනයන්ට ගොදුරු වුවද ඊට බොහෝ මිත්‍රයන් ඇත. ඔවුන් සමහරෙක් රහස් පොලිසියේය, රජයේ සාමාජිකයෝය. සමහර අවස්ථාවලදී මේ රහස් මිත්‍රයෝ රහස් සභාව ආරක්ෂා කරති.

නොබෝද රුසියන් පුවත්පත් වර්ණනයවන ව්‍යාජ නොඇදහිලිවන්තයන් ගැන පැමිණිලි කර තිබුනි. මෙම පුවත් පත් වලින් එලිදරව් කරන ලද්දේ රජයේ කාර්යාලවල ප්‍රචාරක ආයතනවල සේවය කරන ගණනාවක් නොමැති කොමියුනිස්ට් හොරණෑවක් බඳු සාමාජිකයෝ පිටතින් කොමියුනිස්ට්වරුන් ලෙසඳ ඇතුලතින් රහස් සභාවල සාමාජිකයන් මෙන් පෙනී සිටින බවය.

කොමියුනිස්ට් ප්‍රචාරක දෙපාර්තමේන්තුවේ සේවය කරන තරුණියක් ගැන කථාවක් කොමියුනිස්ට් පුවත්පත් පළකලේය. ඇය සිය සේවය නිමවීමෙන් පසු පෙරලා නිවසට ගොස් සේවයෙන් පසු ගෙදර පැමිණ සිටින සැමියා හමුවෙයි. රාත්‍රි ආහාර කිස නිමවා එම ගොඩනැගිල්ලේ ම සිටින නවත් තරුණයන් කණ්ඩායමක් සමග රැස්වී බයිබල් පාඩම් හා යාච්ඤා මෙහෙයන් පවත්වති. කොමියුනිස්ට් ලෝකය තුල මුළුමනින්ම සිදුවන්නේ මෙයයි. දස දහස් ගනන් මෙවැනි ව්‍යාජ නොඇදහිලිකාරයන් සෑම කොමියුනිස්ට් රටකම නැගී සිටියි. පිළිණු වූ ශුභාරංචිය ඇසීමට ප්‍රදර්ශන දේවස්ථානවලට නොයාම වෙනුවට ඔවුන් උසුලන රජයේ වගකීම් හා බලතලයන්හි සිටගෙනම යේසුස් වහන්සේ වෙනුවෙන් නිහඬව වඩා ප්‍රතිඵල ගෙන දෙන අයුරින් හැසිරීම වඩාත් ඥාණාන්විත බව ඔවුන්ට හැඟී ගොස් ඇත.

එවැනි තැන්වල දහස්ගනන් සාමාජිකයන් රහස් සභාවට වෙති. ඔවුන් නිවෙස්වලදීත්, කුලියටගත් කාමරවලදීත්, උඩු මහල් වලදීත් රහසිගතව ආගමික රැස්වීම් පවත්වති.

රුසියාවේ කිසිවෙක් ළදරු බෞතීස්මයට හෝ වැඩිහිටි බෞතීස්මයට විරුද්ධ නොවෙති. විරුද්ධ තර්ක නොකරති. ඒ පාප්තුමා නොවරදින සුලුය යන මතයට විරුද්ධ නොවෙති. ඔවුන් දහසක් අවුරුදු රාජ්‍යයට පෙර හෝ පසු අය නොවෙති. ඔවුන් අනාගත වාක්‍ය පරිවර්තනය නොකරති. ඒ ගැන කලහ නොකරති. එහෙත් ඔවුන් බොහෝ විට දෙවියන් වහන්සේගේ පැවැත්ම අදේවදෘෂ්ටිකයන්ට ඔප්පු කරන්නේ කෙසේදැයි මම මවිතවෙමි.

අදේව දෘෂ්ටිකයන්ට ඔවුන් දෙන පිළිතුර ඉතා සරලය. ඔබ බෝජන සංග්‍රහයකට ඇරයුම් ලබා ඇතැයිද ඒ ආහර පිසීමට කෝකියකු නැතැයි සිතන්න. එහෙත් අපට භොජන සංග්‍රහය පිළියෙල කරන්නේ සොබාදහමයි. ඔබට තක්කාලි, පිච්, ඇපල්, කිරි සහ මී පැණි ඇත. මනුෂ්‍යවර්ගයා උදෙසා මේවා පිලියෙල කරන්නේ කවුරුන්ද? ස්වභාවධර්මය අන්ධය. ඔබ දෙවියෙකෙනෙක් නැතැයි විශ්වාශ කරන්නේනම් අන්ධවූ ස්වභාවධර්මය අපට අවශ්‍ය එවැනිදේ බහුලත්වයෙන් ද, නන් අයුරින් ද සාර්ථකව සකස් කරන්නේ කෙසේදැ' යි ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

සදකාලික ජීවිතයක පැවැත්ම ඔවුන්ට සනාථ කලහැක. අදේව දෘෂ්ටිකයෙකුට කරුණු දැක්වීමකදී මම මෙසේ ඇසීමි. මවකගේ ගර්භය තුල ඇති කලල රූපයකට කථාකළ හැකි යයි සිතුවහොත් ඔබ කලල රූපය අමතා, කලල ජීවිත ඉතා දීර්ඝ ජීවිතයකට පෙර ඇති කෙටි ජීවිතයක් යයි කියනු ඇත. කලල රූපය කුමක් උත්තර දෙයිද? ඔබ වැනි අදේව දෘෂ්ටිකයන් පාරාදීසය හා අපාය ගැන කියන විට මවකගේ ගර්භ ජීවිතය එකකි. අන් හැම එකක්ම ආගමික මෝඩකම යයි පිළිතුරු දෙනු ඇත. එහෙත් කලල රූපයට සිතීමට හැකි නම් ඔහු තමාටම මෙසේ කියනු ඇත. මෙන්න! අත් වැඩෙනවා, මට ඒවා අවශ්‍ය නැහැ. ඒවා දිගුකරන්නවත් මට බැහැ, ඇයි ඒවා වැඩෙන්නේ? සමහරවිට මගේ ජීවිතයේ අනාගතයේදී ඒවා සමග කටයුතු කරන අවස්ථාව සඳහා වෙන්නට ඇති. පා වැඩෙයි. ඇයි ඒවා වැඩෙන්නෙ? සමහරවිට ජීවිතය කියන්නේ මට ඇවිදීමට සිදුවනු ඇති විශාල ලොකයක් විය හැක. ඇස් වැඩෙයි. මම සම්පූර්ණයෙන්ම අන්ධකාරයෙන් වටවී ඇති හෙයින් ඒවා මට අවශ්‍ය නොවේ. එහෙනම් මට ඇස් කුමකටද? සමහරවිට ලෝකයේ ආලෝකය හා පාට වර්ග තිබිය හැකිය. කලල රූපය තමාගේ වැඩීම කල්පනා කර බලන්නේ නම් නොදැකම මවගේ ගර්භයෙන් පිටත ඇති ලෝකය ගැන දැනගනු ඇත. එය අප කෙරෙහිද එසේමය. අප තරුණව සිටින තාක් කල් අපට ශක්තිය ඇත. එහෙත් එය නිදෙස් ලෙස පාවිච්චි කිරීමට සිත නැත. වසරක් පාසා

අප දැනුමෙන් හා ඥානයෙන් වැඩෙන අතර මිණී කරත්තය අප මිණීවල වෙත ගෙනයාමට බලා සිටියි. තව දුරටත් පාවිච්චි නොකරනු ලබන දැනුමක් සඳහා ඥානයේ වැඩීමක් අපට අවශ්‍යවන්නේ ඇයි? කලල රූපයට අත් පා හා ඇස් වැඩෙන්නේ ඇයි? එය අනුගමනය කිරිමක් සඳහාය. ඉතින් එය දැන් අප සමගය. අනුගමනය කිරීම සඳහා අප මෙහිදී අත්දැකීම, දැනුම හා ඥානයෙන් වැඩෙමු. අපි මරණින් පසු උත්කෘෂ්ඨ මට්ටමකින් සේවය කිරීමක් සඳහා සූදානම් වෙමු.

රජයේ කොමියුනිස්ට් ධර්මය යේසුස් වහන්සේ ඔසවනු නොලබයි. රහස් සභාවේ සේවකයන් මීට පහසුවෙන් පිළිතුරු සපයයි'' ඔබේ සාක්කුවේ තිබෙන ප්‍රවෘති පත්‍රය කුමක්ද? එය ඊයේ හෝ අද ප්‍රවඩා පත්‍රයක් ද'' යි මට පෙන්වන්න. ආ! ඒක 1964 ජනවාරි 14 ද එකක්. 1964 කවද සිටද ගණන් ගන්නේ. ජිවත් නොවුනු කෙනෙක් හෝ කිසිවක් නොකල අයෙක් මුල් කරගෙනද? ඔහු ජීවත් වූයේ නැහැයි ඔබ කීවත් ඔහුගේ උත්පත්තියේ සිට ඔබ වර්ෂ ගණන් කරයි. කාලය පැවතුනේ ඔහුට ප්‍රථමයෙනි. එහෙත් ඔහු පැමිණි පසු ඊට පෙර තිබුනු හැම දෙයක්ම නිෂ්ඵල බවත් නියම කාලය ආරම්භ වන්නේ දැන් පටන් බවත් මනුෂ්‍ය වර්ගයාට පෙනිගියේය. යේසුස් වහන්සේ නිකම්ම ප්‍රබන්ධ කථාවක් නොවන බව ඔබේ කොමියුනිස්ට් ප්‍රවෘතති පත්‍රම සාධකයකි.

බටහිර රටවල පාස්ටර්වරු ඔවුන් තුල නැති කිතු දහමේ මූලික සත්‍යයන් පහද දෙති. ඔබ ඇත්තවශයෙනම, අපේ විශ්වාශය සනාථ කරන්නා වූ සත්‍යය ගැන දේශනා අසනු ඇති. එහෙත් යකඩ තිරය පිටුපස එය කිරීමට පුහුණු නොවූ මිනිසුන් ඔවුන්ගේ විශ්වාශයනට දෙන්නේ අතිශයින්ම ත්‍රාසජනක පදනමකි. රජයේ දෙවස්ථානයේ ආරම්භයද කිතු දහමේ ප්‍රධාන බලකොටුව වූ රහස් සභාවේ අවසානයද මෙතැන් සිට යැයි පැහැදිලි ලෙස බෙදු දක්වන පවුරක් එහි නොමැත. කොමියුනිස්ට් වාදීන් හා සහයෝගයෙන් කටයුතු කරන රජයේ දේවස්ථානයට දිගු ඉතිහාසයක් ඇත. රුසියන් සමාජවාදී විප්ලවයේ අවසානයත් සමගම එකල ජීවමාන

සභාවේ නායක පූජකතුමාවූ සර්ජියුස්තුමාගේ නායකත්වයෙන් මෙය ආරම්භ විය. මේ ජීවමාන සභාව මේ කාලයේදී මොස්කව් නගරයේ දී ප්‍රසිද්ධියේම මෙසේ පලකලේය. "අපේ ඉලක්කය යලිත් සභාව ගොඩනැගීම නොවේ. එය මකා දැමීමය. සකල ආගම් නැතිකර දැමීමය. සභාව සඳහා ලක්ෂණ වැඩ පිළිවෙලක් අපට මෙවැනි සර්ජියුස් ලා හැම රටකම සිටිති. හංගේරියේ කතෝලික බැතිමතුන් අතර බොංලග් නම් පියතුමෙක් විය. ඔහු සහ පොෘතස්තන්ත්‍රවාදී පූජකයන් කොමියුනිස්ට්වරුන්ට රාජ්‍ය පාලනය අල්ලා ගැනීමට උදව් දුන්නේය. රුමේනියාවේ කොමියුනිස්ට්වරුන් බලයට පත්වූයේ ඔතොඩොක්ස් පූජක බුර්බූසියාගේ ආධාරයෙනි. ඔහු පැසිස්ට් වාදියෙක්ව සිටියේය. ඔහුගේ නායකයන්ට වඩා 'රතු' වැළඳගනිමින් පසු වූ පව්වලට වේශ නිරූපනයක් කලේය. මෙම පූජකයා සෝවියට් රාජ්‍ය ලේකම්වරයා ළඟ සිටගෙන පසුව ප්‍රකාශයට පත් කල කොමියුනිස්ට් රජය පිළිගන්නා අයුරින් මෙසේ කීය. "මෙම රජය විසින් භූමික පරාදීසයක් මවනු ඇත. ඔබට තව දුරටත් ස්වර්ගීය එකක් අනවශ්‍යයි" යනුවෙනි. රුසියාවේ ආම්බිෂොප් නිකොඩම් රජයට ඔත්තු සපයන බව වාර්තා කර ඇත. රුසියානු රහස් පොලිසියෙන් කලඑලි බට මේජර් ඩෙරිබියන් පූජක නිකොබිම් එවැනි අයෙක් බවට සාක්ෂි දී ඇත. සියලුම ආගම්වල තත්වය මෙබඳුය. රුමේනියාවේ බැප්ටිස්ට් සභිකයන් බලයෙන් රවටාගෙන ඇත. එය නියම කිතු දහමට දෝෂාරෝපණය කරයි. රුසියානු බැප්ටිස් නායකයාද කරනුයේ මේ ටිකම ය. රුමේනියානු ඇඩ්වෙන්ටිස් සභාවේ නායකයා, තමා කොමියුනිස්ට් වාදීන් බලයට පත්වූද සිටම.රහස් පොලිසියේ ඔත්තු සපයන්නෙක් වී සිටි බව කීවේය.

හැම දේවස්ථානයක්ම වසා දමනුවාට වඩා (දැනටමත් දහස් ගණනක් වසා දමා ඇත.) අනෙක් අතට කිතුනුවන් හා කිතුදහම අන්තිමේදී විනාශ කරලීම සඳහාත් ශූරලෙස රජයේ දේවස්ථාන කිහිපයක් ඉතිරිකරලීමට ඉතා ශූර ලෙස කල්පනා කොට ඉඩ දී තිබේ. සංචාරකයන් මුලා කිරීමටත් සභාවේ

සැලකිල්ල පමණක් තබා එය කොමියුනිස්ට් වාදයට හැරෙන ආයුධයක් බවට පත් කිරීම වඩා සුදුසු බව ඔවුහු තීරණය කළහ. එවැනි පසුබිමක් යටතේ මම මෙවැනි දේවස්ථානයක් භාර දුන්නේ රහස් පොලිසියට ඔත්තු සැපයීම සඳහාය. එය බටහිර වසන එකම ආකාරයකට පුරුදු පුහුණු වූ අයට අවබෝධ කරගත හැක්කේය. එහෙත් රහස් සභාව එවැනි ඊනියා දේව සභාවල්, හැඟුම්බර, බලසම්පන්න හැම මැවිල්ලක් වෙතම යන ශුභාරංචි ව්‍යාපාරයක් වෙනුවට පිලිනොගනු ඇත.

බොහෝ වංචනික ජීවිතයන් ගතකරන නායකයන් සිටියද, රජයේ දේවස්ථානවල නියම ආගමික ජීවිත ගතකරන අයද සිටිත්. බටහිර බොහෝ දේවස්ථානවල තත්වය ඒකාකාර බව මගේ සිතට ආ හැඟීමකි. නායකයන්ගේ උසස් ගුණ සමුදයයන් නිසා අදහන සමූහයා විශ්වාසවන්ත වෙති.

ඕතොඩොක්ස් සැලැස්ම නතරවී ඇත. වෙනස්වී නැත. කොමියුනිස්ට්වරු වංක කමින් දේශනා කලද එය සභාවේ සාමාජිකයන්ගේ හදවත් වලට අහර දෙයි. ලූදරන් වරු ප්‍රෙස්බිටීරියන් වරු හා පොතෙතේත්‍රවාදීහු සමහර පැරණි ක්‍රම අනුගමනය කරති. නිසරු දේශනාවකින් ඇතිවූ ඇදහිල්ල දේශකයාගෙන් වසන් කල යුතුව ඇත්තේ දේශකයාම එය රහස් පොලිසියට දන්වන හෙයිනි. මනුෂ්‍යයෝ එවැන්නන් ද්‍රෝහියන් බව දැන දැනම ඔවුන්ගේ උදව් ඇතිව කැපවූහ. මෙය ලෙවීකථාවේ 11: 37 හි සඳහන් කල ප්‍රතිමූර්තිමත් වදනින් දැක්වෙන සියලුම රජයේ දේවස්ථානවල නායකයන්ද සියලුම උසස් නිලධරයන්ද කොමියුනිස්ට්වරුන් නොවන බව කීමට අපක්ෂපාතීත්වය අපට බලකරයි. තමන් විසින්ම සැඟවී සිටින අය කිහිප දෙනෙකුන් හැර රහස් දේව සභාවේ සියළුම දෙනා රජයේ දේවස්ථාන වල දී උසස්ය. ඔවුන් කිතු දහම නිකම් වැනෙන සුළු එකක් නොව සටන්කාමී ආගමක් බව දකිති. රුමේනියාවේ පූජ්‍ය ව්ලැඩිමීර්ස්තිගේ ආශ්‍රමය අසලට රහස් පොලිසිය පැමිණි කල මහත් දුෂ්කරතාවයනට මුහුණ දුන්හ. ආගම තහනම් කිරීමට තැත්කරන විට ඇතැම් කොමියුනිස්ට්වරු ජීවිත පවා පූජා කළහ.

එහෙත් රජයේ දේවස්ථානය උණරෝගියකු මෙනි. සෝවියට් රුසියාවේ දේවස්ථාන 6000 ක් පමණ තිබීම ගැන මවිතවෙමි (මේ සමාන ජන ගහනයක් ඇති එක්සත් ජනපද-ඇත්තේ දේවස්ථාන 300000 ක් පමණි) මේවා අප ඡායාරූප වල දකින දෙව් මැදුරු මෙන් නොව කුඩා කාමරය. විදේශික සංචාරකයෝ මොස්කව් නගරයේ සෙනග රැස්වූ පොතෙස්-තන්ත්‍ර දේවස්ථාන බලා එහි ආගමික නිදහස ඇතැයි කියති. දේවස්ථාන 'පිරී ඉතිරී පවතී'යි ඔවුහු වාර්තා කරති. ආත්ම හැත්තෑ ලක්ෂයක් වෙනුවෙන් ඇති පොතෙස්තන් සභාවේ භීෂණය ඔවුහු නොදකිති. සෝවියට් දේශයේ වැසියන්ගෙන් 80% ක් පමණ දෙනාට ඇවිදින දුර ප්‍රමාණයක පිහිටා ඇති කුඩා කාමරයක ප්‍රමාණයේ දේවස්ථානයක් වත් නොමැත. සමූහයා අමතක කල යුතුව ඇත. නැතහොත් රහස් සභා ක්‍රමය අනුගමනය කල යුතුය. වෙන යමක් තෝරා ගැනීමට නැත. කොමියුනිස්ට්වාදය වැඩියෙන් පාලනය කරන විට දේවස්ථානවලට වඩා රහසින් සේවය කිරීමට සිදුවේ.වසාදමන ලද රජයේ ගොඩනැඟිලිවල ආගම් විරෝධී රැස්වීම් පවත්වති.

## අදේවදෘෂ්ටි සාහිත්‍යය රහස් සභාව ''ආහාර'' කර ගන්නේ කෙසේද?

මෙය කෙසේ පාවිච්චි කළ යුතු දැ'යි රහස් සභාව දනී, ප්‍රථමයෙන්ම එය කපුටුවන් විසින් එලිසාට අහර සැපයූ ලෙසට සලකයි. බයිබල් පද විවේචනය කිරීමටද, හාස්‍යයට ලක් කිරීමටද අදෙව දෘෂ්ටිකයෝ මහත් උනන්දුවක් හා දක්ෂ කමක් දක්වති.

ඔවුහු ''විහිළු බයිබලය'' හා ''ඇදහිලිවන්තයන්ට හා නොඇදහිලිවන්තයන්ට බයිබලය'' යනුවෙන් පොත් දෙකක් පල කරති. බයිබල් පද කොපමණ මෝඩදැයි සනාථ කිරීමට බොහෝ බයිබල් පද රැස්කර ඇත. ඒ ගැන ප්‍රිතිවිය හැක්කේ කෙසේද? විවේචනය කෙතරම් මෝඩ ලෙස කර ඇත්දැයි කිව ශොත් කිසිවකු එය තැකීමකුදු නොකරයි. කොමියුනිස්ටවරු එය උපහාසයට ලක් කළද වචනයෙන් කිව නොහැකි

ශොභමාන බයිබල් පදයන්ගෙන් මේ පොත් පිටපත් ලක්ෂ ගණනින් මුද්‍රණය කරයි. විසුළු ඇනු පද. අපායේ ගිණි දැල්, යක්ෂයන් සිතුවම් කර බයිබලය උපහාසයට ලක් කිරීමට පල කොට ඇති අදෙව දෘෂ්ටි පොත් යලින් මුද්‍රණය කරදෙන ලෙස ඉල්ලා එවන දහස් ගණන් ලිපි ගැන කොමියුනිස්ට් මුද්‍රණාලය ප්‍රීතිය පල කරයි. ශුද්ධ ලියවිලි සපයා ගත නොහැකි රහස් සභාවෙන් මේ ලිපි ආ බව ඔවුන් නොදනිති. අදේව දෘෂ්ටික රැස්වීම් කෙසේ පාවිච්චි කල යුතු දැයි අපි හොඳින් දැන සිටියෙමු.

කොමියුනිස්ට් මහාචාර්යවරයෙක් එක් රැස්වීමකදී යේසුස් වහන්සේ විජ්ජාකාරයෙක් බව ප්‍රකාශ කළේය. මහාචාර්ය වරයා ඉදිරියේ ජලය පිරි බඳුනක් විය. ඒ තුළට කිසියම් කුඩු ස්වල්පයක් දැමූ විට ඒ ජලය රතු පැහැය ගත්තේය. සම්පූර්ණ පුදුමය මෙන්න!'' ඔහු පැහැදිලි කළේය. එදා යේසුස් වහන් සේත් මෙබඳුම කුඩු ස්වල්පයක් ගෙන වතුරට දමා පුදුමාකාර ලෙස වතුර වයින් බවට හැරවිය. නමුත් මට ඒක යේසුස් වහන්සේට වඩා හෝඳින් කරන්න පුළුවන්! වයින් යලි වතුර බවට හරවන්න පුළුවන්''යි කියමින් තවත් කුඩු ස්වල්පයක් වතුරට දැමීය. එවිට රතු පැහැගත් ජලය සුදු පැහැ ගත්තේය. යලිත් තවත් කුඩු ස්වල්පයක් දැමූ කල යලින් රතු පැහැ ගත්තේය.

එක් කිතුනුවෙකු නැගිට ''සහෝදර මහාචාර්යතුමනි! ඔබ අප පුදුමයට පත් කර තිබේ. නමුත් ඔබට කරන්නට පුළුවන් කුමක්ද? අපි තව එක ඉල්ලීමක් ඔබගෙන් ඉලිලමු. ඔබගේ වයින් වලින් බිඳක් ඔබ පානය කරන්න. මහාචාර්යවරයා ''ඒක මට කරන්න බැහැ ! ඒ කුඩු වස වර්ගයක්!'' යයි කීවේය. ඔබත් යේසුස් වහන්සේත් අතර සම්පූර්ණ වෙනස එයයි. උන්වහන්සේ තමන් වහන්සේගේ වයින් වලින් අපට වර්ෂ දහස් ගණනක් තිස්සේ ප්‍රීතිය ගෙන දෙයි. එහෙත් ඔබේ වයින් වලින් අපට වස බෙද දෙයි.'' ඒ කිතුනුවා සිරගෙට යැවිය. එහෙත් මේ ප්‍රවෘත්තිය ඇදහිල්ල ශක්තිමත් කරමින් පැතිර ගියේය.

අපි දවිත් මෙන් දුබල වෙමු. එහෙත් අදෙව දෘෂ්ටි ගෝලියත්ට වඩා ශක්තිමත් වෙමු. ඒ දෙවියන් වහන්සේ අප සමගය. සත්‍යය අප කෙරේ ඇත. වරක් කොමියුනිස්ට් කථිකයෙක් අදෙව දෘෂ්ටිය ගැන කථාවක් පැවැත්වීය. කම්හලක් අසලවූ එම රැස්වීමට කම්හලේ හැම සේවකයෙකුම සහභාගි විය යුතු විය, ඔවුන් බොහෝ දෙනෙක් කිතුනුවෝය. ඔවුන් නිශ්ශබ්දව අසුන් ගෙන දෙවියන් වහන්සේට විරුද්ධ වූ හා යේසුස් වහන්සේ විශ්වාස කිරීමේ මෝඩකම ගැන තර්ක කරමින් කළ කථාවට සවන් දෙමින් සිටියහ. ආත්මික ලෝකයක් නැත. දෙවිකෙනෙක් නැත. යේසුස් වහන්සේ කෙනෙක් නැත. මින් මතු කිසිවක් නැත. මිනිසා ආත්මයක් නැති ද්‍රව්‍යයක් පමණි, යන මත ඔප්පු කිරීම සඳහා මෙම දේශනය පැවැත්විය. කථිකයා යලි යලිත් කීවේ මනුෂ්‍යයා නිකම් ද්‍රව්‍යයක් පමණක් බවත් ය. කිතුනුවෙකු නැගිට ප්‍රශ්න යක් ඇසිය හැකිදැයි ඇසීය. අවසරය ලැබුනි. කිතුනුවා ඔහුගේ ඇකිලිය හැකි පුටුව ගෙන පසෙකට වීසි කළේය. මොහොතක් සිටියේය. යලිත් පුටුව දෙස බැලීය. කථිකයා වෙතට ගියේය. ඔහුගේ කම්මුල හරහා වේගවත් පහරක් දුන්නේය. කථිකයාට හොඳටම තරහ ගියේය. කෝපයෙන් මුහුණ රතු විය. පරුෂ වචනයෙන් කෑගසා අනුගාමිකයන් කැඳවීය. කිතුනුවා සිරභාරයට ගන්නා ලෙස අණ කළේය. "උඹ භය නැතිව මට ගැහුවේ ඇයි!" කිතුනුවාගෙන් ඇසීය. "ඊට හේතුව කුමක්ද?"

"ඔබ බොරුකාරයෙක් බව ඔබම දැන් සනාථ කර ඇත" කිතුනුවා පිලිතුරු දුනි. ඔබ කීවේ හැම දෙයක්ම ද්‍රව්‍ය බවත් වෙන කිසිවක් නොමැති බවත්ය. මම පුටුව ඔසවා වීසි කලෙමි. ඇත්තටම ඒක ද්‍රව්‍යයක් තමා. එහෙත් මම ඔබට පහර දුන් විට ඔබ පුටුව මෙන් ක්‍රියා කළේ නැත. ඔබ ක්‍රියා කලේ ඊට වෙනස් අයුරකිනි. ද්‍රව්‍යයකට තරහ නොයයි. පිස්සු නොවැටෙයි. එබැවින් සහෝදර මහාචාර්යවරයාණෙනි! ඔබ වැරදිය. මිනිසා තුළ ද්‍රව්‍යයකට වඩා ඇත. අපි ආත්ම ඇති සත්වයන්ය.

ගණනාවක් නොමැති වාරවලදී සාමාන්‍ය ක්‍රිස්තු භක්තික යන් අදේව දෘෂ්ටිකයන්ගේ විස්තරාත්මක තර්ක වැරදි බව ඔප්පු කර ඇත. එක් දේශපාලන නිලධාරියෙක් "තව කොච්චර කාලයක් උඹේ ඔය මෝඩ ආගම අදහනවාද?" යි මගෙන් ප්‍රශ්න කළේය. ගණන් කළ නොහෙන තරම් අවස්ථාවලදී අදේව දෘෂ්ටිකයන් මරණාසන්න මොහොතේදී තමන් අදේව දෘෂ්ටිකයන්ම සිටි බව වැලපෙමින් යේසුස් වහන්සේට හඬගෑ අවස්ථා මම දැක ඇත්තෙමි.

කිතුනුවකු මරණාසන්න මොහොතේදී ඔහු කිතුනුවකු වී සිටීම ගැන වැළපෙන්නට හැකි දැයි ඔබට සිතින් මවාගත හැකිද? නැතහොත් ඔහු කාල්මාක්ස්ට හෝ ලෙනින්ට ඔහුගේ ඇදහිල්ලෙන් බේරා ගන්නා ලෙස යාච්ඤා කරන්නේද? "හරි නුවණක්කාර උත්තරයත්!" ඔහු සිනාසෙන්නට විය. තව දුරමත් මම මෙසේ කීවෙමි. ඉංජිනේරුවෙක් පාලමක් හද අවසන් වූ පසු එහි සවිය උරගා බැලීමට මීයකු ඒ මතින් යැවීම වැරදිය පාලමේ ශක්තිය උරගා බැලීමට නම් දුම්රියක ඒ මතින් යැවිය යුතුය. එහි සත්‍යය නම් හැම දෙයක්ම යහපත් අයුරින් සිදුවෙමින් අදේවඅදේවදෘෂ්ටික යන්ගේ වැරදි නොපෙනෙන විට ඔබට අදේවදෘෂ්ටිකයෙක් වීය හැකිය. එහෙත් එය විශාල බලාපො-රොත්තු තැබිය හැකි මොහොතේදී රඳා නොපවතියි. සෝවියට් සමූහාණ්ඩුවේ අගමැති වූ පසුද ලෙනින් බලාපොරොත්තු වූ අයුරින් කටයුතු ඉටු නොවනවිට දෙවියන්ට යාච්ඤා කළ බව ඔහුගේ පොත් පෙන්වමින් සනාථ කළෙමි.

අපි සම්පූර්ණයෙන්ම නිහඬවී කටයුතු සිදුවන ලෙසම වැඩී යන්නට ඉඩදී බලා සිටියෙමු. එනම් කොමියුනිස්ට් ආගමික විරෝධී ව්‍යාපාර දියත් කිරීමය. මෙමගින් ඔවුන් සනාථ කලේ සාන්ත අගොස්තීනුගේ "හදවත තුලට පැමිනෙන තෙක්ම හදවතට සහනයක් නැත!"

## කොමියුනිස්ට්වරුන් පවා දිනාගත හැකිවූයේ ඇයි?

නිදහස් කිතුනුවන් වූ ඔබ රහස් සභාවට උදව්දුනහොත් කොමියුනිස්ට්වරුන්ගේ හදවත් දිනාගත හැක. ඉන් ලෝකයේ මුහුණුවර වෙනස් කරනු ඇත. එමගින් කොමියුනිස්ට් වරුන් දිනාගත හැක්කේ කොමියුනිස්ට්වාදියකු වීම ස්වභාව ධර්මයට විරුද්ධ හෙයිනි. බල්ලකු පවා උගේම ඇට (ලෙවීමට) ආශා කරයි. තමන්ට ඉවු කිරීමට සිදුවී ඇති ක්‍රියා පිළිවෙල නිසාද, සත්‍ය කරුණු වලට විරුද්ධව කටයුතු කිරීමට සිදුවීම නිසාද කොමියුනිස්ට්වරුන්ගේ හදවත් ඔවුන්ට ම විරුද්ධව කැරලි ගසයි. කොමියුනිස්ට් වරුන් ප්‍රකාශ කරන කරුණ නම් අප එක්තරා අන්දමකට ඒකරාශීවූ රසායනික ද්‍රව්‍ය කොටස් රැසක් බවත් මරණින් පසු යළිත් අප ලුනු සහ ඛනිජ ද්‍රව්‍ය බවට පත්වන බවත්ය. මට මෙසේ අසන්නට සිදුවිය. ''එසේනම් බොහෝ රටවල කොමියුනිස්ට්වරුන් තමන්ගේ ජීවිත ඉතාම යහපත් දේ වෙනුවෙන් දී ඇත්තේ කෙසේද? රසායනික ද්‍රව්‍ය රැසකට ඉතාමත් හොඳ දෙයක් තිබිය හැකිද? රසායනික ද්‍රව්‍යවලට අනුන්ගේ යහපත උදෙසා පූජා වීමට හැකිද? මේ පැන වලට ඔවුන්ට පිළිතුරු නොවීය.

අනතුරුව කෲරකම! මිනිසුන් කෲර ලෙස මවනු නොලද්දෝය. දිගටම කෲරකම දැරිය නොහැක. නාසි පාලකයන්ගේ අවසානය අපි දැක ඇත්තෙමු. සමහරු සිය දිවි නසා ගත් අතර සමහරු පසුතැවිලිව තම අපරාධ පාපොච්චාරණය කළහ.

කොමියුනිස්ට රටවල අන්ත බේබදු කමට ඒකාන්තයෙන්ම හේතුවන දෙයක් ඇත. කොමියුනිස්ට්වාදය මගින් ගෙන දිය නොහැකි පුළුල් ජීවිතයකට හැම දෙනෙක් තුළම ආශාවක් ඇති රුසියානුවන් ගෙන් බොහෝ දෙනෙක් උසස් හදවත් ඇති පරාර්ථකාමීන්ය. කොමියුනිස්ට්වාදය නොගැඹුරුය. දැන ගැන්මට ඉතා සුළුය. ජීවිතයේ ගැඹුර කුමක්දැයි සොයා එය කොතැනක හෝ හමු නොවූවිට ඔවුන්

එය සොයන්නේ මත්පැන් තුලිනි. ඔහුට ජීවත්වීමට ඇති කෘෘර වංචාකාරී ජීවිතය කෙරේ ඇති තද ක්‍රොධය, මත් පැන් තුලින් ප්‍රකාශ කරති.

ඔහුට දැනගත හැකිවී නම් සත්‍යය ඔහු සදකාලයටම නිදහස්ව තබන්නාක් මෙන් මත්පැන් සුළු වෙලාකකට ඔහු නිදහස්ව තබයි.

බුකාරස්ට් නගරය රුසියානුවන් අල්ලා ගැනීමෙන් පසු දිනක් මට නොවැලැක්විය හැකි හේතුවක් නිසා හදියියේම සුරා සැලකට ගියෙමි. මම බීරියටද එහි යාමට කථා කලෙමි. එහි ඇතුළට ගියවිට එක් රුසියානු කැප්ටන් වරයෙක් තුවක්කුවක් ඇතැතිවද, හැම දෙනෙකුම ඔහුට මත්පැනින් සංග්‍රහ කරනු මා දුටුවෙමි. ඔහු එය පිළිකෙව් කෙළේය. ඔහු මුළුමනින්ම බීමත්ව සිටියේය මිනිසුන් බියවී සිටියහ. මම හඳුනන සුරාසැල් හිමියා වෙත හොස් බී ගත් කැප්ටන් නිහඬ කරවන බවට පොරොන්දු වී තවත් බීමට දෙන ලෙස කිවෙමි. එක් වයින් බෝතලයකින් පසු තවත් වයින් බෝතලයක් ඔහුට දෙන ලදී මේසය මත විදුරු තුනක් විය. කැප්ටන් වරයා වීදුරු තුනම ආවාරශීලිව පිරවීය. සියල්ලම ඔහු හිස් කළේය. මමත් බිරිඳක් නොබීවෙමු. කොපමණ බීමත්ව සිටියද ඔහුගේ කල්පනාව නිරවුල්ව තිබිණ. ඔහු මත්පැන් බීමට බලවත්සේ පුරුදුව සිටියේය. මම ජේසුස් වහන්සේ ගැන ඔහුට කීවෙමි. බලාපොරොත්තු නොවූ අවධානයකින් යුතුව ඔහු සවන් දී සිටියේය.

අවසානයේදී ඔහු, දැන් ඔබ කව්දැයි ඔබ කීවෙහිය. මම කවුදැයි දැන් ඔබට කියමි. මම ස්ටාලින් යටතේ හටගත් මහා පීඩා කාලයේදී දෙවියන් කෙරෙහි විශ්වාශ අත්හල ඕතොඩොක්ස් පූජකයෙක්මී. මම දෙවිකෙනෙක් නැතැයි ගමින් ගමට දේශන පවත්වමින් ගියෙමි. පූජකවරයෙක් වශයෙන් මම වංචාකාරයෙක් වී සිටමි. "මා මෙන්ම සියළු ඇමතිවරුන්ම වංචා කාරයන් බව" මම ඔවුන්ට කීවෙමි. මගේ උනන්දුවීවේ නියම අගය මම දැන ගත්තෙත්, රහස්

පොලිසියේ නිලධාරියෙක් වූයෙමි. දෙවියන් වහන්සේ මට දඬුවම් කරන්නේ මේ ඇතින් මා මරාදැමූ කිතුනුවන් නිසාය. මේවා අමතක කරනු වස් මම මත්පැන් බොන්නෙමි! බොන්නෙමි!! එහෙත් එය කල නොහැකිවිය.

බොහෝ කොමියුනිස්ට් වරුන් සිය දිවි හානි කර ගනිති. මහා කවියෙකුවූ එසෙයිනින්, මායිආකොව්ස්කි., මහා ගත් කතුවර ෆැඩීව් ද එසේ සිය දිවි හානි කර ගත්තෝය. 'ප්‍රීතිමත් බව' නමැති නවකථාව ඔහු අවසන් කල වහාම ඔහු වෙඩිතබා ගෙන සිය දිවි හානි කර ගැනීම ගැන ඔහු ප්‍රීතිවනු ඇත. එහි ඔහු පැහැදිලි කර තිබුනේ ප්‍රීතිමත්කම අයත්වන්නේ කොමියුනිස්ට් වාදය වෙනුවෙන් කොක්කඩවා සේවය කිරීමෙන් බවයි. එවැනි මහා මුසාවක් දැරීම ඔහුට ඉතා අපහසු කාර්යයක් විය. ටොම්කින්, ජෝෆි වැනි සාර් සමයේ සටන්කාමී කොමියුනිස්ට් පාලකයන්ට සත්‍ය වශයෙන්ම කොමියුනිස්ට්වාදය කෙසේදැයි බලා සිටිය නොහැකි විය. ඔවුන්ගේ ද අවසානය වූයේ සිය දිවි හානි කර ගැනීමෙනි.

කොමියුනිස්ට් වරුන් ප්‍රීතියෙන් තොරය. ඔවුන්ගේ ආඥාදායකයන් පවා එසේය. ස්ටාලින් කොපමණ ප්‍රීතියෙන් තොරව සිටියේදැයි කිවහොත් ඔහුගේ පැරණි සහෝදරයන් මරා දැමීමෙන් පසු නිරන්තරයෙන්ම ඔහු පසු වූයේ තමාට කිසිවකු විසින් වස දෙනු ඇතැයි යන සිතිවිල්ලෙනි. බැංකුවක මෙන් සුරක්ෂිත වැසියහැකි නිදන කාමර අටක් ඔහුට විය, ඉන් කුමන කාමරයක ඔහු නිදියන්නේදැයි කිසිවකු දැන සිටියේ නැත. අරක්කැමියා ඔහු ඉදිරිපිට අහර අනුභව කොට දැක්වූ පසු පමණක් ඔහු අහර ගත්තේය. කොමියුනිස්ට්වාදය කිසිවෙකු ප්‍රීතිමත් නොකරයි. එහි ආඥාදායකත්වයන් ද එසේමය. ඔවුන්ට යේසුස් වහන්සේ අවශ්‍යව ඇත. කොමියුනිස්ට් වාදය ඉවත ලීමෙන් කොමියුනිස්ට්වාදයේ මුර බල්ලන් වැනි කොමියුනිස්ට් වරුන්ගෙන් අප නිදහස් වන්නේ නැත. වහලුන්ව ඇති ඇගේ මිනිසුන්ගේ බලවත් අවශ්‍යතා රහස් සභාව නියෝජනය කර සිටින්නිය. අපි ඇයට උදව් කළ යුතු වෙමු.

රහස් සභාවේ ඇති විශෙෂ ලක්ෂණය නම් ඇදහිල්ලේ උනන්දුමත් භාවයයි. ජෝජ් නම් රහස් නමකින් හැඳින්වූ එක් ඇමතිවරයෙක් රහස් සභාවේ එක් සිද්ධියක් ඔහුගේ පොතක මෙසේ කියයි.

හංගේරියාවේ ඇමතිවරයෙකු වෙතට පැමිණි රුසියානු හමුදාවේ කැප්ටන් කෙනෙකු ඇමතිතුමා හුදෙකලාවම හමු විය යුතු බව පැවසීය. ඔහු තරුණය. ශක්තිමත්ය. ජයග්‍රාහක යෙකු වශයෙන් ඔහුගේ කටයුතු දැන සිටියේය. කුඩා සාකච්ඡා කාමරයකට ගිය පසු දොර වසන ලදී. බිත්තියේ එල්ලා තිබුනු කුරුසියට ඔහු හිස නමා ආචාර කළේය.

"මේක බොරු බව ඔබ දන්නවා ද?" ඔහු ඇමතිවරයාට කීවේය.

එක දූප්පතුන් මුලා කර ගෙන ඔවුන් මෝඩයන් ලෙස තබා ගෙන ඔබලා ඇමතිවරු වගේ සිටින්ට පාවිච්චි කරන වංචාකාරී එකක්. දැන් එන්න; අපි තනිවමනේ! මට කියන්න ඔබ යේසුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා බව ඇත්තටම විශ්වාස කලේ නැති බව! ඇමතිවරයා සිනාසුනේය.

"මගේ දූප්පත් ගැටයා ! ඇත්තටම මම ඒක විශ්වාස කරනවා. ඒක ඇත්තයි."

"මාත් එක්ක වංචාවෙන් සෙල්ලම් කරන්න එපා. මේක විහිළුවක් නොවෙයි. මට හිනාවෙන්න එපා!" තරුණයා කෑගැසීය. තරුණයා ඔහුගේ රිවොල්වරය ඇද ඇමතිවරයාට එල්ල කළේය.

"ඒක බොරුවක් යයි මට නොකිවොත් මම වෙඩි තියනවා",

"ඒක බාරගන්න බැහැ. ඒක ඇත්තක් නොවෙයි. අපේ දෙවියන් වහන්සේ ඇත්තටම සත්‍යවූ දෙවියන් වහන්සේගේ පුත්‍රයායි" ඇමතිවරයා කීවේය.

රිවොල්වරය පසෙකට විසිකල තරුණයා ඇළිත්තුමා සිප ගත්තේය. ඔහුගේ දෙනුවන් තුලින් කඳුලු පැන නැංගේය.

"ඒක ඇත්ත" ඔහු හැඬීය. "ඒක ඇත්ත, මම ඒක විශ්වාස කරනව. මිනිසුන් මේ විශ්වාසය නිසා මැරෙන බව බව දකින තෙක් මට විශ්වාස කරන්න බැරිවුනා. බොහොම ස්තූතියි, ඔබ මගේ විශ්වාසය ශක්තිමත් කලා. දැන් මටත් යේසුස්වහන්සේ වෙනුවෙන් මැරෙන්න පුළුවනි. ඒක කරන්නෙ කොහොමද කියා ඔබ මට පෙන්නුවා."

මම මෙවැනි තවත් සිද්ධි දනිමි. රුසියානුන් රුමේනියාව අත්පත් කර ගත් පසු, දිනක ආයුධ සන්නද්ධ සෙබළුන් දෙදෙනෙක් දෙව් මැදුරකට ඇතුළු වූහ. "අපිට උඹලාගේ ඇදහිම විශ්වාස කරන්න බැහැ. ඒ ඇදහීම අත්හැර නොදමන අයට මෙතැනම වෙඩි තියනවා. ඇදහිම අත්හරින අය දකුණු පැත්තට වෙයල්ලා" මෙය ඔවුන්ට දෙව්මැදුර අතහැර නිවෙස් කරා යාමට ලැබුනු අණ විය. ඔවුන්ගේ ජීවිත උදෙසා ඔවුන් පැන දිවූහ. එහි රැඳුනේ නැවැතුනු කිතුනුවන් කිහිප දෙනා හා සෙබළුන් දෙදෙනා පමණකි. සෙබළුන් දෙදෙනා ඔවුන් සිප ගත්තෝය. "අපිත් ක්‍රිස්තියානි කාරයෝ. සත්‍යය වෙනුවෙන් මිය යාම වටිනා එකක් බව කල්පනා කරන අය සමග සබඳකම් පැවැත්වීමට අපි කැමති" යයි ඔවුන් දෙදෙනා කීය.

මෙවැනි මිනිසුන් අපේ රටවල ශුභාරංචිය උදෙසා සටන් කරති. ශුභාරංචිය උදෙසා පමණක් නොව නිදහස උදෙසා ද සටන් කරති.

බටහිර කිතුනුවෝ බොහෝදෙනා නිකරුනේ පැයගණන් සංගීතය වෙනුවෙන් කා දමති. අපේ ගෙවල්වලද ඇති උස් හඬින් නද දෙන සංගීතයන් ඇසිය හැක. එහෙත් එසේ උස් හඬින් ඇත්තේ ශුභාරංචි කථා හා රහස් සභාවේ වැඩ කටයුතු අසල්වැසියන්ට ඇසී පොලිසියට දැන්වීම වැලැක්වීමටය. "අහම්බෙන් බටහිරින් පැමිණි කිතුනුවකු ඔවුන් හමුවූ විට ඔවුන් කෙසේ ප්‍රතිචාරනේ ද?

මේ වාක්‍ය ලියන මම සැලකිය යුත්තෙක් නොවේ. එහෙත් මම හඬක් නැත්තවුන්ගේ හඬ වෙමි. මුකවාඩම් ලැබූවන් වෙනුවෙන් වෙමි. බටහිර රටවල් හා හැඳුනුම්කමක් නොමැතියවුන් වෙනුවෙන් වෙමි. ක්‍රිස්තියානි කටයුතු ගැන විශ්වාසයෙන් යුක්තව ඉතා ඕනෑකමින් ඔවුන්ගේ නාමයෙන් අසා සිටිමි. අවංක එමෙන්ම පීඩාවිඳින රහස් සභාව ගැන ඔබේ යාච්ඤාවද, ප්‍රායෝගිකව කරන ආධාරයන්ද මම ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ නාමයෙනි.

පළමුවෙන්ම, අපි කොමියුනිස්ට්වරුන් දිනාගන්නෙමුව. දෙවියන්වහන්සේ අපේ පැත්තේ සිටින බැවිනි.

දෙවැනිව අපේ පණිවුඩය, හදවතේ ගැඹුරින්ම අපේක්ෂා කරන පණිවුඩයයි.

නාසීන් යටතේ සිටි කොමියුනිස්ට්වරු ඔවුන්ගේ අමාරුකම්වලදී යාච්ඤා කළ බව මට පැවසීය. සමහර කොමියුනිස්ට් නිලධාරීන්ගේ දෙතොල් අතර යේසුනි! යේසුනි!! යනුවෙන් රැව්දෙනු මම දැක ඇත්තෙමි.

අපේ මනුෂ්‍යයන්ගේ සකල සංස්කෘතික උරුමයන් අපේ පැත්තේ බැවින් අපි දිනන්නෙමු. රුසියානුවන්ට නවීන ලේඛන තහනම් කල හැකිය. එහෙත් මනුෂ්‍යයන්ට ක්‍රිස්තුස් ආලෝකය ලැබිය හැකි ටෝල්ස්ටෝයිගේත්, ඩොස්ටොව්ස්කිගේත් ග්‍රන්ථ වෙයි. නැගෙනහිර ජර්මනියේ ගොතේ ගේ ද පෝලන්තයේ සියන්කිවිස් ගේ ද ග්‍රන්ථ එසේමය. රූමේනියානු ගත් කතුවර සැඩොවියානුගේ ''සාන්තුවරයන් ගේ දිවිය'' නැමැති පොත ''සාන්තුවරයන්ගේ පුරාණ කථාව'' යනුවෙන් වෙනස් කොට පලකලේය. එහෙත් මේ මාතෘකාව යටතේද ශාන්තුවරයන්ගේ යහපත්, උනන්දු ජීවිතයන්ට නිදසුන් ගෙන හැර පෑවේය.

ඔවුන්ට රෆායෙල්ගේ, මයිකල් ඇන්ජිලෝගේ, ලියනාඩෝඩා වින්සිගේ විශ්මකර්ම, චිත්‍රකර්ම අත්හැර දැමිය නොහැක. මේ චිත්‍රකර්මයන් කථාකරන්නේ යේසුස් වහන්සේ

ගැනය. ක්‍රිස්තුස් වහන්සේ ගැන කථාකරන විට ඔවුන්ගේ හදවත් තුල ඇති මහත් ආත්මික අවශ්‍යතාවයන් මාගේ තාරුව්කාරයෝය, ඒවා මාගේ උදව්කාරයෝය. ඔවුන්ට ඇති මහත්ම අපහසු කම මගේ ප්‍රශ්නයන්ට උත්තර දීගත නොහැකිවීමය. ඔහුට ඇති මහත්ම අපහසුකම නම් මට පක්ෂව ඇති ඔවුන්ගේ හෘද සාක්ෂිය නිහඬ කිරීමට ඔවුන්ට නොහැකිවීමය.

අදේවදෘෂ්ටි කථා පවත්වන මම පුද්ගලිකව හඳුනන මහාචාර්යවරයෙක් ඔහුගේ කථා පැවැත්වීමට උදව් කරන ලෙස ඉල්ලා යාච්ඤා කළේය. රහස් දේව මෙහෙයයන්ට සහභාගිවීමට බොහෝ ඈත යන කොමියුනිස්ට්වරු මම දැක ඇත්තෙමි. එහිදී ඔවුන් සොයාගතහොත් එවැන්නකට නොගිය බව කියා සිටියි. පසුව ඔවුන් වැලපෙති. මුහුණ පෑමට සිදුවූ කරදරයේදී ඇඳහිල්ල වෙනුවෙන් ඍජුව සිටීමට ධෛර්යමත් නොවීම ගැන පසුව වැලපෙති. ඔවුන් ද සාමාන්‍ය මිනිසුන්ය.

විශ්වාශයක ලාබාල අවධියේදීම ඔහුට (කිසිවෙකුගේ) තනිවීමට සිදුවුවහොත් එම විශ්වාසය දියුණුවෙයි, වැඩෙයි. එය ජයග්‍රහණය කරන බව අපට සහතිකය. රහස් සභාවේ සිටින අපි එය යළිත් ජයග්‍රහණය කරනු දැක ඇති බැවිනි. කොමියුනිස්ට්වරුන්ට යේසුස්වහන්සේ ප්‍රේම කරනු ලැබිය. ඔවුන් උන්වහන්සේ වෙතට දිනාගත යුතුය. එසේ කළ හැකිය. ඔවුන් දිනාගත හැක්කේ යකට තිරය පිටුපස ඇති රහස් සභාවට මගින් පමණකි. සකල මනුෂ්‍යවර්ගයාගේම ආත්මයන්කරා ගැලවීම ළඟාකරදී යේසුස්වහන්සේ තෘප්තිමත් කිරීමට යමෙක් බලාපොරොත්තුවේනම්, ඔහු රහස් සභාවේ කටයුතු උසුලාගත යුතුය. යේසුස්වහන්සේ වදලේ, ''සකල ජාතීන්ටම කියන්න'' යනුවෙනි. ''යකඩ තිරය ළඟදී නවතින්න'' යි නොකීසේක. මිනිසුන් තිදෙනෙකුගෙන් එකෙක් බැගින් වහලුන් කරගෙන ඇති කොමියුනිස්ට් වාදයේ යකඩ තිරය ග්‍රහණය කිරීමට, යේසුස්වහන්සේට ඇති විශ්වාශවන්ත කමත්, බලවත් දයානුකම්පාවත් අපට බල

කරයි. රහස් සභාවේ සේවය කිරීමෙන් ඔවුන් මුළුමනින්ම ජයග්‍රහණය කල හැක. රහස් සභාව කණ්ඩායම් තුනකින් නිර්මානය වේ.

**පළමුවැන්න:-**

දේවගැතිවරු, කොමියුනිස්ට්වරු, වෙන්කළ දේවගැතිවරු කණ්ඩායම් තුනකින් රහස් සභාව නිර්මාණය කරනු ලබයි. ඉන් පළමුවැන්න නම් රජයට අවශ්‍ය ලෙසට ශුභාරංචිය දේශනා කිරීමට අකමැතිව දේවස්ථානවලින් හා රැලෙන් වෙන්කරනු ලැබූ හිටපු දේවගැතිවරුය. එවැනි බොහෝ දේවගැතිවරු වෘීගතන් සිරකරන ලදුව ඔවුන්ගේ විශ්වාශය නිසා වධ වින්දෝය. ඔවුන් නිදහස් කරන ලදුව යළිත් රහසිගතවම සම්පූර්ණයෙන් ප්‍රතිඵල ගෙන දෙන අයුරින් රහස් සභාවේ කටයුතු කරගෙන ගියහ. කොමියුනිස්ට්වාදීන් දේවස්ථාන වසාදැමුවද, ඔවුන්ට විශ්වාශ පක්ෂපාතී දේවගැතිවරු පත්කරගත්තද, වඩාමත් ප්‍රතිඵල ගෙනදෙන අයුරින් රහස් සභාවේ කටයුතු පවත්වාගෙන ගියහ. රහසිගතව ඔවුන් රාත්‍රියේ දී කමත්වලදී ද, ගබඩාවල දී, ආවරණයවූ කාමරවල දී රැස්වීම් පැවැත්වූහ. ඔවුන් ජීවමාන වේද සාක්ෂිකයෝය. සිරගෙවල දැමුවද, අන්තරායකාරී වධයට කැපකලද, දෙවියන්වහන්සේගේ සේවය අත් නොහරින්නෝය.

**දෙවැන්න: කැපවූ සභාව**

රහස් සභාවේ දෙවැනි කොටස නම් කැපවූ ස්ත්‍රී පුරුෂයන්ගෙන් සැදි විශාල හමුදවයි. රුසියාවේ හෝ චනයේ නාමික, සිතෙන් අඩක් පමණක් කැපකල, ඇල් මැරුණු කිතුනුවන් නොමැත. රීළඟ කරුණ නම් පිඩාවන් තුලින්, වඩා යහපත්, යේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරන, ආත්ම ළන්වහන්සේ වෙත දිනන කිතුණුවෙක් ඉපිදෙයි. කොමියුනිස්ට් පිඩාවන් ආපස්සට හැරී නිදහස් ලෝකයේ කලාතුරකින් දක්නට ලැබෙන උනන්දුවත් කැපවූ කිතුනුවන් නිර්මාණය කොට ඇත. කිතුනුවකු වුවද ඔහුට හමුවන හැම ආත්මයක්ම දිනා නොගන්නේ මන්දැයි මොවුන්ට තේරුම් ගත නොහැක.

රුසියානු හමුද පුවත්පතවූ ''රතු තරුව'' රුසියානු කිතුනුවන්ට පහරදෙමින් මෙසේ කීවේය. ''යේසුස්වහන්සේ නමදින්නන් හැමදෙනාම පහුරුගාමින් කෑදර කමකින් දිනා ගන්නට කැමතිවෙති''. එහෙත් ඔවුන්ගේ දීප්තිමත් කිතුනු ජීවිත සහෝදර ගැමියන්ගේත්, අසල්වැසියන්ගේත් ආදරය, ගරු බුහුමන් දිනා ගනියි. ගමක හෝ නගරයක අන් අය වඩාත් ප්‍රිය කරන තැනැත්තන් කිතුනුවන්ය. මවක් ඇගේ ළදරුවන්ට සැළකිය නොහෙන තරම් රෝගාතුර වූවිට කිතුනු මවක් පැමිණ ඇයට උදව් දෙයි. මිනිසකු සිය දරුවික පලා ගැනීමට නොහැකිතරම් අසනීපවූවිට කිතුනුවකු පැමිණ එය කරදෙයි. ඔවුන් ඔවුන්ගේ කිතු සමය තුල ජීවත්වෙයි. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂි දරන විට මිනිසුන් එය විශ්වාශ කරයි. එයට සවන් දෙයි. මන්ද? මොවුන්ගේ ජීවිත තුලින් ඔවුන් යේසුස් වහන්සේ දැක ඇති බැවිනි. බලපත්‍ර ලත් දේව-ගැතිවරයෙක් මිස අනෙක් පූජකයෙකුට දේවස්ථානයන්හි දේශනාකිරීමට නොහැකිවූ ද සිට ලක්ෂගණන් උනන්දුවෙන්, කැපවූනු කිතුනුවන් කොමියුනිස්ට් ලෝකයේ හැම මුල්ලකම සිට ආත්ම දිනමින් සිටිති. වෙළඳ පොළවලදී ද, ගම්වලදී ද ඔවුන් සාක්ෂි දරති. දේව සේවය කරති. කිතුනු මස් වෙළෙන්දෙක් ශුභාරංචි පත්‍රිකාවලින් මස් දවටා විකුණන බව පුවත් පත්වල පලවිය. කොමියුනිස්ට් මුද්‍රණාල වල සේවය කරන වගකිවයුතු නිලධාරීන් මහ රෑ පෙරලා මුද්‍රණ ලයට පැමිණ දහස් ගණන් ක්‍රිස්තියානි විස්තර පත්‍රිකා අච්චුගස්වා ඉරු නැගෙන්නට පෙර දෙර අගුලු දමා යන බවද මේ පුවත්පත් වලින් හෙලිකරන ලදි. මොස්කව් නගරයේ ළමුන්ට කිසියම් මාර්ගයකින් මෙම පත්‍රිකා ලැබෙන බව පුවත් පතේ පලවිය. ළමයි ඒවා ගුරුවරුන්ගේ පාසැලේ එල්ලා ඇති,ඇඳුමට උඩින් අඳින කබායේ සඟවති. දේව සේවයට කැපවී සිටින ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාව ඉතාමත්ම බලවත්ය. ඔවුන් ප්‍රතිඵල ලබා දෙයි.

කොමියුනිස්ට් කියුබාවේ දේවගැතිවරුගේ රහස් සභාවේ කටයුතු ගැන දැනගත් පසු ඔවුන් සිරකළහ, වධ දුන්හ. පසුව කොමියුනිස්ට දේව ගැතිවරු සමග යලිත් එක් කරන ලදී.

කොමියුනිස්ට්වරුන් කැපවූ දේව සේවකයන් වධ හිංසා පමුණුවා විනාශ කිරීමට බලාපොරොත්තු වුවද, ඒ වධ හිංසා තුලින් ඔවුන් වඩාමත් පාරිශුද්ධ භාවයකට පත්වෙති.

## තුන්වැන්න:- මැඩලිය නොහෙන නිහඬකරලිය නොහෙන රජයේ දේවස්ථානයන්හි දේවගැතිවරු.

මුකවාඩම් දමූ නිහඬකල රජයේ දේවස්ථානවල සිටින විශ්වාශවන්ත දේවගැතිවරු රහස් සභාව සතු අත්‍යාවශ්‍යවූ තුන්වැනි කණ්ඩායමය. රහස් සභාව රජයේ දේවස්ථාන වෙතින් සම්පූර්ණයෙන්ම වෙන් කොට නැත. යුගොස්ලා-වියාව හංගේරියාව පෝලන්තය ආදී බොහෝ කොමියුනිස්ට් රටවල රජයේ දේවස්ථානවල දේවගැතිවරු රහස් සභාවේ රහසින් සේවය කරති. සමහර රටවල මේ දෙක අතර සම්මුඛ පරීක්ෂණයක් ඇත. දේවගැතිවරුන් ඔවුන්ගේ එක් කාමරයකින් සෑදි දේවස්ථාන තුලදී යේසුස්වහන්සේ ගැන කථාකිරීම තහනම්ය. ඔවුන්ට ළමා හෝ තරුණ රැස්වීම් තහම්නම්ය. කිතුනුවන් නොවන අය මේවාට එලඹීමට අකමැතිය. රෝගීවූ කිතුනුවන් වෙනුවෙන් නිවසේදී යාච්ඤා කිරීම මේ දේවගැතියනට තහනම්ය. දේවස්ථාන අර්ථවිරහිත තත්ත්වයකට පත්කරලීම සඳහා කොමියුනිස්ට් නීතිරීති වලින් ඔවුන් වටේටම අහුරා ඇත. නිරන්තරවම මේ දේවගැතිවරු ආර්ථික නිදහස විහිළුවක් බවට පත් කරවන පාලනය කිරීම් වලට මුහුණ දෙති. එහෙත් මේ නිදහසට අන්තරාය පමුණුවන කොමියුනිස්ට් නීති රීති ඉක්මවා යමින්, නිර්භීතව, සමාන්තර දේව සේවයක් ඔවුන් ඉටුකරති. ළමයින් හා තරුණයන් අතරේද රහසිගත දේව සේවයක් මොවුන් ඉටුකරගෙන යති. නිවෙස්වලදී ද රහසිත ස්ථානවලදී ද ශුභාරංචි ප්‍රකාශක කටයුතු කරන්නේ රහසිනි. ඔවුන්ට රහස් මගකින් ලැබෙන ශුභාරංචි විස්තර පත්‍රිකා ශුභාරංචිය දූනගැනීමේ සාගින්නෙන් පෙලෙන ආත්ම අතරේ බෙදා දෙති. කොමියුනිස්ට් නිතිරිති නොසලකා හරිමින්, ඔවුන්ගේ නිදහස අන්තරායයට පමුණුවමින්, ඔවුන් වටා ඇති ආත්ම වලට සේවය කරති. පහසුවෙන්ම කීකරු-වෙමින් දේවවචනය රහසින් පතුරුවා හරිමින් ඔවුන්ගේ ජීවිත

අනතුරුදායක අඩියකට පත්කර ගනිති. මේ උපක්‍රමයන් හෙලිකරනු ලැබ බොහෝදෙනා සිරගෙවල දමන ලදී. ඔවුන්ට වර්ෂ කීපයකට සිර දඬුවමක් ලැබුනි. ඔවුන් රහස් සභාවේ අත්‍යාවශ්‍ය කංඩායමයි. ප්‍රථම දේවගැතිවරු වධහිංසා පමුණුවා ඉවත හරවා ගනු ලැබූ පසු රජයේ දේවස්ථාන ඔවුන්ට අවසර දී ඇති ප්‍රමාණයට වඩා විශාල ලෙස රහසිගතව දේව සේවයක් පවත්වති. මේ සියල්ලම රහස් සභාවේ කටයුතුය. කොමියුනිස්ට්වාදය පරාජය කරන තුරු රහස් සභාව කටයුතු කරයි. සමහර රටවල එක් ප්‍රදේශයකට වඩා අනෙක් ප්‍රදේශය ක්‍රියාශීලීය. එහෙත් මේ හැම තැනකම ඉතා අන්තරායකාරී තත්ත්වයක් තුලින් යේසුස් වහන්සේට සේවය කරති.

ආගමික කටයුතු ගැන වඩාමත් උනන්දුවක් දක්වන අය කොමියුනිස්ට් රටවල සංචාරය කොට ඔවුන්ට කිසිම රහස් සභාවක් හමු නොවුන බව ලියති. එය හරියටම මධ්‍යම අප්‍රිකාවේ නූගත් ගෝත්‍ර අතර සංචාරය කොට පැමිණ "මම ඉතා ඕනෑකමින් ඇසුවෙමි. ඔවුන් වනචාරී භාෂාවන් කථා කරන්නේදැයි ඇසුවෙමි. ඔවුන් සියල්ලෝම කීවේ ඔවුන් නොදන්නා බවය'' යනුවෙන් පැවසීම වැනිය. සත්‍යය නම් වනචාරීන් කථාකරන බස වනචාරී බසක් බව ඔවුන්ම නොදැනීමය.

ප්‍රථම දශකයේදී කිතුනුවන් ඔවුන් කිතුනුවන් බව නොදත්හ. ඔබ ඔවුන්ගෙන් ආගම කුමක්දැයි ඇසුවේ නම් ඔවුන්, යේසුස්වහන්සේ, මෙසියස්වහන්සේ වශයෙන් අදහන්නන්, යුදෙව්වන්, ඊශ්‍රායෙල් ජාතිකයන්, සහෝදරයන්, සාන්තුවරයන් දෙවියන්වහන්සේගේ දරුවන් වශයෙන් උත්තර දෙනු ඇත. ප්‍රථමයෙන්ම ඔවුන් කිතුනු නාමය පට බඳිනු ලැබුවේ අන්තියෝකියේදීය.

මාටින් ලූතර්ගේ අනුගාමිකයන් ඔහු ලූදරන් වාදියෙකැයි දැන සිටියෝය. එහෙත් මාටින් ලූතර් මේ නමට තදින්ම විරුද්ධ වූයේය.

කොමියුනිස්ට්වරු රහස් සභාව යයි ඊට නම් කල සේම, නිරුත්සාහයෙන්ම කොමියුනිස්ට් දේශයන්හි නිර්මාණයවූ රහස් සංවිධානයකැයි ඊට බටහිර ආගමික තත්ව පරීක්‍ෂකයෝ නම් කළහ. රහස් සභාවේ සාමාජිකයෝ මෙම සංවිධානය ඒ නමින් හඳුන්වන්නේ නැත. කිතුනුවන් ඇදහිලිවන්තයන්, දේව දරුවන් යයි ඔවුන් හඳුන්වා ගනිති. එහෙත් ඔවුන් රහස් සභාවේ කටයුතු ඉදිරියට ගෙන යති. රහසිගත ස්ථානවලදී හමුවෙති. විදේශිකයකු සහභාගිවුවද, ඔහුට රහස් සභාවක් දුටිමි යයි කිව නොහැකි රහසිගත රැස්වීමකදී ශුභාරංචිය පතුරුවති. මේ පුදුම එලවන සුළු රහස් සංවිධානයට සතුරන් විසින් දෙනු ලැබූ ප්‍රමාණවත් නමකි "රහස් සභාව."

ඔබට බටහිර රටවල වර්ෂ ගණනක් සංචාරය කළ හැක. එහෙත් ඔබට සෝවියට් ඔත්තු සේවයකැයි කිව හැකි එකක් හමු නොවෙති. කුතුහලයෙන් පිරිගිය සංචාරකයෙකුට පෙන්වීමට තරම් එය මෝඩ නොවෙයි. මේ ධෛර්යමත් රහස් සභාවේ පැවැත්ම හා වැඩීමේ වැදගත්කම සනාථ කරන රුසියානු පුවත්පත් සේවයේ දක්ෂ නිලධරයන්ගේ ප්‍රකාශයන් සමහරක් මීලඟ පරිච්ඡේදයේ සඳහන් කරමි.

## හයවන අදියර

# ක්‍රිතුදහම කොමියුනිස්ට් වාදය පරදවන්නේ කෙසේද?

සෝවියට් හමුදාව තුලත්, රුමේනියාවේත් රහසිගතව යේසුස් වහන්සේගේ පණිවුඩය පැතිරවීමේදී ලත් අපේ අත් දැකීම් මම ඔබට කීවෙමි. කොමියුනිස්ට්වරුන් විසින් නිදහසක් නොදී පීඩා කරන අය වෙනුවෙන්ද, උන්වහන්සේගේ පණිවුඩය පතුරවාලීමට උදව් කරන මෙන්ද, මම ඔබගෙන් ඉල්ලා සිටියෙමි. මගේ අභියෝගය ක්‍රියා විරහිත වීද? සැබෑවූ සිහිනයක් වීද?'' එය ක්‍රියාත්මක කළ හැක්කේද?

මේ ප්‍රශ්න වලට අපට ඉතාමත් යහපත් ප්‍රවෘත්ති සමග උත්තර දිය හැක.

කොමියුනිස්ට්වරුන් ඔවුන්ගේ අර්ධ ශත වර්ෂයක කොමියුනිස්ට් පාලනය උත්සවාකාරයෙන් සිහිපත් කරති. එහෙත් ඔවුන්ගේ ජයග්‍රහණය නම් පරාජයයි. ක්‍රිතු දහම ජය ගෙන ඇත. කොමියුනිස්ට්වාදය නොවේ. රුසියානු පුවත් සේවය එනම් අපේ සංවිධානය ගැන සූක්ෂමව පරීක්ෂණය කරන්නා රහස් සභාව ගැන තොරතුරු බහුල වශයෙන් දනී. කොමියුනිස්ට්වරුන් හා සටන් කරමින්ම රහස් සභාව ප්‍රසිද්ධි-යේම කටයුතු කිරීමට තරම් ශක්තිමත් වී ඇත. අනෙක් මාර්ග වලින් ද අපට ලැබී ඇති ප්‍රවෘත්ති, කොමියුනිස්ට් ප්‍රවෘත්ති සේවයේ වාර්තා සනාථ කරයි. මතක තබා ගන්න! මේ රහස් සභාව හරියටම පාවෙන අයිස් කන්දක් වැනිය. එහි වැඩි කොටසක් ඇත්තේ මතුපිටින් යටය. නමුත් කුඩා කොටසක් නිරන්තරයෙන්ම පෙනෙන්නට තිබේ. මතුවට කෙටියෙන් සකස් කරගත් වැදගත් වාර්තා දෙමි.

## හිම කන්දේ තියුණු කූඩ

1966 නොවැම්බර් මස 7 ද "කොකේසස්"හි සුහුම් හි දී රහස් සභාවේ රැස්වීමක් එළිමහනේදී ම පැවැත්වීය. මෙයට සහභාගිවනු වස් වෙනත් නගරවල සිට බොහෝ ජනයා පැමිණියහ. දේශනාව අවසානයේ තරුණයන් හතලිස් දෙනෙකු යේසුස් වහන්සේ පිළිගත්හ. අනතුරුව ඔවුන් අසල වූ කළු මුහුදේ දී ගිල්වීමේ බෞතීස්මය ලැබුවේ හරියට ම බයිබලයේ කාලයේදී මෙනි.

කලින් උපදෙස් දීමක් එහිදී නොවීය. අර්ධ ශතවර්ෂයක කොමියුනිස්ට් පාලනයෙන් පසු බයිබල් හෝ වෙනත් ක්‍රිස්තියානි පොත් නොවීය. ධර්මදූත ආශ්‍රම නොවීය. රහස් සභාවේ දේවධර්මවේදීන් පුහුණු නොකළහ. එහෙත් උපස්ථායක පිලිප්තුමාහට එක් පැයක් පමණක්කථා කල නපුංසකයා මෙසේ කීවේය.

"මෙන්න වතුර තිබේ. බෞතීස්ම කිරීමට මට කවර බාධාවක් තිබේද?" පිලිප් "මුළු සිතින් මාව විශ්වාස කරන්නෙහි නම් පුළුවන්" එවිට පිලිප් ද නපුංසකයා ද දෙදෙනම වතුරට බැස්සෝය. පිලිප් ඔහුව බෞතීස්ම කලේය. (ක්‍රියා 8: 36-38)

කළු මුහුදේ ජලය සැහෙන පමණ ඇත. රහස් සභාව යලිත් බයිබල් යුගය අරඹා ඇත.

1966 "ගුරුවරුන්ගේ සභරාව" අගෝස්තු 23 වන ද කලාපයේ, කොමියුනිස්ට්වරුන් විසින් පත් කළ නායකයන්ට හා නීතිවලට අනුකූලවී, ඔවුන්ගේ කැපවීම ලෙටන ගත කිරීම පිලිකෙව් කල රොස්ටොව් ඔන් ඩොන්ගි බැප්ටිස් සභිකයෝ, ඊට විරෝධය පළ කරමින් වීදිවල පෙලපාලි සංවිධානය කළ බව" ප්‍රවෘත්තියකින් සඳහන් විය. එය සිදු වූයේ මැයි 1 ද ය. පැරිසිවරුන්ගේ මත වලට විරුද්ධ වෙමින් සබත් දිනයේදී යේසුස්වහන්සේ හාස්කම කලාක් මෙනි. රහස් සභාව කොමියුනිස්ට් නීති වලට විරුද්ධව ක්‍රියා කිරීමට තෝරා ගන්නේද කොමියුනිස්ට්වරුන්ගේ උත්සව දිනයන්ය.

මැයි දින සියළු දෙනාම සහභාගි විය යුතු මහ රැලියක් වෙයි. ඒ වෙලාවේම රුසියාවේ ඊලඟ දෙවැනි බලවේගය වූ රහස් සභාව විදිවලදී දකිය හැකිය.

එක් දහස් පන්සියක් පමණ කිතුනු ඇදහිලිවන්තයෝ පැමිණියහ. ඔවුන් පොළඹවූයේ කුමක් ද? දෙවියන්වහන්-සේගේ ප්‍රේමයයි. සිරගෙදර සාගතය ඔවුන් දැන සිටියහ. ඔවුන්ට විඳින්නටවූ වධ වේදනා දැන සිටියහ.

කලුන්ඩා ගමෙහි හමාරා සොයුරියගේ සැමියා සිරගෙදරදී මල පුවත ලැබුනේ කෙසේදැයි බාර්තොල්ඩ් කිතුනුවන් පළ කල රහස් ප්‍රකාශය මගින් රුසියාවේ හැම දෙනාම දනී. දූන් ඇය දරුවන් හතර දෙනකු සිටින වැන්දඹුවකි. සැමියාගේ මල සිරුරේ දෙ අත්වල මාංචුවල සලකුණු තිබෙනු ඇය දුටුවාය. දෙ අත්, ඇඟිලි, යටි පතුල භයානක ලෙස පුළුස්සා තිබුනි. යටි බඩෙහි පිහි පහරක ලකුණු විය, දකුණු පාදය ඉදිමී තිබුනි. දෙපාවල පහර දීම්වල සලකුණු විය. මුළු සිරුර පුරාම වූයේ භයානක ලෙස පහර දීමෙන් ඇතිවූ තුවාලවල සලකුණුය.

රොස්ටොව් ඔන් ඩොන් හි පෙලපාලියට සහභාගිවූ හැම දෙනාම මෙය ඔවුනට ද පැමිණිය හැකිව තිබෙන ඔවුන්ගේ ඉරණම බව දත්හ. මාස තුනකට පමණ ප්‍රථමයෙන් දෙවියන් වහන්සේට සිය ජීවිතය භාර දුන් මේ වේද සාක්ෂිකයාගේ මෘත කලේබරය විශාල දැන්වීම රැගත් මහ ජනකායක් ඉදිරියේ මිහි දන් කළේය.

"යේසුස් වහන්සේ වෙනුවෙන් මිය යාම මට ජීවිතය ලබා ගැනීම වැනිය."

"ආත්මය නැසිය නොහැකි ශරීරය පමණක් නැසිය හැකි අය කෙරෙහි බිය නොවන්න."

"දේව වචනය නිසා මැරුම් කෑ අය පූජාසන යටදී මම දුටිමි." යනුවෙන් එම දැන්වීම් වල ලියා තිබුනි.

මේ ජීවිතදයකයාගේ නිදසුන රොස්ටොව් ඔන්ඩොන්හි සියලුදෙනා උනන්දුකරවන සුළුවීය. ඔවුන් කුඩා නිවසක් වටා රැස්වූහ. සෙනග සැමතැනම විය. සමහරු කිට්ටුව ගෙවල්වල වහල මත විය. සමහරු ගස්වල සිටියහ. හරියටම සාකෙව්ස්ගේ දිනය සිහිපත් කරවීය. එදින දේව සේවයට කැපවූවෝ අසූ දෙනෙකි. ඉන් විසිතුන් දෙනෙකු "කොම්සොමෝල්ස්" නමැති කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සාමාජිකයෝ වූහ. බෞතීස්ම මෙහෙය පැවැත්වූ ඩොන් නදිය කරා සෙනඟ ගමන්කලේ නගරය පසුකරමිනි.

කොමියුනිස්ට් පොලිස් භටයන් පුරවාගත් රථ ඩොන් නදී ඉවුරේ සිටි කිතුනුවෝ වට කළහ. නායක සහෝදරයා සිරභාරයට ගැනීමට ඔවුන්ට උවමනාවිය. මුළු පිරිසවූ එන්දහස් පන්සියයම සිර භාරයට ගැනීමට නොහැකිවිය. ඔවුහු හැමදෙනාම දණින් වැටී මෙම රැස්වීම පැවැත්වීමට ඉඩදෙන ලෙස ඉල්ලා දෙවියන්ට කන්නලව් කළේය. නායක සහෝදරතුමා සිරභාරයට ගැනීම වැලැක්වීම සඳහා සියළු සහෝදරියෝ ඔහු වටා උරෙනුර ගැටී සිටියෝය. තත්වය වඩාමත්ම භයානක විය.

යුචිටෙල්ස්කායා ගැසට් පත්‍රය රොස්ටොව් හි නීති විරෝධී බැප්ටිස් සංවිධානයක් සතුව රහස් මුද්‍රණාලයයක් ඇතැයි වාර්තා කරයි. (රුසියාවේ බැප්ටිස්නමින් ශුභාරංචි වැඩ හා පෙන්තකොස්ත සභාව යන දෙකම හඳුන්වයි.) විශ්වාශය මත රඳා සිටි තරුණයෝ විසින් මෙම ප්‍රකාශන මුද්‍රනය කළහ. මම ද ඉතා හොඳයැයි අනුමතකළ එක් රහස් සභාවේ පත්‍රිකාවක දෙමව්පියන්ට මෙසේ උගන්වා තිබුනී. එනම් "අනිත්‍ය දේ නිසා ශෝක නෝවීමට දරුවන්ට උගැන්වීම සඳහා ඔවුන් අවමංගල උත්සව සහභාගි කරවීමය. එහි, කොමියුනිස්ට් පාසැල්වල දෙන අදේවදෘෂ්ටි විෂම අධ්‍යාපනයේ විෂහරණය කිරීම සඳහා ක්‍රිස්තියානි අධ්‍යාපනයක් දෙන ලෙසද ඉල්වා තිබුනේය. ළමයින් මෝලුන් බවට පත්කරවන දේ (ආගම) ගැන බිය සැක ඇතිලෙස මිශ්‍ර වන්නේ ඇයිදැයි යුචිටෙල්ස්කායා ගැසට් පත්‍රයේ ලිපියක් අවසාන කරමින් ප්‍රශ්න කලේය.

රහසිගතව බෞතීස්මය පවත්වා අසු වූ රහස් සභාවට විරුද්ධව පාඩු විභාගයේ විස්තරයක් ගුරුවරුන්ගේ සහරාවෙහි පල කොට තිබුනි. කොමියුනිස්ට් අධිකරණයට අපහාසකළ තරුණ කිතුනුවන් සාක්ෂිවශයෙන් කැඳවා තිබුනි. ඔවුන් ඉතා කොපවී, ජ්වලිතය නිසා පිස්සන් මෙන් හැසිරුණහ. අදේවදෘෂ්ටීන් ප්‍රසිද්ධියේ බොරුකාරණයක් බව ඔප්පුකළ අය ගැන තරුණ ලඳක ඉතා උනන්දුවකින් බලා සිටියාය.

රුසියානු පක්ෂ මූලස්ථානය අබියස නිර්භීතව, වඩා නිදහසක් ඉල්වා සිටීමේ වරදට රහස් සභාවේ සාමාජිකයන්ට පහරදෙනු ලැබූහ. සිරගෙවල දමන ලදහ. 1963 පලවූ අද "සෝවියට් ජීවිතය" 6 වන කලාපයේ, රුසියාවේ මුල්තැන ගෙන ඇති එහි නිදහස ප්‍රසංගා මුඛයෙන් අගය කරමින් කොමියුනිස්ට් පාලනය තුල ඇති බැප්ටිස් සභාවේ, පාලක ද්‍රෝහියෙකද, කිතුනු සමූලඝාතකයෙක් වූ තාරෙව්ගේ දයාවන්ත කම පලකරන ලිපියක් අපට ලැබුනි, රහසිගතව බටහිරට මේ ලිපිය ගෙනයන ලදි.

මේ කාලයේදීම මොස්කව්හිදී පැවැත්වූ ප්‍රසිද්ධ වීර පෙළපාලියක ප්‍රකාශනයක් යට දැක්වේ.

ප්‍රේමණීය සහෝදර, සහොදරියනි! ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ද පිය වූ දෙවියන්වහන්සේගේ ද සමාදනය ඔබට වේවා!.

1969 මැයි මස 16 ද මධ්‍යම බලවේගයට ඉදිරිපත්ව උදව්දීම සඳහා පන්සියයක පමණ බැප්ටිස් සභිකයන් කණ්ඩායමක් එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවේ කොමියුනිස්ට් පක්ෂයේ ආරාධනය පරිදි මොස්කව් හී මධ්‍යම සංගමයේ කාර්යාලය බලා ගමන් කල බව ඔබට ඉතා ඕනෑකමකින් දන්වමි.

ප්‍රධාන ලේකම් බ්‍රෙෂ්නෙව් වෙත අපි පෙත්සමක් පිළිගැන්වීමු. මේ ප්‍රකාශනය ගැන තවදුරටත් කරුණු දැක්වීමට දවස මුළුල්ලේම එම ගොඩනැගිල්ල ඉදිරි පිට අපි

සිටියෙමු. එය මොස්කව්හි දී ආ ප්‍රථම කොමියුනිස්ට් විරෝධී පෙළපාලිය විය. එය සංවිධානය කළේ රහස් සභාවේ නියෝජිතයන් විසිනි. දවස අවසානයේ එක් සහෝදරයෙක්වූ ස්ට්‍රොගනොව්ට චෝදනාකර නැවත දෙවන පෙත්සම ද බ්‍රෙෂ්නෙව් වෙත ඉදිරිපත් කල නමුත් එය ද ප්‍රතික්ෂේප කරන ලදී. ඔවුන්ට සලකන ලද්දේ ඒ පරිද්දෙනි.

නියෝජිතයෝ 500 දෙනා රාත්‍රිය මුළුල්ලේම මාවතේ රැඳී සිටියහ. මොටර් රථ වලින් ඔවුන්ට මඩ හා කුණු විසිකරනු ලැබූහ. ඔවුන්ට අපහාස කලේ එසේය. වර්ෂාව වැස්සද, මෙ අයුරින් සංග්‍රහ කරණලද පසුදින එළිවන තුරුම මේ කොමියුනිස්ට් පක්ෂයේ කාර්යාලය අබියස රැඳී සිටියහ.

පක්ෂ ගොඩනැගිල්ල තුලට ගිය හැම දෙනාටම නිලධාරීන් පහර දෙන බවද, ඊට විරුද්ධව සාක්ෂි හෝ නොමැති බවද දැන දැනම එහි තුලට යාමට යෝජනා කළහ. එහෙත් එය ඒකච්ඡන්දයෙන් ප්‍රතික්ෂ්ප කොට බ්‍රෙෂ්නෙව් හමුවීමට සිටියහ. අනතුරුව නොවැලැක්විය හැකි දෙයක් සිදුවිය.

පස්වරු 1. 45 ට පමණ බස් රථ 28 ක් පැමිණියේය. කෘෘර පලිගැනීම ඇරඹුනි. අපි එකිනෙකාගේ අත් අල්වාගෙන වලල්ලක් මෙන් සෑදී සිට "කුරුසිය දරාගන්නා දිනයන් අපේ දිවියේ ප්‍රීතිමත් දින වේ" යන ගීය ගැයූවෙමි. රහස් පොලිසියේ භටයෝ අපට පහර දුන්හ. තරුනයන්ට මෙන්ම මහල්-ලන්ටද පහර දුන්හ. පේලියෙන් මිනිසුන් ඉවතට ඇද පහර දුන්හ. තාර මතට තල්ලු කළහ. සමහරුන්ගේ හිසකෙස් වලින් බසය වෙත ඇද්දහ. පැනයාමට තැත්කලවිට සිහි නැතිවනතුරු පහර දුන්හ. තුවාල කරුවන්ගෙන් බස් පුරවා ගෙන ඔවුන් නොදන සිටි තැනකට ගෙන ගියහ. රහස් පොලිසියේ බස් රථ තුලින් අපේ සොයුරු සොයුරියන්ගේ හී හඬ නික්ම ආයේය. මේ සියල්ල සිදුවූයේ විශාල ජනකායක් මැදය.

මීලඟට වඩාමත් ශොභන සිද්ධීන් පැමිණුනේය. පත්සියදෙනා සිරකළ පසු ඇත්ත වශයෙන්ම ඔවුන්ට වධ දුන්හ. යොහන් බෞතීස්ත සිරකල පසුද යේසුස්වහන්සේ

''පසුතැවිලිවෙයල්ලා දෙවියන්වහන්සේගේ රාජ්‍යය අත ළඟය'' ''මතෙව් 4. 17'' යි දේශනාකළාක් මෙන්ම, යළිත් කොමියුනිස්ට් මධ්‍යම කාරක සභාව කරා යාමට තරම් ධෛර්යයක් සහෝදර වින්ස් සහ හොරව් වෙත තිබුනේය. ඔවුන් කිතුනු රැලේ නියම ගොපල්ලනේය.

සිරකල නියෝජිතයන් නිදහස් කරන ලෙස සහෝදර වින්ස් හා හොර්ව් අණ කර සිටියේය. මේ ධෛර්යමත් සහෝදරයන් දෙදෙන ක්‍රමයෙන් නොපෙනී ගියේය. පසුව ඔවුන් ලිෂොටොව්ස්කියා සිර කඳවුරේ දමූ බවට ආරංචියක් ලැබුනි.

මේ රහස් සභාවේ දයකයෝ මින් තැතිගත්තෝද? නැත. යළිත් ඔවුන්ගේ නිදහස අනතුරට පත්කරගත්හ. ප්‍රථමයෙන් කිවු ප්‍රකාශය යළිත් පලකලේ ''මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අදහන්නට පමණක් නොව උන්වහන්සේ වෙනුවට දුක් විඳින්ටත් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් තුඹලාට දෙන ලද්දේය. (පිලිප්පි. 1: 29)'' යි කියමිනි. මේ බයිබල් පද ගෙන හැර පාමින් ඔවුන් සහෝදරයන් උනන්දු කලේය. ''මක්නිසාද, අප මේ පීඩාවලට නියම කරනු ලැබ සිටි බව තුඹලාම දන්නාහුය'' (1 තෙස්සලෝනි 8: 3) ''අපේ ඇදහිල්ලේ කර්තෘද සම්පූර්ණ කරන්නාදවූ යේසුස් වහන්සේ දෙස බලමින් අප ඉදිරියෙන් තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. උන්වහන්සේ තමන්වහන්සේ ඉදිරියෙහි තිබුණු ප්‍රීතිය නියා ලජ්ජාව සුළු කොට කුරුසියෙහි වධ විඳ දෙවියන් වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තේ වැඩ හිඳගත් සේක.'' (හෙබ්‍රෙව් 12. 2)

රහස් සභාව මොස්කව් හා රොස්ටොව් ඇතුළු මුළු රුසියාව පුරාම ඇති අදේව දාෂ්ටිකයන් විසින් කරන, තරුණ සිත් විෂම කිරීමට ප්‍රසිද්ධියේම විරුද්ධ වෙති. රජයේ දේවස්ථානවල ඉගැන්වීම් වලට විරුද්ධව ඔවුන්ගේ රහස් ප්‍රකාශනයේ මෙසේ තිබුන බව 1966 ඔක්තෝම්බර් 4 ද ප්‍රව්ඩා උක්රේනි පුවත් පතේ පලවිය. ''අපගේ දිනවලදී සාතන් ආඥාදයකයා වෙයි. දෙවියන් වහන්සේ පිලිකෙව් කරන නීති දේව සභාව විසින් පිළිගනියි.'' යනුවෙනි.

අමෙරිකාවෙන් ලබාගත් ශුභාරංචි පණුවුඩ ඇසීමට කණ්ඩායමක් සංවිධානය කල සහෝදර ඇලෙක්සී නෙවීරොව්, බොරිස් ගැර්ම්ෂොව් සහ ඇක්ෂෙන් ෂුබොව් යන අයට විරුද්ධව පැවරූ නඩු විභාගය 'ප්‍රව්ඩා වොස්ටොකා' පුවත් පතේ පලවිය. පසුව බෙදා හරනු ලැබූ මේ ශුභාරංචි පණිවුඩ ඔවුන් පටිගත කරන ලදී.

'විනෝදගමන' 'කලාකවය' යන ව්‍යාජ නම් වලින් රහස් ශුභාරංචි රැස්වීම් සංවිධානය කිරීම ගැන ඔවුන්ට චෝදනා කර තිබුනි. මේ හරියටම ප්‍රථම සභාව රෝමයේදී වැඩ කලාක් මෙන් රහස් සභාව වැඩ කරති. රහස් සභාව කුඩා පොත් මුද්‍රණය කරති''යි 1966 සැප්තැම්බර් 15 ද සෝවියට් ස්කායා මොල්ඩාවියා පුවත් පතේ චෝදනාවක් එල්ල කර තිබුනි. නීතියෙන් තහනම් කර තිබුනද ඔවුන් ප්‍රසිද්ධ ස්ථානවල රැස්වෙති. යේසුස්වහන්සේගේ නාමයට සාක්ෂි දරමින් තැතින් තැන යති. එම පුවත් පතම, 'රෙනි' සිට විෂිනාවූ දක්වා යමින් තිබුනු දුම්රියක තරුණයන් තිදෙනෙක්ද, තරුණියන් තිදෙනෙක්ද''අපේ තරුණයන්, කිතු තුමන්ට කැප කරමු'' නමැති ගීය ගැයූ බව වාර්තා කලේය. මෙම වාර්තාකරුම ප්‍රසිද්ධියේම විරුද්ධ වූයේ, වීදිවලදීද, දුම්රිය නැවතුම් පොලවලදීද, දුම්රිය මැදිරිවල මෙන්ම බස්රථ තුලදීත් රජයේ ආයතන තුලදීත් මේ දූතයෝ දේශනා කරන හෙයිනි. යලිත් අද රුසියාවේ ක්‍රියා කරන රහස් සභාව මෙයයි.

ප්‍රසිද්ධ ස්ථානවල කිතුනු ගී ගැයීමේ වරදට පැවරූ නඩුව, විභාග කොට දඬුවම ප්‍රකාශ කල කල්හි ඔවුන් ''දෙවියන්ගේ හස්තයට අපි යටත්වන්නෙමු, ස්වාමීනි අපි ඔබ වහන්සෙට ස්තුති කරන්නෙමු. මේ පීඩාවන් ඇදහිල්ල නිසා විඳීමට ඔබ වහන්සේ ඉඩ හැර ඇත්තේය.'' එවිට සභාව උන්මාදයෙන් මෙන් උද්‍යෝගීව තරුණයන් සිරගෙට යැවීමට හේතුවූ එම ගීය ම ගැයූහ මැයි පළමුවැනිද කොප්ෂිග් සහ සැහාරොව්කා ගම්වල ගැමියනට දේවස්ථානයකට යාමට නැතිවූ හෙයින් ඔවුන් වනයේ රහසින් දේව මෙහෙයන් සංවිධානය කළහ. සමහරෙක් ''උපන් දින උළෙලක්'' පවත්වන මුවාවෙන් ආගමික රැස්වීමක් සංවිධානය කලහ.

පවුලේ සාමාජිකයන් හතර පස් දෙනෙක් සිටින පවුලක උපන් දින උත්සව වසරකට තිස් පහක් පමණ පවත්වන්නේ මෙවැනි රැස්වීම් සඳහාය.

සිරගෙයට හෝ වධබන්ධන වලට හෝ රහස් සභාවේ කිතුනුවන් බිය ගැන්විය නොහැක. හරියටම මුල් සභාව ඔවුන්ට ලැබුනු පීඩාවන් නිසා කැපවීමේ උච්චස්ථානයකට පත්වූවාක් මෙනි. තුන්වරක්ම සිරබත් කෑ එක් රහස් සභාවේ නායකයෙකු වූ සහෝදර ප්‍රොකොෂිව් සිරගෙයින් නිදහස් වූ වාහාම රහසිගත ඉරිද දහම් පාසැල් ඇරඹූ බව 1966 ඔක්තෝබර් 4 ද ප්‍රව්ඩා උක්රේනි පුවත් පතේ පලවීය. දැන් යළිත් ඔහු සිරගෙට යවා ඇත.

මානුෂික නීති කොමියුනිස්ට් නීති විමර්ෂනයට භාජන කරමින් රහස් ප්‍රකාශනයක ඔහු මෙසේ ලිවිය. රජයේ දෙවස්ථාන දෙවියන් වහන්සේගේ ආශිර්වාද වලක්වා දමා ඇත. දඩුවම් විඳින රුසියානු සහෝදරයන් ගැන අසන කල්හි එවැන්නක් බටහිර වේදෝ'' කියා ඔබට සිතා ගත නොහැක. ඔගොනියොක්, බැලිම, කාලය වැනි සඟරාවල පිටකවර යොදමින් ශුභාරංචි ප්‍රකාශන බෙදා දෙනු බව 1966 විද්‍යාව සහ ආගම සඟරාවේ නවවැනි කලාපය වාර්ථාකරයි. ලියෝටොලස්ටෝයිගේ ''ඇනා කැරනීනා නවකථාවේ පිටකවරය දමා බයිබල් පිටපත් දෙනු ඔබට දැකිය හැක. 1966 ජූනි 30 ද කසකස්ටැන්යා ප්‍රව්ඩා පුවත් හා ''කොමිනි-යුස්ට් ජාත්‍යන්තරය'' නැමැති ගීයේ තනුව යොද ගී ගයන බව වාර්තා කරයි. එහෙත් මේ ගීයෙන් කියැවෙන්නේ දෙවියන් වහන්සේට ස්තුතිකිරීමය.

සයිබීරියාවේ කලුන්ද හි පලකල රහස් ලිපියකින් උත්තම පූජකයන් ලියන්නන් හා පැරිසිවරුන් යේසුස් වහන්සේ පිලාත්ට පාවාදුන් ආකාරයෙන් එක් බැප්ටිස් නායකයෙක් සභාවත් ලොකයේ සත්‍ය දේව සේවකයන්ද විනාශකර දමා ඇති බව කීවේය. එහෙත් විශ්වාශවන්ත වූ රහස් සභාව ක්‍රියාකරයි.

ක්‍රිස්තුස් වහන්සේගේ මනාලිය නොකඩවාම උන්වහන්සේම සේවය කරයි. මා සිරකර සිටින විටද රහස් සභාව කොමියුනිස්ට්වරුවරුන් උන්වහන්සේ වෙතට දිනාගනිමින් සිටියේය. ඔවුන් මම නිවැරදි බව පිළිගත්හ. ඔවුන් සිටින්නේ දිනාගත හැකි අවස්ථාවකය. කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සාමාජිකාවක් වූ ටැන්යා කුගුනෝවා ගේ ලිපියක් ''බාකු' හි කම්කරුවා'' පත්‍රයේ 1966 අප්‍රේල් 27 ද පලකර තිබුනි. මේ ලිපිය අල්ලා ගන්නා ලද්දේ කොමිනිස්ට් නිලධාරීන් විසිනි.

එය මෙසේය.

''ආදරණීය නඩියා නැන්දේ!

අපේ ප්‍රේමණීය ස්වාමීන් වහන්සේගේ ආසිරි මම ඔබට එවන්නෙමි. එතුමා මට කොපමණ ප්‍රේම කරන්නේද? එතුමා ඉදිරියේ අප කිසිත් නැත. මම විශ්වාස කරනවා නැන්ද මේ වචන තේරුම් ගනිවි කියා. ''ඔබේ සතුරනට ප්‍රේම කරන්න. ඔබට සාප කරන්නන්ට ආසිරි පතන්න. ඔබට වෛර කරන්නන්ට යහපත කරන්න. ඔබ හෙලාදකින්නන් ගැන යාච්ඤා කරන්න''

මේ ලිපිය අල්ලා ගන්නා විට ටැන්යාත් තවත් බොහෝ තරුණ කොමියුනිස්ට්වරුත් ජේසුස් වහන්සේ වෙතට ගෙන ආ සහෝදර පීටර් සෙරිබ්‍රින්නිකොව් හට සිපිරිගෙයට යාමට සිදු විය. ඔහුගේ දේශනයක් කොමියුනිස්ට් පුවත්පත් මෙසේ පල කළේය. ''ප්‍රථම කිතුනුවන් සේම අප ක්‍රිස්තුස් වහන්සේ ඇදහිය යුතුය. අපේ ප්‍රධාන නීතිය බයිබලයයි. වෙන කිසිවක් අප නොහඳුනමු. අපි මිනිසුන් විශේෂයෙන්ම තරුණයන් පාපයෙන් මුදවා ගැනීමට උනන්දු විය යුතුය. තරුණයන්ට යේසුස් වහන්සේ ගැන කීම කොමියුනිස්ට් නීති යෙන් තහනම් කර ඇති බව ඔහුට කී විට ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. ''අපට ඇති එකම නීතිය බයිබලයයි.'' කෘෘර අදේවදෘෂ්ටි ආඥාදායකත්වය ඇති රටකට සරිලන ඉතාමත්ම සාමාන්‍ය පිළිතුර එයයි.

අනතුරුව කොමියුනිස්ට් පුවත්පත වනවර ඡායාරූපයක් විස්තර කළේය. තරුණ ගැහැණු පිරිමි ළමයි ආගමික ගී ගයති. ඔවුහු ප්‍රදර්ශනයට මෙන් ඇති බෞතීස්මය ලබති. එහෙත් නපුර තබා ගනිති. සතුරනට දක්වන්නේ වංචනික ප්‍රේමයකි.

බාකු'හි කම්කරුවා පත්‍රය කොමියුනිස්ට් තරුණ සංගම් වල සාමාජිකත්වය උසුලන පිරිමි හා ගැහැණු ළමයි කිතු තුමන්ගේ සත්‍යතාවයෙහි පවතින බැව් කියයි. එම ලිපිය අවසන් කරන්නේ මෙබඳු වදන් වලිනි. "කොමියුනිස්ට් පාසැල් තෙතරම බෙලහීන විය යුත්තේද? ආලෝකය වලකා ලීමෙන් සිදුවන කරදරය කෙසේද? නොසැලකිලිමත් ගුරු-වරුන් කෙරෙන් ගෝලයන් උදුරා ගැනීමට පූජකයන්ට හැකිය. "ඉතාම හොඳ ශිෂ්‍යයා කිතුනු ළමයෙකු බව දක්වා 1966 ජුනි 30 ද කසකස්ටැන්යා ප්‍රව්ඩා පුවත්පත් භීතිය පල කර සිටියේය. රහස් සභාවේ පත්‍රිකාවකින් "අපේ දරුවන් තොටිල්ලේ සිටින අවධියේ සිටම දෙවියන් වහන්සේ වෙතට කැප කිරීමට අපේ උත්සාහයන් හා යාච්ඤාවන් එක් කරමු. ලෝකයේ යටි උගුල්වලින් අපි දරුවන් ආරක්ෂා කරමු." මව් වරුන් අමතා තිබුන බව 1966 ජනවාරි 17 ද කිර්ගිසියා ප්‍රව්ඩා පත්‍රයේ පල විය.

මේ උත්සාහයන් සාර්ථකව ඇත. කොමියුනිස්ට් පුවත් පත් ඊට සාක්ෂි දරයි. තරුණයන් අතර කිතු දහම ඉදිරියට ඇදෙයි. කොමියුනිස්ට් තරුණ සංගමයක සාමාජිකාවක් වූ නීනා කිතුනුවෙකු වූ අයුරු රුසියාවේ සිලියාබින්ස්ක් හි පුවත් පතක් පැහැදිලි කරයි. එය වූයේ රහස් කිතුනු ආගමික රැස්වීමකට සහභාගිවීමෙනි. එවැනි ආගමික රැස්වීමක් 1966 සෝවියට්කායා ජස්ටිටීයා කලාපයේ නව වන වෙළුමේ විස්තර කරයි.

"එය පැවැත්වූයේ මැදියම් රැයකය. මිනිසුන් ඔවුන්ගේ සෙවනැලි පවා සඟවමින් විවිධ ප්‍රදේශ වලින් ළඟා වූහ. අඳුරු මිටි කාමරයක සියලුම සහෝදරයන් රැස්වූහ. තදබදය නිසා දණින් සිටගැනීමටද නොහැකි විය. මඳ එළියක් විහිදුවමින්

සිටි ගැස් පහන ද සුළං නොමැතිවීමෙන් නිවී ගියේය. එහි වූ හැම දෙනාගේ මුහුණු දහදියෙන් තෙත් වන්නට විය. මාවතේ සිට එක් සොහොයුරෙක් පොලිසිය එන්නේ දැයි බලා සිටියි. එහෙත් නීතා පැවසුවේ එවැනි රැස්වීමක සැලකිල්ලෙන් හා උනුසුම් චුම්බනයකින් ඇය පිලිගත් බවය. මට දූන් ඇති මහත්, ආලෝකමත් ඇදහිල්ලක් - දෙවියන් මත තැබූ ඇදහිල් ලක් - ඔවුන්ට ද තිබුනු බව කීවාය. එතුමාගේ රැකවරණයට අප කැඳවයි.මා හොඳින් හඳුනන කොස්මොසල්වරු මට ආසිරි පැතීමෙන් තොරව මා පසුකර ගිය දෙන්! ඔවුන් මව ගරහමින් කථා කල දෙන්! මට කම්මුල් පහරක් දුන්නාවේ. බැප්ටිස් සහිකයිනි! ඔවුන් එසේ කලාවේ! මට ඔවුන් අනවශ්‍යයය. ඇය වැනි තරුණ කොමියුනිස්ට්වරුන් අවසානය දක්වා යේසුස් වහන්සේට සේවය කිරීමට තීරණය කර ඇත.

''අපි ඔවුන්ට දුන් දඬුවම නොකීවෙමු. එහෙත් ඔවුන්ගේ අපරාධය හෙලි කලෙමු. එනම් ඔවුන් ලමයින්ට යේසුස් වහන්සේ ගැන උගන්වා ඇත''යි සහෝදර ක්ලැසීන්, බොන්-ඩාර් සහ තෙලිජින් හට විරුද්ධව පැවති නඩු විභාගයක් විස්තර කරමින් කසකස්ටැන්යා ප්‍රව්ඩා පත්‍රය 1967 අගෝස්තු මස 18 ද කියා සිටියේය.

''කිතුනුවන් තමන්ට විරුද්ධවම පාලකයන්ගේ තරහ අවුස්සවති. තවත් අය සිරකර සිටියද මේ මුරණ්ඩු කිතුනුවෝ නිදහස්ව සතුටන් පසු නොවී නිතරම අහිංසක කොමියුනිස්ට් නිලධාරීන්ගේ තරහ අවුස්සා දැමීම නිසා ඔවුන් නොකඩවාම කිතුනුවෝ සිරගෙවල් වලට යවති. ඔවුන්ගේ අපරාධය වූයේ නීති විරෝධී මුද්‍රණාලයයක්, හෙක්ටෝග්‍රාප් 15 ක් ක්‍රිස්තියානි පොත් බැඳීමට ගන්නා යන්ත්‍ර 6 ක් ළඟ තබා ගැනීම'' යයි සෝවියට්ස්කායා කිර්ගිසියා පත්‍රය 1967 ජූනි 15 ද පැමිණිලි කලේය.

දහස් ගණන් කාන්තාවන් හා ගැහැණු ළමයි බයිබල් පද, යාච්ඤාවන් මුද්‍රණය කල පටි, පිත්ත පටි බැඳ සිටිනු සොයා ගත් බව 1968 පෙබරවාරි 21 ද ප්‍රව්ඩා පත්‍රය පළ කලේය.

බටහිරටද සුදුසු යැයි මට සහතික කල හැකි මේ නව මෝස්තරය පුරුදු කරනු ලැබුවේ වෙන කිසිවෙකු නොව කොමියු-නිස්ට් පොලිස් සේවයේ සිටින කිතුනුවෙකු වූ ලියුබට්ස් හි සහෝදර ස්ටැසියුක්ය. පසුව ඔහු සිර කල බව පුවත්පත පල කළේය.

කොමියුනිස්ට් අධිකරණයන් හමුවට ගෙන එන කිතුනුවන් පිලිතුරු දෙන්නේ ස්වර්ගීය උනන්දු කරවීමකින් බඳුය. විනිශ්චයකාරතුමා, "තහනම් කල රහසකින් මිනිසුන් අල්ලා ගන්නේ ඇයිද?"යි ප්‍රශ්න කල විට, "අපේ ඉලක්කය සකල ලෝකය ම ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනා ගැනීම යයි කිතුනු සොයුරියක් පිළිතුරු දුන්නාය.

තවත් නඩු විභාගයකදී "උඹේ ආගම විද්‍යා විරෝධී එකකි"යි විනිශ්චයකාරතුමා සරදම් කරමින් පැවසීය. චෝදිත ගැහැණු ළමයා ඔහුට පිළිතුරු දෙමින් "අයින්ස්ටීන් හෝ නිව්ටන් හට වඩා විද්‍යාව ගැන ඔබ දන්නේ ද? ඔවුන් (ආගම) විශ්වාස කරන්නන්ය. අයින්ස්ටීන්ගේ නාමය අපේ විශ්වය දරා සිටියි. විශ්වයේ නම අයින්ස්ටීනියානු විශ්වය බව විදුහලේදී මම උගතිමි. අයින්ස්ටීන් මෙසේ කියයි. දිවැස් වරයන්ගේ යුදෙව් ආගම අපි පිරිසිදු කරන්නේ නම්, විශෙෂයෙන්ම පසුව පූජක කපටිකමට යටවූ කිතු දහම යේසුස් වහන්සේ දේශනා කල ආකාරයට පිරිසිදු කරන්නේ නම් සකල සමාජයීය නපුරු කම්වලින් මුළු ලෝකයම මුදා ගත හැකි ආගමක් අප සතු වෙයි. මේ ආගම ජයග්‍රහණයට පත් කිරීම හැම දෙනෙකුගේම මහඟුතම, සුපරිශුද්ධ කාර්යයයි. අපේ මහා සත්ව විද්‍යාඥයෙකු වූ පැව්ලොව් මතකයට නගන්න. ඔහු කිතුනුවෙකු වූ බව අපේ පොත් නොකියන්නේ ද? කාල් මාක්ස් තමන්ගේ "දස් කැපිටල් ග්‍රන්ථයේ පෙරවදනේ මෙසේ කීවේය. කිතු දහම! විශෙෂයෙන්ම ප්‍රොතෙස්තන්තුවාදයට අනුව ඇති කිතු දහම පාපයෙන් විනාශවී ගිය චරිත හැඩ ගැස්වීමෙහි ලා ඇති අනගිතම ආගම වෙයි." පාපයෙන් විනාශ වුනු චරිතයක් මා සතු විය. එය යළි ක්‍රමානුකූලව ගැඩගැස්වීමට නම් කිතුනුවෙකු විය යුතු බව මට කාල්මාක්ස් උගැන්වීය. මාක්ස්වාදීනි! ඔබලා මෙය ගැන මා විනිශ්චය කරන්නේ කෙසේද?

විනිශ්චය කාරයා නිහඬවූයේ ඇයිදැයි දැන ඔබට වටහා ගත හැකිය.

මෙබඳුම චෝදනාවක් වූ විද්‍යාවිරෝධී ආගමක් ඇදහීමේ වරදට අධිකරණය හමුවට පැමිණි කිතුනුවකු මෙසේ කීවේය. විනිශ්චයකාර තුමනි ඔබ ක්ලෝරපෝම් හා වෙනත් ඖෂධ සොයාගත් සිමසන් පමණ විද්‍යාඥයෙක් නොවන බව මට සහතිකයි. ඔහුගේ උසස්ම සොයාගැනීම කුමක් විය හැකිදැයි ප්‍රශ්න කළවිට ඔහු මෙසේ කීය. "එය ක්ලෝරෆෝම් නොව මම පව්කාරයෙක් බවත් දෙවියන් වහන්සේගේ දයාවෙන් ඉන් ගැලවිය හැකි බවත් සොයාගැනීම" යි මා පැවසීය.

ජීවිතය - සියදිවි පුදන ජීවිතය - රුධිරය - විශ්වාශය වෙනුවෙන් වගුරවන රුධිරය රහස් සභාව වෙතින් කිතු දහමට ඉදිරිපත් කර ඇති උසස්ම තර්කයයි. අප්‍රිකාවේ කීර්තිමත් ධර්මදූතයෙක් වූ ඇල්බට් ෂෙට්සර් මෙසේ පැවසුවේය. වේදනාවේ සලකුණ ඇතියවුන්ගේ ශුද්ධවූ සහභාගිකම ශෝකයේ මිනිසා වූ යේසුස් වහන්සේ සමග සහභාගිකම පවත්වයි. රහස් සභාව එහි ගැලවුම්කරුවානන් සමග බැඳුනු ප්‍රේමයෙන් එක්සත් වී සිටියි. එම ප්‍රේමයෙන්ම එහි සාමාජිකයන් එකිනෙකා බැඳී සිටිය. ලෝකයේ කිසිවෙකුට ඔවුන් පරාජය කල නොහැක.

රහසින් ලබාගත් ලිපියක රහස් සභාව මෙසේ කියාතිබුනි. "වඩාහොඳ කිතුනුවන් වීමට අපි යාච්ඤා නොකරමු. එහෙත් දෙවියන් වහන්සේ බලාපොරොත්තුවන අන්දමේ කිතුනුවන් වීමටය. ක්‍රිස්තුස් වහන්සේ වැනි කිතුනුවන්ය, දෙවියන් වහන්සේගේ මහිමය සඳහා කැමැත්තෙන්ම කුරුසිය උසුලන කිතුනුවන් වීමටය.

යේසුස් වහන්සේ දෙසූ අයුරු සර්පයන් මෙන් ඥාණවන්තව; අධිකරණයන්හිදී ඔවුන්ගේ නායකයා කවුරුදැයි ප්‍රශ්න කලවිට ඊට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරති. 1966 ජනවාරි 15 ප්‍රව්ඩා වොස්ටොකා (පෙරදිග සත්‍යය) පත්‍රයේ, විත්ති-කාරියක් වූ මාරියා සෙව්සියුක්ගෙන් ඇය යේසුස්වහන්සේ

වෙත ගෙන ආවේ කවුදැයි ප්‍රශ්නකළවිට "දෙවියන් වහන්සේ උන්වහන්සේගේ රූලට තමා එක් කළ බව කී අතර ඔබේ නායකයා කවුදැයි තවත් අයෙකුගෙන් ප්‍රශ්න කලවිට "අපට මනුෂ්‍ය නායකයෙක් නැහැ"යි පිළිතුරු දුන් බව, පලවිය.

පයනියර් කෙනෙක්වීම පිළිකෙව් කිරීමටත්, රතු ටයි පටිය ඉවත් කිරීමටත් ඉගැන්නුවේ කවුද? යි කිතුනු ළමුන්-ගෙන් විමසීය. ඒක කලේ අපේම නිදහස් කැමැත්තෙන්. කවුරුවත් ඉගැන්නුවේ නැහැ. සමහර තැනක පාවෙන හිම කඳුවල තුඩු පෙනෙන්නට තිබුනද තවත් සමහර තැනෙක ඔවුන්ගේ නායකයා සිපිරිගෙට යාමෙන් වැළකීමට තමන්ම බෞතිස්ම කර ගැනිම අභ්‍යාස කරති. සමහර විට ගංගාවලදී බෞතිස්ම කරන විට බෞතිස්මය කරන්නාත් එය ලබන්නාත් දෙදෙනාම වෙස් මුහුණු පළඳිති. කිසිවෙකුට එවිට ඔවුන්ගේ ඡායාරූප ගත නොහැක.

1964 ජනවාරි 30 ද උචිටෙල්ස්කායා ගැසටා පත්‍රයේ, වොල්නිසිතෝ-කොර්ස්කි දිස්ත්‍රික්කයේ වොරොනින් ගමෙහිදී පැවැත්වූ අදෙවදෘෂ්ටි රැස්වීමක් ගැන වාර්තා කරයි. දේශනය අවසානයේදී අසා සිටියවුන් ප්‍රශ්න නගමින් අදේව දෘෂ්ටියට පහර දෙන්නට පටන් ගත්හ. "ඔබ පතුරුවන සුචරිතවාදී හැසිරීමේ ක්‍රම කොමියුනිස්ට්වරුන් ලබාගන්නේ කොහෙන්ද? සොරකම් නොකරන්න! මිනී නොමරන්න! වැනි ආඥාවලට අවනත නොවන්නේ ඇයි? ඔවුන් ප්‍රශ්න කළහ. ඒ හැසිරීමේ ධර්ම පැමිණියේ බයිබලයෙන් බව ඔවුන් කොමියුනිස්ට් වරුන්ට එදිරිව පෙන්වා දී සිටියහ. දේශකයා සම්පූර්ණයෙන්ම කැළඹී කියේය. ප්‍රශ්න කල අයට ජය ලබාදෙමින් දේශනය අවසන් විය.

## රහස් සභාවට පීඩා වැඩිවෙයි.

අද පෙර නොවූ විරූ අත්මින් රහස් සභාවේ කිතුනුවන් වධ බන්ධන විඳිති. රුසියාවේ හැම ආගමක්ම පීඩාවන්ට ලක්වෙති. කොමියුනිස්ට් රටවල යුදෙව්වන්ට දයානුකම්පා-වෙන් තොරව වධ හිංසා පැමිණවීම කිතුනුවන්ගේ හදවත්

පෙලන්නක් විය හැකිය. එහෙත් වධහිංසාවල ප්‍රධාන ඉලක්කයව ඇත්තේ රහස් සභාව යි. සෝවියට් ප්‍රවෘත්ති සේවය, රාශි වශයෙන් සිරගෙට දැමීම, නඩු විභාගයන් වාර්තා කරයි. එක් තැනක කිතුනුවන් 82 නෙක් පිස්සන් වනු පිණිස මානසික රෝහලකට දැමීමය. දින කිහිපයකට පසු විසි හතර දෙනෙකු මිය ගියේ දීර්ඝ ලෙස කල යාච්ඤාව නිසාය. දීර්ඝ යාච්ඤාව මිනීමැරුමේ කවදද? ඔවුන්ට විඳින්නට සිදුවූ දේ ඔබට සිතාගත හැකිද? ඔවුන්ගේ දරුවන්ට ක්‍රිස්තුස් වහන්සේ ගැන උගන්වන බව හෙලිවී නම් ළමුන් දෙමාපියන් වෙතින් ඉවත් කරනු ලැබේ. ඒ ජීවිතකාලයටමය. ඉන්පසු ඔවුන් බැලීමටද අවසර නැත. ඔවුන්ට විඳීමට සිදුවන දරුණුම වේදනාව එයයි. අධ්‍යාපනක්ෂේත්‍රයයේ වෙනස්කම් කිරීමට විරුද්ධව එක්සත් එක්සත් ජාතින්ගේ ප්‍රකාශනයට සොවියට් රුසියාව මෙසේ අත්සන් තබා ඇත. එනම් ''ස්වකීය ඇදහිලි වලට අනුකූලව ආගමික හා සුචරිත අධ්‍යාපනයක් සිය දරුවන්ට ලබාදීමේ නියම සහතික දෙමව්පියන් වෙත තිබිය යුතුය''. රජයේ දේවස්ථානවල නායක ද්‍රෝහියෙකු වූ කාරෙව් රුසියාවේ මේ නිදහස ඇති බැව් ලිපියක කියා සිටියි. මුළාවූවන් ඔහු විශ්වාශ කරති, දැන් සෝවියට් ප්‍රවෘත්ති සේවයට සවන් දෙමු.

1963 ජූනි 4 ද ''සොවෙජටස්කායා රුසියා'' පත්‍රයේ බැප්ටිස් සභිකයෙකු වූ මාක්රින්කෝෂා වෙතින් ඇගේ දරුවන් හය දෙනා ගෙන යනු ලැබීය. ඇය සිය දරුවන්ට ක්‍රිස්තියානි විශ්වාසය ලබාදීමත්, පළමුවෙන් රතු කර පටිය බැඳීමෙන් ඔවුන් වැලැක්වීමත් ඇය කල වරදය. ඇගේ දඩුවම ඇසූ කල ''විශ්වාශය නිසා මා දුක් විඳිමි යි පැවසුවාය. ඇය කෙරෙන් ඉවත්කල දරුවන් හය දෙනාගේ නේවාසික පහසුකම් සඳහා ඇයට මුදල් ගෙවන්නට සිදුවිය. ඔවුන්ට කොමියුනිස්ට් වාදය පුහුණු කරවයි, කිතුනු මව්වරුනි! ඇගේ මානසික වේදනාව ගැන සිතන්න. මෙවැනිම සිද්ධියක් ඉග්නාටි මුල්ලින් හා ඔහුගේ භාර්‍යාවටද, සිදුවූ බව යුසුටෙල්ස්-කාය ගැසටා'' පත්‍රය කියයි. විනිශ්චය කරු ඔහුට විශ්වාශය

අත්හැරදමනලෙස නියෝග කලේය. "නුඹෙ දූවද?" නැතහොත් දෙවියන්දුයි තෝරාගනින්. නුඹ තෝරාගන්නේ දෙවියන්ද? එහෙත් ඔහු මෙසේ පැවසීය. "මම මගේ විශ්වාශය අත් නොහරිමි."

ශාන්ත පාවුල්, "සියල්ල යහපතට ය යි පැවසීය. කිතුනුවන් ලෙස හැදුනු වැඩුනු ළමයි මව් පියන් වෙතින් ඉවත් කොට කොමියුනිස්ට් පාසැල් වලට ඇතුල් කරනු මම දැක ඇත්තෙමි. "අදේව දෘෂ්ටිකයන් විනාශවනු වෙනුවට නිවෙස්වලදී උගත් විශ්වාශය අනික් ලමුන් අතරේද පතුරුවති. "යේසුස් වහන්සේට වඩා සිය ළමයින්ට ප්‍රේම කරන්නන් තමන්වහන්සේට නොවටිනා බව බයිබලය අපට පවසයි. මේ වචනවල අ' ථය යකඩ තිරය පිටුපස ඇත.

ඔබේ දරුවන් නොදැක සතියක් ගත කිරීමට උත්සාහ කරන්න. එවිට ඔබට අපේ රුසියානු සොහෙ යුරන්ගේ වේදනාව දැනගනු ඇත. කිතුනු දෙමාපියන්ගේ අයිතිවාසිම වැලැක්වීම අදත් නොකඩවාම සිදුවෙයි. දැනා මෑත දි වූ සිද්ධියක් සෝවියට් ප්‍රවෘත්ති සේවයෙන් දැක්විය හැක, එය 1967 මාර්තු 29 ද "සැනමියා ලූනොස්ට්" පත්‍රයේ පලවිය. සිටිෂ් මහත්මිය කෙරෙන් ඇගේ පුතු වූ වේසටිෂ් ලැව් ඉවත් කලේ දේව භයින් යුක්තව ඔහු හැදූ වැඩු නිසාය. අස්වාභාවික අධ්‍යාපනයක්' දීමේ වරදට හැමරොවිස්කි හි සැබාවිනා මහත්මිය කෙරෙන් ඇගේ අනාථ වූ මිනිබ්පිය වූ වැනියා ඉවත් කරනලදී. මෙය 1968 ජනවාරි 13 ද සොවියට්ස්කායා රුසියා පත්‍රයේ පලවිය.

ප්‍රොතෙස්තන් සභාව ගැන පමණක්ම කථා කිරීම අසාධාරණය. රුසියාවේ ඕතොඩොක්ස් සභාවේ කිතුනුවන් සම්පූර්ණයෙන් වෙනස් වී ඇත. ඔවුන්ගෙන් ලක්ෂ ගණනක් හිරගෙය තුලින් ගොස් ඇත. එහි ඔවුන්ට යහන් නොමැත. කුරුසියේ ඇණ ගැසූ යේසුස් වහන්සේගේ රුවක් නොමැත. ශුද්ධවූ ප්‍රතිමාවක් නැත. සුවඳ දුම් නැත. ඉටිපන්දම් නැත. දේව ගැතියෙක් ලෙස නියම කර ගත් කැපවූ අයෙක් එහි

නැත. එහි පූජකයාට ලෝගුවක් නැත. තිරිහුපිටියෙන් කල පාන් නැත. කැප කරන ලද වයින් නොමැත. ශුද්ධවූ තෙල් නැත. කියවීමට පිළියෙල කර ගත් යාච්ඤා පොතක් නැත. මේ සියල්ලක්ම නොමැතිවද දෙවියන් වහන්සේ වෙතට කෙළින්ම යා හැකි බව ඔවුන් සොයා ගෙන තිබේ. ඔවුන් දෙවියන්ට කන්නලව් කරති. දෙවියන් උන්වහන්සේගේ ආත්මය ඔවුන් මතුයෙහි වගුරුවති. එය නියම ආත්මික පිබිදීමකි. මූලික කිතු දහම හා ඒකාකාරීබවක් රුසියාවේ ඕතොඩොක්ස් සභිකයන් අතර පවතියි.

බලවතුන් අනුගමනය කරන රටවල් මෙන් රුසියාවේද ඕතොඩොක්ස් පිළිවෙත් ස්වල්පයක් පිළිගනිමින්, පලපුරුද්දේ බලය මත රඳා සිටිමින්, දෙවියන් වහන්සේට ඉතා සමීප වූ, ශුභාරංචියේ මූලික සත්‍යය තුල රැඳුනු ඕතොඩොක්ස් පිළිවෙත් පැන නැගී ඇත. මෙම ස්භාව මහා වේද සාක්ෂිකයන් ලබා දී ඇත. වයොවෘද්ධ ආච්බිෂොප්වර කලුගානි යමොගන් දූන් කොහිදූයි කාට කිව හැකිද? ඔහු දෙවි‑න් රහිත කොමියුනිස්ට් රජය සමග සාමූහික ඉගැන්වීම් වලට ප්‍රසිද්ධියේදීම අගිතව විරුද්ධ වූයේය.

වර්ෂ පනහක කොමියුනිස්ට් පාලනය සහ රුසියානු පාලනය සහ රුසියානු ප්‍රවෘත්ති සේවය රහස් සභාවේ සම්පූර්ණ ජයග්‍රහණයයි. රහස් සභාව වචනයෙන් කිව නොහැකි ගැහැට මැදින් යයි විශ්වාශයේ රඳා පවතියි. රුසියානු යුද හමුදාවේ රහසිගත ආධාරයෙන් රුමේනියාවේ මේ බීජය අපි වපුරා ඇත්තෙමු. රුසියාවේ ද, රුසියාව ආක්‍රමණය කල රටවල ද මෙම බීජය වැපුරුවෙමු. එම බීජය පල ගෙනදී තිබේ.

කොමියුනිස්ට් ලෝකය ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගත හැකිව තිබේ. කොමියුනිස්ට්වරුන්ට ද කිතුනුවන් විය හැකිය. එසේ කලහැක්කේ ඔවුන් විසින් ගැහැට කරනු ලැබුවන්ට අපි උදව් දීමෙනි. මගේ නිවැරදිතාවය සනාථ කරමින් සෝවියට් සංගමයේ ද, චීනයේ ද, අනෙකුත්

කොමියුනිස්ට් දේශයන්හිද රහස් සභාව දියුණුව ඇත. භයංකර සිද්ධීන් අතරේදී ද අපේ සහෝදරයන් පෙන්වා සිටින පියකරු බව දක්වීමට රුසියාවෙන් ලැබුනු මේ ලිපිය දක්වමි.

## කොමියුනිස්ට් දැරියක් වූ වැරියා යේසුස් වහන්සේ සොයාගත්තේ, ඒ ගැන සාක්ෂි දරුවේ, වහල් මෙහෙකාරියක් වූයේ කෙසේද?

ප්‍රථම ලිපි තුන වාරියා යේසුස් වහන්සේ වෙතට ගෙන හැරලූ කිතුනු දැරියක වූ මාරියා ගෙනි.
**ප්‍රථම ලිපිය:**

"මම තවදුරටත් මෙහි ජීවත්වෙමි. සිර මැදිරිය තුල ඇති කොමියුනිස්ට් තරුණ සංගමයේ හැම දෙනාම මට ආදරෙයි. එකියක් මගෙන්, මට තේරුම් ගන්න බැහැ ඔබ කොහොම කෙනෙක්ද? කියා. ඔබ හැමටම ප්‍රේම කරන නමුත් මෙහි බොහෝ දෙනෙක් ඔබට අපහාස කරතියි ප්‍රශ්න කලාය". මිතුරන්ට පමණක් නොවෙයි සතුරන්ටත්,හැමදෙනාටත් ප්‍රේම කිරීමට දෙවියන් වහන්සේ අපට උගන්වා තිබෙනවා යයි මම ඇයට පිළිතුරු දුනිමි. මුලදී මේ කෙල්ල මට පාඩු ගෙන දුන්නද, ඇය ගැන විශේෂ උනන්දුවකින් යාච්ඤා කළෙමි. ඇයට ප්‍රේම කිරීමට මට හැකිදැ? යි මගෙන් ඇය ප්‍රශ්න කලවිට මම ඇය සිපගතිමි, අපි දෙදෙන කඳුළු හෙලෙමු. දැන් අපි යාච්ඤා කරන්නේ එකට ය. කරුණාකර ඇය ගැන යාච්ඤා කරන්න. ඇගේ නම වාරියායි.

මහ හඬින් දෙවියන් එපාකරන අයට ඔබ සවන් දුන්විට ඔවුන්ගේ නියම තත්වය ඔබ දකිනු ඇත. ඔවුන් දෙතොලින් දෙවියන්ට සාප කලද, ඔවුන්ගේ හදවත් තුලින් මහත් බලාපොරොත්තුවකින් පසුවන බව ඔවුන්ගේ ජීවිතයෙන්

පෙන්වයි. ඔවුන්ගේ හදවතේ කෙඳිරිය ඔබ අසනු ඇත. මේ මනුෂ්‍යයන් යමකිසිවක් සොයමින් පසුවෙති. ඔවුන්ගේ අභ්‍යන්තර හිස් බාවය, ඔවුන්ගේ දෙවිකෙනෙක් නොමැති කමෙන් වසා ගැනීමට අදහස් කරති".

මෙ ක්‍රිස්තුස් වහන්සේ තුල,
ඔබේ මාරියා.

දෙවැනි ලිපිය,

"මගේ පළමු ලිපියෙන් අදේව දෘෂ්ටික දූරියක් වූ වාරියා ගැන ඔබට ලිව්වෙමි. මගේ ප්‍රියාදරිය; අපේ බලවත් ප්‍රීතිය ඔබට කීමට නොඉවසිල්ලෙන් පෙලෙමි. වාරියා ක්‍රිස්තුස් වහන්සේ ඇගේ පුද්ගලික ගැලවුම්කාරයා හැටියට පිළිගත්තාය. ඇය හැමදෙනාටම ඒ ගැන ප්‍රසිද්ධියේම සාක්ෂි දරන්නීය. ඇය යේසුස් වහන්සේ විශ්වාසකර ගැලවීමේ ප්‍රීතිමත් කම තේරුම් ගත් විට ඇය මහත් අසතුටකින් පෙළුනාය. ඒ මීට පෙර ඇය දෙවිකෙනෙක් නැහැයි ප්‍රචාරය කර තිබුනු හෙයිනි. දැන් ඇය ඇගේ අපරාධය මකා ගැනීමට ඉටාගෙන ඇත. මම අදේවදෘෂ්ටි රැස්වීමකට වාරියා සමග ගියෙමි. ඇයට නවතින ලෙස මම අවවාද කලෙමි. එහෙත් එය අසාර්ථක විය.

වාරියාත් මමත් කුමක් සිදුවන්නේදැයි බැලීමට ගියෙමු. සාමාන්‍යලෙස කොමියුනිස්ට් ගිය ගැයීමෙන් පසු (වාරියා එම ගිය නොගැයුවාය) ඇය රැස්වීම ඉදිරියට පැමිණියාය. ධෛර්යමත්ව, මහත් හැඟීමකින් යුතුවූ ඇය ඇගේ ගැලවුම්කාර යේසුස් වහන්සේ ගැන සාක්ෂි දැරුවාය. එහෙත් ආත්මික නෙත් වසාගෙන, අන් අයටද ඊට මඟ පෙන්වමින් විනාශය කරා යමින් සිටීම ගැන ඇගේ ප්‍රථම කොමියුනිස්ට් සහෝදරයන්ට අනුකම්පා කරන ලෙස අයැද සිටියාය. තමන්ගේ පාපී මාවත් වලින් ඉවත්වී යේසුස් වහන්සේ වෙතට එන ලෙස හැමදෙනාගෙන්ම ඇය යටහත් පහත් ලෙස ඉල්ලා සිටියාය. කිසිවෙකු ඇය වැළකුවේ නැත. ඇය කථාව

අවසන් කොට ඇගේ මිහිරි හඬින් "කුරුසියේ බලයත් එහි ඉගැන්වීමත් රැකීමට දිවි දුන් යේසුස් වහන්සේ ගැන ප්‍රකාශ කරන්නට ලජ්ජා නොවෙමි"යි නමැති ගිය ගැයුවාය.

ඊට පසුව... ඊට පසුව ඔවුන් අපේ මාරියා ගෙන ගියාය. අද මැයි නව වැනිද. ඇය ගැන කිසිත් අපි නොදනිමු. ඇය ආරක්ෂා කිරීමට තරම් දෙවියන් බලවත්ය. අපි යාච්ඤා කරමු.

මේ,
ඔබේ මාරියා.

තෙවැනි ලිපිය,

"ඊයේ, අගෝස්තු 2 ද මම සිරගෙදර දී මාරියා සමග කථා කළෙමි. ඇය ගැන සිතිවෙනවිට මගේ හදවතින් රුධිරය වැගිරි යයි. ඇත්තටම ඇය තවමත් දූරියක්. යන්තම් අවුරුදු 19 ක් වූවා පමණයි. ඇය ආත්මිකව ද බිලිඳෙකි. එහෙත් ඇය ස්වාමීන් වහන්සේට මුළු හදවතින්ම ප්‍රේමකර එක් වරම පීඩාකාරී මාර්ගයේ ගියාය. දුප්පත් කෙල්ල! හරිම බඩගින්-නෙනුයි හිටියෙ. ඇය සිරගෙදර සිටින බව දැනගත් වහාම ඇයට පාර්සල් යැවීමට පටන් ගතිමු. එහෙත් ඇයට ලැබුනේ අපි යැවූ දේවලින් බොහොම ටිකකි.

ඊයෙ මම ඇය දකිනකොට සුදුමැලිවී, කෙට්ටුවී, පහර දෙනු ලැබ සිටියාය. ඇස් පමණක් පෙන්වූයේ දේව සමාදානයයි. පොලොවේ දක්නට නැති ප්‍රීතියයි. මගේ ප්‍රියාදරය, යේසුස් වහන්සේගේ මේ සුදුම සමාදානය අත් නොදුක ඇති අයෙකුට එය කෙසේදැයි අවබෝධ කරගන්නට බැහැ. ඒත් මේ සමාදානය ඇති අය කොපමණ ප්‍රීතිමත් ද යේසුස් වහන්සේ තුල සිටින අපි දුක් කම්කටොළු වලින් හා පරාජයවීම් වලින් නැවැත්විය හැකිද? මාරියා ඔයා කලදේ ගැන කණගාටු වන්නෙ නැද්ද? මම යකඩ පොලු අතරින් ඇසුවෙමි. 'නැහැ' ඇය පිළිතුරු දුන්නාය. ඔවුන් මම නිදහස්

කලහොත් නැවතත් ගොස් ක්‍රිස්තුස් වහන්සේගේ මහත් ප්‍රේමය ගැන කියමි''යි ඇය කීවාය. මම දුක්විඳිනවා යැයි සිතන්න එපා. ස්වාමීන් වහන්සේ මට මෙතරම් ප්‍රේම කිරීමත්, උන් වහන්සේගේ නාමයෙන් විඳින ප්‍රීතියක් නිසා මම ඉතාමත්ම සන්තෝෂ වෙමි. ඔබේ මුළු හදවතෙන්ම ඇය වෙන්වෙන් යාච්ඤා කරන ලෙස මම යටහත්ව ඉල්ලා සිටිමි. සමහරවිට ඇය සයිබීරියාවට යවනු ඇති. ඇගේ ඇඳ සිටි ඇඳුම් හැර අන් සියල්ලම පැහැරගෙන තිබුනි. ඇයට නෑයින් නොමැත. ඇයට ඉතාමත්ම අවශ්‍යවන දේ අප රැස්කල යුතුය. ඔබ අන්තිමට එවූ මුදල් ටිකද ඇය වෙනුවෙන් තබා ඇත. මාරියා පිටුවහල් කලහොත් ඒවා ඇයට දෙමි. ඇය ශක්තිමත්කොට අනාගතයේදී ද ස්ථිරව සිටීමට දෙවියන්වහන්සේ ඇයට බලය දෙනු ඇතැයි මම විශ්වාශ කරමි. දෙවියන්වහන්සේ ඇය රකින සේක්වා!

මේ,
ඔබේ, මාරියා.

සිව්වන ලිපිය:

පෙම්බර මාරියා වෙත,

අන්තිමේදී මට ඔබට ලියන්නට හැකි වුනා. අපි ..... හි සැතපුම් දහයක් පමණ නගරයෙන් ඔබ්බෙහි ඇති අපේ කඳවුරට සේන්දු වුනා. අපේ ජීවිතය විස්තර කිරීමට මට අපහසුය. එය ඔබ දන්නවා ඇති, මා ගැන කරුණු ටිකක් ලිවීමට මම සිතමි. මට වැඩ කළ හැක. උන්වහන්සේ දුන් ශක්තිය නිසා මම ස්තුති කරමි. මමත් ''X'' සොහොයුරියත් එකම කම්හලක වැඩෙහි යොදවා ඇත. එහි යන්ත්‍රවල අපි වැඩ කරමු. වැඩ අමාරුය. ''X'' සොයුරියගේ ශරීර සනීපය එතරම් හොඳ නැහැ. මම අප දෙදෙනා වෙනුවෙන්ම වැඩ කළ යුතුය. මගේ වැඩ කොටස ප්‍රථමයෙන්ම අවසන් කොට අනතුරුව ඇයගේ වැඩ කොටස නිම කිරීමට උදව් දෙමි. අපි

දිනකට පැය දෙලහක් හෝ දහතුනක් වැඩ කරමු. අපේ ආහාර ඔබේ ආහාර වගේමයි. ඉතාම ටිකයි. එහෙත් මම ඔබට කියන්න අදහස් කරන්නේ එය නොවෙයි. ඔබ තුලින් ගැලවීමේ මාර්ගය මට පෙන්වා දුන් බැවින් මගේ හෘදයංගම ස්තුතිය හා ප්‍රසංසාව උන්වහන්සේට දෙමි. දූන්, මේ මහ යමින්ම, මම යන්නේ කොහිද? මා දුක් විඳින්නේ කවුරුන් උදෙසාද කියාත්, මගේ ජීවිතයේ කිසියම් අර්ථයක් ඇති බවත් මම දනිමි. පාපයෙන් ගැලවීමේ මහා ප්‍රීතියත් හැම දෙනාටම පැවසීමේ ආශාවකින් මම පෙලෙමි. ක්‍රිස්තුස් වහන්සේ තුල ඇති ප්‍රේමයෙන් අප වෙන්කරලිය හැක්කේ කාට ද? කිසි වෙකුට හෝ කිසිවකට නොහැක. හිරගෙටවත් දුක් ගැහැට වලටවත් නොහැක. උන්වහන්සේ තුල තැබූ විශ්වාසය ශක්තිමත් කිරීමේ අවියෙන් පමණක් අපට දුක් ගැහැට පමුණු වයි. උතුරා ගලා යමින් ඇති උන්වහන්සේගේ කරුණාවෙන් මගේ හදවත පිරී ඉතිරී ගොස් ඇත. වැඩෙහිදී ඔවුන් මට සාප කරති. අඩුවම් කරති. අතිරේක වැඩ පවරති. ඒ මම නිහඬ නොවීම නිසාය. මට නිහඬ විය නොහැක. ස්වාමීන් වහන්සේ මට කල දේ හැම දෙනාටම මම පැවසිය යුතුය. මරණීය මාවතේ යමින් සිටි මා උන්වහන්සේ විසින් අළුත් සත්වයෙක් බවට පෙරලා ඇත. අළුත් මැවිල්ලක් බවට හරවා ඇත. මීට පසුවද මට නිහඬ විය හැකිද? නැහැ! කවදවත් නැහැ! මගේ තොල් පෙති වලට කථා කළ හැකිතාක් කල් උන්වහන්සේගේ මහා ප්‍රේමය ගැන හැම දෙනාට ම පවසන්නෙමි.

කඳවුරට යන අතර මඟදී අපට කිතුනු සොයුරු සොයුරි යන් මුණ ගැසුනහ. දෙවියන් වහන්සේගේ දරුවන් වූ මේ සොයුරු සොයුරියන් දකින ප්‍රථම දර්ශනයෙන්ම, ආත්මය තුලින් ඔබ විඳින වින්දනය කෙතරම් අසිරිමත් ද? එය කථා කිරීමට අනවශ්‍යයය. ප්‍රථම දර්ශනයෙන්ම ඔවුන් කවුරුන්දැයි ඔබ දැනගනු ඇත.

අතර මගදී දුම්රිය නැවතුම්පොලකදී එක් ස්ත්‍රියක් අපට අතරදී පැවසුවේ වචන දෙකකි. එනම් ''දෙවියන් ජීවමානව සිටී'' යන්නය.

අප මෙහි පැමිණි දින සැන්දෑවේම පොලව යට සිර කඳවුරු වලට ගෙන ගියහ ඉදිරියේ සිටි අයට ''ඔබට සාමය වේව''යි අපි පැතුවෙමු. අපි සොම්නසට පත් කරමින් හැම තැනකින්ම ඇසුනේ ''අපි ඔබ හැම සමාදනයෙන් පිලිගනිමු'' යන්නයි. ප්‍රථම සන්ධ්‍යාවේදීම අපි එකම පවුලක අය යයි හැඟීමක් ඇති විය.

ඔව් එය ඇත්තයි! මෙහි සිටින බොහෝ දෙනා යේසුස් වහන්සේ පුද්ගලික ගැලවුම්කාරුවාණන් ලෙසට පිලිගත් අය වෙති. පිරකරුවන්ගෙන් අඩකටත් වඩා කිතුනුවෝය. අග්‍ර ගණයේ ගායකයන්, ඉතා හොඳ ශුභාරංචි දේශකයන් අප සමග වෙති. දවසේ වැඩ නිමවීමෙන් අනතුරුව සන්ධ්‍යාවේදී එක් රැස්ව අපගේ ගැලවුම්කරුවාන්නගේ පාදමූලයේ ගත කරන මේ කාලය කෙතරම් අසිරිමත්ද? යේසුස්වහන්සේ සමග හැම තැනම නිදහස ඇත. මම මෙහිදී ඉම්බිරි ගීතිකා ඉගෙන ගනිමි නිත්පතා උන්වහන්සේගේ වචනය වඩ වඩා ලබා ගනිමි. මාගේ දහනව වැනි වියෙහිදී ප්‍රථම වරට යේසුස් වහන්සේගේ ජන්මෝත්සවය පැවැත්වීමු. මේ අසිරිමත් දිනය කිසිදක මට අමතක නොවෙයි.

එදින දවස මුළුල්ලේම වැඩ කළ යුතුවිය. කෙසේ වුවත් අපේ සහෝදරයන් කීපදෙනෙකුට අසල ඇති නදිය කරා යාමට හැකි විය. ඔවුන් මිදී ඇති හිම කුට්ටි කඩා ඉවත්කර බව්තිස්මය සඳහා ස්ථානය පිලියෙල කලේය. ඒ රැයෙහි දී දේව වචනයට අනුකූලව මමත් තවත් සොහොයුරන් හත් දෙනෙකුත් වතුර බව්තිස්මය ලැබුවෙමු. අනේ! මේ කොපමණ ප්‍රීති දිනාද? මාරියා ඔයාත් මා සමග සිටියානම් මම කොපමණ කැමතිද? යටගිය දවස්වල මම ඔබට විරුද්ධව කල වැරදිවලින් බිඳක්වත් ඔබ කෙරෙහි ඇති ප්‍රේමය තුලින් මකා ගැනිමට තිබුනානේ!

එහෙත් දෙවියන්වහන්සේ අප හැම දෙනා උන්වහන්සේගේ ස්ථානයේ තබයි උන්වහන්සේ අප සිටුවන්නේ කොහි ද? එතැන ස්ථිරව සිටිය යුතුය.

දෙවියන්වහන්සේගේ දරුවන්වූ, පවුලේ හැමදෙනාටම මගේ ආසිරිය දෙන්න. දෙවියන්වහන්සේ මට මෙන් ම ඔබටද එදිනෙද කටයුතු වලදී බොහෝසෙයින් ආශිර්වාද කරනු ඇත. හෙබ්‍රෙව් 12-1 — 3 කියවන්න.

අපේ සහෝදරයන් හැමදෙනාම ඔබට ආසිරි පතති. නොකඩවා පැමිණෙන වේදනා මධ්‍යයේ වුවද උන්වහන්සේට ස්තුති කිරීමට තරම් ඔබේ විශ්වාශය ශක්තිමත් වීම ගැන ඔවුහු ප්‍රීතිවෙති. ඔබ අන් අයටද ලියන්නේ නම් අපේ ආසිරිය ඔවුන්ට පුදකරන්න.

මේ

ඔබේ

මාරියා

පස්වැනි ලිපිය,

ආදරණීය මාරියා

අන්තිමේදී ජේලි කිහිපයක් ලිවීමට මට අවස්ථාව ලැබුනි. මගේ ආදරවන්තියේ, දෙවියන් වහන්සේගේ කරුණාවෙන් මමත් සොහොයුරියත් නිරෝගීව හොඳින් සිටින බව කිව හැක. අපි ............ ගියා. ඔවුන් අපි ............කරා යවා ඇත.

මම ඔබේ මාතෘ සැලකිල්ල වෙනුවෙන් ස්තුති කරමි. ඔබ පිළියෙල කලා වූ සියල්ල අපට ලැබුනි. ඉන් ඉතාමත්ම වටිනා එක වූ බයිබලය එවීම නිසා ඔබ ස්තුති කරමි. සියල්ලන්ටම ස්තුතියි. ඔබ ඔවුන් ලියනවිට මගේ ආසිරිය ඔවුන්ට පුදකරන්න.

උන්වහන්සේගේ පරිශුද්ධ ප්‍රේමයේ ගැඹුරු අභිරහස මට හෙළිදූද සිටම, ලෝකයේ ඉතාමත්ම ප්‍රීතිමත් තැනැත්තා වීමට මම කල්පනා කලෙමි. මම මුහුණ පෑ දුක් ගැහැට විශේෂ වරප්‍රසාදයක් ලෙස සලකමි. මගේ විශ්වාසයේ මුල් දිනවලම උන්වහන්සේ වෙනුවෙන් දුක් විඳීමේ මහත් ප්‍රීතිය ලබා දීම ගැන මම සතුටු වෙමි. "මම අවසානය දක්වාම උන්වහන්සේ කෙරෙහි විශ්වාසවන්තව රැඳී සිටිවා"යි හැම දෙනාම මා ගැන යාච්ඤා කරන්න.

උන්වහන්සේ ඔබ හැම දෙනා ශුද්ධවූ සටන සඳහා ශක්තිමත්ව තබත්වා! "X" සොයුරිය ඔබ හැම දෙනාම සිපගනියි. අපි .........කරා යැවූ විට සමහර විට ඔබට තවත් ලිපියක් එවන්නට අවස්ථාවක් ලැබේවි. අප වෙනුවෙන් තැවෙන්න එපා. අපි ප්‍රීතිමත්ව සිටිමු. සන්තෝෂව සිටිමු. මක්නිසාද? ස්වර්ගයේ අපේ දායාදය මහත්ය. — මතෙව්, 5–11–12.

මේ - ඔබේ,
මාරියා.

මාරියා කොමියුනිස්ට් වාදියක් වූවාය. පසුව යේසුස් වහන්සේ හමුවී උන්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරුවාය. අවසානයේ ඇය වහලියක් වශයෙන් දඬුවමට යටත් වූවාය. පෙරකී ලිපිය මාරියා නමැති මේ තරුණියගේ අවසන් ලිපියයි. ඉන් පසු ඇය ගැන තොරතුරක් නොවීය. එහෙත් කොමියුනිස්ට් වාදයට යටත්ව ඇති ලෝකයෙන් තුනෙන් එකක් පමණ සිටිනා දුක් ගැහැට විඳින රහස් සභාවේ ආත්මික සොඳුරු බවත්, ඇගේ මේ යේසුස් වහන්සේ කෙරෙහි ඇති පියකරු ප්‍රේමයත්, සාක්ෂියත් පැහැදිලි කර දෙයි.

## හත්වන අදියර

# ලංකාවේ නිදහස් ක්‍රිස්තු භක්තිකයින්ට ආධාර කල හැක්කේ කෙසේ ද?

සියළුම නිදහස් ක්‍රිස්තු බැතිවරුන්ට පහත සඳහන් කරන අයුරින් වහාම ආධාර කල හැකිය.

අදේවදෘෂ්ටීන් ඔවුන්ගේ ජීවිතේහි ඇසට නොපෙනෙන හේතුන් පිළිනොගනිති. ක්‍රිස්තු භක්තිකයන්ට ආධාර කල හැක්කේ ඔවුන්ම භක්තිමාර්ගයේ ගමන් කරමින් සහෝදරත්වයක් ඇති කරමින් ආදෘෂ්ටිමත් දෙවියන් වහන්සේ අදහාමිනි.

ක්‍රිස්තු භක්තිකයෝ ස්ථිර පරිත්‍යාගශීලිව ජීවත්විය යුතුය. ඔවුන්ගේ සහෝදර බැතිමතුන්ට හිංසා කරන සෑම අවස්ථාවලම අදේවදෘෂ්ටි විෂය නැති භංග කිරීමට හැකි විශේෂ ලියකියවිලි මුද්‍රණය කර එහි සිටින ප්‍රාරම්බය සිට විද්‍යාලවල සිටින සියළු දෙනාටම බෙදා හැරිය යුතුයි. මේ අදේවදෘෂ්ටිමත් ඉගැන්වීම් වලට පිළිතුරු දීමට පුළුවන්, ක්‍රිස්තියානි පිළිතුරු මුද්‍රණය කර යවන්නට අපට පුළුවන. සතරවන, අප කල යුත්තේ අභ්‍යන්තර බැතිමතුන් සමග අත්වැල් බැඳ ක්‍රිස්තු ධර්ම ප්‍රකාශ කරන දූතයන් හැටියට ගමන් බිමන් යෑමට මුදල් හදල් වලින් ආධාර කිරීමයි.

තවද ශුභාරංචි ගුවන් විදුලි මාර්ගයෙන් කොමියුනිස්ට් දේශවලට ප්‍රකාශ කල යුතුය. ඇදහිල්ල නිසා දිවි පිදූවාවූ ක්‍රිස්තියානි පවුල්වලට අපි සියළු අන්මින්ම ආධාර කල යුතුය.

අභ්‍යන්තරව පවත්වාගෙන ආ භක්තිමතුන්ගේ සහකාරයෙක්ව සිට, යම්තම් මැරවරුන්ගෙන් ජීවිතය බේරාගෙන ආ මම, මා සමග සිටි අනිකුත් සහෝදරයෝ ප්‍රසිද්ධව විරුද්ධ

විය යුතුයි. ලාංකික ක්‍රිස්තු භක්තිකයෝ මේ කොමියුනිස්ට් වරුන් වෙනුවෙන්,ඔහුගේ ගැලවීම සඳහා යාච්ඤා කල යුතුය.

තමන් ගැන යම් හිතැති ආප්‍රේමයක් තිබේ නම් එවැනි හිතැති ප්‍රේමකමක් තමාගේ අසල් වැසියාටත් යොමු කල යුතුයි.

දෙවනුව නිදහස් ක්‍රිස්තු බැතිමතුන් ශුද්ධ ලියවිලි (බයිබලය) සහ ඒ ලියවිලි වල කොටස් අරින්නට පුළුවන් මම නිදහස් ලොවට පැමුණුනායින් පසු ශුද්ධ ලියවිලි බොහොමයක් යැව්වාය. ඒවා නොඅනතුරුව ලැබී තිබේ. මේ ඉතාම අවශ්‍යය. රුසියාවේ සහ එහි ප්‍රතිපත්ති අනුගමනය කරන රටවල්වල වෙසෙන ක්‍රිස්තු භක්තිකයින් දහස් ගණනක් ශුද්ධ ලියවිලි හෝ එහි තිබෙන වෘත්තාන්තය අවුරුදු විස්සකට පනහකට පමණ දකින්ටවත් ලැබී නැත. තුන්වෙනුව කොමියුනිස්ට් රටවල සිටින්නන්ගෙන් එතුමන්ලාට ආයාචනයක් පනිවිඩයක් සහ බැගෑපත් ඉල්ලීමක් ඉදිරිපත් කරමි.

මම දන් විශ්වාස සාගතයෙන් ආගම නිසා දිවිපුද කොමියුනිස්ට් දේශවල අභියන්තර සිද්ධස්ථානවල සිටින අදේවදෘෂ්ටි කොමියුනිස්ට් වාදීන්ගේ බැමිවල දුක්විඳින්නාවූ ඔබතුමන්ලාගේ සහෝදර,සහෝදරියන්ගේ පනිවිඩය මම දැන් ප්‍රකාශ කලෙමි.

වැඩිවිස්තර හා තෑගී මේ ලිපිනයට එවන්න

ඇඳිල්ලෙන් සහනය,
තැ. පෙ. 25,
නුගේගොඩ.

---

53/1, දෙනිවල පාරේ පදිංචි පී. සේනාපතිරත්න විසින් නුගේගොඩ, ගංගොඩවිල 'දීපානි' (අ. බටදූවආරච්චි) වෙතින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී. *1972/1106/1 (15 Jen.)*

# මාසික සඟරාව

ඔබ අපගේ (නොමිලේ) බෙදා හරින
මාසික සඟරාව හා වෙනත් තොරතුරු
දැනගැනීමට කැමැත්තෙහි නම් අද ම
අපට ලියා එවන්න.

ඇඳගිල්ලෙන් සඟනය
තැ. පෙ. 25
නුගේගොඩ.